205 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 205 - இல. 16
**Volume 205 - No. 16**

2011 දෙසැම්බර් 20 වන අඟහරුවාදා
2011 டிசம்பர் 20, செவ்வாய்க்கிழமை
**Tuesday, 20th December, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
තේරීම් කාරක සභා රැස්වීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද:**

සභාගර්භ ආලින්දයේදී පහර දීම

**විසර්ජන පනත් කෙටුම්පත, 2012 – [විසිතුන්වන වෙන් කළ දිනය ]:**

[ශීර්ෂ 3 (විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෝෂ්ඨ අමාත්‍යවරු); ශීර්ෂ 108, 308 (තැපැල් සේවා); ශීර්ෂ 143 (පාර්ලිමේන්තු කටයුතු); ශීර්ෂ 184 (පුද්ගලික ප්‍රවාහන සේවා); ශීර්ෂ 183 (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු); ශීර්ෂ 106, 304 (ආපදා කළමනාකරණ); ශීර්ෂ 176 (සිවිල් ගුවන් සේවා); ශීර්ෂ 181, 328 (ඵලදායිතා ප්‍රවර්ධන); ශීර්ෂ 173 (රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ); ශීර්ෂ 124, 216 (සමාජ සේවා); ශීර්ෂ 175 (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන); ශීර්ෂ 133 (තාක්ෂණ හා පර්යේෂණ )]- කාරක සභාවේදී සලකා බලන ලදී.

**කාර්මික තාක්ෂණ ආයතනය:**

වාර්ෂික වාර්තාව (2008)

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக்கூட்டம்
தெரிவுக்குழுக் கூட்டம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**

சபாமண்டப ஓய்விடத்தில் தாக்குதல் நடத்தியமை

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012 - [ஒதுக்கப்பட்ட இருபத்துமூன்றாம் நாள்]:**

[தலைப்புகள் 3 (விசேட செயற்பாடுகளுக்கான பணியகம் (சிரேட்ட அமைச்சர்கள்); தலைப்பு 108, 308 (தபால் சேவைகள்); தலைப்பு 143 (பாராளுமன்ற அலுவல்கள்); தலைப்பு 184 (தனியார் போக்குவரத்துச் சேவைகள்); தலைப்பு 183 (மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள்); தலைப்பு 106, 304 (அனர்த்த முகாமைத்துவம்); தலைப்பு 176 (சிவில் விமான சேவைகள்); தலைப்பு 181, 328 (வினைத்திறன் மேம்பாடு); தலைப்பு 173 (அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு); தலைப்பு 124, 216 (சமூக சேவைகள்); தலைப்பு 175 (அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி); தலைப்பு 133 (தொழினுட்ப ஆராய்ச்சி)] - குழுவில் ஆராயப்பட்டது.

**கைத்தொழில் தொழில்நுட்ப நிறுவகம் :**

வருடாந்த அறிக்கை (2008)

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Meeting of Committee on Parliamentary Business
Meeting of Committee of Selection

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:

Attack in the Lobby

APPROPRIATION BILL, 2012 - [Twenty Third Allotted Day]

Considered in Committee - [ Head 3 (Secretariat for Special Functions (Senior Ministers); Head 108, 308 (Postal Services); Head 143 (Parliamentary Affairs); Head 184 (Private Transport Services); Head 183 (Public Relations and Public Affairs); Head 106, 304 (Disaster Management); Head 176 (Civil Aviation); Head 181, 328 (Productivity Promotion); Head 173 (Public Management Reforms); Head 124, 216 (Social Services); Head 175 (State Resources and Enterprise Development); Head 133 (Technology and Research) ]

INDUSTRIAL TECHNOLOGY INSTITUTE:

Annual Report (2008)

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 දෙසැම්බර් 20 වන අඟහරුවාදා***
*2011 டிசம்பர் 20, செவ்வாய்க்கிழமை*
*Tuesday, 20th December, 2011*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011 දෙසැම්බර් මස 20 වන අඟහරුවාදා, එනම් අද දින පෙර වරු 11.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### තේරීම් කාරක සභා රැස්වීම
### தெரிவுக்குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE OF SELECTION

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ රැස්වීමක් 2011 දෙසැම්බර් මස 20 වන අඟහරුවාදා එනම් අද දින පෙර වරු 11.15ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස සියලු ගරු සභික මන්ත්‍රීවරුන්ට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 නොවැම්බර් 22 දිනැති අංක 1733/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.-[ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2008 සහ 2009 වර්ෂ සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(ii) 2007 සහ 2008 වර්ෂ සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්; සහ

[ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා]

(iii) 2009 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව හා ගිණුම්.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத் தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2008 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ; සහ

(iii) 2009 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - පැමිණ නැත.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පන්නිපිටිය, රුක්මලේ, අංක 100/2 දරන ස්ථානයේ පදිංචි නයනා කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, ශ්‍රී විජයාරාම පාර, අංක 10/2, "දීපානි" නිවසෙහි පදිංචි එල්.කේ.ආරියරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඌරගස්මන්හන්දිය, හිරිකුඹුර පදිංචි නන්දා ගුණසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කුරුණෑගල, ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයෙහි සේවය කරන පී.ඒ. සුවින්දිනී දර්ශිකා අල්විස් මහත්මියගෙන්ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගොඩනැඟිලි සහ වාහන: කුලිය/බද්ද
### சுகாதார அமைச்சின் கட்டிடங்கள் மற்றும் வாகனங்கள்: வாடகை /குத்தகை
### BUILDINGS AND VEHICLES FOR MINISTRY OF HEALTH : RENT/LEASE

1308/'11

2. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැඟිලි කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැඟිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැඟිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබා ගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබා ගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹි පුද්ගල සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

යන්න සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010 மற்றும் 2011 ஆண்டுகளில்,

(i) சுகாதார அமைச்சிற்கு உரித்தல்லாத கட்டி டங்களை வாடகைக்கு அல்லது குத்தகைக்கு எடுப்பதற்கு ஏற்பட்ட மொத்த செலவினத்தையும்;

(ii) வாடகைக்கு அல்லது குத்தகைக்கு எடுக்கப்பட்ட கட்டிடங்களின் சதுரஅடிக்கான வாடகைப் பெறுமதியையும்;

(iii) கட்டிடங்களின் குத்தகைக் கால அளவையும்;

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி வருடங்களில்,

(i) அமைச்சின் எந்தவொரு நிறுவனத்திற்கும் உரித் தல்லாத வாகனங்களை வாடகைக்கு அல்லது குத்தகைக்கு அமர்த்தியதில் ஏற்பட்ட மொத்த செலவினத்தையும்;

(ii) சொந்தமாக உள்ள மொத்த வாகனங்களின் எண்ணிக்கையையும்;

(iii) வெளி வளங்களிலிருந்து பெற்றுக் கொள்ளப் பட்ட ஏனைய சேவைகளையும்;

(iv) மேற்படி வெளிவள சேவைகளுக்கான செல வினத்தையும்;

(v) வெளிவள அடிப்படையில் ஒப்பந்தம் செய்யப்பட்ட நபர்களின் எண்ணிக்கையையும்;

(vi) மொத்த பணியாளார் தொகையையும்;

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state for years 2010 and 2011 separately -

(i) the total cost for renting or leasing of buildings which are not owned by the Ministry of Health;

(ii) the rate for a square feet of rented or leased buildings; and

(iii) the leasing period of the buildings?

(b) Will he also state in relation to the Ministry of Health for aforesaid years separately-

(i) the total money spent on hiring or leasing of vehicles which do not belong to any of the ministry related entities;

(ii) the total number of vehicles owned;

(iii) the other outsourced services;

(iv) the cost incurred in outsourced services mentioned above;

(v) the number of people who have been contracted on outsourced basis; and

(vi) the total staff strength?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க )
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2010 වසර සඳහා පිරිවැය රුපියල් 2,724,250

2011 වසර සඳහා පිරිවැය රුපියල් 4,797,000

(ii) මාසික කුලිය හෝ බද්ද මුළු ගොඩනැඟිල්ල සඳහාම තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලබන බැවින් වර්ග අඩියක් සඳහා තක්සේරු ලබාදී නොමැත. රජය විසින් තක්සේරු කරන්නේ මුළු නිවසටම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව මුළු නිවසෙහි තක්සේරුව තමයි තිබෙන්නේ.

(iii) ඇමුණුම 1 බලන්න.

(ආ) (i) රුපියල් 39,950ක මාසික කුලී පදම මත 2011 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා අවස්ථා දෙකකදී වාහන කුලියට ගෙන ඇත. ඒ සඳහා 2011 නොවැම්බර් මාසය දක්වා රුපියල් 424,846ක මුදලක් ගෙවා ඇත. නොවැම්බර් මාසයෙන් පසු කුලියට හෝ බද්දට කිසිදු වාහනයක් ගෙන නොමැත.

(ii) 158කි.

(iii) (iv), (v), (vi) පිළිතුරු සඳහා ඇමුණුම 2 බලන්න. ඇමුණුම් **සභාගත*** කරමි.

ඇමුණුම 2 අනුව ලබා ගන්නේ ආරක්ෂක සේවාව, පිරිසිදු කිරීම, කිළිටි රෙදි සේදීම, අමු ආහාර සැපයීම සහ ආපනශාලා සේවාව කියන ඒවායි.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு கள்:*
*Annexes tabled:*

ඇමුණුම 1

බාහිර පුද්ගලයින්ගෙන් කුලියට හෝ බද්දට ලබා ගන්නා ලද නිවාස පිළිබඳ විස්තර

| අනු අංකය | ආයතනයේ නම. | ගොඩනැගිල්ල හිමිකරුගේ නම හා ලිපිනය. | බදු කාලය |
|---|---|---|---|
| 1 | මොණරාගල මහ රෝහල | ඩී.එම්.එල්.ආර්.දිසානායක මයා. අංක 82/1,තිස්ස පාර,මොණරාගල. | වසර 01 |
| 2 | එම | ආර්.එම්.එම්.ගුණවර්ධන මයා. ප්‍රගති මාවත, මොණරාගල. | වසර 01 |
| 3 | නුවරඑළිය මහ රෝහල | එල්.සූරියආරච්චි මිය. නො.54, හයික්ලි ලේඩි මැකලම් පාර, නුවරඑළිය. | වසර 04 |
| 4 | එම | පී.එස්.එම්.එස්.මංගල ගුණසේකර මයා. නො.77/1,රෝහල් පටුමග, හාවා එළිය,නුවරඑළිය. | වසර 01 මාස 06 |
| 5 | පොලොන්නරුව මහ රෝහල | පී.ජී.අනුර විජේසිරි මයා. ප්‍රියන්ත එන්ටප්‍රයිසස්, කලහගල, පොලොන්නරුව. | වසර 01 |

[ගරු ලලිත් දිසානායක මහතා]

| | | | |
|---|---|---|---|
| 6 | කුරුණෑගල ශික්ෂණ රෝහල | ඒ.එම්.ඩී.සී.අතපත්තු මිය. අංක 1B,බාලදක්ෂ මාවත,කුරුණෑගල. | වසර 01 |
| 7 | එම | ඒ.එම්.බණ්ඩාර මයා. අංක 26/10,බෞද්ධාලෝක මාවත,කුරුණෑගල. | වසර 01 |
| 8 | එම | එච්.එම්.බණ්ඩාර මැණිකේ මිය. අංක 22, ජායා පතිරණ මාවත, කුරුණෑගල. | වසර 01 |
| 9 | එම | එච්.ඒ.විමලාවතී මිය. අංක296,තරංගා,ජයන්තිපුර මාවත,කුරුණෑගල. | වසර 01 |
| 10 | එම | ජේ.එච්.එම්.කේ.බී.ජයසිංහ මයා. විල්තෙර උයන,පළමු වන පටුමග,වැව රවුම,කුරුණෑගල. | මාස 11 |
| 11 | එම | ඩබ්.ඒ.ඒ.පී.වික්‍රමසිංහ මයා. අංක 9/71,බාලදක්ෂ මාවත, ජයන්තිපුර,කුරුණෑගල. | වසර 01 |
| 12 | බදුල්ල මහ රෝහල | එස්.ඩී.පෙරේරා මිය. අංක 18,වැටකෙයියාවල පාර,උඩහමුල්ල,නුගේගොඩ. | වසර 01 |
| 13 | එම | ටී.එම්.වජිර තෙන්නකෝන් මයා. අංක 32, මායා වෙරස්, මායා මාවත,කිරිබත්ගොඩ. | වසර 02 |
| 14 | එම | ඩබ්.එම්.විමල් කීර්තිරත්න මයා. සී19, 2/2,සොයිසාපුර,මොරටුව. | වසර 02 |
| 15 | දකුණු කොළඹ ශික්ෂණ රෝහල | එච්.ඒ.පෙරේරා මයා. නො.40/12,ජය සමඟි මාවත, ද සිල්වා පාර, කළුබෝවිල,දෙහිවල. | වසර 01 |
| 16 | මහරගම ජාතික පිළිකායතනය | ඩබ්.ඒ.ඒ.ආර්.වීරක්කොඩි මයා. නො.35,ජාලියගොඩ. පිළියන්දල | වසර 01 |
| 17 | එම | අමිත් නිශාන්ත ගුණවර්ධන මයා.205,නල්ලවත්ත පාර,මහරගම | වසර 01 |
| 18 | යාපනය ශික්ෂණ රෝහල | වී.සෝමසුන්දරම් මයා. 186/6,පරුත්තිත්තුරෙ වීදිය,යාපනය. | වසර 05 |
| 19 | එම | කේ.සන්මුගනාදන් මිය. 54/1,රෝහල් මාවත,යාපනය. | වසර 01 මාස 05 |
| 20 | එම | එස්.කනගම්බිකෙ මිය. 216,මනිප්පෙ මාවත, වන්නාර්පන්නෙ,යාපනය | වසර 03 |
| 21 | එම | ටී.වයි.බෙනරාජ් මයා. 31,කෝවිල් වීදිය,චුන්ඩිකුලි,යාපනය. | වසර 01 |

ඇමුණුම 2

බාහිරින් ලබාගන්නා සේවාවන්

| බාහිරින් ලබාගන්නා සේවාව | ගිවිසුම්ගත පිරිවැය (රුපියල්) | | ගිවිසුම්ගත පුද්ගල/ආයතන සංඛ්‍යාව | | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2010 වසර | 2011 වසර | 2010 වසර | 2011 වසර | 2010 වසර | 2011 වසර |
| ආරක්ෂක සේවාව | 287,886,891/= | 288,601,626/= | 01 | 01 | 1,354 | 1,374 |
| පිරිසිදු කිරීම | 446,980,283/= | 958,734,540/= | 09 | 09 | 2,756 | 3,312 |
| කිළිටි රෙදි සේදීම | 132,967,392/= | 123,733,723/= | 34 | 34 | අදාළ නොවේ. | |
| අමු ආහාර සැපයීම | 992,193,303/= | 783,830,897/= | 39 | 42 | අදාළ නොවේ. | |
| ආපන ශාලා සේවාව | 66,229,511/= (ආදායමකි) | 69,838,281/= (ආදායමකි) | 30 | 30 | අදාළ නොවේ. | |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඇමති -ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා- දූෂණයට විරුද්ධව කටයුතු කරනවා කියන එක අපට පේන්න තිබෙන සුබ ලකුණක්. හොර කරන ආණ්ඩුවක අඩු ගණනේ ඒකවත් කරන එක ලොකු දෙයක්. මෙවැනි outsource activities කරලා අද රෝහල්වල බෙහෙත් නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. මෙවැනි ඒවාට සල්ලි ගෙවනවාට වැඩිය හොඳයි ඒ තිබෙන සල්ලි ටික බෙහෙත් ගන්න පාවිච්චි කරන එක. අද මහ රෝහලකට ගියොත් එහි බෙහෙත් නැහැ. ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ඇඳන් 1,100ක් තිබෙනවා. එයින් 325ක් පාවිච්චි කරන්නේ නැතිව තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් මොනවාද කරන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අහලා තිබෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කුලියට ලබා ගත් ගෙවල් පිළිබඳවයි. ඒ සඳහා යොදවපු මුදල කිසි ලෙසකින්වත් අපතේ යන එකක් නොවෙයි. රෝහල්වල වෛද්‍යවරුන් සඳහා, ඒ වාගේම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය ගොඩනැඟිලි එකපාරට ඉදි කරන්න බැහැ. ඒ, වෛද්‍යවරුන්ගේ සහ රෝහල් කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාව සඳහා කුලියට ගත්තු නිවාසයි. පිරිසිදු කිරීමේ සේවාව තමුන්නාන්සේලාගේ රජය මඟින්ම පැවැරුවා පෞද්ගලික අංශයට. එය තමයි අප දිගටම කර ගෙන යන්නේ. එම සේවාව, ආරක්ෂක සේවාව, කිළිටි රෙදි සේදීම, අමු ආහාර සැපයීම ආදි සේවා සිදු වෙනවා. අමු ආහාර සැපයීමේ සේවාව බාහිරින් ලබා ගෙන තමයි දිගින් දිගටම කරන්නේ. අමු ආහාර සපයන්නේ රෝගීන්ටයි. නේවාසික රෝගීන් සඳහා අවශ්‍ය කෑම ටික දෙන්නයි. පිරිසිදු කිරීම කියලා කියන්නේ ගරු ඇමතිතුමාගේ ගෙදරවත් අපේ ගෙදරවත් පිරිසිදු කරන එක නොවෙයි. පිරිසිදු කරන්නේ රෝහල්. රෝහල් පිරිසිදු කිරීම සඳහා තමයි මේ මුදල වැය කරලා තිබෙන්නේ. ආරක්ෂක සේවාව රෝහල්වලට ආරක්ෂාව සැපයීම සඳහායි. ඒ සියල්ල නිදහස් සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා කරන ලද වියදම්. මේ කිසිවක් අනවශ්‍ය වියදම් නොවෙයි. සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා කරන වියදම් තමයි මෙහි තිබෙන්නේ. ආපනශාලා සේවාවෙන් ආදායම් ලබනවා. රජයට වියදමක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය අහන්නේ සුර සැප ලබන ඇමතිවරුන් වෙනුවෙන් නොවෙයි. මේ, බෙහෙත් නැති අහිංසක ජනතාව වෙනුවෙන් අහන ප්‍රශ්නයක්. මේ සල්ලි පාවිච්චි කරලා බෙහෙත් ගන්න පුළුවන් හැකියාව ගැනයි අහන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නැතත් මා උත්තරයක් දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉස්සෙල්ලා අහන ප්‍රශ්නය වටහා ගන්න ඕනෑ. ඒ වැටහීම ඇති වුණොත් ප්‍රශ්නය විසඳෙනවා. දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ගොඩනැඟිලි ඕනෑ තරම් තියා ගෙන ඒවා පාවිච්චි නොකර වෙනත් ඒවා කුලියට ගන්නවා. ඒ සල්ලිවලින් බෙහෙත් ගන්න පුළුවන් නේද කියලායි මා අහන්නේ. මෙතුමන්ලාට මේවා තේරෙන්නේත් නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා පටලවා ගෙන. එහෙම ගොඩනැඟිලි නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙතුමන්ලාට මේ සම්බන්ධයෙන් තේරෙන්නේ නැහැ. මේවා අහන කොට එතුමන්ලාට රිදෙනවා. කරුණාකර උත්තර දෙන්න. ඔය ලැබෙන සල්ලි ටික පාවිච්චි කරන්න ඕනෑ රෝහල්වලට අවශ්‍ය බෙහෙත් ටික ගන්නයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොඩනැඟිලි ගන්නේ රෝහල්වල වෛද්‍යවරුන්ට සහ රෝහල් කාර්ය මණ්ඩලයටයි. එහෙම නැතිව ඇමතිවරුන්ට නිදා ගන්න කුලියට ගත්තු ගෙවල් නොවෙයි ඒවා. රෝහල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගත්තු ඒවායි. විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරුන් සහ අනෙකුත් වෛද්‍යවරුන් වෙනුවෙන් ගත් ඒවායි.

එක වාහනයක් විතරයි කුලියට අරන් තිබෙන්නේ. වාහන දහස් ගණන් අරන් නැහැ. නොවැම්බර් මාසයේ සිට ඒකත් නවත්වලා තිබෙනවා. ඒ නිසා අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරන කිසි දෙයක් කරලා නැහැ. ඊළඟට සියල්ලම ජනතාවගේ සෞඛ්‍ය සේවාව වෙනුවෙන් තමයි කරලා තිබෙන්නේ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වාණිජ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ බෙහෙත්වල මිල පාලනය අයින් කරලා දැම්මා. අපේ ගරු ඇමතිතුමා දැන් නැවතත් ජනතාවට නියමිත මිලට බෙහෙත් ටික දෙන්න මිල පාලන ක්‍රමයක් නැවත හඳුන්වලා දීලා තිබෙනවා. මෙතුමා වාණිජ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ තමයි ඒ මිල පාලන ක්‍රමය නවත්වලා බෙහෙත් ටික නියමිත මිලට දෙන්න බැරි තත්ත්වයක් ඇති කළේ. අපි නොවෙයි, තමුන්නාන්සේ වාණිජ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ ඇමති කාලයේ, තමුන්නාන්සේලාගේ කාල සීමාව තුළ බෙහෙත්වලට තිබුණු මිල පාලනය අයින් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මෙහෙම නොවෙයි කළේ. ඒ ගරු මන්ත්‍රීතුමා වාණිජ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ රුපියල් 100ට ගෙනාපු බෙහෙත්වලට තව රුපියල් 65ක් එකතු කරලා තමයි විකුණුවේ. නමුත් අපි ඒක සම්පූර්ණයෙන් අයින් කරලා දැම්මා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහන්නම්. මේ ආණ්ඩුවේ තිබෙන හැම ප්‍රශ්නයක්ම හැදුවේ එක්සත් ජාතික පක්ෂය ලු. තුනෙන් දෙකක බලයක් තිබෙනවා කියනවා, නමුත් මේ ප්‍රශ්න,- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉතින් ප්‍රශ්නය තමයි අහන්නේ. මම මේ හබරාදූව පිළිබඳ ප්‍රශ්නයක් අහන්නේ. මේ අවස්ථාවේ කියන්නේ හැම එකකටම යූඑන්පී එක සම්බන්ධයි කියලා නේ. මේක outsource කරලා තිබෙන්නේ යූඑන්පී කාලයේ නම්, ඇයි ඒවා වෙනස් කරන්නේ නැත්තේ? අවුරුදු 17ක සාපයක් කියලා කිව්වාට, ඔබතුමන්ලාත් අවුරුදු 17ක් රට පාලනය කරලා තිබෙනවා. ඇයි ඔය ප්‍රශ්නයට උත්තර නැත්තේ? රෝහල්වල බෙහෙත් නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මමත් තමුන්නාන්සේගෙන් එක ප්‍රශ්නයක් අහන්නද? තමුන්නාන්සේ වැස්සකටවත් ඉස්පිරිතාලෙකට ගොඩ වෙලා තිබෙනවාද කියන්න කෝ. අඩුම තරමින් රජයේ රෝහලකින් බෙහෙතක් අරගෙන තිබෙනවාද කියලා කියන්න කෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා බෙහෙතක් ගන්න වැස්සකටවත් රජයේ රෝහලකට ගොඩ වෙලා නැහැ. ඒ විධියට පොඩ්ඩක් ගොඩ වෙලා කථා කළා නම් ඊයේ ජාතික සංවිධායකකම දිනා ගන්න තිබුණා. ඉතින් අපි බොහොම කනගාටු වෙනවා. තමුන්නාන්සේ හැමදාම ඇවිල්ලා ප්‍රශ්න අහලත් පක්ෂයේ අය තමුන්නාන්සේව පත් කළේ නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I would like to ask a Privilege Question, Sir, because -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

No, you cannot ask a Privilege Question.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

We are concerned about the health of all the Hon. Members. What is the condition of the Hon. Ravi Karunanayake's health? ඊයේ ගුටි බැට වැදිලා තිබුණා ලු.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

No, that is not a point of Order. [*Interruption.*]

## ක්‍රීඩා අමාත්‍යාංශයේ උපදේශකයන්: විස්තර
## விளையாட்டுத்துறை அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
## ADVISERS UNDER MINISTRY OF SPORTS : DETAILS

1495/'11

3. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விளையாட்டுத்துறை அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வள வென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப் பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங் கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப் பனவுத்தொகை தனித்தனியாக எவ்வளவென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Sports at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) of the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles;

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them; and

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட் டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. මම කනගාටු වෙනවා, මගේ මිත්‍ර රවි කරුණානායක මන්ත්‍රීතුමාට පක්ෂයේ නියෝජ්‍ය නායකකම අහිමි වීම ගැන. ඒ ගැන මගේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද විපක්ෂ නායකතුමා එළවලා එතුමා නායකයා වෙන්නයි බලා ගෙන හිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

(අ) (i) කිසිවෙකුත් නැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ආ) (i) නැත.

(ii) පැන නොනඟී.

(ඇ) (i) නැත.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න නැහැ.

## කුඹුක්කන නව පාලම ඉදි කිරීම : විස්තර
## கும்புக்கன புதிய பால நிர்மாணம் : விபரம்
## CONSTRUCTION OF NEW BRIDGE IN KUMBUKKANA : DETAILS

1584/'11

4. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල-වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ, කුඹුක්කන ගංගාරාම විහාරස්ථානය සමීපයෙන් ගලා යන දිය පාර හරහා ඉදි කර තිබූ පාලම පුළුල් කිරීම සඳහා කඩා දමා මාස ගණනාවක් ගත වී ඇතත් එහි ඉදි කිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නව පාලමේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලම ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එක් එක් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ මිල ගණන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම පාලම ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) විදේශ ආධාර මඟින් ලබා ගත්තේ නම්, එම ආධාර ලබා දුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மொனறாகலை மாவட்டத்தில் மொனறாகலை - வெல்லவாய பிரதான நெடுஞ்சாலையில் கும்புக்கன கங்காராம விஹாரைக்கு பக்கத்தில் ஓடுகின்ற அருவிக்கு குறுக்காக அமைக்கப்பட்டிருந்த பாலத்தை அகலமாக்குவதற்காக உடைக்கப்பட்டு பல மாதங்கள் கடந்துள்ள போதிலும் அதன் நிர்மாணப் பணிகள் இன்றுவரை ஆரம்பிக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) புதிய பாலத்தின் நிர்மாணப் பணிகள் பூர்த்தி செய்யப்பட உத்தேசிக்கப்பட்டுள்ள திகதி யாது;

(ii) அதற்காக மதிப்பிடப்பட்டுள்ள தொகை எவ்வளவு

என்பதை அவர் அறிவிப்பாரா

(இ) (i) இப் பாலத்தை நிர்மாணிப்பதற்காக கேள்விப் பத்திரம் கோரப்பட்டதா;

(ii) அவ்வாறெனின் கேள்விப் பத்திரங்களை சமர்ப்பித்த நிறுவனங்களின் பெயர்கள் எவை;

(iii) அந்தந்த நிறுவனங்களினால் சமர்ப்பிக்கப்பட்ட கேள்விப் பத்திர விலைக்கள் யாவை;

(iv) கேள்விப் பத்திரம் வழங்கப்பட்ட நிறுவனம் மற்றும் ஏற்புடைய விலைகள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) இப் பாலத்தை நிர்மாணிப்பதற்காக மதிப்பிடப் பட்ட தொகை உள்நாட்டு நிதியங்களிலிருந்து பெறப்பட்டதா;

(ii) வெளிநாட்டு உதவிகள் மூலம் பெறப்பட்ட தெனில், அந்த நிதி உதவியை வழங்கிய நாட்டின் பெயர் யாது

என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that even though a few months have lapsed since, the bridge over the stream that flows near the Gangarama temple in Kumbukkana on the Moneragala Wellawaya main road in the Moneragala District, was demolished for widening, its construction work has not yet been started?

(b) Will he inform-

(i) the proposed date of completion of the construction work of new bridge; and

(ii) the estimated sum for that?

(c) Will he state-

(i) whether tenders were called for the construction of this bridge;

(ii) if so, the names of institutions that forwarded tenders;

(iii) the bids submitted by each institution; and

(iv) the institution to which the tender was granted and the relevant bid?

(d) Will he state-

(i) whether the estimated sum for the construction of this bridge was generated out of local funds; and

(ii) if it was obtained as a foreign aid, the name of the country that provided aid?

(e) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ අංක 243/1 දරන මෙම පාලමේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට 2011.01.28 දිනට නියමිතව තිබුණද මෙම කොට්ඨාසයේ බුත්තල පැවති 2011 දැයට කිරුළ ප්‍රදර්ශන කටයුතුවලට බාධාවක් විය හැකි බැවින් එම කටයුතු 2011.02.21 වන දින ආරම්භ කරන ලදී.

(ආ) (i) 2011.12.19

(ii) රුපියල් 26,058,803.74

(ඇ) (i) ඔව්.

(ii) සතුට බිල්ඩර්ස් ආයතනය.

හොවෙල් කන්ස්ට්‍රක්ෂන් ආයතනය

වලිසි ඉංජිනියරින් ආයතනය

තුඩාව බ්‍රදර්ස් ආයතනය

(iii)

| | |
|---|---|
| සතුට බිල්ඩර්ස් ආයතනය | රු. 21,924,474.30 |
| ජයවංශ කන්ස්ට්‍රක්ෂන් ආයතනය | රු. 23,681,790.00 |
| හොවෙල් කන්ස්ට්‍රක්ෂන් ආයතනය | රු. 31,841,265.90 |
| වලිසි ඉංජිනියරින් ආයතනය | රු. 25,084,264.26 |
| තුඩාව බ්‍රදර්ස් ආයතනය | රු. 28,431,130.32 |

(iv) සතුට බිල්ඩර්ස් ආයතනය රු. 21,924,474.30

(ඈ) (i) දේශීය අරමුදල්

(ii) අදාළ නොවේ.

(ඉ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කලින් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ප්‍රශ්නයේ (ආ) (i) කොටසට පිළිතුර මොකක්ද කියා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
2011.12.19

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2011.12.19 කියන්නේ ඊයේ. දැන් මේ වන විට ඒ පාලමේ සියලු කටයුතු අවසන් වෙලා ජනතා අයිතියට පවරන්න පුළුවන් තත්ත්වයට පත් වෙලා තිබෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ (ආ) (i) කොටසින් අසා තිබුණේ "නව පාලමේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට යෝජිත දිනය කවරේද" කියායි. අදාළ සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව ඉදි කිරීම අවසන් කරන දිනය තමයි ඒ දිනය. ඉදි කිරීමේ කටයුතුවලින් තවත් සියයට විසි ගණනක් ඉදිරියේදී අවසන් කළ යුතුව තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල, වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ තිබෙන මේ ස්ථානයේ පමණක් නොවෙයි, තව බොහෝ තැන්වල මේ ආකාරයට කොන්ත්‍රාත් පවරා ඉදි කිරීම් මන්දගාමී වුණු පාලම් තිබෙනවා. ඒ වාගේම අතරමඟ වැඩ නතර වුණු පාලම් තිබෙනවා. මේ විධියට අතරමඟ නතර වුණු, මන්දගාමී වුණු පාලම් මොනවාද කියා හඳුනා ගෙන ඒවා කඩිනමින් ක්‍රියාත්මක කරන්න සහ නිශ්චිතව අවසන් කරන්න දින යොදා තිබෙනවාද? අමාත්‍යාංශයට මේ ගැන අවබෝධයක් තිබෙනවාද, නැත්නම් ඒ ගැන තක්සේරුවක් තිබෙනවාද, ඒ ගැන පසු විපරමක් තිබෙනවාද කියා මා අහනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයටත් ඒ වාගේම මහාමාර්ග අමාත්‍යාංශයටත් මන්දගාමී වැඩ පිළිවෙළක් නැහැ. නමුත් අදාළ ඉදි කිරීම් කටයුතු කිරීමේදී පරිසරයත් සමඟ සහ බාහිරව එල්ල වන අනෙකුත් විවිධ අවශ්‍යතාවන් සඳහා ඇහුම් කන් දෙන්නට සිදු වනවා. ඒ අනුව දින වකවානු වෙනස් වන්නට පුළුවන්. ඒ පිළිබඳව නිවැරදි අධ්‍යයන කටයුතු කරලා, ඒ කාර්ය නිමා කරන්නයි අපි අමාත්‍යාංශයක් විධියට පියවර ගන්නේ. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණු අනුව යම් කිසි ගැටලුවක් තිබෙනවා නම් ඒක සඳහන් කරන්න. ඒ පිළිබඳව අපිට සොයා බලන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර තැන්වල පාරේ පළලට වඩා පාලමේ පළල අඩුයි. අලුතෙන් පාලමක් හදන කොට වුණත් වර්තමානයේ තිබෙන පාරේ පළලට සමානව තමයි හදන්නේ. හැබැයි, අපට තිබෙන විදේශ අත්දැකීමක් තමයි, පාරේ පළලට වඩා පාලමේ පළල වැඩියෙන් හදන එක. අනාගතයේ දී පුළුල් වන පාර සඳහා අවශ්‍ය විධියටයි පාලම හැදෙන්නේ. ඒ කියන්නේ අනාගතය දැකලා තමයි හදන්නේ. ඉතින් ඒ නිසා කරුණාකරලා ඉදිරියේදී මේ පාලම් නිර්මාණය කරන කොට පාරේ පළලට වඩා පාලම තරමක් ලොකුවට හදලා තිබුණොත් අනාගතයේ දී පාර පුළුල් කිරීමේදී ගැටලුවක් මතු වන්නේ නැහැ. නමුත් අපිට ලංකාවේ දකින්නට ලැබෙන්නේ එහි අනෙක් පැත්තයි. මේ ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා සඳහන් කරන පරිදි නව පාලමක් ඉදි කිරීමේදී අනාගතයේ අදාළ පළල් කිරීම පිළිබඳව තීන්දු අරගෙන පවතින පාරේ පළලට වඩා පළලින් වැඩි කරලා පාලම් ඉදි කිරීමට කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමාගේ අදහස උපදෙසක් ලෙස ක්‍රියාත්මක කරන්නට ඉදිරියටත් බලාපොරොත්තු වනවා. එතුමා ලබා දෙන උපදෙස් සහ අදහස් එතුමාගේ පක්ෂය තුළ ක්‍රියාත්මක නොවන නිසා එතුමාට තැනක් ලැබිලා නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒක මෙතැනට අදාළ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ ප්‍රශ්න ගැන මා බලා ගන්නම්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ නිසා එතුමාට යම් කිසි තැනක් ලබා ගැනීමේ හැකියාව ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

## කුඩා රබර් ඉඩම් හිමියන් : සහනාධාර
## சிறு இறப்பர் தோட்ட உரிமையாளர்கள்: மானியம்
## SMALL-SCALE RUBBER ESTATE OWNERS: GRANT OF SUBSIDIES

1844/'11

7. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රබර් වගාව දියුණු කිරීම සඳහා කුඩා රබර් ඉඩම් හිමියන්ට සහනාධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, ඒ යටතේ ඉඩම් හිමියන්ට ලබා දෙන සහනාධාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இறப்பர் பயிர்ச் செய்கையை முன்னேற்று வதற்காக சிறு இறப்பர் தோட்ட உரிமையாளர் களுக்கு மானியம் வழங்கும் செயற்பாடொன்று நடைமுறையில் உள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அதன் கீழ் இறப்பர் தோட்ட உரிமையாளர்களுக்கு வழங்கப்படும் மானி யங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

asked the Minister of Plantation Industries:

(a) Will he state-

(i) whether a programme of giving subsidies to small-scale rubber estate owners with a view to developing the rubber cultivation, is being implemented; and

(ii) if so, the subsidies given to the estate owners under that programme?

(b) If not, why?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க )
(The Hon. Mahinda Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) I ආර්ථික ඵලදායී වයස ඉක්ම වූ රබර් වගාවන්වල ගස් ඉවත් කර නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 1,75,000ක වගා සහනාධාරයක් අතිගරු ජනාධිපතිතුමා මෙවර යෝජනා කරලා තිබෙනවා.

II යෝග්‍ය බව තහවුරු කරන ලද බිම්වල අලුතෙන් රබර් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 1,50,000ක වගා සහනාධාරයක් අතිගරු ජනාධිපතිතුමා මෙවර යෝජනා කරලා තිබෙනවා.

III රබර් වගාවේ අපරිණත අවධිය තුළ අතුරු බෝග වගා කිරීම සඳහා අක්කරයකට රුපියල් 4,000ක වගා සහනාධාරයක් ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා.

IV පරිණත වගා බිම්වල වැසි ආවරණ යෙදීම සඳහා ගසකට රුපියල් 25ක සහනාධාරයක් ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා.

V ජාතික පොහොර සහනාධාර වැඩසටහන යටතේ කිලෝග්‍රෑම් 50ක මිශ්‍ර පොහොර මිටියක් රුපියල් 1,300 කටද, කිලෝග්‍රෑම් 50ක ඍජු පොහොර මිටියක් රුපියල් 1,200 කටද පිරිනමන්න අතිගරු ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා. විශාල මුදලක් රජයෙන් වියදම් කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙකයි. Hon. Minister, you answered "yes" to (a) (i). What are the areas or districts in the North and the East that come under the scheme of granting subsidies? The other day you spelt out certain new areas.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

Yes. There are the traditional areas like Kegalle, Ratnapura, Galle, Matara and some areas in Hambantota. In addition, there are non-traditional areas that we have gone into such as Moneragala.

His Excellency the President has suggested in the Budget for 2012 that we look at rubber cultivation in the Ampara District, mainly in Maha Oya and Padiyathalawa, where we have identified nearly 10,000 hectares suitable for rubber cultivation.

In addition, one year ago, I instructed the Rubber Research Institute to carry out experiments in the North to see whether the land is suitable for rubber cultivation and the report that they have presented to me after one year of experiments has established that certain parts in the North, especially Vavuniya South and certain parts in Mullaitivu, are conducive for rubber cultivation. So, we are now discussing with the Ministry of Economic Development, the possibility of expanding it to those areas. If we are successful in going into those new areas, we would be able to achieve our objective of increasing significantly the rubber cultivation in this country so that the value-added industries which have been established in this country do not have to, in future, import the latex or the resource from outside the country and they can be given the full supply they require from within this country and further expansion of these value-added industries could also be put into place so that employment generation as well as income generation could be achieved.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Minister, my second question is, could you tell us when you would be starting re-planting or new plantations in the North?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

We are having discussions with the Ministry of Economic Development at the moment and hopefully, by next year, since new planting will be given that extra subsidy of Rs.150,000 by His Excellency the President, we would be able to start it. We are now in a position to identify the smallholders in those areas. Actually, there is a lot of interest already shown by the people in those areas to grow rubber because the prices are quite high at the moment and that is an additional income they can get in addition to whatever they are doing in the areas of agriculture at present. There is plenty of land, from what I believe. We will be working very closely with the Ministry of Economic Development to put that strategy in place.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

My third Supplementary Question is, are you adopting new methods of making latex rubber?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

Are you referring to centrifuged latex rubber?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Yes. Has that been introduced to all areas?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

Well, the value-added industries are the ones which -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

නැහැ, රබර් කැපීම, ඔට්ටපාලු ගැනීම පිළිබඳව නවීන ක්‍රම තමුන්නාන්සේගේ අමාත්‍යාංශය විසින් -

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

That, Hon. Member, we have been doing perennially. The Rubber Research Institute conducts continuous research in improving productivity and decreasing the cost of production so that a higher income can be enjoyed by the smallholders.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Thank you for your comprehensive reply, Hon. Minister.

## ලියා පදිංචි නොකළ මූල්‍ය ආයතන : ක්‍රියාමාර්ග
### பதிவு செய்யப்படாத நிதி நிறுவனங்கள்: நடவடிக்கை
### UNREGISTERED FINANCIAL INSTITUTIONS : COURSE OF ACTION

1209/’11

1. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මේ දක්වා ලියා පදිංචි කර බලපත්‍ර ලබා දී ඇති මූල්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මූල්‍ය ආයතනවල නම් කවරේද;

(iii) මහ බැංකුව වෙත වාර්තා වී ඇති ලියා පදිංචි නොවී පවත්වාගෙන යනු ලබන මූල්‍ය ආයතන තිබේද;

(iv) එසේ නම්, ඒවායේ නම් කවරේද;

(v) එම ලියා පදිංචි නොකළ මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இதுவரை இலங்கை மத்திய வங்கியில் பதிவு செய்யப்பட்டு உரிமங்கள் வழங்கப்பட்டுள்ள நிதி நிறுவனங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) இந்நிதி நிறுவனங்களின் பெயர்கள் யாவை யென்பதையும்;

(iii) மத்திய வங்கிக்கு அறிக்கையிடப்பட்டுள்ள பதிவு செய்யப்படாமல் பேணிவரப்படுகின்ற நிதி நிறுவனங்கள் உள்ளனவா என்பதையும்;

(iv) அவ்வாறாயின் அவற்றின் பெயர்கள் யாவை யென்பதையும்;

(v) இந்த பதிவு செய்யப்படாத நிதி நிறுவனங்கள் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House-

(i) the number of financial institutions that have been registered with the Central Bank of Sri Lanka and issued with licences up to now;

(ii) the names of those financial institutions;

(iii) whether there are financial institutions that are run without being registered, as reported to the Central Bank;

(iv) if so, what their names are; and

(v) the course of action to be taken against such unregistered financial institutions?

(b) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ආවාට පස්සේ ප්‍රශ්නයට පිළිතුර දෙන්නද? නැත්නම් පිළිතුර සභාගත කරන්නද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
සභාගත කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 88යි. එනම්,

| | |
|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව | 23 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව | 9 |
| ලියා පදිංචි මුදල් සමාගම් සංඛ්‍යාව | 38 |
| කල්බදු මූල්‍යාකරණ පනතේ 3(සී) වගන්තිය යටතේ ලියාපදිංචි කළ කල්බදු මූල්‍යාකරණ ආයතන සංඛ්‍යාව | 18 |

(ii) අදාළ ආයතනවල තොරතුරු ඇමුණුම් I හි සඳහන් වේ.

(iii) ලියා පදිංචි නොවී පවත්වා ගෙන යනු ලබන මූල්‍ය ආයතන පිළිබඳව මහ බැංකුව වෙත වාර්තා වී ඇත. මේ සම්බන්ධයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් සමාගම් පනතේ II වගන්තිය යටතේ පරීක්ෂණ සිදු කරමින් පවතී.

(iv) ශ්‍රී ලංකා මහ බැකුවේ මුදල් මණ්ඩලය විසින් අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වන බවට නිශ්චය කොට නියාමන පියවරක් ගත් ආයතන.

(අ) නියාමන පියවර - මුදල් සමාගමක් ලෙස ලියා පදිංචි කිරීම

1. ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(ආ) නියාමන පියවර - මහජනයාගෙන් ලබාගත් තැන්පතු මුදල් ආපසු ගෙවීමට නියම කිරීම.

1. ජනතා ප්‍රගති ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. වරුණ ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
3. දේශීය සම්පත් සංවර්ධන හා ආයෝජන සංගමය

(ඇ) නියාමන පියවර - ඉහත (අ) සහ (ආ) නියාමන පියවරවලට අනුගත නොවීම නිසාවෙන් නීතිමය පියවර ගනු ලබන ආයතන

1. ජන - ශ්‍රී ෆයිනෑන්ෂියල් කොපරේෂන් කම්පැනි ලිමිටඩ්
2. වාසනා ෆිනෑන්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. රුරල් ඩිවලොප් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
4. ජනහඳ ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
5. ලංකාවින් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
6. රිසෝර්ස් එන්හාන්ස්මන්ට් ඇන්ඩ් නේෂන් ඩිවලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
7. එමරල්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
8. රුරල් ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
9. ගෝල්ඩන් ෆයිනෑන්ෂල් සර්විසස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
10. පූර්ණ ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
11. ඔකඳ ෆිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිඩට්
12. පියදාස රත්නායක *
13. ඩී. කේ. උදයසිරි *
14. නාරංගොඩ ලියනගේ දොන් මිනොල් හසන්ත නාරංගොඩ (ශ්‍රියාවි හෝම්ස්, ලෑන්ඩ්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් නමැති ව්‍යාපාරයේ අයිතිකරු) *
15. සක්විති හවුස් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් *
16. කළුතොට එන්ටර්ප්‍රයිසස්
*නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

(v) ඉහත (iv) (අ)හි දැක්වෙන ආයතනය මගින් මුදල් සමාගමක් ලෙස ලියා පදිංචි කර ඇත. (iv) (ආ) හි දැක්වෙන ආයතන තුන මහජනයාගෙන් ලබා ගත් තැන්පතු මුදල් ආපසු ගෙවීමට පියවර ගෙන ඇත. (iv) (ඇ) හි දැක්වෙන ආයතන 16 සම්බන්ධයෙන් නීතිමය පියවර ගනිමින් පවතී.

පොදුවේ ලියා පදිංචි නොකළ මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග පහත පරිදි වේ.

යම් ආයතනයක් පිළිබඳ තොරතුරු ලැබීමෙන් පසු එම ආයතනය අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වන්නේ දැයි නිර්ණය කිරීම සඳහා 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ II වන වගන්තිය ප්‍රකාරව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බලය පවරනු ලැබේ.

එම පරීක්ෂණයන්ට අනුව එම ආයතනය අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වන බවට මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපර්තමේන්තුවේ අධ්‍යක්ෂ නිගමනය කරන්නේ නම් ඒ පිළිබඳව වාර්තාවක් මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

එම ආයතන අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වන බවට නිර්ණය කළහොත් මූල්‍ය සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මූල්‍ය සමාගමක් ලෙස ලියා පදිංචිය ලබා ගත යුතු බවට නියම කිරීම හෝ තැන්පතු වගකීම් ආපසු ගෙවීමට විධානය කිරීම හෝ ඇතුළු විධාන නිකුත් කිරීමට හැකිය. එමෙන්ම, තැන්පතුකරුවන් සුරැකීම සඳහා එම සමාගම් ඈවර කිරීම ඇතුළු අවශ්‍ය යැයි හැඟෙන පියවරයන් ගත හැකිය.

අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වූ බවට නිර්ණය කරන ලද ආයතන/පුද්ගලයන්ගේ නම් මුදල් මණ්ඩලයට, මුදල් සමාගම් පනතේ 37වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධියට පත් කළ හැක.

ගරු නීතිපතිතුමාගේ උපදෙස් හා එම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව අනවසර මුදල් ව්‍යාපාරවල නිරත වූ ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවරවලට එළඹිය හැකිය.

අවසර නොලත් මුදල් ව්‍යාපාරවල කටයුතු හේතුවෙන් මහජනතාවට සිදු වන හානි අවම කිරීම සඳහා පුවත් පත් දැන්වීම් පළ කිරීම, ජනතාව දැනුවත් කිරීම සඳහා පුවත් පත් සහ වෙනත් ප්‍රකාශනවලට ලිපි සැපයීම, පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම, ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මහජනයා දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබයි.

(ආ) පැන නොනඟී.

ඇමුණුම I

**ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී/ලියාපදිංචි මූල්‍ය ආයතන**

බලපත්‍රලාභී වාණිජ බැංකු (23)

1. අමානා බැංක් ලිමිටඩ්
2. අයිසීඅයිසීඅයි බැංක් ලිමිටඩ්
3. ඉන්දියන් ඕවර්සීස් බැංක්
4. ඉන්දියන් බැංක්
5. එම්සීබී බැංක් ලිමිටඩ්
6. කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී
7. ඩීඑෆ්සීසී වර්ධන බැංක් ලිමිටඩ්
8. ඩොයිෂ් බැංක් ඒ ජී
9. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
10. හැටන් නැෂනල් ඩිවලොප්මන්ට් බැංක් පීඑල්සී
11. නේෂන්ස් ට්‍රස්ට් බැංක් පීඑල්සී
12. පබ්ලික් බැංක් බර්හාඩ්
13. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
14. මහජන බැංකුව
15. යූනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී
16. ලංකා බැංකුව
17. සම්පත් බැංක් පීඑල්සී
18. සිටි බැංක් එන් ඒ
19. සෙලාන් බැංක් පීඑල්සී
20. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංක්
21. ස්ටේට් බැංක් ඔෆ් ඉන්දියා
22. හබීබ් බැංක් ලිමිටඩ්
23. හැටන් නැෂනල් බැංක් පීඑල්සී

බලපත්‍රලාභී විශේෂිත බැංකු (9)

1. එම්බීඑස්එල් සේවින්ග්ස් බැංක් ලිමිටඩ්
2. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
3. ඩීඑෆ්සීසී බැංකුව
4. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
5. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
6. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැංක් ලිමිටඩ්
7. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
8. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැංක් ලිමිටඩ්
9. සණස ඩිවලොප්මන්ට් බැංක් ලිමිටඩ්

ලියාපදිංචි මූල්‍ය සමාගම් (38)

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
3. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
4. ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ්
5. එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
6. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
7. එලයන්ස් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
8. එච්එන්බී ග්‍රැමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්
9. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් ලිමිටඩ්
10. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
11. කැපිටල් ෆිනෑන්ස් ලිමිටඩ්
12. කොමර්ෂල් ක්‍රෙඩිට් පීඑල්සී
13. ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්
14. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
15. පීපල්ස් ලීසිං ෆිනෑන්ස් පීඑල්සී
16. බාට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ්
17. බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
18. විලුඩ් ෆිනෑන්ස් ලිමිටඩ්
19. රිසෝර්ස් ෆිනෑන්ස් ලිමිටඩ්
20. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
21. ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි කම්පනි ලිමිටඩ්
22. ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
23. ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ්
24. දිවැස ෆිනෑන්ස් ලිමිටඩ්
25. නන්දා ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්
26. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
27. මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
28. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
29. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී
30. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
31. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
32. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
33. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
34. සිරිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
35. සෙන්කඩගල ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
36. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
37. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
38. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

විශේෂිත කල්බදු [illegible] සමාගම් (18)

1. ඇසට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ්
2. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්
3. ඉසුරු ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්
4. එල්බීඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
5. එස් එම් බී ලීසිං පීඑල්සී
6. ඔරියන්ට් ෆිනෑන්ෂියල් සර්විසස් කෝපරේෂන් ලිමිටඩ්
7. කාර්සොන් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ලීසිං ලිමිටඩ්
8. කොමර්ෂල් ලීසිං කම්පනි පීඑල්සී
9. කොම්බැංක් ලීසිං කම්පනි ලිමිටඩ්
10. කෝපරේටිව් ලීසිං කම්පනි ලිමිටඩ්
11. පීපල්ස් මර්චන්ට් පීඑල්සී
12. පීපල්ස් ලීසිං කම්පනි ලිමිටඩ්
13. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
14. මර්චන්ට් බැංක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී
15. ලිස්ටන් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
16. සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරිං ලිමිටඩ්
17. සිලිජ් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
18. සොෆ්ට්ලොජික් ක්‍රෙඩිට් ලිමිටඩ්

## නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය : විදුලි සැපයුම
## நுரைச்சோலை அனல் மின் நிலையம்: மின் விநியோகம்
## NOROCHCHOLAI THERMAL POWER PLANT: POWER SUPPLY

1733/'11

5. ගරු අජිත් කුමාර මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் குமார - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Ajith Kumara on behalf of the Hon. Anura Dissanayake)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ වත්මන් නිෂ්පාදන ධාරිතාවය කොපමණද;

(ii) විවෘත කළ දින සිට එම බලාගාරය මගින් අඛණ්ඩව විදුලි සැපයුමක් ලබා දෙන්නේද;

(iii) එම බලාගාරය වසා දමා හෝ අක්‍රීය තත්ත්වයෙන් පැවති දින ගණන කවරේද;

(iv) එම තත්ත්වයට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின் வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுரைச்சோலை அனல் மின் நிலையத்தின் தற்போதைய உற்பத்திக் கொள்ளளவு எவ்வளவு;

(ii) திறந்து வைக்கப்பட்ட திகதி தொடக்கம் மேற்படி மின் உற்பத்தி நிலையத்தின் மூலம் தொடர்ச்சியாக மின்சாரம் வழங்கப்படுகின்றதா;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையம் மூடப்பட்டு அல்லது செயலிழந்திருந்த நாட்கள் எவ்வளவு;

(iv) மேற்படி நிலைமைக்குக் காரணமாயிருந்த விடயங்கள் யாவை

என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minster of Power and Energy:

(a) Will he inform this House-

(i) the current generation capacity of the Norochcolai Thermal Power Plant;

(ii) whether the aforesaid power plant has been providing a continuous power supply since the date on which it was opened ;

(iii) the number of days for which the aforesaid power plant had been closed down or inactive; and

(iv) the factors which contributed to the aforesaid situation?

(b) If not, why?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙ.වො.300

(ii) විවෘත කළ දින පටන්, විශේෂයෙන්ම අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාසවල ඇති වන නියං කාලය තුළ බෙහෙවින් අවශ්‍ය වන විදුලි බලය සපයමින්, මූලික ධාරා බලාගාරයක් ලෙස මෙම විදුලි බලාගාරය කටයුතු කර තිබේ. තාක්ෂණික බිඳ වැටීම් හේතුවෙන් මෙම බලාගාරය අවස්ථා කිහිපයකදීම වසා දැමීමට සිදු වූ අතර, එම බිඳ වැටීම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු සහ ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ඉක්මන් පියවර ගන්නා ලදී.

(iii) දින 35

(iv) සැලසුම්ගත සහ සැලසුම් නොකළ නඩත්තු කටයුතු සහ ගල් අඟුරු සැපයුමේ ප්‍රමාදය.

(ආ) අදාළ නොවේ.

## නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිල්ල විවෘත කිරීම : උපදෙස් නොතැකීම
## பட்டினமும் சூழலும் பிரதேச சபைக் கட்டிட அங்குரார்ப்பணம்: அறிவுறுத்தல்களைக் கவனத்திற்கொள்ளாமை
## INAUGURATION OF TOWN AND GRAVETS PRADESHIYA SABHA BUILDING : DISREGARD OF INSTRUCTIONS

1814/'11

**6. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு அருந்திக்க பர்னாந்து சார்பாக )
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Arundika Fernando )

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව සඳහා ඉදිකළ නව ගොඩනැගිල්ල 2011.07.05 දින විවෘත කළ බවත්;

(ii) ඒ වන විට, එම ප්‍රාදේශීය සභාවේ අභිනව පාලනාධිකාරිය දිවුරුම් දී නොතිබූ බැවින් විශේෂ කොමසාරිස් ලෙස බලතල පැවරී තිබූ ප්‍රාදේශීය ලේකම්තුමියගේ වගකීම යටතේ එම විවෘත කිරීම කළ බවත්;

(iii) අභිනව පාලනාධිකාරිය දිවුරුම් දී නොමැති අවස්ථාවක එම විවෘත කිරීමේ උත්සවය පැවැත්වීම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එය කල් තබන ලෙස දෙන ලද උපදෙස් නොසලකා හැරීමක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යම් ප්‍රාදේශීය ලේකම්වරයෙකුට අමාත්‍යාංශ ලේකම්වරයකු විෂයානුබද්ධිතව ලබා දෙන උපදෙස් නොසලකා හරිමින් කටයුතු කිරීමට බලයක් තිබේද;

(ii) නොඑසේ නම්, ඉහත පරිදි ක්‍රියා කළ ත්‍රිකුණාමලය නගර හා කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில், பட்டினமும் சூழலும் பிரதேச சபைக்காக நிர்மாணிக்கப்பட்ட புதிய கட்டிடம் 2011.07.05ஆம் திகதி அங்குரார்ப்பணம் செய்துவைக்கப்பட்டதென்பதையும்;

(ii) அப்போது, மேற்படி பிரதேச சபையின் புதிய ஆளும்தரப்பினர் சத்தியப்பிரமாணம் செய்திருக்கவிலையென்பதால் விசேட ஆணையாளராக அதிகாரமளிக்கப்பட்டிருந்த பிரதேச செயலாளரின் பொறுப்பின் கீழ் அந்த அங்குரார்ப்பணம் நடைபெற்றது என்பதையும்;

(iii) புதிய ஆளும்தரப்பினர் சத்தியப்பிரமாணம் செய்திராத ஒரு சந்தர்ப்பத்தில் மேற்படி அங்குரார்ப்பண வைபவத்தை நடத்தியமையானது பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சின் செயலாளரினால் அதனை ஒத்திவைக்குமாறு வழங்கிய அறிவுறுத்தல்கள் கவனத்தில் கொள்ளப்படாமையாகும் என்பதையும்

அவர் அறிவரா?

(ஆ) (i) அமைச்சின் செயலாளர் ஒருவரினால் எவரேனுமொரு பிரதேச செயலாளருக்கு விடயப் பரப்பிற்கு அமைவாக வழங்கப்படும் அறிவுறுத்தல்களை கவனத்தில் கொள்ளாமல் செயற்படுவதற்கு அதிகாரம் உள்ளதா என்பதையும்;

(ii) இன்றேல், மேற்கூறியவாறு செயற்பட்டுள்ள திருகோணமலை பட்டினமும் சூழலும் பிரதேச செயலாளருக்கு எதிராக எடுக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that-

(i) the new building constructed for Town and Gravets Pradeshiya Sabha in Trincomalee District was opened on 05.07.2011 ;

(ii) the Divisional Secretary who had been authorized as the Special Commissioner was responsible for that opening, as the new governing body had not been sworn in by that time ; and

(iii) holding that opening ceremony at a time when the new governing body had not been sworn in was an act of disregarding the instructions given by the Secretary to the Ministry of Public Administration and Home Affairs to postpone the event?

(b) Will he state-

(i) whether a Divisional Secretary has the authority to act disregarding the subject related directions given by a Secretary to a Ministry ; and

(ii) if not, the steps that will be taken against the Divisional Secretary of Trincomalee Town and Gravets who acted in the aforesaid manner?

(c) If not, why?

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව සඳහා ඉදි කළ නව ගොඩනැගිල්ල 2011.07.05 දින නොව 2011.07.25 දින විවෘත කර ඇත.

(ii) මෙම ගොඩනැගිල්ල විවෘත කිරීමේ දිනය පිළිබඳ තීරණය ගෙන ඇත්තේ නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදීය.

(iii) කල් තබන ලෙස උපදෙස් ලබා දී නොමැත.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

## වරප්‍රසාද: සභාගර්භ ආලින්දයේදී පහර දීම
## சிறப்புரிமை: சபாமண்டப ஓய்விடத்தில் தாக்குதல் நடத்தியமை
## PRIVILEGE: ATTACK IN THE LOBBY

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 දෙසැම්බර් මස 19 වැනි දින අය වැය තෙවන වර කියවීමේදී රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ විවාදය විපක්ෂය වෙනුවෙන් ආරම්භ කරමින් මගේ කථාව කර ගෙන යනු ලැබුවා. මගේ කථාව අවසන් කර පාර්ලිමේන්තු සභා ගර්භයෙන් පිටතට පැමිණෙද්දී එක්වරම මා ඉදිරියට කඩා වැදුණු පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීවරයා "මොකක්ද යකෝ උඹ ඇතුළේ කිව්වේ" කියමින් මට අතින් පයින් පහර දෙනු ලැබුවා. ඒ පහරදීම තුළින් මට සුළු තුවාල සිදු වූ අතර, ඒ අවස්ථාවේ මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හලීම් මැතිතුමාත්, මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත අලුවිහාරේ මැතිතුමාත් මා අසල සිටියා. මේ ගැන ඔවුන් සාක්ෂි දරනු ඇත. එමෙන්ම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මැතිතුමා වහාම මා එම ස්ථානයෙන් පිටතට රැගෙන යනු ලැබුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරුන්ට පහර දුන් ප්‍රථම අවස්ථාව නොවන අතර, මෙයට කලින් කිහිප වතාවක්ම රජයේ මන්ත්‍රීවරුන් විසින් මේ ආකාරයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහර දීම් සිදු කරන ලදී.

පාර්ලිමේන්තුවේ විනය රැක ගැනීම සහ මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කර දීම ඔබතුමා සතු අයිතියක් යැයි සිතන අතර, මේ සඳහා මැදිහත්ව අදාළ මන්ත්‍රීවරුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ඇතැයි හුදෙක්ම බලාපොරොත්තු වෙමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද "ඩේලිමිරර්" පත්‍රයේ මෙසේ සඳහන් වෙනවා:

" '…Mr. Bandara made some remarks against me. Then, I was furious,' he said. He admitted having assaulted Mr. Bandara."

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග ප්‍රකාර අවසර තිබෙන්නේ ඔබතුමා දෙන ලද ලිපිය කියවීමට පමණයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි. අද පුවත් පතේ ඒ සිද්ධිය සපථ කර තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලිපිය කියවා අවසානයි. ඒ පිළිබඳව ගරු කථානායකතුමා වෙත වාර්තාකොට අවශ්‍ය කටයුතු කරන බව ප්‍රකාශ කර සිටිමි.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව මට පැහැදිලි කිරීමක්,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, මෙය වරප්‍රසාද ප්‍රශ්නයක් බැවින් ඒ පිළිබඳව සොයා බැලීමට යොමු කර තිබෙනවා. එවැනි අවස්ථාවක නම සඳහන් වූ පමණින් පැහැදිලි කිරීමක් කිරීමට අවසර ලැබෙන්නේ නැහැ.

ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විසින් මතු කිරීමට ඉල්ලා සිටින ලද වරප්‍රසාද ප්‍රශ්නය, වරප්‍රසාද ප්‍රශ්න ගණයට නොවැටෙන බැවින් එය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොමැත. [බාධා කිරීම්] That is because according to the letter submitted by you, you are challenging the Chair. Therefore it is -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
May I explain, Sir?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You are allowed to meet the Hon. Speaker and explain matters but you cannot raise it here.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I want to tell you what I am trying to address. It is a right of the Opposition.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
This matter will also be submitted by me.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
We are meeting at 11.00 a.m.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes. So, we can take this up at 11.00 o'clock and according to the Standing Orders, you are not in a position to raise it in the House.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා මහතා]

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු එම්.බී. ෆාරුක් මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රකාශයක් කරනවාය කියා මම ඔබතුමාටත්, ආණ්ඩුවටත් දැනුම් දුන්නා. මොකද, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇහුවා, "විරුද්ධ පක්ෂයේ නායකත්වය වෙනස් වනවාද?" කියලා. මම එතුමාට කිව්වා, "වෙනස් වන්නේ නැහැ. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ." කියලා. ඒත් අවාසනාවකට විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ වාහනය නම් කැඩිලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ අතරේදී මේ ගරු සභාව තුළින් එක්සත් ජාතික පක්ෂයේ සියලුම දෙනාගෙනුත්, රටිනුත් මා සමාව ඉල්ලනවා, ඊයේ මට සිරිකොත මන්දිරය ආරක්ෂා කරන්න බැරි වීම ගැන. ඒ සිද්ධිය ගැන අපි පොලීසියට කියලා තිබෙනවා. පොලීසියෙන් දැනටමත් ක්‍රියා කර ගෙන යනවා. මම ආණ්ඩුවෙන් ඉල්ලන්න කැමැතියි, මෙකට කණ්ඩායමක් දමලා අපක්ෂපාතීව, බලපෑම් නැතිව මේ විභාගය කරන්නය කියලා.

ඊට අමතරව අද තව පැමිණිල්ලක් දමනවා, එතැනට සම්බන්ධ වුණු අයට අමතරව පිටින් සම්බන්ධ වුණු සංවිධානයක් පිළිබඳව. එනම්, මහාරාජා සංවිධානයෙන් මේක උසි ගන්නවලා මේකට සම්බන්ධ වෙලා මිනිස්සු ගෙනෙන්න ක්‍රියා කළා කියලා. ඇයි, සජීවීව ප්‍රකාශයක් දෙන්නේ සිරිකොත ඉස්සරහා? ඒක උවමනා නැහැ. "Breaking News" දෙන්න පුළුවන්, ඕනෑ අවස්ථාවක. එහෙනම් කරදරයක් වෙනවා කියලා ඒ අය පෙන්වන එක විතරයි මෙතැන සිදු වන්නේ. ඊට ඉස්සෙල්ලා මාස කිහිපය තුළත් කරපු ප්‍රකාශ දිහා බලනවා නම් පෙනෙන්නේ මොකක්ද? වෙනත් රටක ඕකට කියන්නේ hate campaign කියලායි. කොහොම හරි මහාරාජා සංවිධානයත් මේකට සම්බන්ධ වෙලා තිබෙනවා කියලා අපට පෙනී ගොස් තිබෙනවා. ඒ ගැනත් අපි පොලීසියට දැනුම් දෙනවා. අපි මාධ්‍ය නිදහස ගරු කළාට මාධ්‍යයකට එතැනට එන්න බැහැ. මා හිතන්නේ නැහැ, දේශපාලන පක්ෂවල නායකයින් වෙනස් කරන්න මාධ්‍යවලට පුළුවන් කියලා. ඒක අපේ වැඩක්. අපි අපේ පක්ෂ ඇතුළේ ඉඳ ගෙන අපේ වැඩ කටයුතු කරන්නම්. ගහ ගන්නම්, ඕනෑ එකක් කරන්නම්. ඒ වාගේම මෙතැනට සම්බන්ධ වුණු කෙනකු යම් කිසි චෝදනාවක් කරලා තිබෙනවා අපි දැක්කා. අපේ පක්ෂයේ ශිරාල් ලක්තිලක මැතිතුමාගේ සාමාජිකත්වය දැනට අත් හිටුවා තිබෙනවා. මා කලකට ඉස්සෙල්ලා ජර්මන් තානාපතිතුමාට කිව්වා, මෙයාට සල්ලි දෙන එක කරන්න එපාය කියලා; එක එක සංවිධානවලින්, NGOවලින් සල්ලි එනවා කියලා. ඒ නිසා විදේශ මුදල් මේ එක එක අයට ලැබුණාද කියන එකත් ආණ්ඩුවෙන් විභාග කරලා බලන්නය කියලා මා ඉල්ලීමක් කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I am raising this point of Order based on the explanation given by the Hon. Leader of the Opposition. A car belonging to Parliament has also been damaged at Sirikotha. Who travelled in that vehicle? The number of the vehicle has also been obtained. Sir, it is the property of Parliament. Therefore, you have to inquire into this. Take the vehicle back, find out and tell us who used that vehicle to travel to Sirikotha? කාර් එකේ හුළං ගිහිල්ලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That will be referred to the Hon. Speaker.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
I agree with the Hon. Member. It should be inquired into. But, do not take it back. Then, I will not have a car. -[*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
There had been a lady in that car. Who was that lady? Why did she use a car belonging to Parliament to go to Sirikotha yesterday? These are all serious questions. Sir, that is the property of Parliament. You must inquire and take the vehicle back immediately.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That will be brought to the notice of the Hon. Speaker.

## විසර්ජන පනත් කෙටුම්පත, 2012
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
## APPROPRIATION BILL, 2012

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: දෙසැම්බර් 19]
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி : டிசம்பர் 19]
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]
*Considered further in Committee-* [*Progress: 19th December*]
[MR. DEPUTY SPEAKER *in the Chair.*]

### 3 වන ශීර්ෂය.- විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 253,604,000

### தலைப்பு 3.- விசேட செயற்பாடுகளுக்கான பணியகம் (சிரேட்ட அமைச்சர்கள்)

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 253,604,000

HEAD 3.- SECRETARIAT FOR SPECIAL FUNCTIONS (SENIOR MINISTERS)

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 253,604,000

### 108 වන ශීර්ෂය.- තැපැල් සේවා අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 77,980,000

### தலைப்பு 108.- தபால் சேவைகள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 77,980,000

HEAD 108. - MINISTER OF POSTAL SERVICES

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 77,980,000

### 143 වන ශීර්ෂය.- පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -පුනරාවර්තන වියදම,
රු.322 ,000,000

### தலைப்பு 143. - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 322,000,000

HEAD 143. - MINISTER OF PARLIAMENTARY AFFAIRS

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 322,000,000

### 184 වන ශීර්ෂය.- පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 51,000,000

### தலைப்பு 184.- தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 51,000,000

HEAD 184. - MINISTER OF PRIVATE TRANSPORT SERVICES

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 51,000,000

### 183 වන ශීර්ෂය.- මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 49,000,000

### தலைப்பு 183.- மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 49,000,000

HEAD 183. - MINISTER OF PUBLIC RELATIONS AND PUBLIC AFFAIRS

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 49,000,000

### 106 වන ශීර්ෂය.- ආපදා කළමනාකරණ අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 100,750,000

### தலைப்பு 106.- அனர்த்த முகாமைத்துவ அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 100,750,000

HEAD 106. - MINISTER OF DISASTER MANAGEMENT

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 100,750,000

### 176 වන ශීර්ෂය.- සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 86,715,000

### தலைப்பு 176.- சிவில் விமான சேவைகள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 86,715,000

HEAD 176. - MINISTER OF CIVIL AVIATION

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 86,715,000

### 181 වන ශීර්ෂය.- ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 37,860,000

### தலைப்பு 181.- வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 37,860,000

HEAD 181. - MINISTER OF PRODUCTIVITY PROMOTION

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 37,860,000

### 173 වන ශීර්ෂය.- රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 86,050,000

**தலைப்பு 173.- அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 86,050,000

HEAD 173. - MINISTER OF PUBLIC MANAGEMENT REFORMS

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 86,050,000

**124 වන ශීර්ෂය.- සමාජ සේවා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 158,406,000

**தலைப்பு 124.- சமூக சேவைகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.-செயல்முறைச் செயற்பாடுகள்-மீண்டுவருஞ் செலவு ரூபா 158,406,000

HEAD 124. - MINISTER OF SOCIAL SERVICES

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 158,406,000

**175 වන ශීර්ෂය.- රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා**

01වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 106,515,000

**தலைப்பு 175.- அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 106,515,000

HEAD 175. - MINISTER OF STATE RESOURCES AND ENTERPRISE DEVELOPMENT

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 106,515,000

**133 වන ශීර්ෂය.- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන - මෙහෙයුම් වැඩ සටහන - පුනරාවර්තන වියදම, රු. 165,995,000

**தலைப்பு 133.- தொழினுட்ப, ஆராய்ச்சி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 165,995,000

HEAD 133. - MINISTER OF TECHNOLOGY AND RESEARCH

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 165,995,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

අද දින පෙර වරු 11.00ට පැවැත් වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම පස්වරු 2.00ට පැවැත් වෙන බවත්, තේරීම් කාරක සභාවේ රැස්වීම එකී රැස්වීමෙන් අනතුරුව පැවැත් වීමට තීරණය කොට ඇති බවත් ගරු සභාවට දන්වා සිටිමි.

ශීර්ෂ අංක 3, 108 සහ 308, 143, 184, 183, 106 සහ 304, 176, 181 සහ 328, 173, 124 සහ 216, 175, 133 සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා සහ අපර භාග 1.00 සිට අපර භාග 6.00 දක්වා.

ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

[පූ. භා. 10.08]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු සභාපතිතුමනි, "2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 3, 108 සහ 308, 143, 184, 183, 106 සහ 304, 176, 181 සහ 328, 173, 124 සහ 216, 175, 133 වැය ශීර්ෂවලින් එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතු යැයි මම යෝජනා කරමි."

ගරු සභාපතිතුමනි, අප අද සාකච්ඡා කරන්නේ මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ නව සංකල්පයක් -අලුත් සංකල්පයක්- තුළින් මේ සභාවේ කටයුතු වඩාත් ප්‍රායෝගිකව ඒ වාගේම වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළක් ගැනයි.

මම හිතනවා, මා මේ කාරණය ගැන කිව්වාට වරදක් නැහැයි කියා. ඇතැම් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් විශේෂ කාරක සභාවකට ඉදිරිපත් කරලා ඒ තුළින් සාකච්ඡා කරලා ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ගෙනැත් සම්මත කරන්නය කියලා අපේ නායකතුමා තමයි යෝජනා කළේ. ඇත්ත වශයෙන්ම මම ඒ යෝජනාවට ස්තුතිවන්ත වෙනවා. කථානායකතුමා, පාර්ලිමේන්තුවේ සභානායකතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු අපි සියලු දෙනා රැස් වෙලා අමාත්‍යාංශ 21ක කාර්ය භාරය සහ ඒවායේ වැය ශීර්ෂයන් එම කාරක සභාවේදී සාකච්ඡා කරන්නට යෙදුණා. මම දැක්කා, එම කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළ වෙලාවේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඒ පිළිබඳව සෑහෙන විස්තරයක් කළා. මමත් ඒකට වචන කිහිපයක් එකතු කරන්නට කැමැතියි.

මම මෙන්ම මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම මැති-ඇමතිවරුන් මේ අදහස දරනු ඇතැයි මම විශ්වාස කරනවා. මේ දක්වා පැවති පුරුද්ද වුණේ එක් එක් අමාත්‍යාංශයක වැය ශීර්ෂ වෙන් වෙන් වශයෙන් විවාද කොට වෙන් වෙන් වශයෙන් ඡන්ද විමසීම පැවැත්වීමයි. එහෙම තමයි අපි කලින් සම්ප්‍රදායානුකූලව කළේ. නමුත් 2008 මේ වාගේ විශේෂ කාරක සභාවක් පවත්වලා අමාත්‍යාංශ කිහිපයක් ගැන පමණක් සාකච්ඡා කළා. මේ පුරුද්ද අවශ්‍ය මෙන්ම හොඳ දෙයක් වුණත් එහි කිසියම් අඩු පාඩු කිහිපයක් දක්නට ලැබෙනවා. ඒ කියන්නේ මේ පාර්ලිමේන්තුවට අමාත්‍යාංශ ගෙනල්ලා වැය ශීර්ෂයන් සාකච්ඡා කිරීමේ අඩු පාඩු කිහිපයක් තිබෙනවා. මෙහිදී මුලින්ම දක්නට ලැබෙන අඩු පාඩුවක් වන්නේ මන්ත්‍රීවරුන් අදාළ විෂයන්ගෙන් බැහැරව මේ පාර්ලිමේන්තුවේ කරුණු දැක්වීමයි. කුඩා ප්‍රදේශයකට පමණක් සීමා වුණු ඇතැම් සිද්ධීන් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට මන්ත්‍රීවරුන් පෙළඹෙනවා. පුළුල් ප්‍රශ්න සහ ප්‍රතිපත්ති මෙන්ම ආයතනවල කාර්ය සාධනය පිළිබඳව අදහස් දක්වනවා වෙනුවට පුද්ගලයන්ගේ චරිතය පිළිබඳ විවේචන ඉදිරිපත් කරමින් කාලය ගත කළ බව අපි හොඳින් දන්නා කරුණක්.

ඊ ළඟට දක්නට ලැබෙන දුර්වලතාවක් වන්නේ ඇතැම් අමාත්‍යාංශ පිළිබඳව මන්ත්‍රීවරුන් වැඩි සැලකිල්ලක් නොදැක්වීමයි. පටු කාර්ය භාරයක් සහිත කුඩා අමාත්‍යාංශ

නොවැදගත් ඒවා වශයෙන් සැලකීමේ පුරුද්දක් දක්නට ලැබෙනවා. මේ අනුව ඒවායේ කාර්ය සාධනය නිසි ඇගැයීමකට ලක් නොවීමට ඉඩ තිබෙනවා. නම් වශයෙන් ඒවා මොනවා දැයි කියා ප්‍රකාශ කිරීමට මා සූදානම් නැති වුණත් මේ අප්‍රසන්න තත්ත්වය මෙවර අය වැය විවාදයේදීත් දක්නට ලැබුණා. දැනට සාකච්ඡාවට ලක් වී තිබෙන අමාත්‍යාංශ 21 පිළිබඳව පත් කරන ලද විශේෂ කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් මමත් ඊට සහභාගි වුණා. මේ කටයුත්ත වඩාත් සතුටුදායක මෙන්ම ඵලදායක කාර්යයක් වූ බව මගේ හැඟීමයි. අදාළ විශේෂ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් කටයුතු කළ මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම මැති ඇමතිවරුන් මගේ අදහස අනුමත කරනු ඇතැයි මම තරයේ විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, ඒ කිව්ව දේ එදා ගරු සභානායකතුමා මේ වාර්තාව ඉදිරිපත් කරද්දීත් සඳහන් කළා.

විශේෂ කාරක සභාවේ වාර්තාව මගේ මේ අදහස ප්‍රතිරාවය කරනු දක්නට ලැබීම මට විශාල සතුටක්. ගරු සභාපතිතුමනි, කාරක සභාවේ වාර්තාවේ  සඳහන් වෙනවා, "අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට කලින් වාර්ෂික ඇස්තමේන්තු මේ අයුරින් පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් ඉදිරියේ සාකච්ඡාවට ලක්වීම සතුටුදායක මෙන්ම ඵලදායක බැව් සාධනය වී ඇත. කුමක් නිසාද යත් කාරක සභා රැස්වීම්වලදී සුවිශේෂ කරුණු ගණනාවක් පැහැදිලි කොට ඊට විසඳුම් ඉදිරිපත් කරනු ලැබ ඇති බැවිනි." කියලා.

මේක තමයි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වාර්තාවේ සඳහන් වන්නේ. විශේෂ කාරක සභාවේ රැස්වීම් හුදෙක් කථා පවත්වනු ලැබීමට පමණක් සීමා වූයේ නැහැ. අදාළ අමාත්‍යාංශවල නිලධාරින් මේ කාරක සභා රැස්වීම්වලට සහභාගි වුණා. ඒ අනුව පැමිණ සිටි නිලධාරින්ගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව අපට ලැබුණා. මන්ත්‍රීවරු හැටියට නිලධාරින්ගෙන් ප්‍රශ්න කරන්න අපට අවස්ථාව ලැබුණා.

අපගේ දැඩි සැලකිල්ලට ලක් වූ කරුණු ගණනාවකට වැදගත් ප්‍රතිචාර ලබා ගැනීමේ අවස්ථාව උදා වුණා කියන එක මා සඳහන් කරන්න ඕනෑ. ඊට වැඩිමනත් වශයෙන් යම් කිසි කරුණක් සම්බන්ධයෙන් ගත යුතු ප්‍රතිකර්ම සම්බන්ධයෙන් එකඟත්වයට පැමිණීමේ අවස්ථාවක් අපට ලැබුණා. මේ ව්‍යායාමයේදී දක්නට ලැබුණු වඩාත් කැපී පෙනුණු වාසියක් වුණේ මෙකී සාකච්ඡා ඉතාමත් සුහද වාතාවරණයක් තුළ පවත්වනු ලැබීමයි. එහිදී අපට ස්ථාවර නියෝගවල විවාද රීති, කථා නොකර සිටින මන්ත්‍රීන් විසින් පිළිපැදිය යුතු රීති ආදිය බලපෑවේ නැහැ. අපට කැමැති විධියකට නිලධාරින්ගෙන් ප්‍රශ්න කරලා අපේ සැක දුරු කර ගන්න අවස්ථාවක් ලැබුණා. ගරු සභාපතිතුමනි, මෙහිදී සැලකිල්ලට භාජනය කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුගමනය කරන රටවල් ගණනාවක් විසින් අනුගමනය කරමින් තිබුණු පුරුද්දක් වශයෙන් මේ පුරුද්ද හඳුන්වා දෙන්න පුළුවන්. ඇතැම් රටවල් වසර ගණනාවක් තිස්සේ මේ ආකාරයෙන් කටයුතු කර තිබෙනවා. පාර්ලිමේන්තු ක්‍රමයේ මව් පාර්ලිමේන්තුව වන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවත්, කැනඩාවේ සහ ඕස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තුවත් මේ ක්‍රමය අනුගමනය කර තිබෙනවා. ඇමෙරිකානු කොංග්‍රස් සභාව මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි හොඳම උදාහරණයක් බව මම මේ ගරු සභාවට සඳහන් කරන්න කැමැතියි.

ඇමෙරිකානු කොංග්‍රස් සභාවේ රාජකාරි බහුතරයක් කරනු ලබන්නේ කාරක සභාවලින්. ඒ රටේ සෙනෙට් සභාවේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ විවාද බොහෝ විට සීමා වී තිබෙන්නේ රාජ්‍ය පාලනය පිළිබඳ විධිමත් කරුණු සාකච්ඡා කිරීමටයි. එදිනෙදා පරිපාලනය පිළිබඳ සාමාන්‍ය කරුණු එහිදී දිර්ඝ ලෙස සාකච්ඡාවට ලක් වන්නේ නැති බව මා මතක් කර දෙන්න කැමැතියි.

මේ ක්‍රමයේ යෝග්‍යතාව පිළිබඳ මට හොඳින් වැටහී තිබෙනවා. මේ පුරුද්ද තවදුරටත් දීර්ඝ කළ යුතු බවයි මගේ හැඟීම. මේ අවස්ථාවේදී අප විසින් අමාත්‍යාංශ 21ක් සඳහා පමණයි මේ නව ක්‍රමය හඳුන්වා දී තිබෙන්නේ. මෙහිදී අප සැලකිල්ලට ලක් කළ යුතු කරුණ වන්නේ, ආසන්න වශයෙන් අමාත්‍යාංශ 64ක වැය ශීර්ෂ දින 19ක් හෝ ඊට වඩා අඩු දින ගණනක් තුළ සාකච්ඡා කළ යුතු වීමයි. මෙවර විවාදයට වෙන් වී ඇත්තේ දින 17ක් පමණයි. මේ කාල සීමාව කිසි ලෙසකින්වත් සෑහෙන්නේ නැති බව කවුරුත් පිළිගත යුතුයි. ඒ අනුව සලකා බලන කොට මෙවර විශේෂ කාරක සභාව පත් කරනු ලැබීම ඇත්ත වශයෙන්ම ඉතාම උචිත ක්‍රියා මාර්ගයක් බව මා සඳහන් කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ 21ක් පිළිබඳ සලකා බැලීමට පත් කරන ලද විශේෂ කාරක සභාවේ වාර්තාවෙහි මගේ මේ අදහස සනාථ කරමින් එහි සඳහන් කර තිබෙන තවත් කොටසක් මේ අවස්ථාවේදී කියවන්න මම අවසර පතනවා:

"වැඩිදියුණු කරන ලද මෙකී ක්‍රියා පටිපාටිය ඉදිරියේදී පවා තවදුරටත් පවත්වා ගෙන යා යුතු බව පාර්ලිමේන්තුවට නිර්දේශ කිරීමට මෙම කාරක සභාව අදහස් කරයි. ලබන වසරේ සිට අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට කලින් සියලුම වැය ශීර්ෂවල ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් විසින් සැලකිල්ලට ලක් කරනු ලබන්නේ නම් වඩාත් ඵලදායක විය හැකි බව යෝජනා කෙරේ. මෙමඟින් අදාළ කාරණා පිළිබඳව නිලධාරීන්ගෙන් කරුණු පැහැදිලි කරවා ගැනීමේ අවස්ථාව සැලසෙන සාකච්ඡා මණ්ඩපයක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලැබෙනු ඇත. අය වැය කාරක සභා අවස්ථා විවාදයේදී මෙවැනි පහසුකමක් ගරු මන්ත්‍රීවරුන්ට නොලැබෙයි. ඊට අතිරේක වශයෙන්, පවත්නා වර්ෂය තුළ සාක්ෂාත් කර ගනු ලැබූ ප්‍රගතියත්, ඉදිරි වර්ෂයේ සංවර්ධන සැලසුමත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කිරීමටත් මේ මඟින් අවස්ථාව උදා වෙයි."

මේ සම්බන්ධයෙන් තවත් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. මෙවැනි විශේෂ කාරක සභාවක් ක්‍රියාත්මක කළ යුත්තේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් සමඟයි කියන එක මා සඳහන් කරන්න කැමැතියි. විශේෂ කාරක සභාවේ සාමාජිකත්වය දැරූ ගරු මන්ත්‍රීතුමන්ලා මගේ අදහස අනුමත කරනු ඇතැයි මම මේ අවස්ථාවේදී අපේක්ෂා කරනවා. මගේ මේ අදහස් දැක්වීම නිමා කිරීමට කලින් ඊනියා "ජ්‍යෙෂ්ඨ අමාත්‍ය" සංකල්පය පිළිබඳව කරුණු කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. ඔවුන්ගේ කාර්ය භාරය විය යුත්තේ කුමක්ද? ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා අත් දැකීම් සැලකිල්ලට ලක් කරන විට ඔවුන්ගේ නිපුණතාව නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දිය යුතු වෙනවායි කියා මා අදහස් කරනවා. දැනට දක්නට ලැබෙන පරිදි ඔවුන්ට ලැබී ඇත්තේ කුඩම්මාගේ සැලකිලි යැයි අපට සිතන්නට පුළුවන්. එම ඇමතිවරුන්ගේ ලේකම් කාර්යාලය මීට වඩා පුළුල් කළ යුතු වෙනවා. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරුන් වශයෙන් ඔවුන්ගේ සේවය මීට වඩා පුළුල් පරාසයකට ලක් කළ යුතු බව මා දන්වා සිටින්න කැමැතියි.

විශේෂ කාරක සභාවේ විෂය පථයට ලක් කෙරුණු තවත් කරුණු ගණනාවක් සම්බන්ධයෙන් කාරක සභාව නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. එම සාකච්ඡා තුළදී ගනු ලැබූ මෙම සියලු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට රජය විශේෂ අවධානය ලක් කළ යුතු බවයි මගේ හැඟීම. එම නිර්දේශයන් ක්‍රියාත්මක වේයැයි කියා මම කල්පනා කරනවා, අදහස් කරනවා.

මේ සම්බන්ධයෙන් තවත් කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඉදිරි අය වැය විවාදවලදී මේ ක්‍රමය තව දුරටත් පවත්වාගෙන යෑමේ අරමුණින් පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කුඩා කාරක සභාවක් පත් කළ යුතු බව යෝජනා කරනවා. මේ ක්‍රමය පිළිබඳව පුළුල්

[ගරු ජෝන් අමරතුංග මහතා]

සාකච්ඡාවක් කිරීමටද එමඟින් අවස්ථාව ලැබෙනු ඇතැයි සිතනවා. ඊට වැඩිමනත් වශයෙන් මේ ක්‍රියාවලියට තවත් අමාත්‍යාංශ ගණනාවක් ඇතුළත් කළ යුතු බවත් මම කල්පනා කරනවා. අමාත්‍යාංශ වෙනස් කාණ්ඩ කිහිපයකට බෙදා විශේෂ කාරක සභා වැඩි ගණනක් පත් කිරීමත් මෙහිදී සිදු කළ හැකි තවත් විකල්පයක් බව මා සඳහන් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මෙම විශේෂ කාරක සභාවේ කටයුතු මෙහෙයවන ලද පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ ගරු සභාවේ සැලකිල්ලට ලක් කිරීම පිණිස සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට එම නිලධාරින් සමත් වී තිබෙන බව මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ඊ ළඟට මට තව එක ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. ඒක මෙම අමාත්‍යාංශ 21ට අදාළ වූ ප්‍රශ්නයක්. ඒ තමයි පසු ගිය දවසේ ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් කරන ලද මහා අපරාධය. මොකක්ද ඒ? මොරටුවේ ප්‍රේම් ළමා නිවාසයේ දරුවන් විකුණන ජාවාරමක් සිදු වන බවට සහ අපචාර සිදු වන බවට පැමිණිල්ලක් ලැබුණා යයි කියමින් ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් එම ළමා නිවාසය වටලා මාධ්‍ය මඟින් මහත් සන්දර්ශනයක් කරනු ලැබූ ආකාරය පසු ගියදා අපි සියලු දෙනාම ප්‍රවෘත්ති පත්‍රවල දැක්කා.

ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. මේ ළමා නිවාසය පාලනය කරන්නේ කන්‍යා සොහොයුරියක් විසිනුයි. ඒ කියන්නේ, ඒ කන්‍යා සොහොයුරිය ඇතුළු කණ්ඩායම තෙරේසා මව්තුමියගේ කණ්ඩායමකුයි. ඒ අය ඒ කාර්ය භාරය කරන්නේ නොමිලයේයි. මේ වාගේ නිවාස ඇත්තේ ශ්‍රී ලංකාවටම දෙකයි. රජය යටතේ පාලනය වන එක නිවාසයක්වත් නැහැ. මෙතැනදී අසාධාරණ ලෙස ළමයි විකුණනවාය කියලා ඒ වාගේම අපචාරයේ යොදවනවාය කියලා දුරකථන පණිවුඩයක් ලැබුණු පමණට, ඒ පිළිබඳව කරුණු සොයන්නේ නැතුව, එය භාරව ඉන්න මේරි එළිසැබෙත් මව්තුමිය අත් අඩංගුවට අරගෙන ඇයව රිමාන්ඩ් භාරයේ තැබුවා. මේ නඩුව විභාග කළ විනිසුරුතුමිය නියෝග කළ ආකාරය වෙබ් අඩවියක දාලා තිබුණේ මෙන්න මේ විධියටයි:

"අද මේ පිළිබඳව නඩුවේ පාලිකා මේරි එළිසැබෙත් නිදහස් කරන ලෙස නියෝග කළ කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ඉවොන් ප්‍රනාන්දු මහත්මිය ළමා අපචාර පරීක්ෂණ පරෙස්සමෙන් හා විධිමත්ව කරන ලෙස ජාතික ළමාරක්ෂක අධිකාරියට අවවාද කළා. ළමයින් විකිණීම හා ළමයින් අපචාරයට යොදා ගත්තැයි පාලිකාවට එරෙහි චෝදනා දෙකෙන්ම ඇය නිදොස් කොට නිදහස් කරන බවද කියා තිබුණා."

ඇත්ත වශයෙන්ම මේ යථාර්ථය තේරුම් ගත්ත, මෙහි නියම තත්ත්වය තේරුම් ගත්ත රහස් පොලීසියත් ඒ වාගේම අනෙකුත් විභාග කරපු නිලධාරිනුත් Attorney-General මාර්ගයෙන් උසාවියට වාර්තාවක් ඉදිරිපත් කරලා මේ මව්තුමිය නිදහස් කර ගත්තා. මෙතැන තිබෙන ප්‍රශ්නය මෙකයි. පත්තරවල දාලා විශාල ආන්දෝලනයක් ඇති කරලා, ඒ ආයතනයට මහ විශාල දෝෂාරෝපණයක් කරලා ඒ අය කරන වැඩ පිළිවෙළ අපධෛර්ය කරන ක්‍රියා මාර්ගයක් තමයි සිද්ධ වුණේ. ගැබ් ගත්ත සිය ගණන් මව්වරු ඉන්නවා. ඒ අය කසාද බැඳලා නැති වුණොත් යන්න තැනක් නැති හින්දා තමයි, මේ මඩමට ඇවිල්ලා ඔවුන්ගේ ආරක්ෂාව ඔවුන් ලබා ගත්තේ. මෙතැනදී නියම ලෙස කරුණු සොයා බලන්නේ නැතුව, හරියට ඒ පිළිබඳව අධ්‍යයනයක් නොකර ඒ මව්තුමිය අත් අඩංගුවට ගත්ත ළමා අධිකාරියේ නිලධාරින්ට විරුද්ධව මොකක්ද රජය ගන්න පියවර කියන එකයි අපට අහන්න තිබෙන ප්‍රශ්නය වන්නේ. අපි කනගාටු වෙනවා, ඇයි මෙහෙම දෙයක් කළේ කියන එක ගැන. මොකද මේ මුදලට කරන රාජකාරියක්, සේවයක් නොවෙයි. ඒක කැපවීමකින් කරන සමාජය සේවයක්. තෙරේසා මව්තුමිය කියන්නේ ලෝකයේ සාම තෑග්ගක් -තිළිණයක්- ලබා ගත්තු මව්තුමියක්. එතුමියගේ කණ්ඩායමක් තමයි මෙතැන රාජකාරි කරන්නේ. මේක අපි ඒ සභාවෙත් සඳහන් කළා. නමුත් මම කල්පනා කළා, සමාජ සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරන අවස්ථාවේ මේ පිළිබඳව කථා කරන්න. ඒ පිළිබඳව කොමිටි වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා.

ඒ නිසා නැවත වරක් මෙවැනි දේවල් නොවෙන්න කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. සමාජ සේවා අමාත්‍යතුමා අද මේ සභාවේ නැහැ. එතුමාගේ අමාත්‍යාංශයත් ඇතුළුව අමාත්‍යාංශ 21ක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ එතුමා මේ සභාවේ ඉන්න ඕනෑ. මින් ඉදිරියට එවැනි අසාධාරණ කටයුතු වෙන්න ඉඩ දෙන්නේ නැහැ කියා එතුමා අද මේ සභාවේ ප්‍රතිඥාවක් දිය යුතුව තිබුණා. ස්වේච්ඡාවෙන් සමාජ සේවා කරන මෙවැනි ආයතනවල ගරුත්වය, ඒවායේ කටයුතු කරන ආගමික සොහොයුරියන්ගේ ගරුත්වය ආරක්ෂා වන විධියට කටයුතු කරන හැටියට ඉල්ලා සිටින අතර, මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා.

Order, please! The Hon. Alhaj A.H.M. Azwer will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[පූ. භා. 10.25]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමාත්, විපක්ෂයේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් නව සංකල්පය පිළිබඳව ඉදිරිපත් කළ අදහස් මා මුළුමනින්ම අනුමත කරනවා. ඇත්ත වශයෙන්ම මේ අය වැය විවාදය පැවැත්වෙන අවස්ථාවේ මා කියන්න ඕනෑ, දැන් මේ අය වැය විවාදයන් ක්‍රමානුකූලව පිරිහෙමින් පවතින තත්ත්වයක් තිබෙනවාය කියන එක. විශේෂයෙන්ම දෙවන වර කියවීමේදී ප්‍රතිපත්ති පිළිබඳව අපේ විවාදය සීමා කරනවා වෙනුවට ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කිව්වාක් මෙන් එතැනදීත් පෞද්ගලික චරිත ඝාතන, මඩ ගැසීම් දක්වා මේවා ව්‍යාප්ත වෙලා තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තුවට පැමිණිලා අය වැය වාද විවාදවලට සවන් දීමට දැන් තානාපති කාර්යාලවල නිලධාරින් එන්නේම නැහැ. ඉස්සර විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය කරන කොට තානාපතිවරු ඔක්කොම ඇවිල්ලා ඒ විවාදයට සවන් දෙනවා. මේ වන කොට මෙම විවාදයන්හි ගුණාත්මකභාවය කොයි තරම් පිරිහිලාද කිව්වොත් අද ඒවට සවන් දීමට කවුරුවත් නොපැමිණෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ලැබෙන අවස්ථාව නිසි පරිදි ප්‍රයෝජනයට ගන්නේත් නැහැ. කමිටු වාර්තා මට්ටමේ සාකච්ඡා වන කොටත් ඒ අදාළ දෙපාර්තමේන්තු ගැන කථා කරන්නේ නැතුව සමහර විට ප්‍රතිපත්ති ගැන කථා

කරමින් මුල් විවාදයේදී කථා කරන්න ඕනෑ දේවල්, දෙවන වතාවට කරනවා. එහෙම බලන කොට කිසිම පැහැදිලි තත්ත්වයක් නැහැ. මා හිතන්නේ ඒ තත්ත්වයන් යටතේ අලුත් සංකල්පයක් ඉදිරිපත් කළා කියලායි. මා දුටුවා, ගිය වතාවේ ඉතාමත්ම ඵලදායී ලෙස සාකච්ඡාව පැවැත්වුණු බව.

මා මුලින්ම ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියපු අදහස්වලට එකඟ වනවා. අමාත්‍යාංශවල ලේකම්වරුන්, අනෙකුත් නිලධාරින් ගෙන්වලා ඒ ඒ දෙපාර්තමේන්තුවල තිබුණු නොයෙකුත් වැරැදි ගැන ඒ අයගෙන් ප්‍රශ්න කරන්නට මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් සලසා දුන්නා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කණ්ඩායමක් එයට සහභාගි වුණා. මා හිතන හැටියට අපේ ආණ්ඩු පක්ෂයට වඩා විපක්ෂයේ මන්ත්‍රීවරුන් එම කාරක සභාවට සහභාගි වුණා. එතුමන්ලා එම නිලධාරින්ගෙන් ප්‍රශ්න කරලා සෑහීමකට පත් වුණා. විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු පිළිබඳව එතුමන්ලා දැනුවත්ව සිටියේ නැහැ. අපේ නිලධාරින්ගෙන් ප්‍රශ්න කරලා, අපි කරපු වැඩ කටයුතු පිළිබඳව එතුමන්ලා සෑහීමකට පත් වුණා. ඒ නිසා ඒ සංකල්පය තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍යයි කියලා මමත් කල්පනා කරනවා. මම හිතන්නේ අමාත්‍යාංශ ඔක්කොම ආවරණය වන ආකාරයට ඒ කටයුත්ත කරලා, ඉන් පසුව වුවමනා නම් අපි සතියක් විතර වෙන වෙනම සාකච්ඡා කළාට කමක් නැහැ කියලායි. මොකද, ඊළඟට කෙළින්ම නිලධාරින්ගෙන් ප්‍රශ්න කිරීමට මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලැබෙනවා. එම සාකච්ඡා මීට වඩා ඵලදායී වනවා. ආණ්ඩුවටත් ඵලදායී වනවා; රටටත් ඵලදායී වනවා. එම නිසා මා මුළුමනින්ම එතුමා කියපු අදහස්වලට එකඟතාව පළ කරනවා.

දෙවැනි කාරණාව සම්බන්ධයෙනුත් මට ලැබී තිබෙන සීමිත කාලය තුළ අදහස් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම මට පැවරී තිබෙන කාර්ය භාරය අනුව මානව සම්පත් සහ රැකියා පිළිබඳ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ කාර්යය ඇමති මණ්ඩලය මට පවරා තිබෙනවා. පසු ගිය හය මාසයක කාලය තුළ අපි විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. ඒ වෙනුවෙන් මෙහෙයුම් කමිටුවක් පත් කරලා, ඒවාට අනු කමිටු 10ක් පත් කළා. විශේෂයෙන්ම අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කම්කරු, විදේශ රැකියා, ඵලදායිතා ප්‍රවර්ධන, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ මේ ආදී අමාත්‍යාංශ 10ක විතර වැඩ ආවරණය වන පරිදි අපි කටයුතු කර තිබෙනවා. මොකද, මේ මානව සම්පත් සම්පාදනය කිරීම අද කේන්ද්‍රීය ප්‍රශ්නයක් බවට පත් වෙමින් තිබෙනවා.

අපේ රටේ ස්වාභාවික සම්පත් සීමිතයි. අපට තිබෙන්නේ පුංචි ආර්ථිකයක්. ගෝලීයකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන අවස්ථාවක් එන කොට අපට තිබෙන එකම සම්පත මානව සම්පතයි. මෙය හරියට සංවර්ධනය කිරීමට අපි උත්සාහ නොගත්තොත් ඉදිරි කාලයේ දී අපට ලෝක ආර්ථිකයේ තැනක් ලැබෙන්නේ නැහැ; අපි පසුපසට යනවා. ඒ නිසා මෙය සැලසුම් සහගතව කළ යුතු කාරණාවක් වනවා. භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය මේ පිළිබඳව මීට වඩා වැඩි අවධානයක් යොමු කරයි කියලා මා කල්පනා කරනවා. මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය අවස්ථාවේ දී මා ඒ ගැන කථා කිරීමට බලාපොරොත්තු වනවා. මොකද, මෙය මූලික වශයෙන් රජයේ සැලැස්මට අන්තර්ගත කළ යුතු ප්‍රධාන කාරණාවක්.

අද අපේ රටේ රැකියාවල යෙදෙන අය සමස්තයක් වශයෙන් ගත්තාම සියයට 62ක් සිටින්නේ අවිධිමත් ආර්ථිකයක් -informal economy එකක්- තුළයි. පෞද්ගලික අංශය විධිමත්ව තිබෙනවා, රාජ්‍ය අංශය විධිමත්ව තිබෙනවා. ඒ දෙකේම තමයි ඉතිරි සියයට තිස් ගණන තිබෙන්නේ. ඒ දෙක හැරුණාම සියයට 62ක් ක්‍රය ශක්තිය අතින්, මිලදී ගැනීමේ හැකියාව අතින් අඩු මට්ටමකයි සිටින්නේ. පොඩි සාප්පුවල වැඩ කරන අය රුපියල් 4,000ක, රුපියල් 5,000ක වැටුපකටයි වැඩ කරන්නේ. ඔවුන්ට එදිනෙදා ජීවිතය ගෙන යන්න බැහැ. මෙවර අය වැය සම්පාදනය කිරීමේදී ඒ අය කෙරෙහි යම් අවධානයක් යොමු වෙලා තිබෙනවා. අපේ රටේ ජනගහනයෙන් සියයට 62ක් තමන්ගේ ආර්ථිකය හසුරුවා ගන්නා අයයි. අය වැය පැත්තෙන් බලන කොට අපි ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ඒ සියයට 62 පිළිබඳව වැඩි සැලකිල්ලක්, වැඩි අවධානයක් යොමු විය යුතුයි.

අපට පෙනෙනවා, අද රජයේ සේවාවේ මානව සම්පත 13,00,000ක් බව. රජයේ සේවාව පිරිහීමට පත් වෙලායි තිබෙන්නේ. එම නිසා අර්බුදකාරී තත්ත්වයකුයි තිබෙන්නේ. ඉහළ සිට පහළ මට්ටම දක්වාම ගුණාත්මකභාවය පිරිහිලා තිබෙනවා. ජනතාවට ඔවුන්ගෙන් වැඩක් කර ගන්න බැහැ. ජනතාව අතර ඒ අය පිළිබඳව කලකිරීම් තත්ත්වයක් තිබෙනවා. එම නිසා රජයේ සේවය මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍යයි. එයත් මානව සම්පත් සංවර්ධනය කිරීමේ අංගයක්.

ඒ විතරක් නොවෙයි. අද අපනයන පැත්තෙන් ගත්තාම අපේ ගරු තිස්ස විතාරණ අමාත්‍යතුමා හැම දාම -නිරන්තරයෙන්ම- මේ පාර්ලිමේන්තුවේ කියන එකක් තමයි අපේ අපනයන සඳහා අතිරේක වටිනාකමක් -value addition එකක්- ගන්නේ නැත්නම් අපට අනාගතයක් නැහැයි කියන එක. තවම සියයට 1ක්, 2ක් පමණයි, value addition එකක් හැටියට තිබෙන්නේ. අපේ exports ගත්තාම තේ, පොල්, රබර් යන සියල්ලටම වැඩි වටිනාකමක් ගන්න පුළුවන්, නව තාක්ෂණය යොදා ගැනීමෙන්. මා හිතන හැටියට එයත් මේකට ඇතුළු වන එකක්.

අනික් අතට ඵලදායක පැත්තෙන් ගත්තාම හැම ක්ෂේත්‍රයකම - පෞද්ගලික අංශයේත්, රාජ්‍ය අංශයේත්, ඒ වාගේම අවිධිමත් ක්ෂේත්‍ර තුළත්- ඵලදායකත්වය අඩු මට්ටමකයි තිබෙන්නේ. ඵලදායකත්වය ඉහළ මට්ටමට ගෙනෙන්නේ නැත්නම් ඉදිරියේදී අපට මේ ආර්ථිකය ස්ථිරසාර ආර්ථිකයක් කර ගන්න පුළුවන් වන්නේ නැහැ. ඇත්ත තමයි, අපේ ආර්ථිකය සියයට 8ක වේගයෙන් යන එක. අපේ ඒක පුද්ගල ආදායම වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලෝක ආර්ථික අර්බුදයක් හමුවේ ඒ තත්ත්වයට යම්තම් මුහුණ දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. නමුත් මේ තිරසාර වර්ධනය රැක ගැනීමට කල්පනා කරනවා නම්, සැලසුමකට අනුව හැම ක්ෂේත්‍රයකටම ගැළපෙන ආකාරයේ මානව සම්පත් සංවර්ධනයක් ඇති කළ යුතුයි. මා හිතන හැටියට මානව සම්පත් වර්ධනය කිරීම තුළින් හොඳ විදේශ රැකියාවලටත්, ජාතික ආර්ථිකයටත්, ලෝක ආර්ථිකයටත් ගැළපෙන්නා වූ ශ්‍රම හමුදාවක් අප රට තුළ ඇති කර නොගත්තොත්, ඉදිරියේදී විද්‍යාව හා තාක්ෂණය වේගයෙන් වර්ධනය වන ලෝකයක අපව පස්සට තල්ලු වෙලා යනවා. ඒක තේරුම් ගෙන අපේ ප්‍රතිපත්ති සම්පාදකයන් භාණ්ඩාගාරය තුළ, විශේෂයෙන් මුදල් අමාත්‍යාංශය තුළ මේ ගැන වැඩි තැකීමක් කළ යුතුයි කියන එක ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊ ළඟට ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 30ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.32]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,මා පළමුවෙන් මතක් කරන්න සතුටුයි මීට වසර කිහිපයකට පෙර විපක්ෂ නායකතුමා සම්පූර්ණ අය වැයම මේ විධියේ විශේෂ කාරක සභාවකට යොමු කරන්න කියලා යෝජනාවක් ගෙනාව බව. රජය ඒ පිළිබඳව සහතිකත් වුණා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. නමුත් අද පක්ෂ, විපක්ෂ

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවා අය වැයේදී ඒ සියලුම අමාත්‍යාංශ මේ විධියේ විශේෂ කාරක සභාවකට යොමු කළ යුතුයි කියලා. ඒක ඉතා හොඳ ප්‍රවණතාවක්. විශේෂයෙන්ම මම මතක් කරන්න සතුටුයි ඒ සාකච්ඡා යන වෙලාවේ මම එතැන දැක්කේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු නොවෙයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියටයි කියලා. අය වැය විවාදයකදී කවදාවත් ආණ්ඩු පක්ෂයටවත්, විරුද්ධ පක්ෂයටවත් ලබා ගන්න බැරි තොරතුරු ඒ කාරක සභාව තුළ ඉඳ ගෙන ලබා ගන්න ඒ හැම කෙනෙකුටම පුළුවන්කම ලැබුණා. මම හිතන්නේ ඒක සුවිශේෂ සිද්ධියක් කියලායි. මොකද, මේ පාර්ලිමේන්තුවේ වගකීම ඒ මන්ත්‍රීතුමන්ලාට හරියට ඉෂ්ට කරන්නට එම කමිටුව වැදගත් වනවා. මම තමුන්නාන්සේලාට එක උදාහරණයක් දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහිදී ඇමතිවරු පවා අදහස් ප්‍රකාශ කළා ඒ වෙන් කරලා තිබෙන මුදල්වල අඩු පාඩු පිළිබඳව. සමහර විට ඒ අයට ඒවා පාර්ලිමේන්තුවේ කියන්න බැහැ. නමුත් අපි ප්‍රශ්න කළාම, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රශ්න කළාම ඔවුන්ට තිබෙන ප්‍රශ්න පිළිබඳව එතුමන්ලාට කියන්න සිද්ධ වුණා. මෙහිදී මම ගරු තිස්ස විතාරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා බොහොම පැහැදිලිව කියපු දෙයක් තමයි අද තාක්ෂණය සහ විද්‍යාව අපි පාවිච්චි කළ යුත්තේ කොහොමද කියන එක. ඒක ඩිව් ගුණසේකර ඇමතිතුමාත් කිව්වා. ඒකට අපිට තිබෙන හොඳම උදාහරණය තමයි ඒ අමාත්‍යාංශයට මුදල්, වෙන් වෙලා තිබෙනවා මදියි කියන එක; නැත්නම් අඩු කරලා තිබෙනවා කියන එක. හැම අවුරුද්දේම ඒක සිද්ධ වෙනවා. ඉතින් අපි අලුත් තාක්ෂණයත් එක්ක යන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවේ කාරණා කිහිපයක් කියලා තිබෙනවා. ඒකට අදාළවයි මම කියන්නේ. මේ අලුත් තාක්ෂණය ගැන අපි නොයෙක් නොයෙක් ආකාරයෙන් කථා කරනවා. මම මේ කියන කාරණය ගැන අපේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා එදා මා එක්ක විවාදයකටත් ආවා. මට ඕනෑ කළා ජා-ඇල ආසනයේ පාසල්වල සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ හදාරන දරුවන්ට ඒ ගොල්ලන්ගේ විෂයයන් පිළිබඳව හදාරන්න පුළුවන් විධියට CD එකක් හදලා දෙන්න. TV එක ගෙදර තිබෙනවා නම්, VCD player එක ගෙදර තිබෙනවා නම් අපේ CD එක නොමිලේ දෙන්න මම උත්සාහ කළා. හුඟක් ඉස්සර තාරා ද මෙල් මහත්මිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විධියට ඉන්න කොට මම මේ පිළිබඳව කථා කළා. එදා මේ පාර්ලිමේන්තුවේම කාරක සභාවේදි ජාතික අධ්‍යාපන ආයතනයට -NIE එකට- අපි නියෝග කළා ඒ CD හදන්න කියලා. මේ මුළු සභාවටම මම කියන්න කැමැතියි, මම කථා කළාම ගන්න පුළුවන් වුණේ CD දෙකයි කියලා. අංක ගණිතය සහ ඉංග්‍රීසි විතරයි. දැන් මේ අවුරුදු ගණනකට ඉස්සර වෙලා කියපු දෙයක්. දැන් මේගොල්ලන්ට කිව්වාම මොකද කියන්නේ? සල්ලි නැහැ කියනවා. ඒ නිසා අපිට මතු වෙච්ච මේ ප්‍රශ්නයේදී අපට පෙනී ගියේ අපි සියලු දෙනාම එකඟත්වයෙන් මේ ගන්නා ක්‍රියා මාර්ගවලදී මුදල් වෙන් විය යුතු විශේෂ අංශ ගැන අපේ අවධානය යොමු කරලා තිබුණේ නැහැ කියන එකයි. ඒ ගැන සහයෝගය දීම පිළිබඳව මම තිස්ස විතාරණ ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ පාර්ලිමේන්තුවේදීත් ඒ පිළිබඳව ප්‍රශ්න මතු කරලා තිබෙනවා. ඒ එක්කම මේ කාරක සභාවේ තිබිච්ච වැදගත්ම දේ තමයි අපිට නිලධාරින් එක්ක සුහදව කථා කරන්න ලැබීම ගැන. මම දන්නවා නිලධාරින් කිසි අපහසුතාවකට ලක් වුණේ නැහැ කියලා. අපි සාකච්ඡා කරන කොට ඔවුන් කිසි අපහසුතාවකට ලක් වුණේ නැහැ. නිලධාරිනුත් විවෘතව කථා කළා. එක උදාහරණයක් මම කියන්නම්. සිමෙන්ති සංස්ථාව ගැන අපි කථා කරන කොට දැන ගත්ත කාරණයක්. සිමෙන්ති සංස්ථාවේ තිබෙනවා ලයිට් concrete කණු සකස් කරන වැඩ පොළක්. ඒ ගොල්ලෝ පාඩු ලබන ආයතනයක් විධියට තමයි දුවලා තිබෙන්නේ. තවමත් ඒ තත්ත්වය තමයි යන්නේ. නමුත් ඒ ලේකම්තුමාත්, නිලධාරි මහත්වරුත් මොකක්ද කිව්වේ? "අපේ සිමෙන්තිවලින් ගහපු ලයිට් කණු ටික ලංකා විදුලිබල මණ්ඩලය ගන්නේ නැහැ, ඒක පිටින් ගන්නවා. ඉතින් කොහොමද අපි ආයතනයක් ගෙනි යන්නේ" කියලා කිව්වා. මම හිතනවා මේ වාර්තාවේ ඒක තිබෙනවා කියලා. ඉතාම හොඳ තත්ත්වයක්. ඒක කවුරුවත් දන්නේ නැහැ. ඒ තත්ත්වය අපි දන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු හරි මොකක් හරි තොරතුරක් දුන්නාම අපි ඒ අනුව කථා කරනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දන්නේත් නැහැ. ඒ අනුව මේ ආයතන ලාභ ලබන ආයතන හැටියට පරිවර්තනය කරන්නේ කොහොමද කියන එක ඒ නිලධාරි මහත්වරු අපට කිව්වා. නමුත් ඒකට ඉඩක් ලැබෙන්නේ නැහැ. ඒ වෙලාවේ ඒ කමිටුවේ සභාපති හැටියට ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා, ඔබතුමා මේකට Cabinet Paper එකක් දමන්න කියලා. මම කියන්නේ මේ කමිටුව Cabinet Paper එකක් දමන්න කියලා එක ඇමතිවරයෙක් තවත් ඇමතිවරයකුට කියන කමිටුවක් නොවෙයි කියලායි. අපි බලන්නේ අමාත්‍යාංශවල තිබෙන ගණන් හිලව් ගැනයි; සල්ලි මදිද, වියදම් කරලා තිබෙන්නේ කොහොමද කියන ඒවා ගැනයි. ඒ නිසා අපි ඒ කමිටුවේ දී තීරණය කළා, නියම ප්‍රමිතියට තිබෙනවා නම් සිමෙන්ති සංස්ථාවේ නිෂ්පාදනය කරන කොන්ක්‍රීට් කණු විදුලිබල මණ්ඩලය මිලයට ගත යුතුය කියලා. මේ විධියේ නිර්දේශයක් කරන්න ඒ කමිටුවට පුළුවන්කම -බලය- තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්ක තවත් කරුණු කිහිපයක් තිබුණා. ඒක මේ ගරු සභාවේ දී ඉදිරිපත් කරන එක වැදගත් කියලා මම හිතනවා. මේ වාර්තාවේ සඳහන් අමාත්‍යාංශ කිහිපයක් පිළිබඳව අපි බැලුවා. අමාත්‍යාංශ කිහිපයක වැඩ කටයුතුවලදී අපට ගන්න පුළුවන් උපරිම ප්‍රයෝජනය ඉතා වැදගත් වනවා. නමුත් සමහර අමාත්‍යාංශ, සමහර ආයතන පවත්වා ගෙන යන්න බැහැයි කියලා, ඒවා වසා දමන්නට යෝජනා කරනවා. මම හිතන විධියට මේ කාරණය අපේ COPE එකටත් ආපු ප්‍රශ්නයක් වන්න පුළුවන්. සියලු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා අපි ඒ ආයතන ගැන සොයලා බැලුවාම අපට යන්න පුළුවන් තැන කොතැනද, යන්න බැරි තැන කොතැනද කියලා අපට බොහොම පැහැදිලිව පෙනෙනවා. දැන් මම බැලුවේ ඒ විස්තර ටික සොයා ගන්නයි. ඒ ගැන සඳහන් පිටුවක් තිබුණා. ඒක වෙනත් තැනක වන්න ඇති. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා ළඟ ඒක තිබෙන්න පුළුවන්. ඒකෙන් නිර්දේශ කරන ආකාරයට අපට පවත්වා ගෙන යන්න බැහැයි කියන ආයතන ටිකත් ඒ අමාත්‍යාංශ ඒ පොතේ බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ නිසා අපි මෙවැනි කාරක සභාවක් ඉදිරියට ගිහිල්ලා කථා කරන කොට - ඒ annex එක මේකේ නැහැ- ඉතාමත්ම නිවැරදි තොරතුරු ලබා ගන්න අපට පුළුවන්කම ලැබෙනවා.

"2011 නොවැම්බර් 17වන දින ප්‍රතිව්‍යුහකරණ ක්‍රියා දාමයේ ප්‍රගතිය" කියන කොටසේ මේ ගැන විස්තර තිබෙනවා. මේකේ පළමු පියවර වශයෙන් තිබෙන්නේ "ලාභ නොලබන රාජ්‍ය ආයතන සම්බන්ධව කමිටු නිර්දේශය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම" කියන එකයි. මේක අපි පළමුවන වතාවට දැක්කේ එදායි. ඒ වාගේම දෙවන පියවර වශයෙන් තිබෙන්නේ,"දීර්ඝ කාලීන බදු පදනම මත රාජ්‍ය ව්‍යාපාර ආයතන ලබා දීමට කැබිනට් අනුමතිය" කියන එකයි. තුන්වන පියවර වශයෙන් තිබෙන්නේ, "සුදුසු ආයෝජකයන් තෝරා ගැනීමට අභිප්‍රාය ප්‍රකාශ කිරීමට කැමැති ව්‍යාප්ති කමිටු හා අමාත්‍ය මණ්ඩල සාකච්ඡා සම්මුති මණ්ඩලයකට පත් කිරීම" කියන එකයි. හතරවන පියවර වශයෙන් තිබෙන්නේ, "දෙස් විදෙස් මාධ්‍ය තුළින් ආයෝජකයන්ට ප්‍රසිද්ධියක් ලබා දීම" කියන එකයි. පස්වන පියවර වශයෙන් තිබෙන්නේ, "ආයෝජකයින්ගේ අභිප්‍රාය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" කියන එකයි. මේ විධියට වැඩ පිළිවෙළකුත් දීලා තිබෙනවා. අවසාන එකට -වර්තමාන තත්ත්වය කියන එකට-

තිබෙනවා, "අපට පැහැදිලි තත්ත්වයක් නැහැ" කියා. මේ වාර්තාවේ ඒ විධියට තිබෙනවා. ඒක කර තිබෙනවාද? නැද්ද? විනිවිදභාවයක් ඇතුව කර තිබෙනවාද? මොකද, හැම තැනකම අපට ඇහෙන්නේ, අපට පෙනෙන්නේ දූෂණය, වංචාව. [බාධා කිරීමක්]ඒවා ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන්. මේ සියල්ලම හරියි කියා මා කියන්නේ නැහැ. විනිවිදභාවයක් හරියට තිබෙනවා නම් අපිට බණින්න දෙයකුත් නැහැ; මේ පාර්ලිමේන්තුවේ කෑ ගහන්න දෙයකුත් නැහැ. මේක ඉතාමත්ම වැදගත් වැඩ කොටසක් කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව ඉතාමත් වැදගත් අංශයක් මේකේ තිබුණා. එතැනදී අපට ඉදිරිපත් කරපු වාර්තාවල එක කොටසක තැපැල් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පිළිබඳව තිබෙනවා. මේකෙදි අපිට පැහැදිලි කර ගත යුතු කරුණු කිහිපයක් තිබෙනවා. ගරු ඇමතිතුමා මෙතැන නැහැ. මා හිතනවා, ඇමතිවරු මෙතැන ඉන්නවා නම්, අවබෝධයක් ඇතුව අපිට හොඳ සාකච්ඡාවක් කරන්න පුළුවන් කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඉස්සෙල්ලාම ගන්න පුළුවන් වුණේ තැපැල් දෙපාර්තමේන්තුවයි. [බාධා කිරීමක්] තැපැල් සේවා ඇමතිතුමා දැන් මේ ගරු සභාවට එනවා. මැරෙන්නේ නැහැ. මතක් කරපු ගමන්ම එනවා. "ශීර්ෂ අංක 108, 308 තැපැල් සේවා අමාත්‍යවරයා. තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින ගැටලු පිළිබඳව සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විශ්‍රාමික විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරන ලද කමිටුව සිය වාර්තාව ඉදිරිපත් කළ බවත්, ඉන් අනතුරුව එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද බවත්, එහි අන්තර්ගත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා එය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බවත්, ගරු තැපැල් සේවා අමාත්‍යතුමා පැහැදිලි කළේය." කියා මෙහි සඳහන් වනවා. මේක ඔබතුමා පාර්ලිමේන්තුවේත් කියලා තිබෙනවා. ඒක බොහොම හොඳ වැඩ පිළිවෙළක්. ඒ වාගේම මේ නිර්දේශය මොකක්ද කියා අපි දන්නේ නැහැ. කවදාද යැව්වේ කියලා අපි දන්නේ නැහැ. ඒකට මොකක්ද වුණේ කියලා දන්නේ නැහැ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මේ සඳහා ගෙන තිබෙන පියවර මොකක්ද කියලා අදවත් කියන්න පුළුවන් නම්, මේ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් හැටියට ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන සහතිකයක් දෙනවා නම් ඒක ඉතාම වැදගත්. ගරු ඇමතිතුමනි, බඳවා ගැනීමේ පටිපාටි පිළිබඳව එහි කාරණා කීපයක් සටහන් කර තිබෙනවා. අපි එදා සාකච්ඡාවේදී ඒවා පැහැදිලි කළා. මට මෙය දීර්ඝ වශයෙන් කියවන්න වෙලාව නැති වුණොත් කරුණාකර මේ තොරතුරු හැන්සාඩ් ගත කරන්න කියලා ඉල්ලනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් කරන ලද පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු තමයි මේවා.

එක කාරණයක් තමයි මේ කටයුතු ආයතන සංග්‍රහයට අනුකූල නොවීම. ඒකාබද්ධ තැපැල් සේවයේ 'ආ' කාණ්ඩයේ 1 'ආ' ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරින් බඳවා ගැනීමේ තරග විභාගය -2011, කියන කාරණය යටතේ සඳහන් වනවා මේ විධියට. "ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ v.2.3 වගන්ති ප්‍රකාරව පත් කිරීමේ බලධරයා විසින් බඳවා ගැනීමට අදාළ නිවේදනය ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු නමුත් ඊට පටහැනිව කටයුතු කර තිබුණි."

ඒ කියන්නේ වෙනම ආයතනයකට දීලා මේ විභාගය පවත්වන්න යනවා. "ස්ලිඩා" ආයතනයට දීලා, ලොකු මුදලක් ගෙවලා ඒ විභාගය පවත්වන්න යනවා. ඒ දැන්වීම පළ කරලා තිබෙන්නේත් ප්‍රවෘත්ති පත්‍රවල. සාමාන්‍යයෙන් මේක ගැසට් පත්‍රයේ පළ කරලා කරන්න තිබෙන වැඩක්. ඒ වාගේම මෙම විභාගය පවත්වන්න යන්නේත් "ස්ලිඩා" එකෙන්මයි. මට ආරංචි විධියට අයදුම් පත්‍ර විශාල ගණනක් ලැබිලා තිබෙනවා. නමුත් මේ විභාගයට අයදුම්කරුවන් 5,000ක් කැඳවන්න විතරයි ඒ ගොල්ලන්ට පුළුවන්. ඉතිරි අයට මොකද වෙන්නේ? කවුද ඒ අය තෝරන්නේ? මොන ක්‍රමයටද තෝරන්නේ? ඒ නිසා මේ කටයුතුවල විනිවිදභාවයක් අපට පෙනෙන්නේ නැහැ. මේ ප්‍රශ්නය සියලුම වෘත්තීය සමිති ඒකාබද්ධව දේශපාලන භේදයෙන් තොරව ඉදිරිපත් කර තිබෙන එකක්. එම නිසා ඒ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ තනතුරු සඳහා අයදුම් කර තිබෙන සියලු දෙනාටම අවස්ථාවක් දෙන්න. ගැසට් පත්‍රයේ පළ කරලා, අපේ විභාග දෙපාර්තමේන්තුවට කියලා, විභාගය තියලා, ඒ අනුව කටයුතු කළොත් මා හිතන විධියට හුඟක් ප්‍රයෝජනයි. මම නොවෙයි මේ කරුණු කියන්නේ. මේවා විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු.

ඊළඟ කාරණය, විභාග ගාස්තු.

"2010 මැයි 14 දිනැති අංක 1654 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි රාජ්‍ය සේවාවන්ට බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගවලට අදාළ විභාග ගාස්තු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයාගේ එකඟත්වයක් මත පළ කර තිබුණු අතර ඉහත ගැසට් නිවේදනයේ 6 වැනි වගන්තිය අනුව මෙවැනි සේවාවන්ට අදාළව අය කළ යුතු විභාග ගාස්තු රුපියල් 500ක් විය. මෙම විධිවිධානය නොසලකා රුපියල් 1,000 බැගින් විභාග ගාස්තු අය කිරීම හේතුවෙන් මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට අයදුම්කරුවන්ට තිබූ අවස්ථා සීමා කර තිබුණි."

මේවා කියන්නේ මා නොවෙයි. ලැබී තිබුණු ඉල්ලුම් පත්‍ර සහ ඊට අදළ ලේඛන සම්බන්ධව කරන ලද විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු තමයි මා කියවන්නේ. මේ පිළිබඳ විස්තර ගරු ඇමතිතුමා ළඟ ඇති. දැන් මේ පිළිබඳව ප්‍රකාශයක් කරනවා නම් මා හිතනවා ඉතා වැදගත් කියලා. ඊළඟට මේ විධියට කියනවා. එය මෙසේයි:

"ඉහත තරග විභාගය, විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගැනීමට තිබූ හැකියාවන් සොයා නොබලා 2011 ජූලි 11 දිනැති පීඑස්ඊ/ඊටී/5/1/28/1/1 අංක දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත ලිපිය පරිදි මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වා ගැනීමට තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ 2011 ඔක්තෝබර් 31 දින දක්වා ගිවිසුමකට එළැඹී නොතිබුණි."

ගරු ඇමතිතුමනි, එහෙම ගිවිසුමකට එළැඹිලා නැහැ. ඊළඟට මෙසේ සඳහන් වනවා:

"(ආ) විභාග දෙපාර්තමේන්තුව හැර වෙනත් ආයතනයක් මඟින් විභාගය පැවැත්වීමේදී උද්ගත වන විනිවිදභාවය හා රහස්‍යභාවය ගැන විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

(ඇ) මේ ආකාරයෙන් බාහිර ආයතනයක් මඟින් බඳවා ගැනීමට අදාළ තරග විභාගය පැවැත්වීමට කටයුතු කිරීමෙන් අනෙකුත් රාජ්‍ය සේවාවන්වලටද මෙය පූර්වාදර්ශයක් වීමේ ඉඩකඩ විගණනයේදී බැහැර කිරීමට නොහැකිය."

මේක ඉතාම වැදගත් කාරණයක්. අවශ්‍ය නම් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න මම මේ ලේඛනය දෙන්නම්. ඔබතුමාගේ අවධානය සඳහාත් යොමු කරන්නම්.

ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගේ අමාත්‍යාංශය ගැන විතරක් කථා කරන්න පුළුවන්කමක් නැහැ, මේ ලැබී තිබෙන සුළු කාලයේදී. මේ සුළු කරුණු ටික පමණක් ඔබතුමාට යොමු කළේ, මේ සේවකයින් බලාපොරොත්තුවෙන් ඉන්න නිසා මේ පිළිබඳව

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

පිළිතුරක් අද ලැබෙයි කියලා. රාජ්‍ය පරිපාලනයෙන් එවාපු ලියුමකුත් තිබෙනවා. පිටස්තර ආයතනයක් මඟින් විභාගයක් තියලා බඳවා ගන්න එක වෙනස් කරලා, සුදුසුකම් එක්ක රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරලා, විභාග දෙපාර්තමේන්තුවෙන් ඒ විභාගය පවත්වලා බඳවා ගන්නවාට ඒ අයගේ විරුද්ධත්වයක් නැහැ. ඒකට ඔබතුමාගේ ප්‍රතිචාරය මොකක්ද කියලා අද කියනවා නම් මා හිතනවා හුඟක් හොඳයි කියලා.

ඊළඟට තව එක කාරණයක් කියන්න තිබෙනවා. මා හිතනවා මෙය හුඟක් වැදගත් කියලා. දැන් ඉන්නවා Senior Ministersලා. මේ අවස්ථාවේ ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා නම් නැහැ. එතුමාත් හිටියා නම් හොඳයි. මහාචාර්ය තිස්ස විතාරණ ඇමතිතුමා ඉන්නවා. හිටපු අගමැතිතුමා වන ජ්‍යෙෂ්ඨ අමාත්‍ය අපේ ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා ඉන්නවා. දැන් මට තේරෙන විධියටයි, කථා වෙච්ච විධියටයි මේ ඇමතිවරුන්ට භාර දීලා තිබෙන වැඩ කොටස් රාශියක් තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වෙන්න කොයි ආකාරයේ පහසුකමක් එතුමන්ලාට තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. මම කාරණා කීපයක් විතරක් කියන්නම්. මා හිතනවා එතැනදී අපට පැහැදිලි වෙයි මේ වැඩේ මොකක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Hon. Ratnasiri Wickramanayaka, Minister (Senior) for Good Governance and Infrastructure ගේ කාර්යයන් හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් Performance Report - 2011 එකේ පහත පරිදි සඳහන් වනවා.

I quote :

"Co-ordination of activities with such Ministries as Highways, Power, Energy, Telecommunications, Transport, Irrigation, Agriculture and Water Supplies with the objective of ensuring the development of the infrastructure."

මා විශේෂයෙන්ම මතක් කරන්නේ මේකයි. මෙවැනි විශාල වැඩ ප්‍රමාණයක්, අමාත්‍යාංශ ප්‍රමාණයක් සම්බන්ධීකරණය කරන කොට ඒ ප්‍රතිඵලය අපි කොහොමද ලබා ගන්නේ? අපිට ප්‍රතිඵලය ලබා ගන්න අවශ්‍යයි මන්ත්‍රීවරු හැටියට. ඒ නිසා අපි යෝජනාවක් කළා, වෙනම උපදේශක කාරක සභාවක් මේ Ministry එක වෙනුවෙන් හදන්න කියලා. ඒ හිටපු අමාත්‍යවරුත් ඒ වාගේම මන්ත්‍රීවරුත් සියලු දෙනාම ඒකට එකඟත්වය පළ කළා. මේ Senior Ministers ලා කියන්නේ අතිවිශේෂ පළපුරුද්දක් තිබෙන, ඒ වාගේම ක්‍රියාත්මක කරපු හොඳ වැඩ පිළිවෙළවල් පිළිබඳ දැනුමක් තිබෙන අමාත්‍යවරු. Senior Ministersලා කියලා කවුරුවත් අහක දමන්න ඕනෑ නැහැ. මේ ඇමතිවරුන්ගේ වැඩ කොටසේ, ඒ -සම්බන්ධීකරණයේ ප්‍රතිඵලය -ප්‍රගතිය- අපට දැන ගන්න විධියක් නැහැ ගරු ඇමතිතුමනි. ඔබතුමා වාගේම ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා ඒ වාගේම අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා ඇතුළු ඇමතිවරුන් කීප දෙනෙක් ඉන්නවා. එතුමන්ලාට විශාල වැඩ කොටසක් පවරා තිබෙනවා. අපේ ගරු ෆවුසි ඇමතිතුමා ඉන්නවා. එතුමාටත් පවරා තිබෙනවා විශාල වැඩ කොටසක්. එතුමන්ලාගේ වැඩ කොටසේ ප්‍රගතිය අපි මනින්නේ කොහොමද? ඒ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද? මේ සියලු දෙනාටම එක අමාත්‍යාංශයයි තිබෙන්නේ; ලේකම්වරයෙක් දෙදෙනෙක් ඉන්නවා; එක ගොඩනැඟිල්ලයි තිබෙන්නේ. මා දන්නා පිළිවෙළට නම් ඒ පහසුකම් මදි.

නමුත් මේවා පිළිබඳව අපට සාකච්ඡා කරන්න පුළුවන් උපදේශක කාරක සභාවක් -Consultative Committee එකක්- දෙන්න. මම හිතන හැටියට රජයට මේකට බැහැයි කියන්න බැහැ. මේ වාර්තාවේත් එය සඳහන් කරලා තිබෙනවා. කරුණාකර ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. මේ වාගේ කරුණු රාශියක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ පොත් දෙන කොට කියවන්නේ නැති එක විතරක් නොවෙයි ප්‍රශ්නය. දැන් CD දෙන අලුත් system එකක් තිබෙනවා. මම දන්නේ නැහැ, කවුරු ඒකට එකඟ වුණාද කියලා. මම නම් එකඟ නැහැ. ඉතින් අපි ගිහිල්ලා CD එක දා ගෙන ඉන්න ඕනෑ. අපේ පුරුද්ද තිබෙන්නේ, අදාළ කරුණු පිළිබඳව තොරතුරු සොයා ගෙන Consultative Committee එකට ඇවිල්ලා කථා කරන්නට. විවේචනය කරන අයට පුළුවන්, නොයෙක් පොත් පත්වල තිබෙන දේවල් බලලා, internetවල තිබෙන දේවල් බලලා කථා කරන්න. මම අදහස් කරන්නේ ඒක නොවෙයි. මම අදහස් කරන්නේ අපි මේ Consultative Committee එකට ගිහින් කථා කරන කොට අපට කරුණු හොඳින් පැහැදිලි කර ගන්නත් පුළුවන්; නිලධාරින්ගෙන් ප්‍රශ්න අහන්නත් පුළුවන්. උපදේශක කාරක සභාවලට අපට අවශ්‍ය නිලධාරින් ගෙන්වා ගන්න පුළුවන්, ඒ අයගෙන් ප්‍රශ්න අහන්න පුළුවන්. ඒ අවස්ථා ඔක්කොම නැතිව යනවා. ඉතින් අපට ඉතුරු වෙන්නේ මොකක්ද? මේ පොත බලලා මේකේ තිබෙන ඉලක්කම්වල හෝ මොනවා හෝ අඩු පාඩුවක් සාකච්ඡා කරන එක විතරයි.

උදාහරණයක් මම කියන්නම්. කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන වේලාවේදී, ලැබුණු තොරතුරු පොතේ - තමුන්නාන්සේලා දීලා තිබෙන පොතේ. CD එකේ තිබෙන්නෙත් එහෙම වෙන්න ඇති.- තිබෙනවා, සේවක අර්ථ සාධක අරමුදලේ දැනට ඇති මුදල් ප්‍රමාණය -දැනට වත්කම්- ගැන කියලා. ඒකේ සඳහන්ව තිබෙනවා, රුපියල් මිලියන නවසිය ගණනක් කියලා. ඉතින් මම ඇමතිතුමාගෙන් ඇහුව්වා. ඒක වැරදියි. ඒකේ තිබෙන්න ඕනෑ, රුපියල් බිලියන නවසිය ගණනක්. අපි මේ කාරණය වෙන අතකට ගෙනිච්චොත් එහෙම, internet එකට දැම්මොත්, පාසල් දරුවෝ බැලුවොත් එහෙම - ඒ ගොල්ලෝ මේවා හදාරනවා.- ඒකේ සඳහන්ව තිබෙන්නේ රුපියල් මිලියන නවසිය ගණනක් කියලා. මේ අවුරුද්ද වන කොට අර්ථ සාධක අරමුදලේ තිබෙන මුදල රුපියල් ට්‍රිලියනයක් වනවා. සේවක භාරකාර අරමුදලේ -ETF එකේ- තිබෙන මුදල රුපියල් බිලියන 125ක් වනවා. ඇමතිතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානයට මෙය යොමු කළොත් එහෙම මේ සා විශාල මුදල් සම්භාරයක් තිබෙන වෙලාවේ අපේ Senior Ministersලාට යම් කිසි වග කීමක් තිබෙනවා, එතුමන්ලාට Cabinet Papers දමන්න පුළුවන් නිසා.

රජයේ සේවකයන්ට අග්‍රහාර රක්ෂණ ක්‍රමය තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ට EPF එකයි, ETF එකයි තිබෙනවා. මේ හරහා මේ වැඩ කරන ජනතාව, මේ සාමාජිකයෝ ආයෝජකයන් බවට පත් කරන්නේ කොහොමද කියලා ක්‍රමයක් හදලා දෙන්න. මම හිතන හැටියට එය අතිවිශාල වෙනසක් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්. මෙහි සාමාජිකයන් හැම කෙනකුටම, -රාජ්‍ය සේවයේ, පෞද්ගලික අංශයේ හැම කෙනකුටම- තමුන්ටයි කියලා ගෙයක් හදා ගන්න වැඩ පිළිවෙළකට මේ මුදල් යොදවන්න අපට පුළුවන්. ආණ්ඩුවටත් නොයෙක් සංවර්ධන වැඩවලට මේ මුදල් අවශ්‍යයි. අපි ඒක පිළිගන්නවා. ඒ වාගේමයි මේ සාමාජිකයාටත්. උදාහරණ ඕනෑ තරම් මම මේ පාර්ලිමේන්තුවේ කියලා තිබෙනවා.

රජයේ සේවකයන් නැත්නම් පෞද්ගලික අංශයේ සේවකයන් මම දන්න පිළිවෙළට දාහකට වැඩි පිරිසක් heart surgeryවලට පෝලිමේ ඉන්නවා. රුපියල් ලක්ෂ තුනක්ද කොහෙද අග්‍රහාර රක්ෂණ ක්‍රමයෙන් දෙනවා. ETF එකෙන් එහි සාමාජිකයන්ට රුපියල් 1,50,000ක් ගෙවනවා. ජනාධිපති අරමුදලෙනුත් මුදල් දෙනවා. ඒ සියල්ලක්ම එකතු වුණාම රුපියල් ලක්ෂ තුනක් විතර වනවා. නමුත් මේ සඳහා රුපියල් ලක්ෂ හතක් විතර වැය වනවා. ඉතින් අනෙක් මුදල වෙනුවෙන් ලැයිස්තු අරන් අපි ගාවට එනවා. මේ ගොල්ලන්ගේ සල්ලි EPF එකේ, ETF එකේ තිබෙනවා. ඔබතුමන්ලාගේ විශේෂ අවධානයට අපි එය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයටම සම්බන්ධ නිසා අපි විශේෂයෙන් තවත් කාරණයක් මතක් කරන්නට ඕනෑ. දැනට අපිට ලැබිලා තිබෙන න්‍යාය පත්‍රයේ එක් අංකයක් යටතේ යෝජනාවක් තිබෙනවා, සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කරන්නට. එක් යෝජනාවක් තිබෙනවා, විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව. ඒකට බොහෝ ප්‍රශ්න මතු වුණා. මිනිස්සු අත පය කඩා ගත්තා. සමහර මිනිසුන් මැරිලා, ඒ අයට තවම වන්දි ගෙවලාත් නැහැ; පරීක්ෂණ කරලාත් නැහැ. ඒක එහෙමම තිබෙනවා. විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත යටින් තව පනත් කෙටුම්පතක් ගැන තිබෙනවා. ඒක තිබෙන්නේ සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කරන්නටයි. මට මතක හැටියට ඒ පනත් කෙටුම්පතේ තිබෙන්නේ අමුතුම කථාවක්. සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කරන්නේ -මට මතක හැටියට එහි 24 වන වගන්තිය; සේවක අර්ථසාධක අරමුදල සංශෝධනය කරන්නේ- ඔවුනට විශ්‍රාම වැටුපක් ලබා දෙන්න සහ ඔවුන්ගේ ශුභ සාධන කටයුතු සඳහා මුදල් වෙන් කරන්නයි. ඒකේ බලය එන්නේත් කම්කරු දෙපාර්තමේන්තුවේ Commissioner-Generalට. අනවශ්‍ය ප්‍රශ්නවලට ඇඟිලි ගහන්න එපා. මම ඒකයි විශේෂයෙන්ම අපේ Senior Ministersලාගෙන් ඉල්ලන්නේ. තමුන්නාන්සේලා අත් දැකීම් තිබෙන අය; බොහොම හොඳට වැඩ කළ අය; ආණ්ඩුවට ආදරය තිබෙන අය. අනවශ්‍ය ප්‍රශ්න ඇති කර ගන්න එපා, එළවලු කූඩය වාගේ. අනවශ්‍ය ප්‍රශ්න ඇති කර ගත්ත තැන් කිහිපයක් තිබෙනවා. එකක් කටුනායක සිද්ධිය. ඒ අය සමඟ සාකච්ඡා කරලා, ඒ අයට ප්‍රයෝජනවත් විධියට කටයුතු කරන්න ගියා නම් ඒ අය විරුද්ධ වන්නේ නැහැ. සේවකයන්ට pension එකක් තිබෙනවා කියන එක හොඳයි. කොහොමද ඒක කරන්නේ? සේවකයෝ බලා ගෙන ඉන්නේ තමන්ගේ කාල පරිච්ඡේදය අවසන් වෙලා ගෙදර යන විට EPF එකේ සල්ලි අර ගෙන ගිහින් දරුවෙකුට දැවැද්ද දෙන්න, නැත්නම් ගෙයක් හදන්න වාගේ දෙයක් කරන්නයි. ඒක pension එකකට ගන්නවාය කිව්වොත් ඒ අයට ඒක ලැබෙන්නේ නැහැ. ඒක නේ මේකෙන් අර්ථ කථනය වෙන්නේ. එහෙම නම් ඒ අය එක්ක සාකච්ඡා කරලා අපි ඒක හොඳ විධියට කරන්න ඕනෑ. කිසිම දේශපාලනයක් නැතිව කටුනායකදී 30,000ක් විතර එළියට බැස්සා. මා මේ කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මීගමුව කළපුවේ කාගෙන්වත් අහන්නේ නැතිව, තමන්ගේ මතයට, හිතුමතයට seaplane එක දාන්න ගිහින් ඒ ධීවරයින් ඒකට විරුද්ධ වුණා. විරුද්ධ වෙලා ඔක්කොම බෝට්ටු ගෙනැත් එතැන වට කරලා ලොකු උද්ඝෝෂණයක් කළා. ඒ අය අපට කිව්වා, එන්න එපාය කියලා. "දේශපාලන මහත්වරු කවුරුවත් මෙතැනට එන්න එපා. මේක අපි බේර ගන්නම්." කියලා ඒ අය අපට කිව්වා. ඔක්කොම ධීවරයෝ එකතු වුණා. අන්තිමට මොකද වුණේ? විශාල ප්‍රශ්නයක් මතු වෙලා, ඒක අකුළා ගෙන ගියා. ඒ, තැනේ ප්‍රශ්නයයි තිබුණේ. වෙන එකක් නොවෙයි. ඒ වාගේම එළවලු කූඩ ප්‍රශ්නයත් ඇති වෙලා තිබෙනවා. ඒ ගැන හුඟක් කථා කරලා තිබෙන නිසා මම ඒ ගැන දැන් කථා කරන්නේ නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගෙන් ඉල්ලන්නේ තමුන්නාන්සේලා මේකට මැදහත් වෙන්න කියලායි.

න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන සේවක අර්ථ සාධක අරමුදල සංශෝධනය කරන වැඩ පිළිවෙළ මේ පාර්ලිමේන්තුවේදී විවාදයට ගන්න එපා කියලා මම කරුණාවෙන් ඉල්ලනවා. එය මේ න්‍යාය පත්‍රයට ගන්න එපා. එතකොට තවත් ප්‍රශ්නයකට රජය මැදි වෙනවා. අපට ඒකට එකඟ වෙලා කියන්න පුළුවන් හොඳයි, ඒක දාන්න කියලා. නමුත් තවත් ප්‍රශ්නයකට මැදි වෙනවා. අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරනවාට විතරක් නොවෙයි, න්‍යාය පත්‍රයේ pension එක සම්බන්ධයෙන් තිබෙන පනත් කෙටුම්පතත් සම්මත කිරීම සම්බන්ධයෙනුයි. ඊට පසුව අපට ඒ ගැන කථා කරන්න පුළුවන්. කථා කරලා අපි හොඳ විධියට හදා ගනිමු. මම මීට වඩා කථා කරන්නේ නැහැ. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා බොහොම හොඳට අහ ගෙන හිටියා. මම හිතනවා, එතුමාටත් ප්‍රයෝජනවත් වුණා කියලා. එතුමාගේ වෙලාව මම ගන්න යන්නෙත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මේ වැඩ පිළිවෙළ හොඳයි. මේ Select Committeeයට හැම අමාත්‍යාංශයම ගෙනැල්ලා කථා කරන එක හොඳයි. එතකොට හොඳ දැනුමක් ලැබෙනවා. මේ වාගේ කුණුහරුප කියා ගන්නේ නැතිව එතැනට වෙලා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට වාඩි වෙලා කථා කරන්න පුළුවන්. මේක ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක්. මේ ගැන අවුරුදු ගණනක් කථා කරලා තිබෙනවා. අවසාන වශයෙන් මම කියන්නේ මේ Select Committeeයෙන් තීරණය කරලා තිබෙන වැඩ පිළිවෙළ ඊ ළඟ සැරේ ක්‍රියාත්මක කරන්නය කියන එකයි. ඒ වාගේම අපේ ගරු ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ට දීලා තිබෙන පහසුකම් සහ එතුමන්ලාට තිබෙන කාර්ය භාරය පිළිබඳව අපට දැන ගන්න, සාකච්ඡා කරන්න උපදේශක කාරක සභාවක් පත් කරලා දෙන්න කියන එකත් ඉල්ලා තිබෙනවා. ඒ නිසා මේ Select Committeeයට සම්බන්ධ වුණු සියලුම දෙනාටම මගේ ස්තුතිය පුද කරමින්, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[மு.ப. 11.00]

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று 21 அமைச்சுக்களின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதம் நடைபெறுகின்றது. அதில் ஒருசில அமைச்சுக்கள் சார்பாக கருத்துக்களைப் பகிர்ந்துகொள்ள விரும்புகின்றேன். முதலில், அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சு சார்பில் சில விடங்களைக் கூறவேண்டியிருக்கிறது. அதில் முக்கியமானது வாழைச்சேனை தேசிய கடதாசிக் கூட்டுத்தாபனமாகும். இக்கூட்டுத்தாபனமானது 1951ஆம் ஆண்டு ஏற்பாடு செய்யப்பட்டு, 1956ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டதாகும். முன்னர் இது தேசிய கடதாசி ஆலை என்ற பெயரில் அழைக்கப்பட்டது. 1956 முதல் 1960ஆம் ஆண்டுவரை இவ்வாலை இயங்குவதில் பெரும் சிரமங்களை எதிர்நோக்கியது. காரணம், அந்தக் காலத்தில் பயிற்சிபெற்ற தொழிலாளர்கள் இருக்கவில்லை. ஆனால், 1960 தொடக்கம் 1996 வரை இந்தக் கடதாசி ஆலை மிகச் சிறப்பாக இயங்கிவந்தது. குறிப்பாக, அந்தக் காலகட்டத்தில் இந்த ஆலை அரசாங்கத்திற்கு வருமானம் ஈட்டிக்கொடுப்பதில் முக்கிய பங்கினை வகித்தது. அதனால், இந்த ஆலைக்கு இரண்டு தடவை உற்பத்தி விருதுகள்கூடக் கிடைத்திருக் கின்றன. அதுமாத்திரமல்ல, இவ்வாலை திறைசேரிக்கு வருடாந்தம் 100 மில்லியன் ரூபாயினை வரியாகவும் வழங்கி வந்தது.

வியாபார ஸ்தாபனமாக இயங்கிவந்த இவ்வாலையானது பல துறைகளில் வருமானத்தை ஈட்டிக்கொடுத்தது. இதன் வருமானத்தின்மூலம் 1972இல் அங்கு board machines ஸ்தாபிக்கப்பட்டது. 1974இல் கொழும்பு, யூனியன் பிளேஸ் பகுதியில் 126 பேர்ச் நிலப்பரப்பில் பெரியதொரு தலைமைக் காரியாலயமும் கட்டப்பட்டது. இந்த ஆலை மேலும் வளர்ச்சியடைந்ததைத் தொடர்ந்து, 1976ஆம் ஆண்டு ஜேர்மன் அரசாங்கத்தின் KfW loan திட்டம்மூலம் எம்பிலிப்பிட்டிய

[ගරු සිනිතම්බි යෝගේෂ්වරන් මහතා]

கடதாசி ஆலை ஆரம்பிக்கப்பட்டது. இது இலங்கையின் இரண்டாவது கடதாசி ஆலையாகும். இந்த எம்பிலிப்பிட்டிய கடதாசி ஆலையின் வருமானத்திலும் வாழைச்சேனை தேசிய கடதாசி ஆலையின் வருமானத்திலும்தான் எம்பிலிப்பிட்டிய கடதாசி ஆலைக்காகப் பெறப்பட்ட கடன் அழிக்கப்பட்டது. இக்காலகட்டத்தில் வாழைச்சேனை தேசிய கடதாசிக் கூட்டுத்தாபனம் மிகவும் இலாபத்தில் இயங்கியதால் இங்கு கடமைபுரிந்த தொழிலாளர்கள் நன்கு கவனிக்கப்பட்டனர். அதனால், மேலதிக தொழிலை மேற்கொண்டு, இவ்வாலையைத் தொடர்ந்தும் இலாபத்தில் கொண்டுசெல்வதில் அவர்கள் மிகவும் ஊக்கமாகச் செயற்பட்டனர். இவ்வேளை, 1997இல் ஐக்கிய தேசியக் கட்சியின் ஆட்சிக்காலத்தில் பொது வளங்கள், மறுசீரமைப்பு ஆணைக்குழுவின் சிபாரிசின் அடிப்படையில் இது கம்பனியாக்கப்பட்டது. அதாவது, தேசிய கடதாசி ஆலை ஒரு லிமிரெட் கம்பனியாக்கப்பட்டது. ஆனால், தற்போதைய அரசாங்கத்தில் தனியார் கம்பனிக்கு வழங்கும்நிலை நிறுத்தப்பட்டுள்ளது.

இக்கடதாசி ஆலையானது 1993ஆம் ஆண்டுக்கு முன்பு வைக்கோலை மூலப்பொருளாகக் கொண்டு இயங்கியது. பின்னர் 'சூழல் மாசுபடுதல்' என்ற வகையில் வைக்கோலைப் பயன்படுத்திக் கடதாசி தயாரிக்கும் செயல்முறை நிறுத்தப்பட்டு, தற்பொழுது கழிவுக் கடதாசியினாலேயே கடதாசி தயாரிக்கப்பட்டு வருகின்றது. ஆனால், அங்குள்ள இதற்கான இயந்திரங்கள் மிகவும் பழுதடைந்த நிலையிலேயே உள்ளன. காரணம், யுத்தத்தைக் காரணங்காட்டி, கடந்த காலத்தில் இதன் தலைமையகம் இயந்திரங்களைப் பராமரிப்பதில் காட்டிய அசமந்தப்போக்கேயாகும். இதனால், இயந்திரச் செயற்பாடுகள் குறைவடைந்து உற்பத்தியும் குறைவடைந்தது. உற்பத்தி குறைவடைந்ததால் கடதாசி ஆலை நட்டத்தில் இயங்க ஆரம்பித்தது. இதனால், இங்கு தொழில்புரிந்த தொழிலாளர்களுக்கான விசேட கொடுப்பனவுகள் நிறுத்தப்பட்டன. தொழிலாளர்களுக்கு வழங்கப்பட்ட மேலதிக வேலை மற்றும் மேலதிக கொடுப்பனவுகள் நிறுத்தப்பட்டதால் வருமான ரீதியில் பாதிக்கப்பட்ட தொழிலாளர்கள் சுயவிருப்பத்தில் தாமாகவே ஆலையிலிருந்து வெளியேற முனைந்தனர். இவ்வாறு ஐந்து தடவைகள் இடம்பெற்று, இற்றைவரை 300 பேருக்குமேல் சுயவிருப்பத்தின்பேரில் வெளியேறியுள்ளனர். இதன் பின்பு 1997ஆம் ஆண்டு தொடக்கம் ஆலை நட்டத்தில் இயங்குவதைக் காரணம் காட்டி, சுயவிருப்பத்தில் வெளியேறிய சிலருக்கு வழங்கப்படவேண்டிய EPF, ETF, பணிக்கொடை போன்றவற்றை வழங்குவதை நிர்வாகம் இன்றுவரை காலதாமதப்படுத்தியுள்ளது. இவ்வாறு வெளியேறியவர்களில் சிலர் வறுமை காரணமாக மீண்டும் ஆலையில் வேலைக்குச் சேர்ந்துள்ள அதேநேரம், 16 பேருக்கு எந்தவிதமான கொடுப்பனவும் கிடைக்காத காரணத்தினால் மிகவும் வேதனையுடன் குடும்பக் கஷ்டத்தில் தவித்துக்கொண்டிருக்கின்றனர்.

தற்போது, இக்கடதாசி ஆலையில் 175 நிரந்தர தொழிலாளர்களும் NAB மூலம் பயிற்சி பெறுபவர்களும் உள்ளனர். எனினும், இவர்களில் கிட்டத்தட்ட 85 பேர் சுயவிருப்பத்தில் வெளியேறுவதற்கான விண்ணப்பங்களை மட்டக்களப்பு பிராந்திய தொழில் ஆணையாளரிடம் கையளித்துள்ளனர். ஆலை திறம்பட இயங்கும்பட்சத்திலும் தொழிலாளர்களுக்குரிய கொடுப்பனவுகள் உட்படச் சலுகைகள் என்பன ஒழுங்காக வழங்கப்படும்பட்சத்திலும் சுயவிருப்பத்தில் வெளியேற விண்ணப்பிப்போர் தொகை குறையலாம். இதேவேளை, அங்குள்ள தொழிலாளர்களுக்குக் கடந்த நவம்பர் மாதத்துக்கான சம்பளம் இதுவரை வழங்கப் படாததால் அவர்கள் பெரும் கஷ்டங்களை எதிர்கொண்டுள்ளனர். ஆலையானது, 100 மில்லியனுக்கு மேல் மின்சாரக் கொடுப்பனவு செலுத்தவேண்டிய நிலையில் உள்ளதால், இன்று மின்சாரம் நிறுத்தப்பட்டு தற்காலிகமாக இயங்கும் நிலை ஏற்பட்டபொழுதிலும்கூட, தங்களுக்கான இதர கொடுப்பனவுகள் மற்றும் உதவிகள் என்பன வழங்கப்படாமையினாலும் சட்ட ரீதியாக வழங்கப்படவேண்டிய EPF நிதியானது கடந்த நான்கு வருடங்களாக மத்திய வங்கியில் இடப்படாத காரணத்தினாலும் தொழிலாளர்கள் வேலைப் பகிஷ்கரிப்பை மேற்கொண்டு வருகின்றனர். இன்று 12 மணிக்கு மீண்டும் மின்சாரம் நிறுத்தப்பட இருக்கின்றது. உண்மையிலே தொழிலாளர்களின் கோரிக்கையில் நியாயம் உள்ளது என்பதை நான் இந்நேரத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இதற்குப் பின்னர், ஆரம்பிக்கப்பட்ட எம்பிலிப்பிட்டிய கடதாசி ஆலையானது நட்டத்தில் இயங்கியதால், அதனை அரசாங்கம் "அவுஸ் லங்கா" என்னும் அவுஸ்திரேலியா நிறுவனத்துக்கு 30 வருட குத்தகையில் 600 மில்லியன் ரூபாய்க்கு வழங்கி, தற்போது 400 மில்லியன் ரூபாவைப் பெற்றுள்ளது. எனினும், வாழைச்சேனை கடதாசி ஆலை தொடர்பில் இதுவரை எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

முன்பு வாழைச்சேனை கடதாசி ஆலையின் ஒரு சொத்தாக இருந்த கொழும்பு யூனியன் பிளேஸ் தலைமைக் காரியாலயக் கட்டிடம் 250 மில்லியன் ரூபாய்க்கு விற்கப்பட்டபொழுது, இதில் 50 சதவீதம் வாழைச்சேனை கடதாசி ஆலைக்குப் பயன்படுத்துவதாக உறுதிசெய்யப்பட்டும் அது முற்றாக நிறைவேற்றப்படவில்லை. எனவே, வாழைச்சேனை தேசிய கடதாசிக் கூட்டுத்தாபனத்தைப் புனரமைப்பதற்குத் தற்போது குறைந்தது 350 மில்லியன் ரூபாய்வரை தேவையாக உள்ளதால், அந்நிதியினை வழங்கி இயந்திரங்கள், கட்டிடங்கள் போன்றவற்றைப் புனரமைத்து அதனை முன்னேற்றுவதற்கு அரசாங்கம் முன்வரவேண்டும் என நான் இவ்விடத்தில் வேண்டுகோள் விடுக்கின்றேன்.

நான்கு வருடங்களுக்கும் மேலாக மத்திய வங்கியில் செலுத்தப்படாமல் இருக்கின்ற தொழிலாளர்களின் EPF நிதியானது வட்டியுடன் செலுத்தப்படல் வேண்டும். தொழிலாளர்களுக்கு வழங்கப்பட வேண்டிய நவம்பர் மாதச் சம்பளத்தையும் இம்மாதச் சம்பளத்தையும் மிகவிரைவாக வழங்குவதுடன், மாதாந்தச் சம்பளத்தைத் தங்குதடையின்றித் தொடர்ச்சியாக வழங்குவதற்கும் முன்வர வேண்டும். சுயவிருப்பில் ஓய்வுபெற்றுச் சென்று இன்றுவரை EPF, ETF பணிக்கொடை பெறாத 16 பேருக்கும் சட்டரீதியான இக்கொடுப்பனவை வழங்க நடவடிக்கை எடுக்கவேண்டும். இதுவரை காலமும் கடதாசி ஆலையில் தொழில்புரிந்த தொழிலாளர்களுக்கு முன்பு வழங்கப்பட்ட விசேட சலுகைகளையும் கொடுப்பனவுகளையும் வழங்க முன்வரவேண்டும். அதாவது, 10 மாத சம்பளக் கடன் உதவி, மேலதிக வேலையும் அதற்கான கொடுப்பனவும் - அதாவது, தொடர்மாற்று வேலை ஊக்குவிப்புப்படி, தினவரவு ஊக்குவிப்புப் படி, மிகை ஊதியம், உடைகளுக்கான கொடுப்பனவு, பாவிக்காத வைத்திய லீவுக் கொடுப்பனவு உட்பட முன்பு வழங்கப்பட்ட அனைத்துச் சலுகைகளையும் வழங்குவதற்கு முன்வரவேண்டும். அத்துடன், சுயவிருப்பில் செல்ல விரும்புபவர்களுடைய கொடுப்பனவுகளை வழங்கி அனுப்பிவிட்டு, மிகுதியாக உள்ளவர்களையும் NABமூலம் பயிற்சிபெற்ற தொழிலாளர்களையும் பயன்படுத்தி இந்தத் தொழிற்சாலையை இயக்க முன்வரவேண்டும். தொழிற்சாலையை இயக்க முடியாத சூழல் அரசுக்கு ஏற்படுமாயின், எவ்வாறு எம்பிலிப்பிட்டிய தொழிற்சாலை குத்தகைக்குக் கொடுக்கப்பட்டதோ, அதேபோன்று வாழைச்சேனைக்

கடதாசி ஆலையையும் குத்தகைக்குக் கொடுத்து, அந்த ஆலை தொடர்ந்து இயங்குவதற்கும் அந்தப் பிரதேசத்திலுள்ள தொழிலாளர்களுக்குத் தொழில் வழங்குவதற்கும் உரிய ஏற்பாடுகளை நீங்கள் மேற்கொள்ள வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். மிக முக்கியமாக மின் கட்டணத்தைச் செலுத்தி முடிப்பதுடன், சுற்றிவர வேலி அமைக்கப்பட்டு அதற்குப் பாதுகாப்பு ஏற்பாடு செய்ய வேண்டியதும் மிக அவசியமாக இருக்கின்றது.

இன்று இந்த ஆலை போதிய பாதுகாப்பு வசதிகள் அற்ற நிலையில் 274 ஏக்கர் காணிப்பரப்பிலே இயங்கிக் கொண்டிருக்கின்றது. தொழிலாளர்கள் தங்கிநின்று வேலை புரிவதற்காகவும் தூர இடங்களிலுள்ள தொழிலாளர்கள் குடும்பத்துடன் தங்குவதற்காகவும் முன்பு தாபிக்கப்பட்ட தொழிலாளர் விடுதிகள்கூட இன்று மாடுகளும் பாம்புகளும் உறைகின்ற இடமாக மாற்றப்பட்டிருக்கின்றன. இந்த ஆலையின் நிலைமைபற்றி அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சரும் பிரதி அமைச்சரும் கவனத்திற் கொண்டு, மிக விரைவிலே உரிய நடவடிக்கை எடுக்க வேண்டும். இவ்விரு அமைச்சர்களையும் அந்த ஆலையைப் பார்வையிடுவதற்கு வருமாறு நான் வேண்டுகோள் விடுத்திருக்கிறேன். கௌரவ அமைச்சர் அவர்கள் வருவதாக என்னிடம் கூறியிருக்கின்றார். எனவே, மிக விரைவிலே கௌரவ அமைச்சர் அவர்கள் அந்த ஆலையைப் பார்வையிட்டு அதனை இயக்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். எனது தந்தையாரும் இந்த ஆலையில் 40 வருடங்கள் இயந்திர இயக்குனராகக் கடமையாற்றியவர் என்பதை இச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அந்த ஆலையில் உள்ள தொழிலாளர்களுக்கு வழங்கப்பட வேண்டிய விசேட கொடுப்பனவுகள் கடந்த பத்து வருடங்களாக வழங்கப்படவில்லை என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். முதல் நடவடிக்கையாக தொழிலாளர்களுடைய சம்பள நலன் பேணும் வகையிலும் EPF, ETF போன்ற சட்ட ரீதியான கொடுப்பனவுகளை வழங்கும் வகையிலும் உரிய நடவடிக்கைகளை மேற்கொள்வதுடன், எம்பிலிப்பிட்டிய ஆலை தொடர்பாகக் கைக்கொள்ளப்பட்ட நடவடிக்கையை மிக விரைவிலே இங்கும் நடைமுறைப்படுத்த வேண்டும் எனவும் கேட்டுக்கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
உங்களுடைய தந்தையாருக்கு விசேட சன்மானம் ஒன்று வழங்கப்பட வேண்டும்.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
அவர் அந்த ஆலையில் 42 வருடகாலம் சேவையாற்றியிருக்கிறாரா?

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
ஆம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் அஞ்சல் திணைக்களம் தொடர்பாகவும் ஒரு முக்கியமான விடயத்தைத் தெரிவிக்க வேண்டியவனாக இருக்கிறேன். அஞ்சல் திணைக்களத்தில் 2006.01.01 முதல் 2010.08.02 வரை சிற்றூழியர்களாக நியமனம் பெற்றவர்கள் தமக்கு வழங்கப்பட்ட நியமனக் கடிதத்தில் குறிப்பிட்டவாறான அடிப்படைச் சம்பளத்தையே 02.08.2010ஆம் திகதிவரை பெற்றுவந்தனர். இந்நிலையில் பொது நிருவாகச் சுற்றறிக்கை இல. 15/01/சம்பளம்/35/2010இன் பிரகாரம், தற்பொழுது இவர்கள் குறைந்த அடிப்படைச் சம்பளத்தில் வைக்கப்பட்டுள்ளார்கள். இச்சம்பளக் குறைப்புப் பற்றிய எதுவித முன்னறிவித்தலும் இதுவரை எந்தவொரு பணியாளருக்கும் வழங்கப்படவில்லை. இதன்படி, தபாற்சேவகர் ஒருவரது மாதாந்த அடிப்படைச் சம்பளம் 14,375 ரூபாயிலிருந்து 11,730 ரூபாயாகக் குறைக்கப்பட்டுள்ளது. ஒருவர் ஒரு பதவிக்கு விண்ணப்பிக்கும் பொழுது வழங்கப்படும் மாதாந்த அடிப்படைச் சம்பளத்தைக் கவனத்திற்கொண்டே அப்பதவிக்கு விண்ணப்பிக்கின்றார். ஆனால், நியமனம் வழங்கப்பட்ட பின்னர் அவருடைய சம்பளம் குறைக்கப்படுமாயின், அவருக்குப் புதிய நியமனக் கடிதமொன்று வழங்கப்பட வேண்டும். மேலும், 02.08.2010க்கு முன்னர் மேலதிகமாக வழங்கப்பட்டதாகக் கணக்கிடப்பட்ட தொகையினையும் 2011 டிசம்பர் மாதச் சம்பளத்திலிருந்து அறவிடுவதற்கு கிழக்கு மாகாண பிரதி அஞ்சல் மா அதிபரினால் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. இந்த வகையில் ஆகக்கூடிய தொகையாக ஒருவர் 150,000 ரூபாய்க்கு மேற்பட்ட தொகையை மீளச் செலுத்தவேண்டிய நிலைமை ஏற்பட்டுள்ளது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே! இப்பொழுது உங்களுடைய பேச்சை முடித்துக்கொள்ள வேண்டிய நேரம் வந்துள்ளது.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
நான் மேலதிகமாக ஒரு நிமிடம் கோருகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Okay.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
எங்கள் தரப்பு நேரத்திலிருந்து மேலதிகமாக ஐந்து நிமிடத்தை எடுத்துக்கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
இல்லை, இன்னும் இரண்டு உறுப்பினர்கள் பேச வேண்டியிருக்கின்றது.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
உதாரணமாக, சம்பள ஏற்றங்களுடன் 14,955 ரூபாயை அடிப்படைச் சம்பளமாகப் பெற்ற ஓர் ஊழியர் தற்பொழுது 12,210 ரூபாயை அடிப்படைச் சம்பளமாகப் பெறுகின்றார்.

[ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා]

அதேநேரம், அவர்களுக்கு ஏற்கெனவே மேலதிகமாகக் கொடுக்கப்பட்ட தொகையை அறவிடும் முகமாக மாதாந்தம் ஆகக்குறைந்தது 2,000 ரூபாயைக் கழித்துக்கொள்ளும்போது அவர் 10,210 ரூபாயையே மாதாந்தச் சம்பளமாகப் பெறும் துர்ப்பார்க்கிய நிலை ஏற்பட்டுள்ளது. இந்நடவடிக்கை கிழக்கு மாகாணத்தில் மாத்திரம் மேற்கொள்ளப்படுகிறது என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன். இச்செயலினால் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த 84 பணியாளர்கள் பாதிக்கப் பட்டுள்ளனர். ஏற்கெனவே பல மாதங்களாக அடிப்படைச் சம்பளம் குறைக்கப்பட்டு வழங்கப்படுகின்ற நிலையில் பொருளாதார ரீதியான நெருக்கடிக்குள் சிக்கித் தவிக்கின்ற இந்தப் பணியாளர்கள், இதன் காரணமாக மேலும் இக்கட்டானதொரு கடன் சுமைக்குள் சிக்கிக்கொண்டிருப்ப தையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். இதற்கு, சம்பந்தப்பட்ட பணியாளர்களை எந்தவிதத்திலும் பொறுப்பாளி களாக்க முடியாது.

அத்துடன், ஏனைய திணைக்களங்களில் கடமையாற்று கின்ற சிற்றூழியர்களுக்கான கடமைகளைவிட அஞ்சல் திணைக்களப் பணியாளர்களின் கடமைகள் மிகவும் கடினமான வையும் பொறுப்பு நிறைந்தவையாகவும் இருக்கின்றபடியி னால், ஏனைய திணைக்களங்களுடன் ஒப்பிடும்போது உயர்ந்த சம்பளமே முன்னைய அரசாங்கங்களினால் இவர்களுக்கு வழங்கப்பட்டு வந்தது. இச்சம்பளங்களுக்கு அமைவாகவே பாதிக்கப்பட்ட இப்பணியாளர்கள் தமது வாழ்க்கை முறையையும் செலவுகளையும் அமைத்துக்கொண்டதோடு கடன்களையும் பெற்றிருந்தனர். ஆனால், திடீரென இடம்பெற்ற இச்சம்பளக் குறைப்பு வாழ்க்கைச் செலவைச் சமாளிக்க முடியாததொரு நிலைமைக்கு அவர்களைத் தள்ளி, அவர்கள் தற்கொலை செய்யும் நிலைமையைத் தோற்றுவித்துள்ளது. எனவே, தபால் சேவைகள் அமைச்சர் அவர்கள் தபால் திணைக்கள ஊழியர்களின் சம்பளத்தைக் குறைப்பதை விடுத்து, அவர்களுக்கான சம்பளத்தை அதிகரிப் பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அத்தோடு, பதிவுசெய்யப்பட்ட பதிலாளர் நியமனத்தின் போது, தற்காலிகமாகத் தபால் சேவையில் இணைந்துள்ள ஊழியர்களது சேவைக்காலம் கணக்கில் எடுக்கப்பட்டு அந்நியமனங்கள் வழங்கப்பட வேண்டும் என்றும் நான் கேட்டுக்கொள்கின்றேன். அதுமாத்திரமன்றி, தபால் திணைக் களத்தின் உத்தியோகத்தர் தேவை கருதி, பொதுச் சேவை ஆணைக்குழுவின் அனுமதியுடன் 02.02.2007இல் இருந்து தபால் அதிபர் தரம் 1இல் 244 பேர் பதில் கடமையாற்ற நியமிக்கப்பட்டனர். ஆனால், திணைக்களம் திட்டமிட்ட வகையில் அவர்களில் 136 பேரை மாத்திரம் 01.09.2010இல் நிரந்தரப்படுத்தலை மேற்கொள்ள நடவடிக்கை எடுத்தது. இவர்களில் 11 பேர் தமிழ் பேசும் உத்தியோகத்தர்கள் ஆவர். அதேநேரம் நிரந்தரம் வழங்கப்படாத 108 பேரில் 31 பேர் வயதில் குறைந்த தமிழ் பேசும் உத்தியோகத்தராவர். இந்நடவடிக்கை காரணமாக வடக்கு, கிழக்கு மாகாணங்களைச் சேர்ந்த இளம் உத்தியோகத்தர்கள் உயர் பதவிகளுக்கான பரீட்சைக்குத் தோற்ற முடியாத நிலைமை உருவாகியுள்ளது. இதனால் வடக்கு, கிழக்குப் பகுதியில் இந்த உயர் அதிகாரிகளுக்கான வெற்றிடங்கள் அதிகமாகவே உள்ளன. எனவே, தபால் சேவைகள் அமைச்சு அந்த 108 தபால் அதிபர்களையும் நிரந்தரமாக்குவதுடன், அவர்களுக்குப் பதவியுயர்வு நிலையையும் ஏற்படுத்த முன்வர வேண்டும்.

அதுமட்டுமன்றி, அண்மையில் நடத்தப்பட்ட நுண்ணாய்வு அதிகாரி பதவிக்கான போட்டிப் பரீட்சைக்கான விண்ணப்பம் கோரலானது, அங்கீகரிக்கப்பட்ட ஆட்சேர்ப்புத் திட்டத்தை மீறும் வகையிலும் தமிழ் பேசும் உத்தியோகத்தர்கள் இப்பரீட்சையில் கலந்துகொள்ளாமல் இருக்கும் நிலையை ஏற்படுத்தும் நோக்கிலும் கையாளப்பட்டுள்ளதாகக் கருத வேண்டியுள்ளது. காரணம், இதற்கான தகைமை குறிப்பிடும் முக்கிய திருத்தக் கடிதங்கள் விண்ணப்ப முடிவுத் திகதியன்றே கொழும்பில் அஞ்சலிடப்பட்டன. அதேவேளை, குறித்த விடயம் சம்பந்தமாக தாங்கள் விரும்பியவர்களுக்குத் தொலை பேசிமூலம் முன் அறிவித்தலும் வழங்கப்பட்டுள்ளது. இதன் காரணமாக மட்டக்களப்பு, யாழ்ப்பாணம் போன்ற மாவட்டங்களிலிருந்து இந்தப் பரீட்சையில் பங்குபற்றியோர் மிகக் குறைவானவர்களாகவே இருந்தனர். குறிப்பாக தமிழ் உத்தியோகத்தர்கள் நாலு பேர் மாத்திரமே இப்பரீட்சைக்குத் தோற்றியுள்ளனர். இது சார்பான முறைப்பாடும் இதுவரை பரிசீலனைக்கு எடுத்துக் கொள்ளப்படவில்லை. எனவே, இவ்விடயமாக அமைச்சர் அவர்கள் விசாரணையை மேற்கொண்டு உரிய நடவடிக்கை எடுக்க முன்வர வேண்டும் என்றும் நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

மேலும், தமிழ் பேசும் உத்தியோகத்தர்கள் தமது மாகாணத்தில்கூட உயர் அதிகாரிகளாக வருவதற்கான வாயில்கள் அனைத்துமே இன்று திட்டமிட்டு மூடப்பட்டுள்ள தாகத் தெரிகின்றது. பொதுவாக வட மாகாணப் பிரதி அஞ்சல் மா அதிபரின் ஓய்வின் பின்னர் இனிவரும் இருபது வருடங்களுக்கு வடக்கு, கிழக்கைச் சேர்ந்த எவருமே மாகாணங்களுக்குப் பொறுப்பான பிரதி அஞ்சல் மா அதிபர் பதவியினைப் பெற்றுக்கொள்ள முடியாத அளவுக்குத் திணைக்களக் கட்டமைப்புச் செயற்றிட்டம் அமைந்துள்ளது. இச்செயற்றிட்டத்தை மாற்றியமைக்க அமைச்சர் அவர்கள் முன்வர வேண்டும். குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களைச் சேர்ந்தவர்களுக்கு அம்மாகாணங்களில் உயர் பதவி வழங்க ஏற்பாடு செய்ய வேண்டும். இன்று வடக்கு, கிழக்கில் தபால் திணைக்களத்திலுள்ள அதிகாரிகள் தரப் பதவிகளில் 90 வீதமானவை வெற்றிடங்களாகவே காணப்படுகின்றன. ஒன்றில் இந்தப் பதவிக்குரிய கடமைகள் கீழ்பதவிகளை வகிப்பவர்களால் ஆற்றப்படுகின்றன, அல்லது வெளி மாவட்டங்களில் இருப்பவர்களைக்கொண்டு நிரப்பப் படுகின்றன, அல்லது அந்த ஆளணிகள் நிருவாக மீளமைப்பு என்ற ரீதியில் வடக்கு, கிழக்குத் தவிர்ந்த வேறு மாவட்டங்களுக்குக் கொண்டு செல்லப்படுகின்றன. எனவே, அமைச்சர் அவர்கள் இதில் தலையிட்டுத் தகுந்த நடவடிக்கை எடுக்க வேண்டும். யுத்த காலங்களில் தமது உயிரைப் பணயம் வைத்து இரவு பகலாகக் கடமைபுரிந்த எமது வடக்கு, கிழக்கு அரசாங்கப் பணியாளர்கள் புறக்கணிக்கப்படுவதை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது. எனவே, தபால் அமைச்சர் அவர்கள் இது விடயமாக, நியாயமான விசாரணைகளை மேற்கொண்டு, பாதிக்கப்பட்ட எமது உத்தியோகத்தர்களுக்கு உரிய நிவாரணம் பெற்றுக் கொடுக்க வேண்டும் என்று மீண்டும் கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

[පූ. භා. 11.19]

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)

(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් පාර්ශ්වයේ සියලු මන්ත්‍රීවරුන් මෙතැනට පැමිණ සිටින බැවින් කාරණයක් මතක්

කරන්න ඕනෑ. අපි බොහොම සන්තෝෂ වෙනවා තමුන්නාන්සේලා ඊයේ කරපු කාර්ය භාරය පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේරීම් කාරක සභා ක්‍රමය සම්බන්ධයෙන් ජෝන් අමරතුංග මැතිතුමා ඉදිරිපත් කළ කාරණා සමඟ මම එකඟ වෙනවා. එය ඉතාම උචිත ක්‍රමයක්. මම හිතනවා සාර්ථක ක්‍රමයක් විධියට ඉදිරියේදී අපට ගොඩාක් ඵල නෙළා ගන්න පුළුවන් ක්‍රමයක් බවට මෙය පත් වේවි කියලා. මෙහි විනිවිදභාවයක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, මෙය නිලධාරි මහත්වරුන්ට ගරු මන්ත්‍රීවරුන් සමඟ බොහොම විවෘතව කථා කරන්න පුළුවන් ක්‍රමයක්. මෙතැන කථා කරනවාට වැඩිය දෙගොල්ලන් තුන්ගොල්ලන්ටම ප්‍රශ්න පිළිබඳව ඉතාම සුහදව, ඉතාම හොඳින් කථා කර ගන්න පුළුවන් ක්‍රමයක්. මා ඒ තත්ත්වය දැකපු හින්දයි කියන්නේ. මේ රටේ අනාගතය වෙනුවෙන් එය හොඳ ක්‍රමයක් කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඵලදායිතාව සහ මානව සම්පත ගැන අප කථා කරන්න ඕනෑ. දශක ගණනක යුද්ධයකට පස්සේ අද රටේ ආර්ථික සංවර්ධන වේගය ඉදිරියට යද්දී ඵලදායිතාව තුළිනුත් රට ඉස්සරහට යන්න ඕනෑ. අපි විශ්වාස කරනවා, මේ රට ඵලදායිතාව තුළින් තවත් ඉස්සරහට යන්න නම් මේ රටේ විශාල ආකල්පමය වෙනසක් ඇති වෙන්න ඕනෑ කියා. ඒක තමයි පළමුවැනි දේ. අපි මේ පිළිබඳව හොඳ විශ්ලේෂණයක් කළා; සොයා බැලුවා. මේ රටේ අපි පුරුදු වූ නරක පුරුදු ගණනාවක් තිබෙනවා. කාලයක් අපේ රට නා නා මාදිළියේ ජාතීන්ට යටත් වෙලා තිබුණා. ඊට පස්සේ දශක තුනක යුද්ධයකට අපි මැදි වෙලා සිටියා. මේ ඔක්කෝමත් සමඟම අපේ රටේ සංවර්ධන වේගය වැඩි වෙද්දී එය තවත් වේගවත් කරන්න මේ රටේ සියලු දෙනාගේම ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයි කියන විශ්වාසයෙන් අපි ඉන්නවා. ඒ වාගේම ඒ තුළින් මේ රටේ මානව සම්පත ඉදිරියට රැගෙන යන්න ඕනෑ. මොකද, මේ රටේ භෞතික සම්පත් ඕනෑ තරම් තිබෙනවා. ඉතාම හොඳ මානව සම්පතක් තිබෙනවා. මේ මානව සම්පතත් ඉතාම හොඳට දියුණු කරන්න අප උත්සාහ ගතහොත් අපේ ඉලක්ක කරා හඹා යන්න අපට පහසු වෙනවා. මම උදාහරණ කීපයක් ගෙන හැර දක්වනවා. සිංගප්පූරුව වාගේ රටක් ගත්තොත් එහි භෞතික සම්පත් කිසිවක් නැහැ. සිංගප්පූරුවට වතුර ටික ගෙනෙන්නේත් අල්ලපු රට මලයාසියාවෙන්. නමුත් සිංගප්පූරුව මානව සම්පත සියයට සියයක් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කර ගෙන තිබෙනවා. අපේ රටේ අපට අවශ්‍ය විධියට භෞතික සම්පත තිබෙනවා. අප අපේ මානව සම්පත කළමනාකරණය කර ගත යුතුයි කියන ස්ථානයේ අපි පැහැදිලිවම ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මෙතැනදී මේ රටේ මාධ්‍යයෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ මාධ්‍ය මඟින් මේ ආකල්පමය වෙනස වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. අපි දැක්කා දශක තුනක් කර ගෙන ගිය යුද්ධයේ අවසාන වකවානුවේ, එනම් අවසාන අවුරුදු හතේ අපේ යුද්ධය අවසන් කරන්න අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නායකත්වය දෙද්දී රටේ ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කරන්න මේ රටේ මාධ්‍යයට පුළුවන් වුණු බව. මාධ්‍යයෙන් ඇති කළ රටේ ජනතාවගේ ආකල්පමය වෙනස කුමක්ද? මේ යුද්ධය මොන ආකාරයකින් හරි ඉවර කළ යුතුයි කියා රටේ ජනතාවගේ මනස මාධ්‍ය විසින් එක තැනකට ගෙනාවා. එදා මා හිටපු අපේ එක්සත් ජාතික පක්ෂයට මේක තේරුම් ගන්න බැරි වුණා. ඒ ගැන මම කනගාටු වෙනවා. නමුත් මාධ්‍යයට පුළුවන් වුණා, මේ යුද්ධය ඉවර කළ යුතුයි කියලා රටේ ජනතාවගේ අදහස් එක තැනකට ගෙනෙන්න. එතැනදී යුද්ධය ඉවර කිරීම සඳහා රටේ ජනතාව ආණ්ඩුවට වඩා ඉදිරියෙන් සිටියා. මා ඒකයි කියන්නේ ආකල්පමය වෙනස මේ රටේ ජනතාව තුළ ඇති කරන්න මේ රටේ මාධ්‍ය නායකත්වය ගත යුතුයි කියලා. රජයකට විතරක් මේ දෙය කරන්න බැහැ. අපේ අමාත්‍යාංශය පුංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනහතරක් තෝරා ගෙන, යම්කිසි මිනුම් දඬු කිහිපයක් තෝරා ගෙන මේ ආකල්පමය වෙනස ඇති කරන්න වැඩ පිළිවෙළ කිහිපයක් ලෑස්ති කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සිරිතක් විධියට හුඟක් මහ ජනතාව බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? උත්පත්තියේ සිට මරණය දක්වා රජය බලා ගත යුතුයි කියන එකයි. උප්පැන්න සහතිකයේ ඉඳලා මරණ සහතිකයත් රජය දෙන්න ඕනෑ. දැන් මේ ආකල්පය අපි කොහෙන් හරි වෙනස් කරන්න ඕනෑ. මේ රටේ ජනතාවට දෙපයින් නැඟී සිටින්න පුළුවන්; ඔවුන්ට විශාල කාර්ය භාරයක් කරන්න ශක්තිය තිබෙනවා. නමුත්, ඔවුන්ගේ සිතුම් පැතුම් අපි යම් ආකාරයකින් වෙනස් කළ යුතුයි. මෙන්න මේ අනුව අපි මේ රටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක ගම්වල ප්‍රජා ව්‍යාපෘතියක් -නියාමක ව්‍යාපෘතියක්- පටන් ගත්තා. අපේ බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමාත් මේ ගැන දන්නවා. එතුමාගේ මැතිවරණ කොට්ඨාසයේත් අපි මේ ව්‍යාපෘතිය පටන් ගත්තා. මේකේදී අපි ගමකින් තරුණ තරුණියෝ, එහෙම නැත්නම් වැඩිහිටියෝ දහ දෙනෙකු තෝරා ගත්තා. තමන්ගෙන් රටට වෙන්න ඕනෑ මොනවාද කියන ආකල්පය ඇති අය එක වසමකින් දහ දෙනා බැගින් -ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් තුන් හාරසියයක්- තෝරා ගෙන දවස් දෙක තුනක් පුහුණු කළා. පුහුණු කරලා ඔවුන්ව නැවත ගමට දැම්මේ මොකක් සඳහාද? අපි රුපියලක ආධාරයක්වත් ඔවුන්ට දුන්නේ නැහැ. ඔවුන්ට දුන්නේ දැනුම විතරයි. හැම වසමකම දහ දෙනා බැගින් අරගෙන ඔළුව වෙනස් කරලා ආපසු ගම්වලට දමලා කිව්වේ මොකක්ද? මේ ආකල්පමය වෙනස ඇති පවුල් 50ක් තමන්ගේ වසමේ හදා ගන්නය කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ අපි කරපු මේ වැඩසටහනේ සාර්ථකත්වය සියයට 70කට වඩා වැඩියි. එහෙම නම් මේක මේ රටේ ක්‍රියාත්මක කරන්න පුළුවන් දෙයක්. දැන් බලන්න, මේ රටේ ඉන්න කම්මැලියෝම දහ දෙනා අරාබියට ඇරියොත් කොහොමද කියා. ඒ තරම් දක්ෂ වැඩ කාරයෝ කණ්ඩායමක් හොයා ගන්න වෙන්නේ නැහැ. අපි පිට රටවල්වලට ගිහිල්ලා බොහොම උජාරුවෙන් කථා කර කර ලංකාවට එනවා. ඇවිල්ලා මොකක්ද කරන්නේ? ඒ රටේ දේවල් කථා කරලා, අපි කන චුයිංගම් එකේ කොළේ පාරට දමනවා; කෙසෙල් ලෙල්ල පාරට දමනවා. නැත්නම් ඉස්සෙල්ලාම අල්ලපු ගෙදර ඉන්න මිනිහාට ඇඟිල්ලක් දිගු කරනවා. එහෙම නම් අපි මේ ප්‍රජා ඵලදායිතාව තුළින් බලාපොරොත්තු වුණේ මොකක්ද? අපි මේ ජනතාව දැනුවත් කෙරුවා, ඉස්සෙල්ලාම තමන්ටම ඇඟිල්ලක් දිගු කර ගන්න ක්‍රමය ගැන. ඒ කියන්නේ, අපෙන් වෙන්න ඕනෑ වැඩ කොටස වෙනවාද කියන තත්ත්වයට මේ ආකල්පමය වෙනස මේ රටේ ඇති කළ යුතුයි. වෙන කාගෙන්වත් නොවෙයි, තමන්ගෙන් වෙන්න ඕනෑ වැඩ කොටස වෙනවාද කියා බලන්න ඕනෑ. තමන්ගෙන් වෙන්න ඕනෑ වැඩ කොටස වෙනවා නම්, අපේ සංවර්ධන වේගය හිතනවාටත් වඩා ඉක්මනට බඹ ගණනක් ඉස්සරහට අරගෙන යන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඒ වැඩ පිළිවෙළ ගැනත් සාකච්ඡා කරලා දැන් කටයුතු කරගෙන යන අවස්ථාවේ, ඵලදායිතා සම්මානයක් දෙන්න දැන් අපි මේ රටේ ලෑහැස්ති කරලා තිබෙනවා. මෙච්චර කාලයක් ඵලදායිතා සම්මාන සඳහා මුළු රටින්ම අපට ඉල්ලුම් පත්‍ර ලැබුණේ සීයයි, දෙසීයයි. මේ මොහොත වෙද්දී ඉල්ලුම් පත්‍ර 2,100ක් ලැබිලා තිබෙනවා. වැඩිපුරම ඉල්ලුම් පත්‍ර ලැබී තිබෙන්නේ රාජ්‍ය ආයතනවලිනුයි. එහෙමනම් රාජ්‍ය ආයතනවල ආකල්ප හොඳ අතකට හැරී ගෙන යන බව අපට පෙනෙනවා. මගේ මිත්‍ර ගරු නවීන් දිසානායක මැතිතුමා මේ සභාවේ ඉන්නවා. මා එතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා මේ රටේ රාජ්‍ය සේවකයින්ගේ උසස් වීම් දෙන්න ඕනෑ කාර්යක්ෂමතාව මත පමණයි කියලා මම ඇමති මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කළා. ප්‍රතිපත්තියක්

[ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා]

හැටියට ඒ යෝජනාව පිළිගෙන තිබෙනවා. අපි මේ සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ; මිනුම් දඬු සකස් කරන්න ඕනෑ. මොකද, මුදල් ඇමතිතුමා අවුරුද්දේ අන්තිමට ජාතික අය වැයෙන් මුදල් වෙන් කරනවා, රාජ්‍ය සේවක මහත්වරුන්ගේ overtime, batta, උසස් වීම් සඳහා. ඉබේටම ඒවා ටික ලැබෙනවා. නමුත් කාර්යක්ෂමතාව පිළිබඳව ඇගැයීමක් කරන්නේ කවුද? අන්න එතැනට අපි එන්න ඕනෑ. ඒ කාර්යක්ෂමතාව තුළ පමණක් ඉදිරි කාලයේදී මේ රටේ රාජ්‍ය සේවක මහත්වරුන්ගේ උසස් වීම් ලබා දෙන්න කටයුතු කළොත්, වෙනත් රටවල්වල කරන ආකාරයට මේ රටේ අපේ රාජ්‍ය සේවයේත් කාර්යක්ෂමතාව මේ වාගේ දෙගුණයක් වනවාට කිසිම සැකයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම දන්නවා, තමුන්නාන්සේ මා දිහා බලන්නේ ඇයි කියලා. කොහොම නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේට වේලාව ගැන මතක් කරන්නයි බැලුවේ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකල්පමය වෙනස ඇති කරන්න අද අපේ අතිගරු ජනාධිපතිතුමා නායකත්වය දීලා තිබෙනවා. එතුමා පැහැදිලි ලෙස ප්‍රකාශයක් කෙරුවා. බලන්න, මීට පෙර මේ රට ගැන මුළු ලෝකයම කථා කළේ අසමත් රාජ්‍යයක් විධියටයි. මුළු ලෝකයේම තිබුණු ඒ ආකල්පය මේ රට වෙනුවෙන් වෙනස් කරන්න අද එතුමාට පුළුවන් වී තිබෙනවා. අසමත් රාජ්‍යය අද සමත් රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ ආර්ථික වර්ධන වේගය සියයට 8ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ලෝකයේ අවට තිබෙන රටවල් දිහා බලද්දී ඒ රටවල ආර්ථික වර්ධන වේගය අඩු වෙලා තිබියදී, ආකල්පමය වර්ධනය තුළින් මේ රටට ඉස්සරහට යන්න පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම අපේ ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. මේ වර්ෂයේ අපට දීලා තිබෙන මුදල් ප්‍රමාණයෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් වේවි කියා විශ්වාස කරමින් අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරි මහත්වරුන්ටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ. භා. 11.28]

**ගරු එස්. බී. නාවින්න මහතා (පාරිභෝගික සුබ සාධනය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - நுகர்வோர் நலன்புரி அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Consumer Welfare)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා වෙන අමාත්‍යාංශ අතරින් පාරිභෝගික ශුභ සාධන අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

මෙය 2011 දී ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කරන ලද අතර, පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර එම ප්‍රතිපත්ති හා සැලසුම් ආශ්‍රිත කටයුතු පිළිබඳව අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීමත්, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ අධීක්ෂණය කිරීමත් මෙමඟින් සිදු කිරීමට අපේක්ෂිතයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 දී පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය පාරිභෝගික ශුභ සාධනය හා රැකවරණය පිළිබඳව දැනට පවතින තත්ත්වය පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කිරීම, ශ්‍රී ලංකාවේ පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී වැදගත් වන පාර්ශ්ව හා ආයතන හඳුනා ගැනීම, පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳ කැබිනට් පත්‍රිකාවක් සකස් කිරීම යන කාර්යයන් සිදු කළා.

පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පහසුකම් සැලැස්වීමට හා සම්බන්ධීකරණය කිරීමට පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය සැලසුම් කරනු ලබයි. එහිදී මා මීළඟට සඳහන් කරන ක්‍රියාකාරකම් 2012 වසර තුළදී සිදු කිරීමට අපේක්ෂිතයි. ආර්ථික විද්‍යාව හා අනෙකුත් විෂයන්වල අර්ථ දැක්වීම් ද සැලකිල්ලට ගනිමින් ගෝලීය දැනුම පදනම් වූ සමාජයක් තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භය තුළ පාරිභෝගික ශුභ සාධනය අර්ථ දැක්වීම, පාරිභෝගික ශුභ සාධනය හා රැකවරණය පිළිබඳ දැනට ඇති ශ්‍රී ලාංකීය හා ජාත්‍යන්තර වූ ප්‍රතිපත්ති ලේඛන, පාර්ලිමේන්තු අණපනත්, ගැසට් දැන්වීම් ආදිය එක්රැස් කොට අධ්‍යයනය කිරීම, පාරිභෝගික ශුභ සාධනය හා රැකවරණය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ මට්ටමේ සාකච්ඡා පැවැත්වීම, මෙම ප්‍රතිපත්ති සම්පාදනයේදී විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතු වෙළෙඳ පොළ ආර්ථිකයේදී වඩාත් අවදානමට ලක් වූ තත්ත්ව හා කණ්ඩායම්වල වාර්තා අධ්‍යයනය කිරීම, පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී වැඩසටහන් සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීම, පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ප්‍රතිපත්තිය හා ජාතික වැඩ පිළිවෙළෙහි කෙටුම්පත සකස් කිරීම, පාරිභෝගික සමිති, නිෂ්පාදන කණ්ඩායම්, ව්‍යාපාර මණ්ඩල, වෘත්තිය මණ්ඩල, සිවිල් සමාජ සංවිධාන, විවිධ පාරිභෝගික කණ්ඩායම්, මාධ්‍ය හා උනන්දුව දක්වන අනෙකුත් කණ්ඩායම් ආදී වශයෙන් වූ මෙම ප්‍රතිපත්තියට අදාළ විවිධ පාර්ශ්වකරුවන් සමඟ මෙම ප්‍රතිපත්තිය පිළිබඳව සාකච්ඡා පැවැත්වීම, මෙම කෙටුම්පත පිළිබඳව පොදු ජනතාවගේ අදහස විමසීම, මේ සඳහා පුවත් පත් දැන්වීම් හා පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ වෙබ් සයිට් භාවිත කිරීම, ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලැස්ම අවශ්‍ය ලෙස සකස් කිරීම හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම, ප්‍රතිපත්ති නිර්දේශ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය අදාළ නීති සම්පාදනය සඳහා අවශ්‍ය පියවර ගැනීම, මෙම ප්‍රතිපත්තීන්හි නිර්දේශ අදාළ අමාත්‍යාංශ හරහා නිසි ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම පිණිස නියාමන යාන්ත්‍රණයක් සංස්ථාපිත කිරීම එම කාරණා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරිභෝගික ශුභ සාධනය ලෝකයේ දියුණු රටවල දක්නට ලැබෙන ඉතාමත් වැදගත් විෂය ක්ෂේත්‍රයක්. පාරිභෝගික ශුභ සාධනය තුළින් නිෂ්පාදනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීම සඳහා පාරිභෝගික රැකවරණය පිළිබඳ සැලකිලිමත් වීම අත්‍යවශ්‍යයි. අප හැමෝම පාරිභෝගිකයෝ. අප විවිධ අවස්ථාවල, විවිධ ආකාරයේ පාරිභෝගිකයෝ බවට පත් වෙනවා. පාරිභෝගිකයා කියන්නේ තමන්ගේ ඍජු පාරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම කරනු ලබන හෝ මිලදී ගැනීමට ගිවිස ගනු ලබන පුද්ගලයින්. අද හැම අමාත්‍යාංශයක්ම, දෙපාර්තමේන්තුවක්ම පාරිභෝගිකයා පිළිබඳ කටයුතු කරනවා. එය හුදෙක් අභ්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යාංශයට පමණක් සීමා වෙනවා කියලායි බොහෝ විට සිතෙන්නේ. නමුත් සෞඛ්‍ය, ධීවර, අධ්‍යාපන ආදී වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍ර පුරා එය පැතිර යනවා. එක අතකින් රජයේ සේවය ලබන සෑම පුරවැසියෙකුම, රජයට බදු ගෙවන්නන් වශයෙන් තවත් විධියකට පාරිභෝගිකයින් වෙනවා. අපි, කඳ වෙළෙන්දන්ගෙන්, බයිසිකල්කරුවන්ගෙන්, ගමේ පොළෙන්

භාණ්ඩ ලබා ගත්ත සමාජයක ඉඳලා ඉන්ටර්නෙට් හරහා භාණ්ඩ හා සේවා ලබා ගන්නා වූ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යයක් දක්වා අද දියුණු වෙලා තිබෙනවා. අද එය ජංගම දුරකථනයක් මිලදී ගනු ලබන "මොබයිල් වාණිජ්‍යයක්" දක්වා දියුණු වෙලා තිබෙනවා.

එදා කද වෙළෙන්දාගේ ජංගම වෙළෙඳාම, අපේ ගමට රටට සීමා වූ වෙළෙඳාම අපේ දේශ සීමාවලින්, කරදිය වළල්ලෙන් එපිටට ගිය ගෝලීය වාණිජ්‍යයක්, ගෝලීය ආර්ථිකයක් දක්වා අද ව්‍යාප්ත වෙලා. මේ පිළිබඳව බුද්ධිමත්ව කල්පනා කරපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, දියුණු ආර්ථිකයක් තිබෙන ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ ශ්‍රේෂ්ඨ පරමාර්ථයෙන් වැඩ කරනවා.

පාරිභෝගිකයා ඉතාම වැදගත්. ඒ නිසා අපි ජාත්‍යන්තර මට්ටමේ දියුණු පාරිභෝගිකයකු නිර්මාණය කළ යුතු වෙනවා. ඒ නිසා පාරිභෝගික ශුභ සාධනය පිළිබඳ ජ්‍යෝෂ්ඨ අමාත්‍ය කාර්යාලයක් ස්ථාපිත කරලා ඒ පිළිබඳව ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කරන්න, ඒ සඳහා අදාළ වූ අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරන්න කටයුතු යොදලා තිබෙනවා.

පසු ගිය අවුරුදු කීපය තුළ පාරිභෝගික රැකවරණය පිළිබඳ විවිධ ක්‍රියා මාර්ග අපේ රජය අරගෙන තිබෙනවා. විශේෂයෙන් "ආහාර පනත" ඇතුළු විවිධ අණපනත් ගෙන ඒමට සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේදී කටයුතු කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් යටතේ පාරිභෝගික ශුභ සාධනය කටයුතු පිළිබඳ ජ්‍යෝෂ්ඨ අමාත්‍ය කාර්යාලය මේ පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වූ තත්ත්වය අධ්‍යයනය කරලා අපේ රටට ගැළපෙන අපේම වූ ජාතික ප්‍රතිපත්ති රාමුවක් හා වැඩ පිළිවෙළක් සකස් කරන්න මුල පුරා තිබෙනවා. සියලුම අමාත්‍යාංශ සම්බන්ධීකරණය කිරීමටත්, අනතුරුව මෙම වැඩපිළිවෙළ ඊට අදාළ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කිරීමටත්, එය ජ්‍යෝෂ්ඨ අමාත්‍ය කාර්යාලය යටතේ අධීක්ෂණය කිරීමටත් බලාපොරොත්තු වෙනවා. මෙම වැඩ පිළිවෙළ සඳහා අපි ඔබ සියලු දෙනාගේම සහාය බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව සකස් කළ වැඩ පිළිවෙළට කැබිනට් මණ්ඩලය ගිය සතියේ අනුමැතිය ලබා දුන්නා. ඒ අනුව මෙම වැඩසටහන ජාතික වැඩසටහනක් ලෙස අප ක්‍රියාත්මක කරනවා. අපි "මහින්ද චින්තන ඉදිරි දැක්ම"තුළින් බලාපොරොත්තු වෙන්නේ ශක්තිමත්, දියුණු ශ්‍රී ලාංකිකයකු නිර්මාණය කරන්නයි. එහිදී ශක්තිමත්, තාර්කික, බුද්ධිමත්, දැනුවත් පාරිභෝගිකයකු නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වෙනවා.

ගෝලීයකරණයට විරුද්ධ වෙලා අපට එයින් ඉවත් වෙන්න බැහැ. අපි ගෝලීයකරණයට සාර්ථකව මුහුණ දෙන්න නම් ශක්තිමත් පාරිභෝගිකයකු නිර්මාණය කරන්න වෙනවා. වෙළෙඳ දැන්වීම්, අළෙවිකරණය පිළිබඳව තාර්කිකව හිතන්න පුළුවන් බුද්ධිමත්, දැනුවත් වූ පාරිභෝගිකයකු බිහි කරන්න අවශ්‍යයි. ඒ වාගේම මෙම සංකීර්ණ සමාජ තත්ත්වය තුළ අවදානමට ලක්වන තත්ත්ව හා ප්‍රජාව ආරක්ෂා කරන පාරිභෝගික ශුභ සාධන වැඩ පිළිවෙළක් මේ රට දියුණු කිරීමේදී ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙනවා. මේ ප්‍රතිපත්ති රාමුව හා වැඩ පිළිවෙළ තුළින් ඒ සඳහා අත්තිවාරමක් දමන්න අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් අපි ඉතාම සන්තෝෂ වෙනවා, මේ අමාත්‍යාංශවලට අදාළ විශේෂ කාරක සභා අවස්ථාවේදී විපක්ෂය වෙනුවෙන් අපේ ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාත්, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් අපේ සාකච්ඡාවලට සහභාගි වීම ගැන. ඒ සහභාගි වීමෙන් එතුමන්ලාගෙත්, අපේ අමාත්‍යාංශයේත් අවශ්‍යතාවන් එකිනෙක හඳුනා ගැනීමට ලැබුණා. මේ වැඩ පිළිවෙළ ඉතාම කාර්යක්ෂම කිරීම සඳහා එතුමන්ලා එදා ලබා දුන්න සහයෝගය ඉදිරි කටයුතු සඳහාත් ලබා දෙනවා ඇතැයි බලාපොරොත්තු වෙමින්, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුදකරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ. භා. 11.38]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් අවසරයි. මම මුලින්ම මේ අමාත්‍යාංශවලට අදාළ විශේෂ කාරක සභාවට මගේ අවංක ආදර ස්තුතිය පළ කරන්න ඕනෑ, අපේ විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන පස් අවුරුදු සැලැස්ම ඉදිරියට ගෙන යැමට, එය අධීක්ෂණය කිරීමට, සම්බන්ධීකරණ කටයුතු කිරීමට ඒ අවශ්‍ය මිලියන 60ක මුදල වෙන් කරලා දෙන්න යෝජනා කරලා තිබීම හා ඒකට සම්පූර්ණ සහාය දක්වා තිබීම ගැන. එහි ඇති වැදගත්කම තේරුම් අරගෙන තිබෙනවා. ඒ වාගේම මම සන්තෝෂ වෙනවා, භාණ්ඩාගාරය එකඟ වීම ගැන එවැනි මුදලක් අපට එන අවුරුද්දේ ලබා දෙන්න. මේ කටයුතු හරියාකාරව ක්‍රියාත්මක කළොත් අපේ රටේ අනාගතයට බලපාන ආකාරයට ලොකු වෙනසක් ආර්ථික සංවර්ධන පැත්තෙන් ඇති කරන්න පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප තේරුම් ගත යුතුව තිබෙනවා රටක් හැටියට භාණ්ඩ හා සේවා අපනයනය කරන තරමට අපේ ආර්ථිකය දියුණු වනවාය කියන කාරණය. එහෙම තමයි හැම රටක්ම දියුණු වෙලා තිබෙන්නේ. එය කිරීමට තාක්ෂණය තමයි අත්‍යවශ්‍ය. විශේෂයෙන්ම උසස් තාක්ෂණය එකතු කරපු තරමට තමයි රටක් හැටියට අපට දියුණු වන්න පුළුවන් වන්නේ. දැනුම කේන්ද්‍ර කර ගැනීමේ වැදගත්කම මහින්ද චින්තනය පිළිගෙන තිබෙන බව අපි දන්නවා. අපි වැඩි බරක් දමා තිබෙන්නේ තොරතුරු තාක්ෂණය දියුණු කිරීමටයි. තොරතුරු තාක්ෂණයෙන් කෙරෙන අලුත් සොයා ගැනීම් සීමිතයි. තොරතුරු තාක්ෂණය, තිබෙන දැනුම පහසුවෙන් ප්‍රචලිත කිරීමේ මාර්ගයක් වනවා. නමුත් නව සොයා ගැනීම් කරපු තරමට තමයි දැනුම කේන්ද්‍ර වන්නේ. ඒ සඳහා පර්යේෂණ කරන්න ඕනෑ. පර්යේෂකයන්ගේ සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ. විශ්වවිද්‍යාලවල පර්යේෂකයන් සඳහා වන පහසුකම් දියුණු කරන්න ඕනෑ. මේ පස් අවුරුදු සැලැස්ම හරහා ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ.

අපි යටත් විජිත ආකල්පය අත් හැරලා අමු ද්‍රව්‍ය අපනයනය කරන රටක් හැටියට නොවෙයි, පුළුවන් තරම් උසස් තාක්ෂණය යොදවමින් ඒ අමු ද්‍රව්‍යවලට වැඩිම අගයක් එකතු කරන්න කටයුතු කරන්න ඕනෑ. එහෙම කරලා ඒ භාණ්ඩවල ගුණාත්මකභාවය පැත්ත දියුණු කිරීමෙන්, ඒ වාගේම මිල අඩු කිරීමෙන් තමයි ලෝක වෙළෙඳ පොළේ තරගකාරී තත්ත්වයක් ඇති කරන්න අපට පුළුවන් වන්නේ. එහෙම කරපු තරමට තමයි අපේ ආර්ථිකය නිසි ලෙස දියුණු කරන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වටිනාකම වැඩි කිරීම පැත්තෙන් බැලුවාම, ජීව තාක්ෂණය, electronics තාක්ෂණය, mechatronics තාක්ෂණය වැනි උසස් තාක්ෂණ උපයෝගී කර ගෙන රටවල් කීපයක්ම ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. මීට හොඳම උදාහරණයක් තමයි, කොරියාව. 1960 ගණන්වල අපට වඩා හතර ගුණයක් අඩුවෙන් ඒක පුද්ගල ආදායමක් තිබුණු කොරියාව ගිය අවුරුද්ද වනකොට අපට වඩා විසි ගුණයකට වැඩි ඒක පුද්ගල ආදායමක් ඇති කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඒ අය ඒ තත්ත්වයට ආවේ ඒ රට තුළම උසස් තාක්ෂණය උපරිම ලෙස දියුණු කර ගෙන ආර්ථිකය ඉදිරියට ගෙන ගිය නිසායි.

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

අපේ රටේ අපනයන දිහා බැලුවාම මට කියන්නත් කනගාටුයි, සියයට දෙකකටත් අඩු ප්‍රමාණයක් තමයි ඒවාට උසස් තාක්ෂණය එකතු කරලා තිබෙන්නේ. දියුණු වෙච්ච රටවල් දිහා බැලුවාම සම්පූර්ණයෙන්ම ඊට වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. ජපානයේ අපනයනවලට සියයට අසූපහකට වඩා උසස් තාක්ෂණය එකතු කරලා තිබෙනවා. කොරියාවේ ඒ ප්‍රමාණය සියයට හැත්තෑවකට වැඩියි. සිංගප්පූරුවේ ඒ ප්‍රමාණය සියයට හැටකට වැඩියි. මැලේසියාවේත් සියයට පනහකට වැඩියි. තායිලන්තය ගිය අවුරුද්දේ සියයට විසිහතක් අපනයනවලට උසස් තාක්ෂණය එකතු කළා. නමුත් අපේ රටේ ඒ ප්‍රමාණය තවම සියයට දෙකකටත් අඩු මට්ටමක තමයි තිබෙන්නේ. ඉතින් මේ තත්ත්වය වෙනස් කිරීම අත්‍යවශ්‍යයි. එහෙම කළොත් තමයි නියම සංවර්ධනයක් ඇති කරමින් දුප්පත්කම නැති කරන ගමන ඉදිරියට ගෙන යන්න රටක් හැටියට අපට පුළුවන් වන්නේ.

අපේ පස් අවුරුදු විද්‍යා තාක්ෂණ නවෝත්පාදන ක්‍රමෝපාය සකස් කරලා තිබෙන්නේ ඒ අරමුණ ඉෂ්ට කිරීමටයි. සම්බන්ධීකරණයත්, අධීක්ෂණයත් කරන ගමන් ඒ අදාළ අමාත්‍යාංශවලට - line ministries - තමයි ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න තිබෙන්නේ.

ඉතින් මේකට නිසි සම්බන්ධීකරණ යන්ත්‍රයක් ගොඩනඟන්නට තිබෙනවා. ඒක හරියාකාරව ගොඩනඟලා, අපි යෝජනා කරන ආකාරයේ වැඩ කොටසක් කරන්නට ඒ අමාත්‍යාංශවලටත් නිසි මුදලක් ලැබුණොත්, එතකොට තමයි අපට මේ ගමන සාර්ථකව ඉදිරියට ගෙන යන්නට පුළුවන් වන්නේ. ඉතින් එය කිරීමට මුදලක් අවශ්‍ය වෙයි. අපි දැන් මේ ඉල්ලා තිබෙන මුදල සෑහෙන්නේ අර අධීක්ෂණය කිරීමේ යන්ත්‍රය ගොඩනැඟීමටයි. එතැනින් එහා මෙය ක්‍රියාත්මක කිරීමට ඒ අදාළ අමාත්‍යාංශය හරහා කටයුතු කරන්නට ඕනෑ. උදාහරණයක් හැටියට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට තමයි, PhD උපාධිධාරී විද්‍යාඥයින් පිට කරන්නට සිදු වන්නේ. ඉතින් ඒ අංශය ශක්තිමත් කරන්නට ඕනෑ; දියුණු කරන්නට ඕනෑ. ඒකයි මා අය වැය කථාව සම්බන්ධයෙන් විවාදය අවස්ථාවේ දී ඉල්ලීමක් කළේ, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල දෙතුන් ගුණයකින් වැඩි කරන්නට ඕනෑයි කියලා. ද්විතීය පාසල්වල රසායනාගාර දියුණු කරන්නට ඕනෑ. ඉතින් අපි ඒ ආකාරයට අවශ්‍ය මිනිස් සම්පත අප රටේ ඇති කළොත්තින් තමයි මේ ගමන අපට හරියට ඉදිරියට යන්න පුළුවන් වන්නේ. ඒක කරනවාත් එක්කම අර පර්යේෂණත් කරන්නට ඕනෑ. කර්මාන්ත ක්ෂේත්‍රය වන්නට පුළුවන්, වැවිලි ක්ෂේත්‍රය වන්නට පුළුවන්, කෘෂිකර්ම අංශය වන්නට පුළුවන් මේ හැම අංශයකම පර්යේෂණ ඉහළ මට්ටමකට නංවන්නට තිබෙනවා. අපේ රටේ අමු ද්‍රව්‍යවලට උපරිම වටිනාකමක් ඇති කරන ආකාරයේ පර්යේෂණ තුළින් තාක්ෂණය දියුණු කරන්නටත් ඕනෑ. සමහර අයගේ හැඟීමක් තිබෙනවා, අපට පිට රටවලින් අවශ්‍ය තාක්ෂණය ලබා ගන්නට පුළුවන් කියලා. ඒක කවදාවත් ලැබෙන්නේ නැහැ. අර cutting edge තාක්ෂණය, ඒ කියන්නේ ලෝකයේ ප්‍රමුඛ තැනක් ගන්නා තාක්ෂණය ඒ රටවල්වල දියුණු කළාට ඒවා අපට දෙන්නේ නැහැ. අපට දෙන්නේ, ඒකට දෙවැනි මට්ටමේ තාක්ෂණයක්. අපිම අපේ තාක්ෂණය දියුණු කරලා තමයි අපට ඔබින ආකාරයට අපේ කර්මාන්තකරණයත් නිසියාකාරව ඇති කරන්නට පුළුවන් වන්නේ. ඉතින් මේ ගමන තමයි රටක් හැටියට අපට යන්නට තිබෙන්නේ. මම ප්‍රාර්ථනා කරනවා ඉදිරි කාලයේ දී භාණ්ඩාගාරයට මෙහි වැදගත්කම හරියට තේරුම් ගෙන කටයුතු කරන්නට හැකි වේවි කියලා. ඒ සඳහා දැන් මේ අය වැයෙන් හොඳ අඩිතාලමක් දමලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ තේරීම් කාරක සභාවේ අනුමැතිය පදනම් කරගෙන අපේ මේ සම්බන්ධීකරණ කටයුත්තට සහාය දීමට ඉදිරිපත් වෙලා තිබෙනවා. මා බලාපොරොත්තු වනවා, ඉදිරි කාලයේ දී ඒ සඳහා දේශීය මුදල් මදි වුණොත් විදේශීය මාර්ගවලිනුත් අවශ්‍ය මුදල ලබා ගෙන මේ පස් අවුරුදු සැලැස්ම හරියාකාරව දියුණු කිරීමට අවශ්‍ය සහාය ලබා දෙයි කියලා. ඒ තුළින් අපේ රටේ නියම සංවර්ධන ගමනක් ඉදිරියට ගෙන යන්නට ශක්තිය ධෛර්ය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ. භා. 11.48]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)

(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපේ රට ඉදිරියට ගෙන යාමට මේ කාලය තුළදී විශාල වැඩ කොටසක් අනුගමනය කරනවා. මෙවර අය වැය ලේඛනයෙන් යෝජනා 100ක් විතර ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ගමට, ගෙදරට, පුද්ගලයාට මේ වැඩ පිළිවෙළ ගෙන යාම සඳහා "දිවි නැඟුම" වැඩසටහන සකස් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා - මා දැනුත් එම සාකච්ඡාවකට සහභාගි වෙලායි ආවේ - ගෙවල් 25,00,000ක් මේ "දිවි නැඟුම" වැඩසටහනට සම්බන්ධ කර ගෙන ඒ ගෙවල්වල තිබෙන ආර්ථික පරිසරය, ආර්ථික තත්ත්වය දියුණු කරන්නට.

අපි බලාපොරොත්තු වනවා, එක පැත්තකින් දුප්පත්කම නැති කරන්න, අනික් පැත්තෙන් පෝෂ්‍යදායි ආහාරයක් ජනතාවට ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න. "දිවි නැඟුම" වැඩ පිළිවෙළ යටතේ සෑම ගෙදරකටම තමන්ට කෑමට අවශ්‍ය අලුත් එළවලු වගා කරන්න, තමන්ට අවශ්‍ය වන පලා ටික වගා කර ගන්න, ඒ වාගේම තමන්ට අවශ්‍ය කුකුළන් ඇති කරන්න, එළුවන් ඇති කරන්න, කිරි හරක් ඇති කරන්න, ඒ වාගේම සත්ත්ව පාලනයට, කුඩා කර්මාන්ත ඇති කරන්න ආදි මේ ආකාරයෙන් තම තමන් කැමැති දෙයක් තෝරා ගෙන ඒ අයගේ ආර්ථිකය දියුණු කර ගන්න අපි කටයුතු කරනවා. පරණ වෙලා තිබෙන එළවලුවල ගුණය අඩුයි; පෝෂණය අඩුයි. වේළුණු එළවලුවල පෝෂණය අඩුයි; ගුණය අඩුයි. ගෙවත්තේ වගා කර ගත් අලුත් එළවලුවල ගුණය වැඩියි; පෝෂණය වැඩියි. ඒ වාගේම සමහර එළවලු වර්ගවලට තෙල් ගහලා විකිණීමට ගෙනෙනවා. ඒවායේත් එක්තරා ප්‍රමාණයක අගුණයක් තිබෙනවා. ඒක ශරීරයට එතරම් දැනෙන්නේ නැහැ. නමුත් කලකදී ටිකක් දැනෙන්න පුළුවන්. එම නිසා අපි තෙල් ගහන්නේ නැතිව, කොම්පෝස්ට් පොහොර යොදා, නිරෝගීකම සහ පෝෂණය රැකෙන පරිදි එළවලු වගා කරන්න උත්සාහ කර ගෙන යනවා. එම නිසා අපි ඒ ගම්වල ගොවීන්ට බීජ සපයා, පැළ තවාන් සකස් කරලා පැළ ලබා දීලා ඒ වගාවන් කර ගෙන යන්න කටයුතු කර ගෙන යනවා.

අපේ බලාපොරොත්තුව, එයින් නවතින්න නොවෙයි. මෙවර අය වැය ලේඛනයෙන් යෝජනා කළා, ගෙවතු විසිපන්ලක්ෂයේ වැඩසටහන යටතේ එළවලු, පලතුරු හා මල් වගාවන් පුළුල් කිරීම සඳහා අක්කර දෙකහමාර දක්වා කුඩා ගෙවතු ඇතුළත් කර ගන්න. එම ගොවීන්ට සහන පිළිවෙළට පැළ ජාති, ඇට ජාති නොමිලේ ලබා දෙන්න කටයුතු කරනවා. අපි පොල් පැළ නොමිලේ බෙදා දෙනවා. පොල් ගස් හතරක්, පහක් තිබෙන පවුලකට වර්ෂයටම කන්න පොල් ලබා ගන්න පුළුවන් වනවා. පොල් කිරිවලින් තමයි ව්‍යඤ්ජන සකස් කරන්නේ. පොල් තෙල් පාවිච්චි කරලා තමයි ඉවුම් පිහුම් කරන්නේ. ඒ වාගේම හිසේ ගාන්න පවා පාවිච්චි කරන්නේ පොල් තෙල්. එම නිසා අපට පොල් අත්‍යවශ්‍ය දෙයක්. මේ අවුරුද්දේ දැනට පොල් පැළ ලක්ෂ 15ක් විතර බෙදා දීලා තිබෙනවා. ලබන අවුරුද්දේ මුල් භාගයේ තව පොල් පැළ ලක්ෂ 5ක් විතර බෙදා දෙන්න කටයුතු කරනවා. පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ පොල් වගා කිරීමේ

මණ්ඩලයෙන් ඒ පොල් පැළ ලබා ගන්නවා. පොල් පැළයක් රුපියල් 65ටයි අපි ලබා ගන්නේ. රුපියල් 65ට අරගෙන නොමිලේ බෙදා දෙනවා. ඒ ආකාරයට -

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Sir, I rise to a point of Order. පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ඉක්මනට කියන්න කෝ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Mike එක දෙන්නේ නැහැ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Kabir Hashim, what is your point of Order?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

Mike එක නැතුවට කියන්න බැරි යැ. Mike එක නැතුවත් කියන්න පුළුවන්. කියන්න.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමා, ඔබතුමා පොල් ගැන කථා කරන කොට, කෑගල්ල දිස්ත්‍රික්කය රබර් ආශ්‍රිත ප්‍රදේශයක් නිසා මට මතක් වුණා, මාවනැල්ල රබර් කර්මාන්තශාලාව පුද්ගලයකුට විකුණන්න යන බව. ඒක පෞද්ගලීකරණය කරන්න යනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

That is not a point of Order. Hon. Minister, you carry on.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

මා කථා කර ගෙන යන මාතෘකාව ඒක නොවෙයි. එතුමාට ඕනෑ කරන -

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

කෑගල්ල දිස්ත්‍රික්කයට අදාළ සම්පතක් විකුණන්න යනවා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

රබර් වගා කරන අයටත් අපි පොහොර සහනාධාරය දීලා, පැළ සපයා ඒ සංවර්ධනය කර ගෙන යනවා. ඒ වගාව වර්ධනය කර ගෙන යනවා. තමුන්නාන්සේටත් රබර් වතු, තේ වතු තිබෙනවා නේ. ඒ පොහොර සහනාධාරය එක්තරා ප්‍රමාණයකට තමුන්නාන්සේටත් ලැබෙනවා. ඉතින් වගා කරලා පොහොසත් වන්න.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

කුඩා රබර් වතු හිමියන්ට සේවයක් කරනවා නම් මේ රබර් කර්මාන්තශාලාව පුද්ගලයකුට විකුණන්න යනවාද?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

නැහැ, නැහැ. කිසිම පුද්ගලයකුට විකිණීමක් කරන්නේ නැහැ. [බාධා කිරීමක්] නැහැ. විකුණන්නේ නැහැ. [බාධා කිරීමක්] විකුණන්නේ නැහැ. ඒකේ අයිතිය රජයට තියා ගෙන පාලනය තමයි භාර දෙන්නේ. පාලනය භාර දීලා වඩා ක්‍රමවත් කරන්න තමයි අදහස් කරලා තිබෙන්නේ. ඒ වැඩ පිළිවෙළ ඇති කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එළවලු පැළ විතරක් නොවෙයි පලතුරු පැළ බෙදා දීලා තිබෙනවා ලක්ෂ ගණනක්. පොල් පැළ ලක්ෂ ගණනක් බෙදා දීලා තිබෙනවා. ඒ වාගේම බීජ වර්ග 5ක් ඒ ගෙවල්වලට සපයන්න අපි කටයුතු කරලා තිබෙනවා. මේ අනුව අපි උත්සාහ කරන්නේ, අපේ බලාපොරොත්තුව වන්නේ ඉදිරි කාලයේදී ඒ විධියට තවත් අක්කර දෙකහමාරක් දක්වාත් ඒක ව්‍යාප්ත කරලා නීරෝගිකමට වුවමනා කරන පෝෂණය ලබා දෙන, ශරීරයට ශක්තිය ලබා ගන්නා වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්නයි. අපි කුකුළු පැටව් නිකම් දෙනවා. එළුවෝ නිකම් දෙනවා. කිරි එළදෙනුන් නිකම් දෙනවා. ඒ වැඩ පිළිවෙළ අපි සකස් කරලා තිබෙනවා. ඒ වාගේම තේ වවන අයට තේ පැළ ලබා දීලා අපි උදව් කරනවා. රබර් පැළ ලබා දීලා රබර් වගා කරන්න උදව් කරනවා. ඒ ආකාරයට අපි කෘෂිකර්මය පැත්තෙන් ලොකු වෙනසක් ඇති කරන්න උත්සාහ කර ගෙන යනවා. අපි පිට රටින් ගෙන්වනවා කුරක්කං, මුං ඇට, මිරිස් හා මීපැණි ආදී දේවල්. ලබන අවුරුද්දේ අපි "දිවි නැඟුම" වැඩසටහන යටතේ ඉලක්ක කර ගෙන යනවා, ඒ මදි ප්‍රමාණය මේ රටේ වගා කරලා එක පැත්තකින් ගොවියාටත් ආදායම වැඩි කර ගන්න අවස්ථාවක් ලබා දෙන්න. ඒවා වගා කිරීමට ගොවියාට උදව් කරන්න සහන සලසන්න, උපකරණ සපයා දෙන්න අපි උත්සාහ කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දේශීය වෛදකමට, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට ඕනෑ කරන බෙහෙත් වර්ග -වියළි ඒවා- අපි ගෙන්වනවා ඉන්දියාව, ඒ වාගේම තවත් රටවල් කිහිපයකින්. නමුත් අපි උත්සාහ කරනවා, පිට රටින් ගෙන්වනවා වෙනුවට "දිවි නැඟුම" වැඩසටහන යටතේ බෙහෙත් උයන් හදලා ඒවාට පැළ සයන්න. ඒ පුද්ගලයන්ට පුළුවන් ඒවා වගා කරලා ආදායම් ලබා ගන්න, තිබෙන ආදායම වැඩි කර ගන්න. එතකොට පිට රටින් ගැනීමත් වළකිනවා. පිට රට යන මුදලත් අපට ඉතුරු වෙනවා. ඒ වාගේම අලුත් අලුත් බෙහෙත් ද්‍රව්‍යවලින් හදන බෙහෙත්වල ගුණයත් වැඩි වෙනවා. දැන් ඒ කාර්යයන් ඒකාබද්ධ කරලා වැඩ පිළිවෙළ සකස් කරලා දෙන කටයුත්තට අපි සම්බන්ධ වෙනවා. ඒ වැඩ පිළිවෙළ මමත්, අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත්, අපේ අනෙක් ඇමතිවරුත් එකතු වෙලා ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා පිට රටින් ගෙනෙන බෙහෙත් පැළ අඩු කරලා, පිට රටින් ගෙනෙන ඒවායේ අවශ්‍යතාව නැති කරලා, මේ රටේම නිෂ්පාදනය කරලා ගොවීන්ට දියුණු වෙන්න වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ අනුව නව යුගයකට මේ රට ගෙනි යන්න පවුල් 25 ලක්ෂයකට මේ විධියේ වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න කටයුතු කර ගෙන යන බව මතක් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.57]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ තෝරා ගත්තු අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන්න පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම ඉතාම වැදගත්, ඒ වාගේම විශේෂ කටයුත්තක් කියලා මම හිතනවා. මොකද, ඒ තේරීම් කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට ඒ අත් දැකීම් මට විශේෂ වුණා. මට කලින් කථා කරපු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේම ආණ්ඩු පක්ෂයේ ද, විපක්ෂයේ ද භේදයෙන් තොරව, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අමාත්‍යාංශවලින් වන කාර්ය භාරය පිළිබඳව තිබෙන ගැටලු විවෘතව සාකච්ඡා කරන්න පුළුවන් අවස්ථාවක් බවට ඒ කාරක සභා අවස්ථාව පත් වුණා. නමුත් අපි විපක්ෂය හැටියට සමහර කාරණා මේ ගරු සභාවේදී මතු කළාම බොහෝ වෙලාවට ආණ්ඩු පක්ෂයේ ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා ඒකට කියන්නේ, එහෙම නැත්නම් ඒකට උත්තර බඳින්නේ එකඟ නොවන පදනමක ඉඳලා.

නමුත් අපි එතැනදී දැකපු දේ තමයි -ඒ කාරක සභාවේ දී විෂයයන් සාකච්ඡා කරද්දී දැකපු දේ තමයි- අමාත්‍යාංශවල නිලධාරි මහත්වරුන්, අමාත්‍යතුමන්ලා, විපක්ෂයේ ආණ්ඩු පක්ෂයේ හැම දෙනාම ඒ අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව ප්‍රමුඛතාව දීලා - ඒක විපක්ෂයෙන් ඉදිරිපත් කරන මතයද, ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරන මතයද කියන එක නොසලකා- වැදගත් කාරණා සාකච්ඡා කරන්න අවස්ථාව ලැබුණ බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ප්‍රධාන සභා ගර්භයේ සාකච්ඡා වන මාතෘකා ජන මාධ්‍යයට විවෘත කර තිබෙනවා වාගේ ලබන අවුරුද්දේ අය වැය විවාදයේදී මේ තේරීම් කාරක සභාවේ විෂය පථයට ගන්නා මාතෘකාත් ඒ තේරීම් කාරක සභාවේ සාකච්ඡා කරන කරුණුත් ජනමාධ්‍යවලටත්, මාධ්‍යවේදීන්ටත් සහභාගි වෙලා ඒවා වාර්තා කරන්න අවස්ථාව ලබා දෙන්නය කියලා මම යෝජනා කරනවා. සමහරවිට මාධ්‍යවේදීන් සහභාගි වන විට මේ තරම් විවෘතව කථා නොකරයි ද දන්නේ නැහැ නේද, ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමනි. නමුත් ඇත්තටම ඒක වැදගත්.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
මම එකඟයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා එකඟයි. ඇත්තටම ඒක හොඳයි. මොකද, ඒ විවෘතභාවය හරි වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ලබන වර්ෂයේ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරද්දී මේ තේරීම් කාරක සභාවට මාධ්‍යවේදීන්ටත් සහභාගි වන්නට අවස්ථාව ලබා දෙන්නය කියලා මම යෝජනා කරනවා. මෙහිදී මතු කරන කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි සාකච්ඡාවට ලක් කරපු ආයතන හැටියට ගත්තොත් වැදගත් අමාත්‍යාංශ ගණනාවක් තිබෙනවා. ඒ වාගේම හිටපු ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළුව අපේ රටේ දේශපාලනයේ කෘතහස්ත අමාත්‍යවරු ගණනාවකගේ අමාත්‍යාංශවල විෂය පථයන් මෙහිදී සාකච්ඡාවට ලක් වුණා. අමාත්‍යාංශ 16ක් විතර තිබුණා වුණත් ඒ හැම එකක් ගැනම වෙන වෙනම කථා කරන්න තරම් කාලයක් නැහැ.

මම විශේෂයෙන්ම අවධාරණයට ලක් කරන්න ඕනෑ, අපි සාකච්ඡාවට ලක් කළ අපේ හිටපු නියෝජ්‍ය කථානායක ගරු පියංකර ජයරත්න අමාත්‍යතුමාගේ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය. ඇත්තටම සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතට ගැනෙන ප්‍රධාන විෂයයක් තමයි මිහින් ලංකා ආයතනය. මිහින් ලංකා ආයතනය ආරම්භ කරන්නේම තරගකාරී ආයතනයක් හැටියටත්, ඒ වාගේම අභ්‍යන්තර ගුවන් සේවාවන් සහ විශේෂයෙන් රටවල් හැටියට ගත්තොත් ඉන්දියාව ඇතුළු සාර්ක් කලාපයේ රටවල් අතර ගුවන් පහසුකම් ලබා දීම වැනි කාරණා සඳහායි. මේක "අහසත් අපේ" කියන සංකල්පයෙන් තමයි පටන් ගත්තේ.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)
"නිල් අහස"

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, "නිල් අහසත් අපේ" කියලා තමයි පටන් ගත්තේ. නමුත් ඒ ආයතනයේ 2007/2008 වර්ෂයේ පාඩුව රුපියල් මිලියන 3,356යි. 2008/2009 පාඩුව රුපියල් මිලියන 4,657යි. 2009/2010 පාඩුව රුපියල් මිලියන 5,722යි. ඊට අමතරව දැනට තිබෙන ණය බර රුපියල් බිලියන 2.4යි. ඒ වාගේම Airport & Aviation Services එකෙන් ගත්ත ණය රුපියල් මිලියන 500ක් ගෙවලා නැහැ. මේ ආයතනය පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දීත් වාර්තා වුණා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ඩිව් ගුණසේකර මැතිතුමා මෙතැන ඉන්නවා. මම ඒ කාරක සභාවේ වාර්තාව ගැනයි කියන්නේ. මේ ආයතනය රුපියල් මිලියන 381.7ක OD එකක් බලාපොරොත්තු වුණා. මේ OD එකක් කියන්නේ පිටින් ගන්න එකක් නොවෙයි. මේ අයිරාව ගන්නේත් රජයෙන්. ආයතනයක් පාඩු වන්න පුළුවන් එක අවුරුද්දක්. ඊළඟ අවුරුද්දේ ලාභ ලබන්න පුළුවන්. හැබැයි, මේක දිගින් දිගටම පාඩු ලබන ආයතනයක්. 2007/2008 පාඩුව වාගේ දෙගුණයක් වනවා 2009/2010 පාඩුව.

අද මෙම ආයතනය මුදල් නාස්ති කරන, ඇත්තටම මුදල් ගිලින ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. මම මේ කියන්නේ මේක ගරු ඇමතිතුමාගේ වගකීම විතරක් නොවෙයි කියන එකයි. මේ විධියට ඒ පවතින ශක්‍යතාව, තත්ත්වය හරිහැටි

විශ්ලේෂණය කරන්නේ නැතිව පෞද්ගලික අභිලාෂයන් වෙනුවෙන් "අහසත් අපේ, පොළොවත් අපේ, ගොඩ බිමත් අපේ, අතන මෙතැන හැම තැනම අපේ" කියා ගෙන ආයතන පැටව් ගැහුවාට පස්සේ සිදු වන විපත්තිය තමයි මේ. ඒක ඊට පස්සේ කවුරු හෝ ඇමතිතුමෙකුගේ වග කීමට යටත් කළාය කියා වැඩක් වන්නේ නැහැ. අපි කවුරුත් විවෘතව දන්නවා, මේ මිහින් ලංකා ආයතනය මේ තරම් නාස්තිකාර ආයතනයක් මට්ටමට පත් වුණේ කොහොමද කියා; ඒකට වග කියන්න ඕනෑ කවුද කියා. ප්‍රශ්නය තිබෙන්නේ තවම කිසිම වග කිවයුත්තෙක් නැතුව රුපියල් මිලියන ගණන්, ලක්ෂ දහස් ගණන් නාස්ති කරන ආයතනයක් බවට මෙය පත් කර තිබීමයි. මේවා රාජ්‍ය මුදල්.

අපේ රටට ගුවන් සේවයක් තිබෙන එක හොඳයි. අපි කවුරුත් දන්නවා, Air Lanka එක විනාශ කළා; Emiratesලා කෑවා; මේක ගිල්ලා කිය කියා අපි හැම දාම මේ පාර්ලිමේන්තුවේ කථා කළ බව. මුදල් නාස්ති කරන එක ආයතනයක් වෙනුවට දැන් තව එකක් හදා ගෙන. මේවා ඇත්තටම අපි විවෘතව කථා කළ යුතු දේවල් බවට පත් වී තිබෙනවා. ඒ නිසා මා අවධාරණය කරනවා, රටේ මුදල් ගිලින, ජනතාවගේ බදු මුදල් ගිලින ආයතන කිහිපයක් තිබෙන බව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීත් අවධාරණයට ලක් වූ ඒ ආයතන ගැන නැවත නැවතත් අවධාරණය කරන්න සිදු වී තිබෙනවා. එකක්, මිහින් ලංකා ආයතනය. ඒක අද මේ විෂය යටතේ කථා කරන අමාත්‍යාංශයක් යටතට අයිති වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන කනගාටුව මේකයි. මිහින් ලංකා ආයතනයේ අවුරුද්දක පාඩුව රුපියල් මිලියන 5,722ක් වන විට 2012 අවුරුද්දට ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු හැම දෙනාටම වෙන් කරන්නේ රුපියල් මිලියන 420යි. බලන්න. ගුවන් සමාගමක් -මිහින් ලංකා ආයතනය- අවුරුද්දකට රුපියල් මිලියන 5,722ක් පාඩු කරන විට ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු දොළොස් දෙනෙකුට අපි වෙන් කරන්නේ රුපියල් මිලියන 420යි. ඒ කියන්නේ ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් සියල්ල එකතුව රුපියල් මිලියන 420යි. කල්පනා කර බලන්න. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ විෂය පථය කථා කරන වෙලාවේ මම කිව්වා, සමහර අමාත්‍යවරුන්ට අවුරුද්දටම වෙන් කරන්නේ රුපියල් ලක්ෂ 30යි කියා. රුපියල් මිලියන 3යි. අපේ හිටපු අගමැතිතුමාත් ඉන්නවා. දේශපාලන ජීවිතයේ විවිධ මතිමතාන්තර තිබුණාට එතුමන්ලා අපි ගරු කරන්න අමාත්‍යතුමන්ලා. අමාත්‍යවරයකුගේ මුළු අමාත්‍යාංශයටම වෙන් කරන්නේ රුපියල් ලක්ෂ 40යි. එහෙම තමයි වෙන් කර තිබෙන්නේ. එතකොට කිව්වා, ඒ ලේකම්තුමන්ලා ඉල්ලලා තිබෙන ගණන තමයි කියා. සමහර තර්ක ආවා, ආවරණය වන වෙනත් අමාත්‍යාංශ තිබෙනවා කියා. අනිකුත් අමාත්‍යාංශවලින් මේවා ආවරණය කරනවා කියා. මිහින් ලංකා ආයතනයේ පාඩුව රුපියල් මිලියන 5,722යි. මිහින් ලංකා කියන එක ආයතනයක් රුපියල් මිලියන 5,722ක් පාඩු කරන විට ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් ඔක්කොටම රුපියල් මිලියන 400යි වෙන් කරන්නේ. මොන තරම් විහිළුවක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පියසේන ගමගේ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයත් මේකට අයිති වනවා. එතුමා ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක්. එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලය ඉදිරිපත් කර තිබෙන පොත මා කියෙව්වා. එහි එතුමාගේ කටයුතු හැටියට තිබෙන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස හඳුන්වන ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය බලා කියා ගැනීමයි. බලා කියා ගැනීමට කිසිවෙක් නොමැති හා නිවෙස්වල සිටියද තම දරුවන් විසින් නොසලකන ලද අසරණ වූ වැඩිහිටියන්. ඇත්තටම අපේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමන්ලාත් ඒ මට්ටමේ තමයි. මම එහෙම කිව්වාට සමා වන්න. තමන්ගේ නිවසේ ඉන්නවා; හැබැයි, බලා කියා ගැනීමට කවුරුත් නැති මට්ටමට පත් වී සිටිනවා. මෙතුමන්ලාත් බලා කියා ගැනීමට කිසිවෙක් නොමැති, නිවෙස්වල හිටියද තම දරුවන් නොසලකන අය කියා තමයි මට හිතෙන්නේ. ආණ්ඩුව කියන නිවසේ හිටියාට මේ ආණ්ඩුවේ වත්කම් තිබෙන ධනය තිබෙන දරුවෝ සලකන්නේ නැති අය බවට පත් වී තිබෙනවා. සල්ලි තිබෙන දරුවෝ ඉන්නවා. ඒ සල්ලි තිබෙන දරුවෝ තමයි මිහින් ලංකා ආයතනයට රුපියල් මිලියන 5,722ක් පාඩු වෙන්න ඉඩ සලසා තිබෙන්නේ. කාර් රේස් තියනවා. අයිෆා සිනමා උළෙල පවත්වනවා. නොලැබෙන තරගයක් ගන්න පොදු රාජ්‍ය මණ්ඩලයට රුපියල් කෝටි 800ක් විතර වියදම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මා කියන්නේ මේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට තම දැනුමෙන් බුද්ධියෙන් මහා සේවයක් කරන්න පුළුවන් බවයි. එය පිළිගන්නවා. මෙතුමා කියන කාරණාව ඇත්ත. රටේ බලා කියා ගන්න කවුරුත් නැති වැඩිහිටියෝ වැඩි කොට්ඨාසයක් ඉන්නවා. මේ මුළු ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමන්ලාම එහෙම තමයි. ඒ මට්ටමට පත් කර තිබෙනවා. තමන්ගේ නිවසේ හිටියත් සල්ලි තිබෙන දරුවෝ බලා ගන්නේ නැහැ.

මා පෞද්ගලිකව හිතන විදිය මම කිව්වේ. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ වැය ශීර්ෂවලට මීට වඩා මුදල් වෙන් කරන්නට ඕනෑ. එහෙම කියන කොට තර්කයක් ආවා සමහර අමාත්‍යාංශවලින් ඒ අමාත්‍යාංශ බලා ගන්නවාය කියා. එහෙම බැහැ නේ. අපේ අම්මලා තාත්තලා ගත්තත්; වැඩිහිටියෙක් වුණාම වයසට ගියාම වියදම් කරන්න තමන්ටම කියලා කීයක් හරි තියෙන්නට ඕනෑ. එතකොට තමයි ආත්ම ගෞරවයක් ඇතිව ජීවත් වන්නට පුළුවන් වන්නේ; කොන්ද කෙළින් තියා ගෙන ඉන්න පුළුවන් වන්නේ. ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශවල නිකම් ඉන්නේ නැහැ. අමාත්‍යාංශයක් කියා කියන්නේ මුළු රටක් ආවරණය වන විධියට කටයුතු කරන තැනක්. ගරු අමුණුගම අමාත්‍යතුමාගේ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යාංශය රටෙන් පිටත් -පිට රටත්- ආවරණය කරනවා. හැබැයි ඉතින් වියදම් කරන්න සල්ලි නැහැ. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යාංශය කිව්වාට, ගරු අමුණුගම ඇමතිතුමාට පිට රට ගිහින් ණය ගන්න සාකච්ඡා කරලා එන්න - tours දෙකක් ගිහින් එන්න- අමාත්‍යාංශයට සල්ලි තියේවිද කියා මම දන්නේ නැහැ. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යාංශය වුණාට විදේශ ගමනක් යන්න මුදලුත් නැහැ.

අපේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඊළඟ ශත වර්ෂය වෙනුවෙන් මේ රට දියුණු කරන්න සිහින දකිනවා. අපේ රටේ අනාගතය දකින්න අපට වෙන අමාත්‍යාංශයක් නැහැ නේ. මේකෙන් තමයි එළිය දකින්න ඕනෑ. මොකක්ද දැන් කරන්නේ? මම කියන්නේ ඒකයි. වැඩිහිටියන්ට සලකන්නට ඕනෑ තමයි. හැබැයි මේ කරන්නේ නොසලකන විධියට සැලකිල්ලක්; නොසලකන සැලකිල්ලක්. අපේ රටේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට කර තිබෙන දෙය තමයි මේ කියන්නේ.

මා පෞද්ගලිකව ඔබතුමන්ලා හැම දෙනාටම මම ගරු කරනවා. ඒ ගරු කිරීම තිබෙන නිසායි මා මේවා කියන්නේ. සල්ලි තියෙන දරුවෝ නොසලකන තත්ත්වයට එතුමන්ලා පත් කර තිබෙනවා. අපේ ගරු පියසේන ගමගේ ඇමතිතුමාගේ පොතේ තියෙන වැඩිහිටියන් හඳුනා ගැනීමේ එක category එකක් ඒක. ඔබතුමාගේ පොතේ වැඩිහිටියන් හඳුනා ගැනීමේ categories හතරක් තිබෙනවා. එකක් තමයි බලා ගැනීමට කිසිවකු නොමැති, නිවෙස්වල හිටියාට තම දරුවන් නොසලකන වැඩිහිටියා. මේ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුත් එහෙමයි. ඊළඟට තිබෙනවා, රජයේ, පළාත් සභා හා පෞද්ගලික අංශය පවත්වා ගෙන යන වැඩිහිටි නිවාසවල ජීවත් වන වැඩිහිටියා. ඔබතුමන්ලාත් ඒ මට්ටමට තමයි පත් කරලා තිබෙන්නේ. එම නිසා මා කියන්නේ මේක ඇත්තටම අසාධාරණ තත්ත්වයක් කියායි. ජනවාරි 01 වන දා ඉඳලා පරිපූරක ඇස්තමේන්තු දාලා වැඩක් නැහැ. පරිපූරක ඇස්තමේන්තුවලින් නොවෙයි, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට තමන්ගේ දේශපාලන ජීවිතයේ තිබෙන ගරුත්වය සහිතව අමාත්‍ය ධුරය පවත්වා ගෙන යන්නට අමාත්‍යාංශය මෙහෙයවන්නට පුළුවන් ආකාරයේ ප්‍රතිපාදනයක් තිබෙන්නට ඕනෑ. නැත්නම් මේක විහිළුවක්. මම ඒකයි කිව්වේ, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් හැම

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

දෙනාටම වෙන් කර තිබෙන ප්‍රමාණයයි, මිහින් ලංකා ආයතනයේ පාඩුවයි සංසන්දනය කළෝතින් තත්ත්වය කොහොම ද කියා හිතා ගන්නට පුළුවන් කියලා. එක පැත්තකින් -මේ වචනය කිව්වාට වැඩි නැහැයි කියා මම කියන්නේ - මේ ගරු අමාත්‍යතුමන්ලාගේ දේශපාලන ජීවිතයටත් එක්ක සිද්ධ වන යම් අපහාසයක් මේක. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිසා මම ඒක නිර්භීතව කියනවා. යම් අපහාසයක් මේක. මේ තත්ත්වය වළක්වන්න මේ ආණ්ඩුව පියවර අර ගෙන නැහැ කිය එක තමයි අවධාරණය කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අවධාරණය කළ යුතු, සාකච්ඡා කළ යුතු තවත් අමාත්‍යාංශයක් තමයි පෞද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශය. එම අමාත්‍යාංශය භාරව ඉන්නේ ගරු සී.බී. රත්නායක ඇමතිතුමායි. එතුමාත් අපේ රටේ දේශපාලනයේ බොහොම වගකීම් දැරූ කෙනෙක්. විශේෂයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයේදී, පශු සම්පත් ක්ෂේත්‍රයේදී ඒ වාගේම බොහෝ ආයතනවල විශාල වගකීම් දැරූ කෙනෙක්. එතුමා අද ගැමුණු විජේරත්න මහත්මයාටත් වඩා පහළ තත්ත්වයට වැටී තිබෙනවා කියායි මා කියන්නේ. මොකද, පෞද්ගලික බස් සේවයේ අද අභියෝග කරන්නා බවට පත් වී තිබෙන්නේ ගැමුණු විජේරත්නයි. ඒකට පිළිතුරු දෙන්නා බවට පත් වී තිබෙන්නේ ගරු වෙල්ගම ඇමතිතුමා. ප්‍රතිවාදියා ගරු වෙල්ගම ඇමතිතුමායි. ඊයේ-පෙරේදාත් මම දැක්කා, ගැමුණු විජේරත්න එක පැත්තකින් අභියෝග කරන කොට -ඔහු හරියට පෞද්ගලික බස් ඇමති වාගෙයි. ගරු සී.බී. රත්නායක ඇමතිතුමාගේ රාජකාරිය කරන්නේ ඔහු.- ඒකට උත්තර දෙනවා ගරු වෙල්ගම ඇමතිතුමා. ගරු වෙල්ගම ඇමතිතුමා අර බජාර් එකේ භාෂාවෙන් "මම ලැහැස්තියි, මම තමයි leader" කියලා යනවා. එතකොට ගරු සී.බී. රත්නායක ඇමතිතුමාගේ රාජකාරිය මොකක් ද? එතුමාගේ අමාත්‍යාංශයේ වගකීම මොකක් ද? එක පැත්තකින් පෞද්ගලික බස්රථ කණ්ඩායමක් ඉන්නවා; කල්ලියක් වාගේ අභියෝග කරනවා. ඊට පස්සේ ටික දවසක් යන කොට වෙල්ගම ඇමතිතුමා අභියෝග කරනවා. ඊට පස්සේ මේ අභියෝගයට මගී ජනතාව පීඩාවට පත් වෙනවා. පාරට බැස්සාම බලන්න ඕනෑ අද strikeද, නැද්ද කියලා. එහෙමයි යන්න වෙලා තිබෙන්නේ. ඇත්තටම මට තේරෙන්නේ නැති දේ තමයි පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යවරයා කියන අමාත්‍ය ධූරය මොකක්ද කරන්නේ කියන එක.

මා මේ සියල්ල කියන්නේ ගරු සී.බී. රත්නායක අමාත්‍යතුමාට තිබෙන දේශපාලන පිළිගැනීම, එතුමාට තිබෙන දේශපාලන ගෞරවය සහිතවයි. මේක එතුමා සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. ගරු සී.බී. රත්නායක ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවකදී හෝ කියන්න, මෙවැනි තත්ත්වයක් නිර්මාණය වුණොත් ඇත්තටම මොකද වෙන්නේ කියන එක. දැන් මෙහෙම විටින් විට පෞද්ගලික බස් සේවයේ අය අභියෝග කරලා බස් ගාස්තු වැඩි කරන්න කථා කරනවා. සියයට 10කින් වැඩි කරන්න කථා කළාම ආණ්ඩුව සියයට 07කින් වැඩි කරනවා. දැන් ඔබතුමාට පැවරිලා තිබෙන්නේ මේ වැඩි කිරීමේ ප්‍රකාශය නිකුත් කරන්නා බවට පත් වෙන්නයි. ඒ කියන්නේ වෙල්ගම ඇමතිතුමා අභියෝගය භාර ගත්තොත් ගොඩ; නැත්නම් බැහැ. එහෙම හරි යන්නේ නැහැ. අපි දන්නවා අපේ රටේ පෞද්ගලික බස් සේවයක් තිබෙන බව.

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලිකප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයේදී මා ප්‍රකාශ කරන්න කැමැතියි ගැමුණු විජයරත්න මහතා සභාපතිත්වය දරන පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය පමණක් නොවෙයි, ලංකාවේ තවත් සංගම් ගණනාවක් තිබෙන බව. නමුත් ඒ චරිතය පමණක්ම ඉස්මතු කර ගෙන අපි කථා කරනවා නම් ඒක වැරදියි කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම මෙහි යථාර්ථයට -සත්‍යයට- මුහුණ දෙන්නේ පුද්ගලික ප්‍රවාහන සේවා ඇමතිවරයා හැටියට මමයි. මාධ්‍ය සංදර්ශනයකට මා ගියේ නැතත් ඒක පෞද්ගලිකව ප්‍රකාශ කරමින් ඒ සඳහා ක්‍රියාත්මක වෙන්න, මගී ජනතාව ආරක්ෂා කර ගන්න මා නිරන්තරයෙන්ම සූදානම් වෙනවා. ඒ නිසා මා ගැන කථා කරපු එක ගැන මා සතුටු වෙනවා. නමුත් මේ කාර්යයේ වගකීම මම භාර ගෙන තිබෙනවා. ඒ නිසා මේ බස් කර්මාන්තය ඔහුට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මගී ජනතාවට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කරන්න මා සූදානම් වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මා ඔබතුමාට යෝජනා කරන්නෙත් ඔබතුමාට පුළුවන් නම් අඩු තරමින් මේ තිබෙන ඒකාධිකාරිත්වය හෝ වෙනස් කරන්නය කියන එකයි. ඒක තමයි ඔබතුමාගෙන් මේ මොහොතේ ඉටු වෙන්න ඕනෑ එකම දේ.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

පැහැදිලිවම ඔබතුමාට 2012 වර්ෂයේ වෙනසක් දකින්න පුළුවන් වේවි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේම සංචාරක කර්මාන්තය දියුණු කිරීම යැයි කියමින් අලුතින් පටන් ගත්ත ව්‍යාපෘතියක් තමයි ගරු ඇමතිතුමනි, මුහුදු ගුවන් යානා -seaplanes- ව්‍යාපෘතිය. මම ඇත්තටම එකම එක දෙයක් දැන ගන්න කැමැතියි. මේ seaplane ව්‍යාපෘතිය වාගේ දෙයක් රටේ මොනවා හෝ තත්ත්වයක් යටතේ, තෝරා ගත්ත ජලාශ කිහිපයක හෝ, සංචාරක කර්මාන්තය ඉලක්ක කර ගෙන කරනවාට අපට විවාදයක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ඒ නිසා පරිසරයට වන හානිය පිළිබඳවයි. මිරිදිය මත්ස්‍ය කර්මාන්තය කියන්නේ අපේ රටේ වැදගත්ම දෙයක්. මිරිදිය මත්ස්‍ය කර්මාන්තයට සිදු වන හානිය, ඒ ප්‍රදේශවල ජනතාවට වන බලපෑම පිළිබඳව පරිසර ශක්‍යතා අධ්‍යයනයක් කරලාද මේ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ? මේ ප්‍රශ්නය උපදේශක කාරක සභාවේත් මතු වෙච්ච ප්‍රධාන ප්‍රශ්නයක්.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු මන්ත්‍රීතුමනි, මෙය ආරම්භ කරන්න පෙර ආයතන 5කින් නිසි අවසරය ලබා ගෙන තිබෙනවා. පරිසර අධිකාරිය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු ආයතන පහක අවසර ඇතිවයි අපි මේ කටයුත්ත කරන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, "නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ" වාගේ තත්ත්වයක් තිබෙන රටක අවසර ගන්න එක ලෙහෙසියි. අවසර ගන්න හරි ලෙහෙසියිනේ. නමුත් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අවසන් කරනවා.

ඒක නිසා අවසර ගන්න පුළුවන්. ප්‍රශ්නය තිබෙන්නේ අවසර ගැනීම වාගේම ඒ seaplane ව්‍යාපෘතිවලින් ජනතාවට වන හානිය පිළිබඳවයි. මොකද, අපි කවුරුත් අවසානයේ අවසර ගන්න ඕනෑ ජනතාවගෙන්නේ. මේවා ක්‍රියාත්මක කරන්න ගියාට පස්සේ -

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමා, සිදු වන හානිය මොකක්ද කියලා කියන්නකෝ. ඒක දැන ගන්න ඕනෑ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මීගමුව කළපුවේ බස්සන්න ගිහිල්ලා මොකද වුණේ?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
එතැන ඇවිත් තිබෙන්නේ දේශපාලන ප්‍රශ්නයක්. නමුත් සාකච්ඡා කරලා අපි ඒක කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේවා දේශපාලන ප්‍රශ්න කියලා ලඝු කරන්න එපා. හොඳ දේවල් හොඳ විධියට ක්‍රියාත්මක කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාල වේලාව අවසන්. [බාධා කිරීමක්]

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමා, මීගමුව කළපුව සම්බන්ධයෙන් ආවේ දේශපාලන ප්‍රශ්නයක්. එහිදී seaplanes පිළිබඳ සමහර අයගේ විරෝධයක් නැහැ. අනික ධීවරයෝ නොවෙයි ඒ විරෝධයට ආවේ. පිට අය හිටියේ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මට කියන්න, හානිය කියලා අදහස් කරන්නේ මොකක්ද කියලා. මොකක්ද හානිය?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, අපේ රටේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ක්‍රියාත්මක වනවා. දැන් ඔබතුමන්ලා පුවත් පත්වල පළ කරපු ජලාශ ලැයිස්තුවක් තිබෙනවා. ඒ ලැයිස්තුවට අනුව seaplanes බැස්සුවොත්, ඒ ජලාශ පාවිච්චි කරන්න වෙන්නේ ඒකට විතරයි. අපි දන්නවා, seaplane එකක් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය කරන ජලාශයකට බස්සනවා කියන්නේ එයින් ඒ කර්මාන්තයට බරපතළ හානියක් වෙනවාය කියන එකයි. මා කියන්නේ මේකයි. ඔබතුමන්ලා මේ ව්‍යාපෘතිය කරන්න. හැබැයි හොඳ විධියට කරන්න. එසේ කියමින් විශේෂයෙන් නැවත වතාවක් -[බාධා කිරීම්] මේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට වැඩිහිටි නිවාස මට්ටමින් සලකන්න එපා, ඊට වඩා දේශපාලන ගරුත්වයක් ඇතිව සලකන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා.12.19]

**ගරු පියසේන ගමගේ මහතා (ජාතික සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியசேன கமகே - தேசிய வளங்கள் அமைச்சர்)
(The Hon. Piyasena Gamage- Minister of National Resources)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික සම්පත් සුරැකීම අරමුණු කර ගනිමින් පරිසරය, ඉඩම්, ඒ වාගේම වනජීවී, ජාතික උරුමයන්, සංස්කෘතික හා රාජ්‍ය සම්පත් ආදී විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කරුණු අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීමත්, ඒ වාගේම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ජාතික සම්පත් උපරිම වශයෙන් දායක කර ගැනීමත් ඉලක්ක කර ගනිමින් අදාළ ආයතන සමඟ වැඩසටහන් සම්පාදනය කිරීම, සම්බන්ධීකරණය කිරීම තමයි මගේ අමාත්‍යාංශයට නැත්නම් මාගේ විෂයයට ඇතුළත් වන්නේ.

රාජ්‍ය සම්පත්වලින් පාඩු ලබන ආයතනවල පාඩුව අවම කර ගැනීමට අවශ්‍යයි. පාඩු ලබන ආයතනවලින් ලාභ ලැබීමට වඩා පාඩු ලබන ආයතනයේ පාඩුව අවම කර ගැනීම වැදගත් වනවා. ඒක එක අංශයක් වනවා. අනෙක් පැත්තෙන් ලාභ ලබන ආයතන කළමනාකරණය කරමින් තවත් වැඩිපුර ලාභ ලබා ගැනීමත්, ඒ වාගේම වසා දමා ඇති නැත්නම් දැනට අකර්මණ්‍ය වෙලා තිබෙන ආයතන අලුතෙන් ආරම්භ කිරීමත් මේ යටතේ කරන්න නව වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. විශේෂයෙන් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ආරම්භ කර තිබෙනවා. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව මඟින් අපේ රාජ්‍ය සම්පත් කොටස් කීපයකට බෙදලා, ඒ අනුව වෙනම කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට සකස් කර තිබෙනවා.

පළමු අංකය යටතේ වැටෙන්නේ, දැනටම වසා දමා තිබෙන රාජ්‍ය ආයතනයි. විශේෂයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් මත පවතින ආයතන ගණනාවක් තිබෙනවා. ඒවා හඳුනා ගෙන, ඒවා පවත්වා ගෙන යන්න විශේෂයෙන් පෞද්ගලික ව්‍යවසායකයන් හඳුනා ගෙන, ඒ පෞද්ගලික ව්‍යවසායකයන් සමඟ සම්බන්ධ වෙලා එකඟතාවකට ඇවිල්ලා, ටෙන්ඩර් කරලා ඒ අනුව ඒ අය සමඟ එකඟතාවකට ඇවිල්ලා, තිස් අවුරුදු කාලයකට බදු දීලා ඒ බදු ක්‍රමය යටතේ ඒ ආයතනවලින් උපරිම ප්‍රයෝජන ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. දැනටමත් එවැනි ආයතන තුනක් මේ විධියට නැවත ප්‍රතිව්‍යුහගත කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. කන්තලේ සීනි කර්මාන්තශාලාව, ඒ වාගේම ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාව සහ මාවනැල්ලේ රබර් නිෂ්පාදන හා අපනයන කර්මාන්තශාලාව දැනටමත් අපේ පෞද්ගලික ව්‍යවසායකයන් හඳුනා ගෙන මේවා දිගු කාලීන බදු ක්‍රමය යටතේ ලබා දීලා ආර්ථික සංවර්ධනයට දායක කර ගෙන උපරිම ලාභ ලබන ආයතන බවට පත් කර ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළවල් සකස් කිරීමට කටයුතු කර තිබෙනවා.

දෙවන අංකය යටතේ වැටෙන්නේ, දැනටමත් ලාභ ලබන ආයතනයි. මේ යටතේ Lanka Mineral Sands Limited - ඛනිජ වැලි සංස්ථාව - ඒ වාගේම Lanka Phosphate Limited, Paranthan Chemicals Company Limited,-

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මාවනැල්ලේ රබර් නිෂ්පාදන හා අපනයන කර්මාන්තශාලාව පාඩු ලබන ආයතනයක් කියලා කිව්වා. ඒක 1984 වන තෙක් ලාභ ලැබුවා. ඒක ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේදී කටයුතු කළා.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

මන්ත්‍රීතුමා ඒ ආයතනය විතරක් නොවෙයි, මේ කියන හැම ආයතනයක්ම ඒ කාල පරිච්ඡේදවල ලාභ ලබා තිබෙනවා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

පාඩුව වෙන්නේ දූෂණයයි නාස්තියයි නිසා. ඒ ආයතනයේ නිසි කළමනාකරණයක් නැති නිසා තමයි පාඩු වන්නේ. ඒ ආයතනය විකුණන්න බැහැ. එය කුඩා රබර් වතු හිමියන්ගේ සම්පතක්.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

නැහැ, විකිණීම නොවෙයි මේ කරන්නේ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

විකුණන්නේ නැතිව මොකක්ද කරන්නේ?

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

මේකෙන් කරන්නේ පෞද්ගලික ව්‍යවසාය සමඟ සම්බන්ධ වෙලා ඒ යටතේ කළමනාකාරිත්වය ලබා දීම.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඒක බොරුවක්. Perth Engineering කියන ඕස්ට්‍රේලියන් සමාගමකට ඩොලර් මිලියන 600කට එය විකුණනවා.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

ගරු මන්ත්‍රීතුමා, මේ හැම ආයතනයක්ම ආරම්භයේදී, නැත්නම් එක කාලයක ලාභ ලබන ආයතන වශයෙන් තිබුණු ඒවා. නමුත් ඇත්තටම කාලයාගේ ඇවෑමෙන් විවිධ අවස්ථාවල කළමනාකාරිත්වයේ සිදු වන වෙනස්වීම් නිසා මේවා දැන් පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා නිසි කළමනාකරණයක් ඒවායේ නැවත ඇති කළ යුතුව තිබෙනවා. ඒවා තමයි අපි යෝජනා කරලා තිබෙන්නේ. මේ බර තනියම රජයට දරන්න බැරි නිසා, මේ ආයතන නිසි ලෙස කර ගෙන යන්න හැකියාව තිබෙන, නිපුණත්වයක් ඇති පෞද්ගලික ව්‍යවසායකයන් කඳවලා ඒ අයට ලබා දෙන්න තමයි කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මේ ආයතනය කුඩා රබර් වතු හිමියන් හාරදහසකට ආසන්න ප්‍රමාණයකින් රබර් කිරි ලබා ගත්ත ආයතනයක්. මේ ආයතනය ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න පුළුවන්. මේ ආයතනය පෞද්ගලික ආයතනයක් බවට පරිවර්තනය වෙනවා නම් ඒක ප්‍රදේශයටම ලොකු හානියක් වෙනවා.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

රබර් විතරක් නොවෙයි කුඩා තේ වතුත් එහෙමයි. [බාධා කිරීමක්] ගෙන යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ සංවිධායකවරයෙකුත් ඔය කටයුත්තට විරුද්ධයි. ජනතාවත් විරුද්ධයි. ඒක පෞද්ගලික ආයතනයකට විකුණන්න දෙන්න එපා. ඒක වැරදියි.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

විකිණීමක් කෙරෙන්නේ නැහැ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

සමාගමකට දෙනවා කියන්නේ විකිණීමක් නේ.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

දැනටම ලාභ ලබන ආයතන ගැනයි මම සඳහන් කළේ. මිනරල් සැන්ඩ්ස්, ලංකා පොස්පේට් සහ පරන්තන් වාගේ ආයතන දැනට ලාභ ලබනවා. මේ ලාභ ලබන ආයතනත් නිසි කළමනාකාරිත්වයක් යටතේ මෙහෙයවලා ගන්න පුළුවන් උපරිම ධාරිතාවක් ලබා ගන්න අපේක්ෂා කරනවා.

ඊ ළඟ කාරණය වශයෙන් කියන්න තිබෙන්නේ දැනට බිඳ වැටී තිබෙන කර්මාන්ත - මුළුමනින්ම අඩ පණ වුණ කර්මාන්තශාලා- ගැනයි. උදාහරණයක් වශයෙන් ගත්තොත් සිමෙන්ති සංස්ථාව යටතේ තිබෙන කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව. ඒ කර්මාන්තශාලාව පසු ගිය කාලයේ භීෂණයත් එක්ක සම්පූර්ණයෙන් විනාශයට පත් වෙලා තිබෙන්නේ. නමුත් ඒ කර්මාන්තශාලාව නඟා සිටුවන්නට පුළුවන්; හදන්න පුළුවන්. ඒ නිසා අපි දැන් ඒ කර්මාන්තශාලාවේ කටයුතු ආරම්භ කරලා පවත්වා ගෙන යන්න බලාපොරොත්තු වෙනවා. ඒක ලාභ ගන්න පුළුවන් වාගේම විශාල සේවාවක් සපයන්න පුළුවන් ආයතනයක් වශයෙන් අපි හඳුනා ගෙන තිබෙනවා.

වතු ක්ෂේත්‍රය තිබෙනවා. මේ යටතේ රාජ්‍ය වැවිලි සංස්ථාව තිබෙනවා. ඒ වාගේම ජනතා වතු සංවර්ධන මණ්ඩලය -ජනවසම - සහ ඇල්කඩුව වැවිලි සමාගම තිබෙනවා. මේ ආයතන තුනක්; ආයතන වර්ග තුනක්. රාජ්‍ය වැවිලි සංස්ථාවයි, ජනවසමයි දෙකම ලාභ ලබන ආයතන නොවෙයි. පාඩු පිටයි පවත්වා ගෙන යනු ලබන්නේ. ඇල්කඩුව වැවිලි සමාගම දැනට ලාභ ලබන තත්ත්වයක තමයි තිබෙන්නේ. ඒ නිසා අපි මේ වෙලාවේ විශේෂයෙන්ම ලාභ ලබන ඇල්කඩුව වැවිලි සමාගමේ ලාභය වැඩි

වැඩිදියුණු කර ගන්න කටයුතු කළ යුතුයි. ඒ වාගේම ඇත්තටම රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනවසම කියන දෙකෙන්ම ලාභ ලැබිය හැකියි. නමුත් මේ ආයතන කාලයක් තිස්සේ අතිවිශාල EPF, ETF මුදල් ප්‍රමාණයක් -කෝටි ගණනක්- ගෙවන්න තිබෙනවා. ඒ නිසා අද රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනවසමට EPF, ETF ගෙවීම පිළිබඳව විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. රාජ්‍ය වැවිලි සංස්ථාවත්, ජනවසමත් ලැබෙන ආදායමෙන් තමයි යැපෙන්නේ. EPF, ETF ගෙවීම මහ හැරී ඇති බැවින් මේ ආයතන අද විශාල අවදානමකට පත් වෙලා තිබෙනවා. නිරන්තරයෙන්, වතු අධිකාරිවරුන් උසාවි ගණනේ ගිහින්, රිමාන්ඩ් වෙලා, කූඩුවේ ඉන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මේ තත්ත්වය රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනවසමට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ වතුවලින් ලැබෙන ආදායම මේ සඳහා ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ නිසා හැම දාම පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ හේතුවෙන් කර්මාන්තශාලාවලට අවශ්‍ය අලුත් යන්ත්‍ර සූත්‍ර ලබා ගන්න සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීමට අවස්ථාව ලැබෙන්නේ නැහැ, ඒ අවශ්‍ය ප්‍රාග්ධනයේ හිඟකම නිසා. ඒ නිසා තිබෙන සමහර කර්මාන්තශාලා වැසී ගෙන යනවා. තිබෙන කර්මාන්තශාලා හරිහැටි පවත්වා ගෙන යෑමට අවශ්‍ය වන ප්‍රාග්ධනය ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ වතුවල තිබෙන කර්මාන්තශාලාවලින් උපරිම ප්‍රයෝජන ගන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා.

මේ වතුවල තව සම්පත් තිබෙනවා. විශේෂයෙන් කැලෑ වවපු වතු තිබෙනවා. ඒ වවලා තිබෙන්නේම කාලයකදී ඒවා ඉවත් කරන්න. ඒවා ඉවත් කරන්න පුළුවන්කම තිබෙනවා නම්, ඒ ගස් විකුණලා ඒ තිබෙන පාඩුව අවම කර ගන්න, නැත්නම් මේ තිබෙන ගැටලු විසඳා ගන්න පුළුවන්කම ලැබෙනවා. එක්කෝ රජය මැදිහත් වෙලා, භාණ්ඩාගාරයෙන් EPF, ETF ගෙවලා අවසන් කරලා ප්‍රතිව්‍යුහගත කළොත් මේ රාජ්‍ය වැවිලි සංස්ථාවත්, ජනවසමත් කියන ආයතන දෙකම ලාභ ලබන ආයතන වශයෙන් - පාඩු නැතිව ලාභ ලබන ආයතන- පවත්වාගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. අන්න ඒ සඳහා වූ වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක කරනවා.

මේ කාලය තුළ කොතෙක් ප්‍රශ්න තිබුණත්, ලාභ ලබන ආයතනවලින් රුපියල් බිලියනයක පමණ මුදලක් පසු ගිය වසරේ මහා භාණ්ඩාගාරයටත් ලබා දීලා තිබෙනවා. ඒ ආයතනවලින් ලාභ ලබන මුදල් පාඩු ලබන ආයතනවලට යොදා ගන්න පුළුවන් නම්, මේ පාඩු ලබන ආයතනත් අනාගතයේදී ඉතාම ඉක්මනින් ලාභ ලබන තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන් කියන එක මා මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)
හොඳයි. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Sitting is suspended till 1.00 pm

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *in the Chair.*

[අ.භා. 1.02]

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2012 අය වැය විශේෂ කාරක සභාවට යොමු කරන ලද අමාත්‍යාංශවලින් විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහ රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂවලට අදාළ කරුණු කීපයක් ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු පියසේන ගමගේ ඇමතිතුමාත් ප්‍රකාශ කළා, ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට අයිති මාවනැල්ල කුට්ටි රබර් කර්මාන්තශාලාව පෞද්ගලික සමාගමකට පවරා දීමට රජය කටයුතු කරන බව. ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිළිබඳවත් රජයෙන් ඒ වාගේම ප්‍රකාශයක් කරලා තිබුණා. Centrifuged latex සහ TSR - Technically Specified Rubber - රබර් නිෂ්පාදනය කරන මේ මාවනැල්ල කුට්ටි රබර් කර්මාන්තශාලාව 1970 දශකයේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය හැටියට කටයුතු කරපු කාලයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් - United Nationsවලින්- ලබා දුන්න රුපියල් ලක්ෂ 35ක ආධාරයකින් ආරම්භ කරපු කර්මාන්තශාලාවක්. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනයට නවීන තාක්ෂණික දැනුම උපයා ගන්නට අපේ විශේෂඥයන්ට අවස්ථාව ලැබුණේ මේ කර්මාන්තශාලාව හරහායි. රබර් නිෂ්පාදනයට අවශ්‍ය ඒ හැම තාක්ෂණයක්ම මේ කර්මාන්තශාලාව හරහා ලබා ගෙන, රබර් පිළිබඳව විශේෂඥයෝ පිරිසක් මේ රටේ බිහි කරවන්න අපට පුළුවන් වුණා. මේ වාගේ ලොකු සේවාවක් මේ ආයතනය තුළින් මේ රටට සිදු වුණා. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ රජයේ මැදිහත්වීමෙන් මිල පිහිටාධාරයක් ලබාදෙන, නැත්නම් මිල සහනාධාරයක් ලබාදෙන වැඩ පිළිවෙළකුත් තිබුණා. ඒ නිසා ඇත්ත වශයෙන්ම ලාභය උපයනවාට වඩා සේවාවක් කරන ආයතනයක් හැටියට තමයි එදා මාවනැල්ලේ පිහිටි මේ කුට්ටි රබර් කර්මාන්තශාලාව නඩත්තු කරගෙන ගියේ. ලාභ ලබනවාට වඩා ඒ ප්‍රදේශයේ, ඒ ක්ෂේත්‍රයට -රබර් ක්ෂේත්‍රයට- සහ ලංකාවේ වැඩිම රබර් වගාව තිබෙන ප්‍රදේශයක අවශ්‍ය වන සම්පතක් හැටියට මේ කර්මාන්තශාලාව පිහිටෙව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ වැඩියෙන්ම රබර් වගා කරන, රබර් නිෂ්පාදනයත් වැඩියෙන්ම තිබෙන දිස්ත්‍රික්කයක් හැටියට අපට කෑගල්ල හඳුන්වා දෙන්න පුළුවන්. ඒ නිසා අපේ දිස්ත්‍රික්කයට මේ කර්මාන්තශාලාව ඉතාම වැදගත් සම්පතක්. එය අප ආරක්ෂා කළ යුතු සම්පතක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රබර් කර්මාන්තය හරහා යැපෙන විශාල පිරිසක් ඉන්නවා. ලක්ෂ ගණනක පවුල් සංඛ්‍යාවක් සෘජුව හෝ වක්‍රව තමන්ගේ ආදායම් මාර්ග උපයන්නේ රබර් කර්මාන්තය හරහායි. ඒ නිසා මේ කර්මාන්තශාලාවේ වැදගත්කමක් තිබෙනවා. 1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට ආවා. ඊට කලින් -ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පැවති කාලයේ- රබර් කිලෝවකට රුපියල් 12ක අපනයන ප්‍රතිදානයක් - export subsidy එකක්- ලබා දීලා තිබුණා.

[ගරු කබීර් හාෂිම් මහතා]

1977න් පසුව රොනී ද මැල් මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට ක්‍රමානුකූලව ඒ අපනයන ප්‍රතිදානය අයින් කරන්න පටන් ගත්තා. ඒ අපනයන ප්‍රතිදානය ක්‍රමානුකූලව අඩු කරලා 1979 වන කොට එය සම්පූර්ණයෙන්ම නැති කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ කුට්ටි රබර් නිෂ්පාදන කර්මාන්තශාලාව සම්බන්ධයෙන් අර්බුද කිහිපයක් ඇති වෙලා 1979 වන කොට ඒ කර්මාන්තශාලාව පාඩු විඳින්න පටන් ගත්තා. ඒ, එක හේතුවක්. ඒ වාගේම එහි හරියාකාර කළමනාකරණයක් නැති නිසා අපේ යූඑන්පී ආණ්ඩුව යටතේම ඒ කර්මාන්තශාලාවේ අර්බුදයක් ඇති වුණා. ඒ තත්ත්වයේ තිබුණු කර්මාන්තශාලාව ගැන ඊට පසුව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවම හරියට සොයා බලලා, එයට නියම කළමනාකරණයක් ඇති කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරමින් -1982 එක්සත් ජාතික පක්ෂ රජය යටතේ- රබර් පිළිබඳ හොඳ දැනුමක් තිබෙන විශේෂඥයකු වූ ලක්න පරණවිතාරණ කියන මහත්මයකු ඒ කර්මාන්තශාලාවේ ප්‍රධාන කළමනාකාරවරයා හැටියට පත් කළා. එතුමාට පුළුවන් වුණා පාඩු විඳපු ඒ ආයතනය මාස 6ක් ඇතුළත ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය කරන්න. පියසේන ගමගේ ඇමතිවරයා කිව්වා, එය පාඩු විඳින ආයතනයක්, ඒ නිසා එය පෞද්ගලීකරණය කිරීම සඳහා රජය පියවර අරන් තිබෙනවා කියලා. මම ඒක පිළිගන්නේ නැහැ. යූඑන්පී ආණ්ඩු කාලයේ 1982න් පසුව එය දිගින් දිගටම ලාභ ලබන ආයතනයක් බවට නඩත්තු කරන්න පුළුවන් හැකියාව අපට ලැබුණා කියන එක මා විශේෂයෙන්ම මේ සභාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. 1982න් පස්සේ ඒ කර්මාන්තශාලාව නිෂ්පාදනය අතින්, රබර්වල ප්‍රමිතිය අතින්, ඒ වාගේම ලැබෙන අළෙවි මිල අතින් ඉහළටම ගෙන යන්නට ඒ කළමනාකාරවරයාට පුළුවන් වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1992 වෙන කොට එය මාසයකට මෙට්‍රික් ටොන් 4,000ක් නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් බවට පත් වුණා.

රබර් කිරි එකතු කරන මධ්‍යස්ථාන 131ක් කෑගල්ල දිස්ත්‍රික්කය පුරාම විහිදිලා තිබුණා. දවසකට රබර් කිරි කිලෝග්‍රෑම් 15,000ක් ඒ කර්මාන්තශාලාවට පමණක් එකතු කරන වැඩ පිළිවෙළක් සකස් කරලා සාර්ථකව ක්‍රියාත්මක කළා. ඇත්ත වශයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ විහිදිලා හිටපු කුඩා රබර් වතු හිමියන් 4,000කට අධික සංඛ්‍යාවකට නියම මිලක් ලබා දීලා ඔවුන්ගේ ආදායම් මාර්ග ස්ථාපිත කිරීම සඳහා මේ කර්මාන්තශාලාව හොඳ ආකාරයෙන් කටයුතු කර ගෙන ගියා. ඒ වෙන කොට අතර මැදියන්ට සහ වෙනත් පෞද්ගලික ආයතනවලට රබර් කිරි සපයන්නන්ගේ; කුඩා රබර් වතු හිමියන්ගේ නියම මිල පහත වැටෙන්න නොදී එහි යම්කිසි ස්ථාවරයක් ඇති කරන තත්ත්වයක් ඒ කර්මාන්තශාලාවේ මැදිහත්වීම නිසා ඇති වුණා කියන එක මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

මාවනැල්ල රබර් කර්මාන්තශාලාව 1992 යූඑන්පී ආණ්ඩුව කාලයේ ලංකාවේ ඉහළම ලාභ ලබන රබර් කර්මාන්තශාලාවක් බවට පත් වෙලා තිබුණා කියන එක මා මතක් කරන්න ඕනෑ. මේ ආණ්ඩුව දැන් කියනවා ඒක පාඩු විඳින ආයතනයක්, ඒ නිසා එය පෞද්ගලික අංශයට විකුණන්න ඕනෑ කියලා. 1992 වන කොට මාවනැල්ල රබර් කර්මාන්තශාලාවේ ස්ථාවර තැන්පත් ගිණුමේ හෙවත් Fixed Deposit Account එකේ රුපියල් මිලියන 50ක් තැන්පත් කරලා තිබුණා. 1992දී රුපියල් මිලියන 50ක් කියන්නේ අද රුපියල් මිලියන 500කට සමාන මුදලක්. මහා භාණ්ඩාගාරයෙන් මුදල් දීලා නඩත්තු කරපු එකක් නොවෙයි එය. ඒ ප්‍රදේශයේ හිටපු කුඩා රබර් වතු හිමියන්ට සේවයක් කරන අතරම, එනම් ඒ ප්‍රදේශයේම රබර් කිරි එකතු කරමින් ඒවාට නියම මිලක් ලබා දෙන අතරම රුපියල් මිලියන 50ක මුදලක් ඒ ආයතනයේ ස්ථාවර තැන්පත් ගිණුමේ තැන්පත් කරලා තිබුණා. මේක තමයි ඒ ආයතනයේ පසු බිම. නමුත් ඒ ආයතනයේ වැදගත්කම අද මේ මහින්ද චින්තන ආණ්ඩුවට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1990 දශකයේ ලංකාවේ ප්‍රථම වරට කුඩා රබර් වතු හිමියන්ගෙන් එකතු වන රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමට හැකි වුණේත් කුඩා රබර් වතු හිමියන් වෙනුවෙන් හදාපු මාවනැල්ල රබර් කර්මාන්තශාලාව නිසයි. අපට පුළුවන් වුණා ඒ කර්මාන්තශාලාව මඟින් නිෂ්පාදනය කරපු රබර් තායිවානයට අපනයනය කරන්න. ඒ අපනයන වැඩසටහන තුළ තායිවානයේ හිටපු ප්‍රධානියෙක් ලංකාවට ඇවිල්ලා මාවනැල්ලේ තිබෙන අපේ රබර් කාර්මාන්තශාලාවත් එක්ක ගිවිසුමක් අත්සන් කරන්න කැමැත්ත දක්වලා, gloves නිපදවන කර්මාන්තශාලාවක් හදන්න සූදානම් වුණා. ඒ කාල පරිච්ඡේදයේදී ගරු රංජන් විජේරත්න මැතිතුමා තමයි වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට කටයුතු කළේ. ඒත් එක්කම ඒ කාල වකවානුව තුළ එතුමා මිය ගියා. එල්ටීටීඊ බෝම්බ ප්‍රහාරයකින් එතුමා මිය ගියාට පසුව ඒ වැඩසටහන අපට දිගටම කර ගන්න බැරි වුණා.

ලංකාවේ මාවනැල්ල කර්මාන්තශාලාවත් එක්ක ගිවිසුමක් අත්සන් කරන්න හිටපු තායිවාන් ජාතිකයා මැලේසියාවට ගිහිල්ලා මැලේසියාවේ කර්මාන්තශාලාවක් ආරම්භ කරලා අද ලෝකයේ වැඩියෙන්ම gloves නිපදවන කර්මාන්ත ශාලාව බවට පත් වෙලා තිබෙනවා. ඇත්තටම ඒක එදා ලංකාවට හිමි වන්න තිබුණු අවස්ථාවක්. 1994 වන තෙක්, යූඑන්පී ආණ්ඩුව තිබෙන තෙක් ඒ කර්මාන්තශාලාව හොඳට හදාගෙන ගියා. 1996න් පසුව මොකක්ද වුණේ? එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව බලයට ආවට පසුව එතැන දූෂිත පාලනයක් ඇති කරපු නිසාත්, නිසි කළමනාකරණයක් නොතිබුණු නිසාත් අවුරුද්දෙන් අවුරුද්ද එම කර්මාන්ත ශාලාව පහත වැටෙන්න පටන් ගත්තා. එහි ලාභය පාඩුවකට පරිවර්තනය වුණා. මට මතකයි 1998 දී හෝ 1999 දී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ එම රබර් කර්මාන්ත ශාලාවේ අලුත් ව්‍යාපෘතියක් පටන් ගත්තා. මොකක්ද කළේ? එතැන cycle tyres හදන ව්‍යාපෘතියක් ආරම්භ කරලා ඇෆ්ගනිස්ථානයේ තලේබාන් සංවිධානය එක්ක ගිවිසුමක් අත්සන් කළා, ඒ රටට cycle tyres අපනයනය කරන්න. ඒ කර්මාන්තශාලාවට cycle tyres නිපදවන machines ටික ගෙනාවත්, ඒවා සුදුසු machines බවට පත් වුණේ නැහැ. එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා එම ආයතනය රුපියල් කෝටි ගණනක ණය බරක් ඇති වෙලා වැටෙන්න පටන් ගත්තා. ඒ තමයි ඒකේ විනාශයේ ආරම්භය. ඒ වාගේ තත්ත්වයක් ඇති කළාට පසුව, ඒක ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය කරන්න බැහැ. පාඩුවක් ඇති වෙනවා කියලා විවිධ චෝදනා කළාට දූෂණය, වංචාව, ඒ වාගේම දුර්වල කළමනාකරණය නිසාම තමයි එම ආයතනය විනාශ කරලා තිබෙන්නේ කියන එක විශේෂයෙන්ම මම මෙතැනදී ප්‍රකාශ කරනවා.

අද ඒ ප්‍රදේශයේ කුඩා රබර් වතු හිමියන්ට පාඩුවක් වන අතර, ඒ ආයතනයේ සේවය කරන සේවකයන්ටත් ඒක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා අද මෙතැනදී කෑගල්ල දිස්ත්‍රික් ජනතාව වෙනුවෙන්, ඒ වාගේම කුඩා රබර් වතු හිමියන් වෙනුවෙන් මම විශේෂයෙන්ම කියන්නේ, මේ විධියට එම ආයතනය පෞද්ගලීකරණය කිරීම පිළිබඳව අපේ විරෝධතාව පළ කරන බවයි. තමන් ඉදිරිපත් කරපු මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රථමයෙන්ම කියන්නේ කිසිම රාජ්‍ය ආයතනයක් නැවත පෞද්ගලික අංශයට විකුණන්නේ නැහැයි කියායි. එහෙම කියන මහින්ද චින්තනයෙන්, ප්‍රදේශයකට, දිස්ත්‍රික්කයකට, රටකට විශාල සේවාවක් වන ආයතනයක් පෞද්ගලික ආයතනයකට විකිණීමට ඇත්ත වශයෙන්ම ආණ්ඩුවට සදාචාරාත්මක අයිතියක් නැහැයි කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. දැනට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඒ ප්‍රදේශය නියෝජනය කරන දේශපාලනඥයෝ කිහිප දෙනෙක්

ඒකට විරෝධතාව පළ කරලා තිබෙනවා. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන් වන අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා, -එතුමාගේ ආසනයේ, ඒ වාගේම මා නියෝජනය කරන මාවනැල්ල ආසනයේ තමයි ඒ කර්මාන්ත ශාලාව තිබෙන්නේ.- ඒ වාගේම ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා, රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා, මෙතැන ඉන්න ජගත් බාලසූරිය ඇමතිතුමා, ඒ වාගේම එච්.ආර්. මිත්‍රපාල නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් ඇමතිවරු සහ නියෝජ්‍ය ඇමතිවරු පස් දෙනෙක් ඉන්නවා. ඒ අය මෙම ආයතනය පෞද්ගලික අංශයට විකිණීම සඳහා අනුමැතිය දෙනවාද? එහෙම නැත්නම් ජනතාව ඉල්ලන දේ සඳහා අනුමැතිය දෙනවාද? එහෙමත් නැත්නම් ඒ ප්‍රදේශයේ කුඩා රබර් වතු හිමියන්ගේ අයිතිය ආරක්ෂා කිරීමට විරුද්ධව කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි. ඒ නිසා විශේෂයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම කියලා ලාභ ලබන්න පුළුවන් රාජ්‍ය ආයතන එක එක පෞද්ගලික අංශවලට කුණුකොල්ලයට විකුණන එක සම්පූර්ණයෙන්ම වැරැදි වැඩක් හැටියට තමයි අපි දකින්නේ. ඒ, එක ආයතනයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තව ආයතනයක් තිබෙනවා. ඒ තමයි ඇඹිලිපිටිය කඩදාසි කම්හල. ඇඹිලිපිටිය කඩදාසි කම්හලත් 1976-1977 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ආරම්භ වූ කර්මාන්තශාලාවක්. ඒ කාලයේ එහි ස්ථිර සේවකයන් 1,200 දෙනෙකු සිටියා. අනියම් සේවකයෝ 400ක් හිටියා. එය 1970 දශකයේදී දිනකට මුද්‍රිත හා ලිපි ලියන කඩදාසි ටොන් 50ක් නිෂ්පාදනය කරපු ආයතනයක්. ඒ වාගේම අක්කර 400ක, එහෙම නැත්නම් අක්කර 600ක වාගේ ඉඩම් ප්‍රමාණයක් තිබුණු ආයතනයක්. ඒ වාගේම 2005 දී මෙම ආණ්ඩුව බලයට ආවාම මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළ පැහැදිලිව අන්තර්ගත වෙලා තිබුණේ ආනයන ආදේශන ප්‍රතිපත්තියක්. එතකොට මේ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණයට ලක් කරන්නේ නැහැය කියලා රජය පොරොන්දුවකුත් දුන්නා.

ඇඹිලිපිටිය කඩදාසි කම්හල දිහා බලන කොට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට පසුව 1996 වන කොටත් මේ ආයතනය හොඳ තත්ත්වයක තිබුණා. ඒ වුණාට ඒ කර්මාන්තශාලාව දවසින්, දවස යන කොට, ඒකේ එක එක ප්‍රශ්න ඇති වෙලා 2001 වන කොට අපේ ආණ්ඩුව තිබෙන කොටත් පාඩු ලබන ආයතනයක් හැටියට අපට ඒක වහන්න සිද්ධ වුණා. 2001දී කෙටි කාලයකින් නැවත මේ ආයතනය ආරම්භ කළා. නමුත් 2003 වන කොට නැවතත් ඒ ආයතනය වහන්න සිද්ධ වුණා. ඉන් පසුව 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට ආවට පසුව 2006 නැවත මේ ආයතනය ආරම්භ කිරීමට කටයුතු කළා. ඒ ආයතනය වැටෙන්නට හේතුවක් තිබුණා. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ගත්ත වැරැදි ආර්ථික ප්‍රතිපත්තිමය තීරණයන් තමයි එයට හේතු වුණේ. යූඑන්පී ආණ්ඩුව කාලයෙන් පසුව 1996 වන කොට කඩදාසි ආනයනය කිරීම සඳහා අය කරපු තීරු බද්ද සියයට 35යි. නමුත් 2000 වන කොට එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩු කාලයේම කඩදාසි ආනයනය කරන බද්ද සියයට 35 සිට සියයට 10 දක්වා අඩු කළා. පිට රටින් මේ රටට ගෙන්වන්න ගියාට පසුව මේ ඇඹිලිපිටිය කඩදාසි කම්හලට ඒවා සමඟ තරග කරන්න බැරි නිසා පාඩු විඳින ආයතනයක් බවට පත් වුණා. එතැන ප්‍රතිපත්තිමය ගැටලුවක් සහ කළමනාකරණ දුර්වලකමක් තමයි ඇති වුණේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2007 දී කුමාර වෙල්ගම ඇමතිතුමා හිටියේ කර්මාන්ත ඇමතිවරයා හැටියටයි. එතුමා කර්මාන්ත ඇමතිවරයා හැටියට මේ ගැන උත්තරයක් දීලා තිබුණා. එතුමාගේ ඒ උත්තරය හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. මහින්ද රත්නතිලක මන්ත්‍රීවරයා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට ඉන්න කොට කුමාර වෙල්ගම ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. කුමාර වෙල්ගම ඇමතිවරයා කියනවා, ඒ කාලයේ මේ ආයතනයේ තිබූ පාඩුවක් නිසා මහා භාණ්ඩාගාරයෙන් මේ ආයතනයට -ඇඹිලිපිටිය කඩදාසි කම්හලට- රුපියල් මිලියන 900ක මුදලක් ලබා දුන්නාය කියලා. ඒ පාඩු විඳින ඒ ආයතනය නඩත්තු කරන්න මහා භාණ්ඩාගාරයෙන් මිලියන 900ක් දුන්නා කියලා එතුමා ප්‍රකාශ කළා. ඒ කාලයේ යූනියන් පෙදෙසේ තිබුණා ගොඩනැගිල්ලක්. ඇඹිලිපිටිය කඩදාසි කම්හලට අයිති ගොඩනැගිල්ලක්. ඒකත් රුපියල් මිලියන 450ට විකුණුවා කියලා එතුමා කිව්වා. එතකොට ඒකත් විකුණලා, මිලියන 900ක් වෙනම දාලා මේ ඔක්කෝම කරලාත් මේක ගොඩ ගන්න අමාරු වුණාය, දැන් නම් මුදල් දාලා SEMA ආයතනයට trial run එකක් ගෙන යන්න තව රුපියල් මිලියන 25ක් දෙනවාය කියලා එතුමා එදා 2007 දී පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ කියන්නේ, මහින්ද චින්තන කාලයේදී ඇඹිලිපිටිය කඩදාසි කම්හලට රුපියල් මිලියන 1,500ක් නැත්නම් රුපියල් මිලියන 2,000කට වඩා අධික මුදලක් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරලා තිබෙනවාය කියන එකයි. ඒ බදු ගෙවන්නාගේ -මේ රටේ පුරවැසියන්ගේ- අතින් ලබා ගන්න මුදලුයි. එවැනි මුදලකුත් එයට තැන්පත් කරලත් ඒකේ සිදු වන දූෂණය, වංචාව නිසාත් කළමනාකරණයක් නැතිවීම නිසාත් ඒ ආයතනය නැති වෙලා ගිහිල්ලා තිබෙනවාය කියන එක ඉතාම පැහැදිලිව ඔප්පු කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව දැන් මොකක්ද ඒ ආයතනයට කරන්න යන්නේ? දැන් ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා, ඇඹිලිපිටිය කඩදාසි කම්හල Perth Engineering Limited කියන Australian සමාගමකට රුපියල් මිලියන 600කට විකුණලා දාන්න. කුමාර වෙල්ගම ඇමතිතුමා 2007 කියනවා, "මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 900ක් අපි ආයෝජන කළා, මුදල් වෙන් කෙරුවා. ඒකට අයිති තව ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 450කට විකුණලා තිබෙනවා" කියලා. ඒ මුදලුත් ඒකට යටත් කළා. තව මිලියන ගණනක් යටත් කරලා තිබෙනවා. එතකොට මේ ආයතනයට කෝටි ගණනක් රටේ මුදල් ආයෝජනය කරලා දැන් මිලියන 600කට Perth Engineering Limited එකට විකුණන්න යනවා. අපට ලැබිලා තිබෙන තොරතුරු අනුව මේ Perth Engineering Limited කියන ආයතනය කඩදාසි කර්මාන්තය පිළිබඳව කිසිම දැනුමත් නැති, කිසිම අත් දැකීමක් නැති ආයතනයක්. ඔවුන් ආයතන සුද්ධ කරන - janitorial services කරන - ඕස්ට්‍රේලියාවේ ආයතනයක්. ඔවුන් මෙහේ ඇවිල්ලා, මිලියන 600කට මේ ආයතනය භාර ගන්න යනවා. එතකොට "මහින්ද චින්තන" ප්‍රතිපත්තියට සාපේක්ෂව බලන කොට මේක පටහැනියි. මේවා කුණු කොල්ලයට එක එක විදේශ කොම්පැනිවලට විකුණලා දානවා. එහෙම කරද්දී ඌන උපයෝගිතා නැත්නම් ඌන කාර්ය සාධක ආයතන කියලා හොඳට ලාභ ලබන, දයාගමගේලා විශාල මුදලක් තැන්පත් කරලා, ආයෝජන කරලා හොඳට දියුණු කරපු ආයතන රජයට පවරා ගන්නවා.

මාවනැල්ලේ තිබෙන රබර් කර්මාන්ත ශාලාව, ඇඹිලිපිටියේ තිබෙන කඩදාසි සංස්ථාව වැනි රජය සතුව තිබෙන රාජ්‍ය ආයතන කුණු කොල්ලෙට පෞද්ගලික අංශයට විකුණනවා. එතකොට මොකක් ද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල තිබෙන සංගතභාවය? එක දවසකට එක දෙයක් කියනවා, තවත් දවසක තව දෙයක් කියනවා. දේශීය ආයතන ආරක්ෂා කරනවාය; රාජ්‍ය ආයතන ආරක්ෂා කරනවාය; පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියනවා. අපට මෙයින් පැහැදිලිව පෙනී යන්නේ අපේ රටේ රාජ්‍ය සම්පත් ටික කුණු කොල්ලෙට එක එක කොම්පැනිවලට විකුණා දමන වැඩ පිළිවෙළක් තිබෙන බවයි. ඒ ප්‍රදේශවලට අත්‍යවශ්‍ය, ඒ දිස්ත්‍රික්කවල ආර්ථිකය ආරක්ෂා කරන්න පුළුවන් වැදගත්ම ආයතන ටික තමයි කුණු කොල්ලෙට විකුණන්න කටයුතු කරන්නේ. එම නිසා මේවා පාඩු ලබන ආයතන බවට පත් වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුවට ඒවා හරියට නඩත්තු කරන්නට බැරි නිසායි. යම් කාලයක -යුඇන්පී ආණ්ඩු කාලයේ- මේ ආයතන ලාභ ලබන ආයතන හැටියට නඩත්තු කර පෙන්වා දී තිබෙනවා. ඒ අතරතුර මේ ආයතන ලාභ ලබන ආයතන බවට පරිවර්තනය කරන්න බැහැ කියන තර්කය අපට කිසි සේත් පිළිගන්නට බැහැ.

[ගරු කබීර් හාෂිම් මහතා]

එම නිසා කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ලේ තිබෙන රබර් කර්මාන්ත ශාලාව, රාජ්‍ය ආයතනයක් බවට හරියාකාරව කළමනාකරණය කර ඒක ඒ විධියටම නඩත්තු කරන්නය කියා මෙතැනදී මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව හා තව ආයතන 21ක් පෞද්ගලීකරණයට ලක් කිරීමට මේ ආණ්ඩුවට සදාචාරාත්මක අයිතියක් නැහැ. එහෙම පෞද්ගලීකරණය කරන්න අයිතියක් නැහැ. මොකද, රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියා මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් තිබෙනවා. එම නිසා, අප ඒ ගැන විශේෂයෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවාය කියමින් මා නිහඬ වෙනවා.

[1.23 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர் )
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Mr. Deputy Chairman, thank you very much for giving me the opportunity to speak a few words on the performance of the Secretariat for Senior Ministers as the Minister of Urban Affairs.

I fully endorse and appreciate the observations made by the Hon. DEW Gunasekara and the suggestions made by the Hon. John Amaratunga. Therefore, I will not touch on what the Hon. John Amaratunga stated on the concept of Senior Ministers. The Hon. John Amaratunga with his Colleagues of the UNP came before the Select Committee to Discuss the Heads of Expenditure of Ministries Selected from the Budget Estimates of the Year 2012 and we explained the work that we were doing. They were very much satisfied with our explanation and wanted to know further about the duties that we are performing and we agreed to make a presentation in due course.

Sir, it has been estimated that the urban population will reach 45 per cent by 2015. The country's urban areas exhibit problems such as slum and squatter settlements, degraded environment, low standards of infrastructure and services and overloaded physical infrastructure. These problems have been looked into and they will be sorted out very soon.

In the small and medium-sized - secondary - towns outside the Greater Colombo, slum and shanty settlements are less of a problem. Instead, lack of basic infrastructure for economic development is considered a major challenge. Improvement and expansion of water supply, sanitation, stormwater drainage and solid waste collection and disposal are considered the priority investment areas by urban and local governments. Improvement of roads, transportation and development of bus terminals are also given high priority.

Sri Lanka's urban society suffers less from high incidence of poverty. However, a significant proportion of urban households still live below the Poverty Index.

His Excellency the President, in his Budget Proposals for 2011, has proposed the establishment of one million home-based economic units covering home gardening, livestock, fisheries and cottage industries to support the home-based economy under the "Divi Neguma" Programme. This Programme has been considered as a nationally-important programme and in the Budget Proposals for 2012, the target has been increased from one million home-based economic units to 2.5 million economic units.

The Hon. Basil Rajapaksa, Minister of Economic Development provides leadership and strategic guidance to execute this programme islandwide covering all districts. I have been appointed as the Chair of the "Divi Neguma" Subcommittee on Cottage Industries with the active participation of the Hon. Douglas Devananda, Minister of Traditional Industries and Small Enterprise Development and four other industrial cluster Ministries. Under this programme, we have conducted seven technology showcase and awareness programmes in Colombo, Anuradhapura, Jaffna, Gampaha, Kegalle, Monaragala and Puttalam. There are over 2,000 to 3,000 participants in each district who have expressed their interest to join the Cottage Industry Programme. Following this, need assessments have been conducted and technology training, raw material and basis tools and marketing facilities including buy-back arrangements are being supported with the active involvement of the five industrial cluster Ministries, institutions and the Ministry of Economic Development.

Many participants have expressed their interest to establish cottage industries while some others who have already been in the business have expressed their interest to expand their operations. The need assessment revealed that the cottage industrialists are in need of credit and financial assistance to establish, expand and sustain their operations. Therefore, I have made arrangements with the Governor of the Central Bank to help find the required financial assistance. I thank Mr. Ajith Nivard Cabraal, the Governor of the Central Bank for extending support and cooperation to take this Government's flagship programme forward. This programme is an important pillar of the "Mahinda Chintana - Vision for the Future" which focuses more on an inclusive economic development covering lagging regions and rural production villages. The theme of the "Divi Neguma" Programmes is, "A self-reliant household: A Wonderful Motherland".

I had a meeting with the bankers to discuss the modalities and mechanisms of supporting the "Divi Neguma" flagship programme of the Government. We all have collective responsibility of supporting micro and small cottage industries that have been screened for viability. I have requested the bankers to give their full support to make this flagship programme a success. I am confident that this programme is a great opportunity for

bankers to support the cottage industrialists and thereby help job creation and income generation at the household and village level to achieve equitable and inclusive sustainable development. Mr. Deputy Chairman, I also have had discussions with the exporters to promote marketing of products of the participants of this programme. I am very positive that the exporters will help us in making this home-based industry programme a success.

As a Senior Minister, I have been assigned the responsibility of chairing two Cabinet subcommittees. One is the Cabinet Subcommittee on Supply and Distribution of Petroleum Products. This Committee meets very often and we have taken important decisions on the emerging issues. The other is the Cabinet Subcommittee on Power and Energy. We have submitted our decisions on these areas to the Cabinet of Ministers for approval and implementation. I am very happy to hold this position as a Senior Minister and whatever shortcomings the Hon. John Amaratunga stated in his speech would be taken into consideration, so that more and more of our time and action can be made use of.
Thank you.

[අ. භා. 1.31]

**ගරු ජීවන් කුමාරණතුංග මහතා (තැපැල් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - தபால் சேவைகள் அமைச்சர்)
(The Hon. Jeewan Kumaranatunga - Minister of Postal Services)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින පැවැත්වෙන තේරීම් කමිටු වාර්තාව සලකා බැලීම පිළිබඳ විවාදයේ දී, තැපැල් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ඉදිරිපත් කර එය සාකච්ඡා කරන මොහොතක තැපැල් විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ඒ සම්බන්ධයෙන් මටත් කෙටියෙන් අදහස් දැක්වීමට ඉඩකඩ ලබා දීම පිළිබඳව මා ඉතාමත්ම සතුටු වන අතර, ඒ පිළිබඳ ඔබතුමාට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

ඇත්ත වශයෙන්ම තැපැල් සේවාව ගැන කථා කරනකොට තැපැල් දෙපාර්තමේන්තුව වසර ගණනාවක් -වසර 300කට ආසන්න- පැරණි ඉතිහාසයක් තිබෙන සේවාවක් සපයන දෙපාර්තමේන්තුවක් බව කියන්නට ඕනෑ. ඒ ඉතිහාසය තුළ ගෞරවනීය තත්ත්වයෙන් මේ සේවාව පවත්වාගෙන යන්නට කටයුතු කර තිබුණත්, පසු ගිය කාලයේ මේ රටේ තිබුණු ඒ යුදමය වාතාවරණය තුළ කටයුතු කරපු ආකාරය අපට අමතක කරන්නට බැහැ. මට පෙර අදහස් දක්වපු ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාත්, ඒ වාගේම දෙමළ ජාතික සන්ධානයේ දමිළ ගරු මන්ත්‍රීවරයකුත් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල තිබෙන තැපැල් සේවාවේ අඩු පාඩුකම් පිළිබඳව පෙන්වා දුන්නා.

ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේ දී සඳහන් කරන්නට ඕනෑ, පසු ගිය කාලය තුළ උතුරු නැඟෙනහිර පළාත්වල තැපැල් සේවාව නිසි අයුරින් පවත්වාගෙන යන්නට පුළුවන් පරිසරයක්, එවැනි පසුබිමක් ඒ පළාත්වල තිබුණේ නැති බව. නමුත් අපි අගය කරන්නට ඕනෑ, අපේ තැපැල් සේවයේ නිලධාරි මහතුන්, සේවක මහතුන් එවැනි අපහසු පරිසරයක් තුළත් තමන්ගේ සේවාව ඉටු කරන්නට, දමිළ ජනතාව කඳවුරුගත වෙලා ඉන්නකොට උතුරේත්, දකුණේත් සම්බන්ධතාව අවම මට්ටමකින් හෝ පවත්වාගෙන යන්නට බොහොම කැපවීමෙන් කටයුතු කළ බව. තමන්ගේ තැපැල් මල්ලත් ඔසවා ගෙන කඳවුරුවලට ගිහිල්ලා ඒ දකුණේ පණිවිඩය උතුරට ගෙන යන්න, උතුරේ දමිළ ජනතාවගේ ඒ පණිවිඩය දකුණට රැගෙන එන්නට අපේ තැපැල් සේවක මහතුන් කරන ලද කාර්ය භාරය අපි අගය කරන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම යුද්ධය අවසාන කාලයේ දී එක් තැපැල් සේවකයෙක් එක අතකින් තමන්ගේ මව ඇද ගෙන, අනෙක් අතින් තමන්ගේ තැපැල් මල්ල ඔසවා ගෙන දුවගෙන එද්දි මවට වෙඩි වැදිලා මැරිලා වැටුණා. ඉන් පසු මව අත් හැරලා තමන්ගේ තැපැල් මල්ල ආරක්ෂා කරගෙන ඒ ප්‍රදේශවලට ඇවිල්ලා වග කිව යුත්තන්ට තමන්ගේ තැපැල් මල්ල භාර දුන්නා. මෙන්න මේ වාගේ බොහොම ගෞරවනීය විධියට තමන්ගේ රාජකාරිය ඉටු කරන්නට, ඒ විශ්වාසනීයත්වය රකින්නට එවැනි අපහසු පසුබිමක් තුළත් තමන්ගේ කාර්ය භාරය එවැනි ආකාරයෙන් ඉටු කරපු අපේ තැපැල් නිලධාරින් ඉන්නවා.

ඇත්ත වශයෙන්ම අද මේ වනකොට "උතුරු වසන්තය" වැඩසටහන හරහා අපට ලැබුණු සියලු වෑන් රථ -අලුත් වෑන් රථ හයක්, ලොරියක්, කැබ් රථ දෙකක්- අපි උතුරු නැඟෙනහිර ප්‍රදේශවලට බෙදලා තිබෙනවා. ඒ වාගේම සියලුම තැපැල් සේවක මහත්වරුන්ට පා පැදි ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කැඩී බිඳී ගිය තැපැල් කාර්යාලවලට නව ගොඩනැඟිලි හදලා, ඒවාට පරිගණක ලබා දීලා, ඒවා අංග සම්පූර්ණ තැපැල් කාර්යාල බවට පත් කරන්නට අපි කටයුතු කර තිබෙනවා. ඒ තුළත් තව අඩු පාඩුකම් ඇති. අපි ඉදිරියට ඒ අඩු පාඩුකම් මඟහැර, ඒවා අවම කර ගෙන උතුරු, නැඟෙනහිර පළාත්වල ජීවත් වන ජනතාවට හොඳ තැපැල් සේවාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පසුබිම සකස් කර දීම සඳහා කටයුතු කරන බව මා මේ අවස්ථාවේ දී සටහන් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තැපෑලේ කාර්ය භාරය ගැනත් කියන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා මේ යුද්ධය නිමා කර ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත් කරන්නට දකින සිහිනය සැබෑ කරන්නට තැපැල් අමාත්‍යාංශය හරහා අප විශාල වගකීමක් ඉටු කළ යුතුව තිබෙනවා. සාම්ප්‍රදායික තැපෑල හරහා මේ කාර්ය භාරය, වගකීම ඉටු කරන්නට බැහැ. ලියුම බෙදන, පාර්සලය බෙදන සාම්ප්‍රදායික තැපෑල තුළ හිර වෙලා අපට මේ ආකර්ෂණීය ගමන ඉදිරියට ගෙන යන්න හැකියාවක් නැහැ. එම නිසා අප නව තාක්ෂණයත් සමඟ වහාම අත්වැල් බැඳ ගත යුතුව තිබෙනවා. මේ වන විටත් අප ඒ සඳහා අවශ්‍ය පියවර අර ගෙන තිබෙනවා. මුළු තැපෑලම ජාලගත කරන්නට අවශ්‍ය පියවර අපි අර ගෙන තිබෙනවා. මොරටුව විශ්වවිද්‍යාලයත් සමඟ ඒකාබද්ධව මේ ජාලගත කිරීම 2012 වසරේ පෙබරවාරි මාසය වන විට අවසන් කර මේ සේවාව සපයන්න බලාපොරොත්තු වෙනවා. මේ හරහා සේවාවන් 21ක් හඳුනා ගෙන ඉදිරි වර්ෂය තුළදී මේ රටේ තැපැල් පාරිභෝගික ජනතාවට විශාල සේවාවක් ඉටු කිරීමට අපට හැකියාව තිබෙනවා.

දෙවන පෙළ නිලධාරින් බඳවා ගැනීම පිළිබඳව ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා. ඇත්ත වශයෙන්ම ඉදිරි වසරේ අප ඒ ජාලගත කිරීම ආරම්භ කරනකොට නිලධාරි හිඟය වහාම පියවා ගන්නට අවශ්‍ය වෙනවා. පුරප්පාඩු 1060ක් පුරවන්නට අවශ්‍ය වෙනවා. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හරහා මේ විභාගය පවත්වන්නට ගියොත් දීර්ඝ කාලයක් ගත වෙනවා. එහෙම කළොත් අපට අවශ්‍ය වෙලාවේදී ඒ පුරප්පාඩු පුරවා ගන්නට ලැබෙන්නේ නැහැ. එම නිසා තමයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය ලබා ගෙන " ස්ලීඩා" ආයතනය හරහා පළාත් මට්ටමින් මේ විභාගය පවත්වා බොහොම විනිවිදභාවයකින් යුතුව පළාත් මට්ටමින් මේ පුරප්පාඩු පුරවන්නට අප කටයුතු කර තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම උතුරු නැඟෙනහිර පළාත්වල ඒ සුදුසුකම් තිබෙන අයට ඒ පුරප්පාඩුවලට

[ගරු ජීවන් කුමාරණතුංග මහතා]

පත් වීම් ලබා ගන්නට පුළුවන්. බස්නාහිර පළාතේ වාගේම අනෙක් පළාත්වලත් සුදුසුකම් තිබෙන අයට ඒ පුරප්පාඩු සඳහා පත් වීම් ලබා ගන්නට හැකි වන අයුරින් පළාත් මට්ටමින් තමයි බොහොම විනිවිදභාවයෙන් යුතුව අප මේ විභාගය පවත්වන්නේ. මොකද, පරිගණක දැනුම පිළිබඳව අප විශේෂ අවධානයක් යොමු කරනවා. පරිගණක දැනුම තිබෙන අය තමයි අපි ඒ පුරප්පාඩු 1060ට බඳවා ගන්නේ.

ඒ සඳහා අයදුම් පත් 16,000ක් අපට ලැබිලා තිබෙනවා. මේ 16,000 දෙනාගේ මූලික අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර, සුදුසුකම් තිබෙන සියලුම දෙනාට ඒ විභාගයට පෙනී සිටින්නට අවස්ථාව ලබා දෙනවා. මෙන්න මේ ආකාරයට තැපැල හරහා අලුත් පියවරක් ඉදිරියට තබන්නට අපි කටයුතු කරද්දී ඒ සඳහා අපට හැම දෙනාගේම සහාය අවශ්‍ය කරනවා.

එදා, 2008 වර්ෂයේදී විශ්ව තැපැල තුළ ශ්‍රී ලංකා තැපැල තිබුණේ 183වන ස්ථානයේයි. නියමිත නිර්ණායකයන් තුළ නොසිටීම නිසා අපි එහෙම ඉවත් කිරීමේ ලැයිස්තුවට වැටී තිබුණා. අද අපි සතුටු වන්න ඕනෑ, අද අපි ඒ ලැයිස්තුවේ 68වන ස්ථානයට පැමිණ තිබෙන එක ගැන. ජාත්‍යන්තර තැපෑලේ විශ්වාසය දිනා ගන්නට අපි කටයුතු කරලා තිබෙනවා. ජාත්‍යන්තර තැපැල ශක්තිමත් කිරීම සඳහා මේ වන විටත් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළ පරිශ්‍රය තුළට අපි EMS තැපැල් සේවාව රැගෙන ගිහින් තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර තැපැල ඒ පරිශ්‍රය තුළට රැගෙන ගිහින් කාර්යක්ෂම ජාත්‍යන්තර තැපැල් සේවාවක් පවත්වන්නට අවශ්‍ය පසු බිම මේ වන විටත් අපි ගොඩ නඟා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2012 වර්ෂයේ තැපැල් සේවාව මේ රටට ඵලදායී විධියට පවත්වා ගෙන යන්නට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ගරු ජනාධිපතිතුමා භාණ්ඩාගාරය හරහා වෙන් කර තිබීම පිළිබඳව මා මේ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමාට මගේ ප්‍රශංසාව පිරිනමනවා. ඒ වාගේම 2012 වර්ෂය තුළ මේ ජාලගත කිරීම හරහා නව තාක්ෂණය තැපැල තුළට ඇතුළු කර ගෙන, පාරිභෝගිකයාට කාර්යක්ෂම තැපැල් සේවාවක් පවත්වන්නටත් කටයුතු කරන බව මා මේ අවස්ථාවේදී සඳහන් කරමින්, මාහට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට නැවතත් මගේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 1.41]

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිරිකොත වුණු සිද්ධිය ගැන මා ඉස්සෙල්ලාම මගේ ශෝකය ප්‍රකාශ කරනවා, එක්සත් ජාතික පක්ෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයකු හැටියට. විළිලජ්ජා නැතුව තමන්ගේ මහ ගෙදරට ගහපු මිනිස්සු එක්සත් ජාතික පක්ෂයේ ඉන්නවා නම් ඒ අය, ඒ අයගෙන් සමාව ලබා ගන්න ඕනෑ. ඒක දේවාලයකට ගැහුවා හා සමානයි. පුද්ගලයනුත් එක්ක තිබෙන මත භේද පුද්ගලයනුත් එක්ක බේරා ගන්න. ඒ වාගේ නරක පූර්වාදර්ශ රටට දෙන්න එපා. ඒ සිද්ධිය විද්‍යුත් මාධ්‍යයෙන් දකින කොට මා කල්පනා කළේ, එක්සත් ජාතික පක්ෂය නැවතත් වනචාරි යුගය, වලත්ත යුගය පටන් ගත්තාය කියලායි. ඒ ගැන මා කනගාටු වනවා. මොකද, එක්සත් ජාතික පක්ෂය දොන් ස්ටීවන් සේනානායක මැතිතුමන්ලා පටන් ගත්ත පක්ෂයයි. මේ පක්ෂයේ ප්‍රබල නායකයෝ සිටියා. නවින් දිසානායක මැතිතුමාත්, මමත් දැන් කථා කළේ ගාමිණී දිසානායක මැතිතුමා කරපු සේවාවන් ගැනයි. ඉතින් දැන් මෙහෙම වන කොට අපට හරි දුකයි. දැන් මේ ගරු සභාවේ ඉන්නවා, තංගල්ලේ අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. එතුමා හොඳ යූඑන්පී පවුලක සාමාජිකයෙක්. එතුමා සමඟ අපේ සම්බන්ධකම් ගොඩක් තිබෙනවා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමන්ලා ගාල්ලේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල සාමාජිකයෝ. කබීර් හාෂිම් මන්ත්‍රීතුමා හොඳ ඉස්ලාමීය භක්තිකයෙක්. ඇයි, ඔහොම බලා ගෙන ඉන්නේ, නිවිච්ච ඉටි පන්දම් වාගේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශය මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයයි. අලුතින් පටන් ගත් අමාත්‍යාංශයක් මට භාර දීලා තිබෙනවා. මේ හබය බේරන්න කියලා තමුන්නාන්සේලා මුලදී මට මේක භාර දුන්නා නම්, මා මේක බේරනවා. මේක මහජන කටයුත්තක්. මේක මට අයිති කටයුත්තක්. මට අයිති දේ තමුන්නාන්සේලා භාර ගෙන අන්තිමට කෙළවා ගත්තා. නටපු නැටුමකුත් නැහැ; බෙරේ පළුවකුත් නැහැ. යකැදුරාත් ඉවරයි; ආතුරයාත් ඉවරයි. දැන් කළුවරේ අත පත ගානවා. මේකේ රහස මා දන්නවා. මා ඒක අද කියන්නේ නැහැ. ඒක පස්සේ කියන්නම්. මේකත් එක්තරා මැජික් වැඩක් වුණේ. අර පැත්ත ගියා නම් ඔහෙන් 15ක් මෙහේ. මේ පැත්ත ගියා නම් එහෙන් 15ක් මෙහේ. දැන් දෙකම නැවතුණා. රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාත් බේරුණා. සජිත් ප්‍රේමදාස මැතිතුමාත් අටෙන් බේරුණා. දයා ගමගේ පැත්තක ඉඳලා score කළා. දයාසිරි ජයසේකර කියන්නේ ජනප්‍රිය මන්ත්‍රීවරයෙක්. නමුත් ඒ ඡන්දයේ තිබුණා පොඩි ජිල්මාට් එකක්. ඒ කියන්නේ, ගිරේ නැතුව පුවක් කැපුවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්න වෙනවා මට මෙවැනි අලුත් අමාත්‍යාංශයක් හදලා භාර දීම ගැන. මම දැන් මහ ජනතාවත් එක්ක, මහජන සම්බන්ධතා හා මහජන කටයුතු ගැන නොයෙක් විධියේ වැඩ කරමින් ඉන්න වෙලාවක්. එහෙම ඉන්න කොට මට මතක් වුණා ඉතිහාසයේ කථාවක්. මම එය කිව යුතුමයි.

මේ ශ්‍රී ලංකාව කිසිම රාජ්‍යයකට යටත් කර ගන්න බැරි වෙච්ච රටක්. අශෝක අධිරාජ්‍යාටවත් හිතක් පහළ වුණේ නැහැ ශ්‍රී ලංකාව ආක්‍රමණය කරන්න. මෝගල් අධිරජ්‍යයා මුළු භාරතයම කන පිට පෙරළපු යුගයේ, තක්සලාව විනාශ කරපු යුගයේ, ශ්‍රී ලංකාවට අත ගහන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. 1815 දී මුළු ශ්‍රී ලංකාවම යටත් කර ගන්න පුළුවන්කමක් නොතිබුණු කාලයක මධ්‍යම කඳුකරයේ සමහර නිලමෙතුමන්ලා දුර දිග නොබලා කටයුතු කිරීම තුළ, ගිවිසුමකින් ශ්‍රී ලංකාවේ පාලනය බන්දේසියක තියලා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට භාර දුන්නා. මේකයි ජෝන් අමරතුංග මැතිතුමනි ඉතිහාසය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඉතිහාසය, භූගෝලය.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ජයග්‍රහණයේ සුවය විඳිමින් ගම්පහ දිස්ත්‍රික් මගේ මිත්‍ර ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අද මුහුණේ බොහොම ස්වාභාවික සෞන්දර්යයක් මතු වෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

කවදාත් එහෙමයි.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඔව්. අපි කන බොන මිනිස්සු නේ. අපි දෙදෙනාම යහළුවෝ නේ. අද පිං පාට ඇවිල්ලා තිබෙනවා. අපිට සන්තෝෂයි. ඉතින් මම කියන්නේ, තමන්ගේ අයියා වැරැද්දක් කළාය කියා සිතලා වැරදීමකින් විභීෂණ රාමට උදව් කරපු නිසා තමයි රාවණා සිහිමූර්ජා වුණේ. ඒ මගේ මතය. ඒ මීසක් මැරුවේ නැහැ. මගේ විශ්වාසය හැටියට අද ගෝවේ තිබෙන්නේ ඒ සිහිමූර්ජා වුණු ලංකාවේ මහ සිංහලයාගේ රූපය. එතුමා මැරුණේ නැහැ, සිහිමූර්ජා වුණා. ලෙනින්ගේ වාගේ බෙහෙත් ගල්වලා නැහැ. මේක කිසිම රටකට යටත් කර ගන්න බැරි වෙච්ච රටක්. මේ රට යටත් කර ගන්න මෝගල් අධිරාජ්‍යයා ආවේ නැහැ; අශෝක අධිරාජ්‍යා ආවේ නැහැ. නමුත් වර්තමානයේ යුරෝපය බැලුවා ආසියාවේ ඇතුළු වෙන්න පුළුවන් රට මොකක්ද කියලා. ඒ ගොල්ලෝ ඒකට පිඹුරුපත් සකස් කළා. ඒ කාලයේ මම කම්කරු ඇමතිවරයා. මම non-Cabinet ඇමති වශයෙන් ඉන්න කොට මහ ජන සම්බන්ධතාවේ සුවද මට හොඳටම දැනුණා. ඇමෙරිකාව ඇතුළු යුරෝපයේ ප්‍රතිගාමී රටවල් ලංකාවේ නායකයෝ කීප දෙනෙක් ගත්තා hire එකට. හැබැයි ගත්තේ ඩීමෝ බට්ටෝ ටිකක්. සරත් ෆොන්සේකා මහත්තයාද සමඟ එක්සත් ජාතික පක්ෂයේ වැඩක් නැති බට්ටෝ ටිකක් ගත්තා. ඒක ජේවීපී එක දන්නවාද කියලා මම දන්නේ නැහැ. එහෙම අරගෙන කුමන්ත්‍රණය කළා ප්‍රභාකරන්ට ජීවය දෙන්න. ප්‍රභාකරන්ගේ මාර්ගයෙන් මේ රට විනාශ කරලා, ජාතීන් අතර අර්බුද ඇති කරලා, ජාතීන් අතර විශ්වාසය බිඳලා ශ්‍රී ලංකාවේ බලය ලබා ගන්න ඒ අය හිතුවා.

ජාතියේ වාසනාවට මහින්ද රාජපක්ෂ කියන ඒ බලවේගය රුහුණෙන් බිහි වුණා. දෙවුන්දර තුඩුවෙන් දියසේන කුමාරයෙක් බිහි වෙනවා කියලා මලියදේව මහ රහතන් වහන්සේ තල් පතක ලියලා තිබුණා. ජනාධිපතිතුමාගේ අම්මාගේ ගම පාලටුව. එතුමා බිහි වුණේ පාලටුවෙන්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පැමිණීමත් එක්ක සුද්දා කලබල වුණා. කෙළින්ම ගිහිල්ලා ඩීමෝ බට්ටො ටික ගරාජ්වලට ගාල් කළා. රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා, ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු ඒ නඩේම ඒ game එකේ හිටියා. ඒක අසත්‍ය නොවෙයි. [බාධා කිරීම්] කමක් නැහැ. හැබැයි, මෙතෙක් මා කර දුන් දේවලුත්, කියපු දේවලුත්, කරපු දේවලුත් ප්‍රතිඵල සහිතයි. මම කරපු ඒවා ගැන මන්ත්‍රීතුමාට පෞද්ගලිකව කියන්න පුළුවන් නම්, සෝදිසි කරලා බලන්න. හැම තැනම සාර්ථක ප්‍රතිඵල තිබෙනවා. මන්ත්‍රීතුමාට වාගේ නොවෙයි, සාර්ථක ප්‍රතිඵල තිබෙනවා. මෙන්න මේ වාගේ කුමන්ත්‍රණකාරී අවස්ථාවක යුරෝපය මාන බැලුවා, ගිවිසුමකින් ශ්‍රී ලංකාව ගන්න බැහැ, ඒ නිසා දැන් මෙන්න මේ වාගේ කීප දෙනෙක් හයර් කරන්න ඕනෑ කියලා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! Hon. Minister, please wind up now.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
තව විනාඩි දෙකක් දෙන්න මට.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
තව විනාඩියක් දෙන්නම්.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව වන විට අතිගරු ජනාධිපතිතුමා නිර්භීතකම පෙන්වලා, ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ඒක රාශි කරලා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට තමන්ගේ සහෝදරයා පත් කළා. රාජපක්ෂ සමාගම. මේක හන්ටර් සමාගම නොවෙයි, රාජපක්ෂ සමාගම. අද වැටකොළු ගෙඩියක් කන්නේ, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා අඩියක් ගහන කොට පිපිඤ්ඤා කැල්ලක් කන්නේ බැසිල් රාජපක්ෂ මැතිතුමාට පින් සිද්ධ වන්නටයි. ඒක හිතේ තියා ගන්න. [බාධා කිරීම්] එක පැත්තකින් ආරක්ෂාව තර වනවා. අනෙක් පැත්තෙන් ආර්ථිකය දියුණු වනවා. අතිගරු ජනාධිපතිතුමා ඒක දැන ගෙන තමයි ප්‍රභාකරන් කියන මිනී මරුවා හේ කරලා දැම්මේ. එයාගේ වරදින් එයා මරුමුවට පත් වුණා. එයාගේ වරදින්. අරයා කළා, මෙයා කළා කියලා කවුරු ලකුණු දමා ගන්න ආවත් වැඩක් නැහැ. බයිසිකලය හදන එකා නොවෙයි, පදින එකා තමයි අමාරුව දන්නේ. වාහනය ගෙන යන්න ඕනෑ ඩ්‍රයිවර්. එහෙම නැතිව බෙන්ස් කොම්පැනිය හදපු එකා නොවෙයි. ඒ සුක්කානම තිබුණේ ජනාධිපතිතුමාගේ අතේ. ඒ සුක්කානම අතේ තියා ගෙන වැඩ කරන ආකාරය ගැන තමන්ගේ සහෝදරයාට උපදෙස් දුන්නා. අද ලංකාව ගැළවුණේ ඒ, ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ පුතුන් නිසාය කියන එක මම මතක් කරනවා.

තවදුරටත් මහ ජන සම්බන්ධතාව තහවුරු කරන බව මම මතක් කරනවා. තමුන්නාන්සේලාට නොහැකි වෙච්ච දේවල් ගැන හිත්වල යම්කිසි ශෝකයක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් කළ හැකි දෙයක් වෙනුවෙන් මම කටයුතු කරන්නම්. ඕනෑ දෙයක් කියන්න, මගේ විෂයය මහජන සම්බන්ධතා, මහජන කටයුතු. ඒ කියන්නේ, කොටන කුකුළාට මොන කොටුවත් ඔට්ටුයි. ඒක නිසායි මට මේ අමාත්‍යාංශය භාර දුන්නේ. මම මීට වඩා කථා කරන්නේ නැහැ.

එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායක ධුරයට ස්වාමි පුරුෂයා පත් වීම ගැන දයා ගමගේ මන්ත්‍රීතුමියට මම සුබ පතනවා. හොඳට හැදෙන්න කියලා මතක් කරමින් මගේ මිත්‍රයාට - ඔබතුමියගේ ස්වාමි පුරුෂයාට- ජයවේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

[අ. භා. 1.53]

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද චින්තන ඉදිරි දැක්ම ක්‍රියාවට නැංවීම සඳහා ඉදිරිපත් කෙරුණු 2012 අය වැය වාර්තාවෙන් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, ඉලක්කගත දූරදර්ශී යෝජනා රැසක් මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. බත බුලතින් සපිරි අගහිඟයකින් තොර ඉසුරුමත් රටක් ගොඩ නැඟීම සඳහා මෙයින් මනා අඩිතාලමක් සැකසෙන බව මා ප්‍රකාශ කරන්නට කැමැතියි. රටක ඉසුරුමත් බව රඳා පවත්නේ ජනතාවගේ අවශ්‍යතාවන් සපිරෙන විටයි. මිනිසා ඇතුළු සියලු ජීවීන්ගේ පැවැත්ම ආහාර මත රඳා පවතින හෙයින් රට තුළ ආහාර සුරක්ෂිතතාවක් ඇති කිරීම ඉසුරුමත් බවේ මූලික අවශ්‍යතාවක් ලෙස රජය පිළිගෙන තිබෙනවා.

ආහාර සුරක්ෂිතතාව රට තුළ ස්ථාපිත කිරීම සඳහා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2012 අය වැයෙන් විශේෂ අනුග්‍රහයක් හා සැලකිල්ලක් ලබා දී තිබෙනවා. ආහාර සුරක්ෂිතතාව සඳහා රජය විවිධ පිළිවෙත් අනුගමනය කරමින් සෑම ජන කොටසකටම සෑම විටම අවශ්‍ය ප්‍රමාණයට හොඳ ප්‍රමිතියෙන් යුත්, ගත හැකි මිලකට හා අවශ්‍ය විවිධත්වයෙන්,

[ගරු පී. දයාරත්න මහතා]

ලොකු කුඩා සැමට සරිලන පරිදි ආහාර සැපයීමට බලාපොරොත්තු වනවා. මෙමඟින් ළදරුවාගේ සිට මහලු විය දක්වා ශ්‍රී ලාංකික සැම දෙනාගේම යහ පැවැත්මට මහත් රුකුලක් සැලසෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝක ජනගහනය පසු ගිය ඔක්තෝබර් වන විට බිලියන 07ක් සේ ඇස්තමේන්තුගත වී තිබෙනවා. පවත්නා සියවස අවසන් වන විට එය බිලියන 10ක් වේ යැයි උපකල්පනය කෙරෙනවා. එහෙත් ලෝක ජනගහනයෙන් මිලියන 01ක් පමණ, එනම් ලෝක ජනගහනයෙන් හතෙන් එකක් දිනපතා සාගින්නෙන් පෙළෙන බව වාර්තා වනවා. ඒ වාගේම ලෝක ජනගහනයෙන් මිලියන තුනහමාරක් පමණ දරුවන් නීරක්තියෙන් හා මන්ද පෝෂණයෙන් පෙළෙන බව වාර්තා වනවා. සංවර්ධනය වන රටවල් දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 3ක් පමණ මන්ද පෝෂණය තුරන් කිරීම සඳහා වැය කෙරෙනවා. ඉදිරි විසි වසර තුළ ආහාර සඳහා ඉල්ලුම සියයට 50 කින් වැඩි වේ යැයිද ගණන් බලා තිබෙනවා. ලෝක ආහාර නිෂ්පාදනය වැඩි වන ලෝක ජනගහනයට සරිලන සේ ආහාර නිෂ්පාදනයට අසමත් වූ හැඩක් පෙනෙන්නට තිබෙනවා. එහෙත් ලොව සම්පත් මිනිසාගේ අවශ්‍යතාවන්ට ප්‍රමාණවත් වුවද අපේක්ෂාවන්ට ප්‍රමාණවත් නොවිය හැකි බව අප විසින් තේරුම් ගත යුතු වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාව තුළ ආහාර සැපයුම හොඳ තත්ත්වයක පවතිනවා. එම තත්ත්වය වඩා ස්ථාවර මට්ටමකට ගෙන ඒම සඳහා ආහාර සුරක්ෂිතතා වැඩ පිළිවෙළක් රජය මඟින් අනුගමනය කරමින් සිටිනවා. එම සංකීර්ණ වැඩ පිළිවෙළින් රජය බලාපොරොත්තු වන්නේ සියලු ජනතාවට, හැම කල්හිම, ආරක්ෂා සහිත පෝෂ්‍යදායක ආහාර, දෛනික ජීව පදාර්ථ අවශ්‍යතා සැලසෙන පරිදි හා ඔවුන්ගේ රුචි අරුචිකම් අනුව ලබා දීම සඳහා භෞතික, සමාජීය හා ආර්ථික පසුබිමක් සකස් කර දීමටයි. දිවි නැඟුම ක්‍රියාදාමය යටතේ මේ සඳහා අති විශාල සහායක් ලැබෙනවා. මේ ක්‍රියා මාර්ග දියත් කිරීමෙන් ජාතික මට්ටමෙන් මෙන්ම ගෘහ මට්ටමෙන් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමෙන් ජාතියේ සංවර්ධනයට මනා දායකත්වයක් ලබා දිය හැකි ජනතාවක් රට තුළ ඇති කිරීමෙන් ඉසුරුමත් දේශයක් ගොඩ නැඟීමට පසුතලය නිර්මාණය වනවා.

ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් ආහාර හිඟයක් නැති බව පැහැදිලියි. එහෙත් කාලගුණ විසමතා, අඩු අස්වැන්න, කෘෂි උවදුරු හා පාරිසරික ගැටලු මඟින් අහිතකර බලපෑම් කෙටි කාලීන වශයෙන් ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපෑම් එල්ල කර තිබෙනවා. කෙසේ වෙතත් මෙරට තුළ සාගින්නේ කිසිවෙකු මියැදෙන්නේ නැහැ. එයට හේතුව ප්‍රධාන භෝග වගාවට අමතරව මුං, කුරහන්, බඩ ඉරිඟු, තල වැනි ධාන්‍ය වර්ග, කොස්, දෙල් ඇතුළු ගෙවතු වගා, පලතුරු, කිරි හා මත්ස්‍ය සම්පත් නෙළා ගැනීමෙන්ද ජනතාවට අවශ්‍ය අතිරේක ආහාර සැපයෙන හෙයිනුයි. සැම විට ආහාර සැපයීමෙන් බලාපොරොත්තු වන්නේ කිසිවෙකු සාගින්නේ පෙළීමට ඉඩ නොතැබීමයි. මේ සඳහා දේශීය ආහාර නිෂ්පාදනය ස්ථාවර කළ යුතුයි. කෘෂි ඵලදායිතාව දියුණු කිරීමෙන් අස්වැන්න වැඩි කිරීමටත් ගොවි බිම් ප්‍රමාණය විශේෂයෙන් යුද්ධයෙන් පසු උතුරු නැඟෙනහිර පුරන්ව ගිය ගොඩ මඩ ඉඩම් නැවත වගා කිරීමට අත හිත දීමෙන්ද කෘෂි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රජය දැඩි උත්සාහයක යෙදී සිටිනවා. "අපි වවමු රට නඟමු" වැඩසටහන යටතේ මෙම අදියරින් ඉතා සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට හැකිව තිබෙනවා. මෙමඟින් ලබා ඇති ප්‍රගතිය අතිගරු ජනාධිපතිතුමා පවසන අන්දමට යුද්ධය නිමා කිරීම තරම්ම අගය කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වගා සංවර්ධනය සඳහා කෘෂි ව්‍යාප්ති සේවා නැවතත් ගමට ගෙන ඒම, ගොවි පවුල්වලට ඉඩම් ලබා දීම, පොහොර සහනාධාරයන් ලබා දීම, බීජ නිෂ්පාදනය වැඩි කිරීම මඟින් ගොවි ජනතාවට සහනයක් සලසා දී තිබෙනවා. වීවලට සහතික මිලක් ලබා දීම, ගොවි සමුපකාර පිහිටුවීම, කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා වෙළෙඳ පොළ සම්බන්ධතා වැඩිදියුණු කිරීම මඟින් ආයතනික පහසුකම් සලසා දී තිබෙනවා. භෝග විවිධාංගිකරණය, එළවලු හා පලතුරු වගාව වැඩිදියුණු කිරීම, පැළ හා බීජ බෙදා දීම මඟින් ගොවි ජනතාවට නව පණක් ලබා දී තිබෙනවා.

එළවලු හා පලතුරු ඇසුරුම් තාක්ෂණය වැඩිදියුණු කිරීම මඟින් නාස්තිය අවම කිරීමෙන් නිෂ්පාදනයේ උපරිම ඵල ලබා ගැනීමට වෙර දරා තිබෙනවා. අතිරේක භෝග වගාව යටතේ මුං, කවුපි, උඳු, තල, කුරහං, මිරිස්, ලූනු, අර්තාපල් ආදිය සඳහා හොඳ මිලක් ගොවීන්ට ලබා දී ඇත. දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කිරි ගොවියාට පහසුකම් රැසක් ලබා දී තිබෙනවා. ත්‍රස්තවාදය පරාජය කිරීම හේතුවෙන් රට වටා ඇති මුළු මුහුදු තීරය මත්ස්‍ය සම්පත නෙළා ගැනීම සඳහා ධීවර ජනතාවට පහසුකම් රැසක් මේ වන විට සලසා දී තිබෙනවා.

ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවද, පහතරට, උඩරට වශයෙන්ද, තෙත් කලාපීය හා වියළි කලාපීය වශයෙන් ද වගා කළ හැකි භෝග ප්‍රමාණය විශාලයි. එසේ කළ හැකි වුවත් කාලගුණික විපර්යාස, පස සෝදා යාම හා පාරිසරික අහිතකර බලපෑම්වලට රජය මුහුණ දිය යුතුයි. ආහාර හිඟයක් වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රමාණයෙන් ආහාර නිෂ්පාදනය කළ යුතුයි. වෙළඳ පොළේ ඉල්ලුමට සරිලන පරිදි සැපයුම නැති අවස්ථාවලදී මිල ඉහළ යාමේ ප්‍රවණතාවක් තිබෙනවා. එසේ ඉහළ යන මිලෙන් වැඩි බලපෑමක් ඇති වන්නේ දුප්පත් ජනතාවට බව ද රජය හොඳින් දන්නවා. ගොවි නිෂ්පාදන වෙළඳ පොළට ලැබෙන කාලවලදී හොඳ මිලක් ගොවි ජනතාවට ලබා දීමටත්, නිෂ්පාදනය අඩු වන කාලවලදී අවශ්‍ය ආහාර ආනයනය කිරීමට කටයුතු කිරීමෙන් ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමට රජය උත්සාහ කරන අතර ආහාර කල්තබා ගැනීමටත්, අසුරා තැබීමටත්, ගබඩා පහසුකම් සලසා දීමටත් දැනටමත් රජය කටයුතු කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතාවට සපයන ආහාර හොඳ තත්ත්වයෙන් ලබා දීම සඳහා ද රජය මහත් වෙහෙසක් ගනියි. නැවුම් ආහාර ජනතාවට ලබා දීම සඳහා කෘෂි නිෂ්පාදන, කිරි ආහාර, මත්ස්‍ය හා මස් ආහාර ඉක්මනින් වෙළඳ පොළට ගෙන යා යුතු වෙනවා. ඒ සඳහා මනා බෙදා හැරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර වෙළඳ පොළ හා ගොවිපළ අතර සම්බන්ධය තර කිරීම සඳහා රජය මගින් පහසුකම් ලබා දී තිබෙනවා. ප්‍රවාහන පහසුකම් මෙන්ම ඇසුරුම් තාක්ෂණය වැඩිදියුණු කර තිබෙනවා. එළවලු, පලතුරු, මත්ස්‍ය හා මස් ආහාර මෙන්ම කිරි ආහාර සැම විටම ශීත කළ හෝ වායු සමනය කළ තත්ත්ව යටතේ තබා ගැනීම සඳහා රජය නිෂ්පාදකයන්, බෙදා හරින්නන් හා වෙළඳ ව්‍යාපාරිකයන් දිරි ගන්වා ඇතත්, නිෂපාදනයේ සිට පරිභෝජනය දක්වා ක්‍රියාවලිය හොඳාකාරව සිදු වන බව තහවුරු කිරීම සඳහා අධීක්ෂණ කටයුතු විධිමත්ව කෙරෙමින් පවතිනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, please wind up now.

**ගරු පී. දයාරත්න මහතා**
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
Sir, can I table the rest of my speech?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Yes.

**ගරු පී. දයාරත්න මහතා**
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
Sir, I **table*** the rest of my speech.

සාධාරණ මිලකට ආහාර සැපයීම සඳහා රජය බලවත් උත්සාහයක යෙදී තිබෙනවා. ඒ හරහා රජය බලාපොරොත්තු වන්නේ දුප්පත් පොහොසත් සැම දෙනාටම ආහාර මිලදී ගැනීමේ හැකියාවක් ලබා දීමයි. අපේ දළ ජාතික නිෂ්පාදිතය සියයට අටකින් වැඩිවන විට කෘෂි නිෂ්පාදනය වැඩි වී ඇත්තේ සියයට හතකින් පමණයි. මෙයට පිළියමක් වශයෙන් ද ඒක පුද්ගල ආදායම වසර පහක් තුළ ඇමෙරිකන් ඩොලර් 2,000 සිට 4,000 දක්වා දෙගුණයක් කිරීමේ උත්සාහයක යෙදී සිටිනවා. ඒ අතර දරිද්‍රතා මට්ටමින් පහළ සියයට නවයක් පමණ ජනගහනය සම්බන්ධයෙන් ද, රජයේ සැලකිල්ල යොමු වී තිබෙනවා. දුගී බව බොහෝ විට මන්ද පෝෂණය නිරක්තය ආදී අහිතකර තත්ත්වයන් ඇති කරන හෙයින් දුගී ජනතාවට ද මිලදී ගත හැකි මිල මට්ටමක් පවත්වාගෙන යාම රජයේ අභිප්‍රාය වී තිබෙනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled:*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර මිල අවම මට්ටමක පවත්වාගෙන යාම එතරම් පහසු කාර්යයක් නොවේ. එයට හේතුව අපේ ආර්ථිකය වෙළඳ පොළ පාලික ආර්ථිකයක් වීමයි. ඉල්ලුම හා සැපයුම අනුව වෙළඳ පොළේ නියම වන මිල රජය මැදිහත් වීමෙන් යම්තාක් දුරට සාධාරණව පවත්වාගෙන යාමට උත්සුක වී ඇත. ආහාර නිපදවන්නන්ට මෙන්ම පාරිභෝගිකයාට සාධාරණ වන අයුරින් මිලක් පවත්වා ගැනීම රජයේ උත්සාහය වේ. 2007 වසරට පසුව ලෝක ආහාර මිල ඉහළ යාමේ ප්‍රවණතාවක් පවතී. ශ්‍රී ලංකාව තුළ ද, මෙම ප්‍රවණතාව බලපවත්වන හෙයින් සෑම විටකම නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකාට අහිතකර බලපෑමක් නොවන පරිදි සාධාරණයක් කිරීම සඳහා බොහෝ විට ආනයන තීරු බදු අඩු කිරීමට රජය විසින් කටයුතු කර ඇත.

රටේ ජනගනයෙන් විශල ප්‍රමාණයක් දරුවන් හා හැට විය ඉක්ම වූවන් වේ. අනාගතය ගොඩ නඟන්නන් ලෙසත්, අතීතය නඟා සිට වූ අය ලෙසත්, ඔවුන්ට අවශ්‍ය ආහාර ලබා දීම රජයේ යුතුකමක් වේ. ජාතියේ ජීවනාලිය වන තරුණ කොටස්වලට අවශ්‍ය ආහාර ඔවුන්ට නොඅඩුව ලබා දීම අත්‍යාවශ්‍ය වේ. මෙයින් අදහස් කෙරෙන්නේ ජනගහනයේ වයස් සීමාවන්ට අනුව අවශ්‍ය වන විවිධ ආහාර ජාතියේ අභිවෘද්ධිය සඳහා සැමට ලබා දීමයි. මේ හේතුවෙන් ධාන්‍ය, විවිධ ඇට වර්ග, එළවලු, පලතුරු, පළා වර්ග කිරි හා කිරි ආහාර, මත්ස්‍ය හා මස් ආහාර නිෂ්පාදනය කිරීම සඳහා විවිධ ක්‍රමවේදන් අනුගමය කරමින් මහා පරිමාණ නිෂ්පාදනය මෙන්ම ගෙවතු වගාව සඳහා ද පහසුකම් සලසා දී ඇත.

2010 වසර වන විට ලෝකයේ බලපවත්නා මන්ද පෝෂණ තත්ත්වය මදක් අඩු වී ඇත. එහෙත් එය තවමත් ඉහළ මට්ටමක පවතී. එයට හේතුව පසු ගිය වසර තුළ ආර්ථික වර්ධනයේ හිතකර වෙනසක් ඇති කිරීම සඳහා ආහාර සුරක්ෂිතතා මට්ටම ඉහළ යාමයි. එහෙත් සමහර රටවල්වලට එම තත්ත්වයෙන් මිදීමට නොහැකිව ඇත්තේ යුද්ධ අරගලවලට මැදිහත් වීම, ආහාර ප්‍රශ්නයට මුහුණ දීමට තරම් ආයතන පහසුකම් නොමැතිකම වැනි කරුණු නිසාය. එහෙත් අපේ වාසනාවට, රටේ වාසනාවට තිස් අවුරුදු යුද්ධයකට පසුව වුවද, එබඳු තත්ත්වයකට අප රට මුහුණ දී නැත්තේ ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාව අඛණ්ඩව පවත්වාගෙන යා හැකි මට්ටමක අප සිටින නිසාය. එහෙත් ජාතියක් වශයෙන් ආහාර සුරක්ෂිතාව පිළිබද අප සුළුවෙන් තැකීම කළ යුතු නොවේ.

මහින්ද චින්තන සංවර්ධන සැලැස්ම යටතේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව රැකීම ජාතියේ ජිවන මට්ටම ආරක්ෂා කිරීමේ මූලික අවස්ථාවක් ලෙස සැලකේ. ජාතික මට්ටමෙන් ආහාර අර්බුදයක් නැති අතර ගෘහ මට්ටමෙන් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා රජයේ විශේෂ අවධානය යොමු වී ඇත. ඒ අනුව ගෘහ මට්ටමෙන් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ග්‍රාමීය කුඩා පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිදියුණු කිරීමටත්, ග්‍රාමීය ජීවනෝපායන් නංවාලීමටත්, ආහාර සුරක්ෂිතතාව අගය කිරීමටත්, ආහාර සුරක්ෂිතතාව සඳහා සකස් කර ඇති ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීමටත් රජය උත්සුකව ඇත. 2012 අය වැයෙන් ඒ සඳහා මහඟු රුකුලක් ලැබෙන අතර දේශීය හා විදේශීය, රාජ්‍ය, රාජ්‍ය නොවන මෙන්ම විශ්ව විද්‍යාල සහාය ලබා ගැනිමටත් රජය ඉදිරිපත් වී ඇත.

***කථාව අවසානයේ පළ කර ඇත.**
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

[අ. භා. 2.02]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අමාත්‍යාංශ 21ක වැය ශීර්ෂ සාකච්ඡා වන මේ අවස්ථාවේදී -විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශ සම්බන්ධව කථා කරන මේ අවස්ථාවේදී- පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳවත් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා පළමුවෙන්ම සන්තෝෂ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පළමුවෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මීට දින කිහිපයකට ප්‍රථමයෙන් මේ අමාත්‍යාංශ විසි එකේ නිලධාරි මහත්ම මහත්මීන් ඒ වාගේම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා කැඳවා පාර්ලිමේන්තුවේදී විශේෂ කාරක සභාවකට යොමු කර මේ අමාත්‍යාංශ පිළිබඳව සාකච්ඡා කළාය කියලා. මීට පෙර කථා කළ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා සහ අනෙකුත් මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ ආකාරයට ඉතාම වැදගත් සාකච්ඡාවක් හැටියට ඒ සාකච්ඡාව අපට ගෙන යන්නට පුළුවන්කම ලැබුණා. විවිධ අමාත්‍යාංශවල පවතින ගැටලු සහ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කර විසඳුම් ලබා ගන්නටත් ඒ වාගේම විපක්ෂ මන්ත්‍රීවරුන් සියලු දෙනාට ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගන්නටත් හැකියාවක් ලැබීම ගැන අප සන්තෝෂ වන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂයන් සාකච්ඡා කර අවසානයි.

කෙසේ වුවත් අපේ රටේ දුප්පත්, පොහොසත්, වැඩිහිටි, ආබාධිත, රණ විරු, විශ්‍රාමික රාජ්‍ය සේවකයින් මේ ආදී වශයෙන් හැම ජන කොටස්වලටම සමාන අයිතීන් බෙදී යන විධියට එහෙම නැත්නම් අපේ රටේ ජීවත් වන විවිධ ක්ෂේත්‍රවල සියලුම ජන කොටස්වලට සාධාරණයක් ඉටු වන පරිදි මෙවර අය වැය සකස් කර තිබීම පිළිබඳව අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලයටත් මා පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා අද මේ අය වැය විවාදයේදී රජයට හෝ රජයේ වැඩ පිළිවෙළට බොහෝ දුරට චෝදනා එල්ල කරන්නට විපක්ෂයට පුළුවන්කමක් තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොහොම නමුත් අය වැය විවාදයේදී විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශවල කාර්ය භාරයන් පිළිබඳව එම අමාත්‍යවරුන් කථා කළා; කරුණු පැහැදිලි කළා; ඒ අමාත්‍යවරුන්ට අයත් වන විෂයයන් පිළිබඳව කරුණු සාකච්ඡා කළා. එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කිහිප පොළක්ම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට කාර්ය භාරයක් පැවරිලා නැහැ කියන කථාව ඉදිරිපත් කරමින් ඒ පිළිබඳව විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ අත්‍යවශ්‍යම සේවාවක් තමයි යහපාලනය සහ යටිතල පහසුකම් කියන්නේ.

[ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය ]

රජයක් හරියාකාරව ක්‍රියාත්මක වන විට, මහ ජනතාවට ඒ සේවාවන් සපයන අවස්ථාවන් වන විට රටේ සම්පූර්ණ පාලනය යහ පාලනයක් විය යුතුයි. ඒ යහ පාලනය තුළින් තමයි රටට, සමාජයට, ජනතාවට සේවාවන් ලබා දෙන්න පුළුවන්කම තිබෙන්නේ. අපේ ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් අතර හිටපු අග්‍රාමාත්‍යතුමා යහපාලනය හා යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය මඟින් විශේෂ කාර්ය භාරයක් මේ වන කොට ඉටු කරනවා. ඒ වාගේම මානව සම්පත්, ග්‍රාමීය කටයුතු, ආහාර සුරක්ෂිතතාවය, නාගරික කටයුතු, සමාජ ශුභ සාධනය මේ ආකාරයට විවිධ ක්ෂේත්‍ර තුළින් ඒ ගරු අමාත්‍යවරුන් මේ වන කොට අපේ රටේ ජනතාව වෙනුවෙන් සේවාවන් ලබා දෙන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. තවත් අමාත්‍යාංශ ගණනාවක එතුමන්ලා උපදේශකත්වය දරමින් ඒ අමාත්‍යාංශ හා සම්බන්ධ වෙමින් ඒ අමාත්‍යාංශවල ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ අවශ්‍ය වන ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සකස් කරන්නටත් එතුමන්ලාගේ දායකත්වය, සහයෝගය ලබා දෙමින් කටයුතු කරනවා. අනෙක් අමාත්‍යාංශ සමඟ සම්බන්ධ වෙමින් ඒ අයටත් උදව් වෙමින් ඒ කටයුත්ත ඉටු කිරීම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් හැටියට ඉතාමත්ම වැදගත් දෙයක් කියායි මා හිතන්නේ. ඒ තුළින් රටේ මහ ජනතාවට විධිමත් සේවාවක් ලබා දෙන්නට හැකියාව, පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කථාවේදීත් සඳහන් කළා මේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට කාර්ය භාරයක් පවරා නැහැ කියන එක පිළිබඳව. නමුත් විශේෂ වැඩ කටයුතු රාශියක් එතුමන්ලාට පවරා තිබෙනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ගත්තොත් ගරු පියසේන ගමගේ අමාත්‍යතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් මේ වන විට විශාල කාර්ය භාරයන් ඉටු කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ තුළින් මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වැවිලි සමාගම මේ වන කොට විශාල වශයෙන් ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්නට පුළුවන්කම ලැබිලා තිබීම කියන්නට සන්තෝෂයි. අපේ දිවයින පුරා පවතින අනෙකුත් ආයතන රාශියක් කඩා වැටීමේ තත්ත්වයට පත් වෙලා තිබුණත් මෙම ආයතනය විශාල වශයෙන් ලාභ ලබන ආයතනයක් බවට අද පත් වෙලා තිබෙන්නේ, කළමනාකාරිත්වයේ තිබෙන දූරදර්ශී වැඩ පිළිවෙළ නිසාය කියා මා හිතනවා. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් මොනරාගල කුමාරවත්ත වතුයාය විශේෂයෙන්ම රටේ ආර්ථිකයට ලොකු ශක්තියක් ලබා දෙන වතු යායක් බවත් සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමා රජයේ විවිධ ආයතන ගැන සඳහන් කරන අවස්ථාවේදී සෙවනගල සීනි සමාගම සම්බන්ධයෙන් සඳහන් කළා. මට මතකයි, විශේෂයෙන්ම සෙවනගල සීනි සමාගම ලාභ ලබපු ආයතනයක් බව. මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ආයතනයක් විධියට සෙවනගල සීනි සමාගම ඉතාමත්ම ලාභ ලබපු ආයතනයක් බවට පත් කරමින් කටයුතු කරන අවධියේ තමයි එක්සත් ජාතික පක්ෂ රජය 2001 සිට 2004 දක්වා එතුමන්ලාගේ රජය පැවතුණ අවධියේ එම සමාගම පෞද්ගලික ආයතනයකට විකුණන්නට කටයුතු කළේ. ඒ ඉතාමත්ම සුළු ගණනකට. එතුමා කිව්ව වචනවලින්ම කියනවා නම් කුණු කොල්ලයට විකිණීමට කටයුතු කළේ එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි කියන එක මම සඳහන් කරන්නට කැමැතියි. ඒ ස්ථානයේ තිබුණු මේ සීනි සමාගමට අයිති දේපළ රාශියක් කුණු කොල්ලයට විකුණා දමන්නට ඒ අවස්ථාවේදී එතුමන්ලා කටයුතු කළා. එහි යාන වාහන, උපකරණ සහ මෙම ආයතනයේ මුදල් ඒ වාගේම නිෂ්පාදනය කළ සීනි විශාල ප්‍රමාණයක් තිබුණා. විශාල වටිනාකමක් ඇති දේපළ සමඟ එම ආයතනය කුණු කොල්ලයට විකුණා දැමීමේ ඒ වකවානුව තුළයි කියන එක මතක් කරන්නට ඕනෑ. එම ආයතනය ලබා ගත්ත පෞද්ගලික ව්‍යාපාරිකයා මේ ආයතනයේ නිෂ්පාදනය කළේ සීනි නොවෙයි. සීනි නිෂ්පාදනය කළේ ඉතාමත්ම අඩුවෙන්. මත් ද්‍රව්‍ය තමයි වැඩි වශයෙන් නිෂ්පාදනය කළේ. රටට ජනතාවට අවශ්‍ය සීනි නිෂ්පාදනය අඩු වීම නිසා තමයි අතිගරු ජනාධිපතිතුමන් මෙවර අය වැයේදී පාඩු ලබන ආයතනයක් හැටියට මේ ආයතනය පවරා ගන්නට කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ඊයෙත් වෙලාව ලැබුණේ නැහැ. ඒ නිසා තව ස්වල්ප වේලාවක් මට අවශ්‍යයි. මොකද, මගේ අමාත්‍යාංශය පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය. වැඩිය කථා කරන්න දෙයක් නැහැ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
වැඩියෙන් විනාඩියක් දෙන්නම්.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මම කෙටියෙන් කථාව ඉවර කරනවා. මට තව විනාඩි දෙකක් තුනක් දෙන්න.

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැඩ කටයුතු තමයි මට විෂයයක් හැටියට භාරව තිබෙන්නේ. පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ කාර්ය භාරය ඉටු කිරීමේදී මහ ජනතාවත් සමඟ සම්බන්ධ කටයුතු නොවෙයි මට කරන්නට තිබෙන්නේ. මහ ජනතාව වෙනුවෙන් කටයුතු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාට මහ ජනතාවට සේවය කරන්න අවශ්‍ය සම්පත් ලබා දීම තමයි විශේෂයෙන් මේ අමාත්‍යාංශයේ වගකීම වන්නේ. ප්‍රධාන වශයෙන් අවශ්‍ය මානව සම්පත් සම්පාදනය, වැටුප් හා දීමනා ගෙවීම, භෞතික සම්පත් හා සේවා පහසුකම් සැලසීම, ප්‍රතිපත්ති සම්පාදනය, මහින්ද චින්තනයට අනුව සමස්ත සංවර්ධන ක්‍රියාවලියම ශක්තිමත් කිරීම අපගේ කාර්ය භාරයන්. අපි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සියලුම මානව සම්පත් සපයා තිබෙනවා. කාර්ය මණ්ඩල පත් කිරීම, පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම, සේවය අවසන් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම, පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් අප අමාත්‍යාංශය මඟින් සිදු කරනවා.

පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රියැදුරන්ට පවා ඒ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට මගේ අමාත්‍යාංශය දැනට කටයුතු කර තිබෙනවා. මේ ආකාරයට අපි භෞතික සම්පත් හා සේවා පහසුකම් සැලසීම වාගේම කාර්යාලයීය උපකරණ, සන්නිවේදන මාධ්‍යයන් සැපයීම, තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීම හා වාහන පවරා දීමත් සිදු කරනවා.

ගරු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය, අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සන්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගෙන ඒ කටයුතු කිරීමත් මෙම අමාත්‍යාංශය සතු විශේෂ වගකීමක් වනවා.

අපේ අමාත්‍යාංශය විරුද්ධ පාර්ශ්වයෙන් හෝ කිසිම කෙනකුගෙන් චෝදනාවක් මේ වන කොට ඇවිත් නැති අමාත්‍යාංශයක්. මම මේ අමාත්‍යාංශය ගැන සන්තෝෂ වනවා, මන්ත්‍රීවරුන් වෙනුවෙන් පාර්ලිමේන්තු අමාත්‍යාංශයේ කටයුතු කලට වෙලාවට ඉටු කිරීමට හැකි වීම පිළිබඳව.

මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමියටත්, ඒ වාගේම අතිරේක ලේකම්, ගණකාධිකාරිතුමා ඇතුළු සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ටත්, විශේෂයෙන්ම මහ භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමින් නිහඬ වනවා.

[අ. භා. 2.13]

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)

(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා, කථික ලැයිස්තුව දිහා බලලා සමහර පුළුවන් අය මුලින් කථා කරන්න පටන් ගත්තාම අපි ඒ ලැයිස්තුවට අනුව කථා කරන්නට ගියාම ටිකක් ප්‍රමාද වුණත් මට මේ අවස්ථාව සලසා දීම පිළිබඳව.

පාර්ලිමේන්තුවේ විශේෂ අය වැය කාරක සභාවේදී අපේ අමාත්‍යාංශයේ කටයුතු සාකච්ඡා කළ ආකාරය පිළිබඳව මම එකඟ වෙනවා. අපේ ඇමතිතුමන්ලා සහ විපක්ෂයේ සංවිධායකතුමා ප්‍රකාශ කළ ආකාරයට ඒ කාරක සභාවේදී සියලු මන්ත්‍රීවරුන්ට අමාත්‍යාංශ ලේකම්තුමන්ලා ඇතුළු සියලු නිලධාරින් එක්ක සුහදව කථා කරන්න සහ ගැටලු පිළිබඳව කථා කරන්න අවස්ථාව සැලසුණා. අය වැය පිළිබඳව කථා කිරීමේදී එකිනෙකා එක එක චෝදනා නඟමින් මේ සභාවේ කථා කළාට රටේ අනාගතය වෙනුවෙන් ගන්නා වූ තීන්දුවලදී තිබෙන බාධක කම්කටොලු ඉදිරිපත් කරන්න අවස්ථාවක්, අවකාශයක් අපට ඒ කාරක සභාව තුළින් ලැබුණා. සමහර අවස්ථාවලදී අපි කෙනෙක් කිවූ දෙයක්, කෙනෙක් සපයා දුන් තොරතුරක් පිළිබඳව මෙතැනට ඇවිල්ලා කථා කරනවා. ඒ දෙය වැරදි වුණත් ඒ වැරදි දේ රටට අර්ථ කථනය කරන්න අපි උත්සාහ කරනවා. මේ කාරක සභාවේදී අපට ලැබුණු අවස්ථාවන් තුළදී එවැනි දේවල් නිවැරදි කර ගන්න පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මා ගැන විශේෂ ප්‍රකාශයක් කිරීම පිළිබඳව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ කෙසේ නමුත් අද මේ රටේ පෞද්ගලික ප්‍රවාහන සේවය පිළිබඳව කථා කිරීමේදී හැම මොහොතකම මාධ්‍ය සංදර්ශනවලට යොමු වෙමින් ක්‍රියා කරන එක්තරා බස් සංගමයක් මඟී ජනතාවගේ කථිකාවට ලක් වෙලා තිබෙන බව කියන්නට ඕනෑ. මේ රටේ පෞද්ගලික බස් රථ 22,800ක් තිබෙනවා. ඒ බස් රථ 22,800 අයත් සංගම් ගණනාවක් තිබෙනවා. ඒ සංගම්වල අවශ්‍යතාව විය යුත්තේ කුමක්ද? ඔවුන්ගේ සේවාදායකයා මඟී ජනතාවයි. මඟී ජනතාවට අවශ්‍ය ගුණාත්මක ප්‍රවාහන සේවාවක් සැපයීම අප විසින් ඉටු කළ යුතු කාර්ය භාරයක්. ඒ කාර්ය භාරය කිරීමේදී සමහර අවස්ථාවල ඒ සංගම් විවිධාකාරයේ අර්ථ කථනයන් කරනවා. පසු ගිය දිනක පුවත් පත්වලින් සහ මාධ්‍ය තුළින් මම දැක්කා මල් වඩම් තිබුණා කියලා කියනවා. එහෙම නැත්නම් දුරකථන මඟින් මරණීය තර්ජන ලබා දුන්නා කියලා කියනවා. දුරකථන මඟින් මරණීය තර්ජන ලබා දුන්නා නම් අද තාක්ෂණය දියුණු වෙලා තිබෙන නිසා දුන්නු කෙනා සොයා ගන්න, බලා ගන්න පුළුවන්කම තිබෙනවා. එහෙම නැතිව කථා කරන්න ගියාම සමහර විට ජීනීවා සමුළුවට ඒ අයටත් යන්න වෙයි. ජිනීවාවලට ගිහින් කථා කරන්න අවස්ථාවක් සලසා ගන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. සමහර විට අපේ ලේකම්තුමාට එන්තරවාසි යවනවා කියලා ප්‍රකාශ කරන්න සූදානම් වේවි. මම ඉතාම කරුණාවෙන් සහ ඉතාම වග කීමෙන් කියනවා අපේ රටේ ප්‍රශ්න අපට කථා කරන්න පුළුවන්කමක් තිබෙනවාය කියා. අපිත් එක්ක සාකච්ඡා කරලා මේ ප්‍රශ්න විසඳා ගෙන ඉස්සරහට යන්න පුළුවන්කමක් තිබෙනවා. මේ සියලු දේ පොදු ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු බව ඔවුන්ගේ අරමුණ විය යුතුයි.

පෞද්ගලික ප්‍රවාහන සේවය පොදු ප්‍රවාහන සේවයේ කොඳු නාරටිය බවට පරිවර්තනය කළ යුතුයි කියා මහින්ද චින්තනයේ සඳහන් වෙනවා. එහෙම නම් පෞද්ගලික ප්‍රවාහන සේවය අලුත් තාක්ෂණයට බද්ධ කර එයට ගුණාත්මක භාවයක් ලබා දිය යුතු වෙනවා. මේ ගුණාත්මක භාවය ලබා දීමේදී අපට පළමුවෙන්ම කරන්න වෙන්නේ 22,800ක් තිබෙන බස්වල රියදුරන්ට සහ කොන්දොස්තරවරුන්ට ඒ වගකීම හරියාකාරව ඉටු කරන්න පුහුණුවක් ලබා දීමයි. ඒ කාර්ය අද ජාතික ගමනා ගමන කොමිසම මඟින් කරනවා. ඒ විතරක් නොවෙයි. බස් හිමියාට ගෙදර ඉඳලා ඒ සියලු තොරතුරු බලා ගන්න පුළුවන් විධියට GPS තාක්ෂණය සම්බන්ධ කරන්නත් අවස්ථාව සැලසෙනවා. ඒ වාගේම බස් රථ ධාවනය වන්නේ කොයි ආකාරයෙන්ද, කොහේ සිටද කියන එක මඟී ජනතාවට දැන ගැනීම සඳහා ඩිජිටල් තාක්ෂණයත් සමඟ සම්බන්ධ වුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න සූදානමක් තිබෙනවා කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

මම දැක්කා අද පුවත් පතක තිබෙනවා ජංගම දුරකථනයකින් කථා කරමින් ධාවනයේ යෙදුණු රියදුරකු අතින් වුණු වැරැද්දක් නිසා 15 දෙනෙකු රෝහල් ගත කරලා තිබෙනවා කියලා. මාර්ග නීතිරීති උල්ලංඝනය කරමින් කටයුතු කිරීම නිසා මේ ජීවිත අවතක්සේරුවට පත් වී තිබෙනවා.

මඟී ජීවිත ඇපයට තියා ගෙන ක්‍රියා කරන්න ඔවුන් සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා අද දවසේ මා විශේෂ ඉල්ලීමක් කරනවා, පොලීසිය මේ සඳහා රාජකාරි කිරීමේදී මේ පිළිබඳව විමසීම් කිරීමේදී දැඩි ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කරන්න ඔබතුමන්ලාගේ සහයෝගයත් ලබා දෙන්න කියලා. ඒ වාගේම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියටත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවටත් අප නියෝගයක් නිකුත් කරන්න බලාපොරොත්තු වෙනවා, මේ වාගේ වැරැදි කරන උදවිය පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පවත්වලා ඒ බස් හිමියන්ගේ බලපත්‍ර අලුත් කිරීම අත් හිටුවන්න කටයුතු කරන්න කියලා. මහ ජන ජීවිත අත් අඩංගුවට අරගෙන, ඒ ජීවිත ඇපයට තියා ගෙන ඔවුන් ක්‍රියා කරන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ඔවුන්ගේ කාර්යය පමණක් ඉටු කර ගැනීමට සිතන නිසායි. ඔවුන් මේ ජීවිත ගැන තක්සේරුවක් ලබා ගන්න සූදානම් වන්නේ නැහැ. මේ ජීවිත ගැන තක්සේරුවක් ලබා ගත යුතුයි. මේ ප්‍රවාහන පද්ධතිය ගුණාත්මක සේවාවක් බවට පත් කිරීම සඳහා අප මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ මෙන්න මේ කරුණු කාරණා ගැන හොඳ අධ්‍යයනයක් කිරීමෙන් පසුවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මහ පොළොවේ පය ගහලා ඉන්න මිනිසුන් හැටියට මඟී ජනතාව ගැන අපටත් වග කීමක් හා යුතුකමක් තිබෙනවා. ඒ වගකීම, යුතුකම ඉටු කිරීමේදී මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය මට ශක්තිය දෙනවා. ඒ වාගේම ජාතික ගමනාගමන කොමිෂන් සභාවත්, පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිවල ඇමතිතුමන්ලා සහ සභාපතිතුමන්ලාත් මට හොඳ සහයෝගයක් ලබා දෙනවා.

අපට සිහිනයක් වී තිබුණු, දශකයක් විතර කාලයක් තිස්සේ අප කථා කරමින් හිටපු විද්‍යුත් කාල සටහන් -ඒකාබද්ධ කාල සටහන්- ක්‍රමය ක්‍රියාත්මක කරන්න අද අප සූදානම් වෙලා ඉන්නවා. මේ ඒකාබද්ධ කාල සටහන් ක්‍රියාත්මක කිරීමේදී පොදු සේවාවත් -ලංගමයත්- එක්ක එකතු වෙලා එය ක්‍රියාත්මක කරන්න අප සූදානම්. ලබන වර්ෂයේදී එය ක්‍රියාත්මක කරලා මේ රටට ගැළපෙන ආකාරයට පවත්වා ගෙන යන්න අපට පුළුවන් වනවා කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

[ගරු සී. බී. රත්නායක මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවාහන පද්ධතියේ අඩු පාඩුකම් තිබුණොත් මගී ජනතාවට බඩගින්න වාගේම එයත් හොඳට දැනෙනවා. ප්‍රවාහන පද්ධතිය නිසි ආකාරයෙන් සකස් කිරීමේදී මගී ජනතාවට සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ගැනීම සඳහා, ඔවුන්ගේ ශරීර කෘත්‍යයන් ඉටු කර ගැනීම සඳහා පහසුකම් සපයන්නත් අවශ්‍යයි. ඒ අවශ්‍ය පහසුකම් සලසා දෙන්න තාවකාලික ලැගුම් හල් නිර්මාණය කරලා ඒ තුළින් ඔවුන්ට නිදහසේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා ගන්න, අනිකුත් අවශ්‍යතා ඉටු කර ගන්න වැඩ පිළිවෙළක් සකස් කර, එය දිස්ත්‍රික්ක විසිපහේම ක්‍රියාත්මක කරන්න අප බලාපොරොත්තු වෙනවා.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් අද කොළඹට විතරක් සීමා කර තිබෙන කාර්යාල පහසුකම් දිස්ත්‍රික්ක විසිපහටම ව්‍යාප්ත කරන්නත් අප සූදානම් කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ "සිසු සැරිය", "නිසි සැරිය", "ගැමි සැරිය" සේවා මේ ප්‍රවාහන පද්ධතිය තුළ ඉතාම ඕනෑකමින් අප ක්‍රියාත්මක කරන බව. අද පොදු ප්‍රවාහන සේවාව රාත්‍රී සේවාවන් ඉටු කළත්, පෞද්ගලික ප්‍රවාහන සේවාව ග්‍රාමීය මට්ටමින් රාත්‍රී සේවාවල යෙදීමක් ක්‍රියාත්මක නොවන නිසා ඒ අවස්ථාව සලසා දෙන්න "නිසි සැරිය" වැඩසටහන ක්‍රියාත්මක කරන්න අප සූදානම් වෙලා තිබෙනවා. සියලු පළාත් එක්ක සාකච්ඡා කරලා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන්න අප කටයුතු කර ගෙන යනවා. දරුවෙක් හදලා ඒ දරුවාට නිසි ලෙස අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් නම් ඒක ඒ දෙමව්පියෝ ලබන මහත් භාග්‍යයක්. ඒ සඳහා ඔවුන්ට ප්‍රවාහන පහසුකම් නැති වුණොත් මොකද වන්නේ? රටක් සංවර්ධනය වන කොට, ගහට පොත්ත වාගේ ඒ සංවර්ධනය හා බැඳී පවතින්නේ ප්‍රවාහන පද්ධතියයි. ඒ ප්‍රවාහන පද්ධතියත් එක්ක එකතු වෙලා ඒ ගමන යන්න අවස්ථාව සැලසීම රජයක වග කීමක්. සංවර්ධනය වූ රටක උගත්, බුද්ධිමත් පිරිසක් බිහි කිරීමේ අභිලාෂය තුළ ඒ දරුවාට අවශ්‍ය පහසුකම් සලසා දීමට, අධ්‍යාපනය ලබා ගෙන ඉදිරියට යන්නට ඔවුන්ට සිසු සැරියට සමගාමීව බයිසිකල් ලබා දීමේ වැඩ පිළිවෙළකුත් අප ක්‍රියාත්මක කර තිබෙනවා. ඒකෙන් අප බලාපොරොත්තු වන්නේ ප්‍රතිලාභයක් ලබා දෙනවාට වඩා අධ්‍යාපනය ලබා ගැනීම සඳහා යාමට ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අලුත් තාක්ෂණය යොදා ගනිමින් මුදල් පරිහරණය කරන්නේ නැතිව කාඩ් එකක් මඟින් බස් ගාස්තුව ගෙවීමේ අවස්ථාව ඒ දරුවන්ට සලසා දෙන්නත් සූදානමින් ඉන්නවා. ඒ සඳහා අප දැන් සාකච්ඡා කර ගෙන යනවා. නිවැරැදිව කාලය හසුරුවමින්, නිවැරැදිව පැන හසුරුවමින් මේ රටට නිවැරැදි තොරතුරු, නිවැරැදි දත්ත හඳුන්වා දෙන්නේ, ඒ සඳහා ක්‍රියා කරන්නේ මාධ්‍යවල සහෝදර සහෝදරියනුයි. ඔවුන්ටත් ඒ අවස්ථාව සලසා දෙන්න අප දැන් සාකච්ඡා කරමින් යනවා.

අප මේ කාරණා සියල්ල එකට එකතු කර ගෙන යන්න සූදානම් වන මොහොතේ මම විශේෂයෙන්ම මාධ්‍යයෙන් පැහැදිලිව ඉල්ලීමක් කරනවා, මේ රටේ මගී ජනතාව වෙනුවෙන් ගුණාත්මක ප්‍රවාහන සේවාවක්, ප්‍රවාහන පද්ධතියක් සකස් කිරීමේ කාර්යයේදී සියලු රට වැසියන් වාගේම, ආණ්ඩුව හැටියට අප ඉස්සරහට යන්න සූදානම් වන කොට ඒ සඳහා මාධ්‍යයේ සහයෝගයද ලබා දෙන්න කියා. එක්තරා සංගමයක් අර ගෙන ඒ සංගමය හුවා දක්වමින් කටයුතු කරන්න සූදානම් වෙන්න එපා. මාධ්‍ය තුළ හැසිරෙන සහෝදර සහෝදරියනුත්, ඒ වාගේම අපත් - සියලු දෙනාම- එකට පාසල් ගියේ ඒ බස් රථයේම වෙන්න පුළුවන්. ගුණාත්මක සේවාවක් නැත්නම් එය විවේචනයට ලක් කිරීමට වඩා ඒ ගුණාත්මක සේවාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසු බිම සකස් කිරීමයි අපේ යුතුකම හා වගකීම වන්නේ. ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බලාපොරොත්තුව රටේ සංවර්ධනයයි. අපි ඒ සංවර්ධනය නිවැරදිව ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ගන්නේ නැතිව යාපනය වාගේ ප්‍රදේශවල ප්‍රවාහන පද්ධතිය ක්‍රියාත්මක කර ගෙන යන කොට රාජකාරිය හරියාකාරව අකුරට ඉටු කළ යුතුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතනවා ඔබතුමාටත් මේ ප්‍රශ්නය තිබෙනවා කියා. මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ උපදෙස් අර ගෙන කටයුතු කර ගෙන යන කොට ඒක අතර මග නතර කරන්න යම් කෙනෙකු උත්සාහ ගත්තා නම් එය වැරැදියි කියන එක මා විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලබන 2012 වර්ෂයේදී බලපත්‍ර නොලබා හිතුවක්කාරව ප්‍රවාහන කටයුතු කරන අයට එසේ ක්‍රියාත්මක වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. ඒ වාගේම අයුතුසහගත විධියට ක්‍රියාත්මක වෙනවා නම්, ජනතාව ඇපයට තියලා, ජනතාව උකසට තියලා කටයුතු කරන්න හදනවා නම් ඔවුන්ගේ ඒ බලාපොරොත්තු ඉටු කර ගන්න ඉඩ දෙන්න අපි සූදානම් නැහැ. පැහැදිලිවම ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දෙමින්, පෞද්ගලික බස් සේවාවේ වගකීම් හරියාකාරව ඉෂ්ට කරමින්, පෞද්ගලික බස් කර්මාන්තයත් නිසි ලෙස පවත්වා ගෙන යා හැකි නිසි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න සූදානම් වනවා කියන එකත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලේකම්තුමාත්, මගේ ආයතනයේ සභාපතිතුමන්ලා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයත්, ඒ වාගේම මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයත් ලබා දෙන සහයෝගයට මගේ ගෞරවණීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 2.26]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் தெரிவுக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்ட 21 அமைச்சுக்களின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே, முக்கியமாக தபால் சேவைகள் தொடர்பில் எனது கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன். வடக்கு, கிழக்கு மாகாணங்களினுடைய தபால் சேவையில் சில மாற்றங்களை ஏற்படுத்துவது தொடர்பில் அரசு முக்கிய கவனத்தைச் செலுத்தி வருகின்றது. இதற்கான முயற்சிகளைத் தபால் சேவைகள் அமைச்சும் தபால் திணைக்களமும் இணைந்து மேற்கொண்டு வருகின்றன. கடந்த யுத்த காலங்களிலும் சரி, அல்லது அதற்குப் பிற்பட்ட காலங்களிலும் சரி, வடக்கு, கிழக்கு மக்களிடையிலான தகவல் பரிமாற்றத்துக்கும் அவர்களுக்கிடையிலான தொடர்பாடலுக்கும் கடிதப் போக்குவரத்து மிக முக்கிய இடத்தை வகித்தது. இந்தத் தபால் சேவையானது அம்மக்களின் வாழ்வாதாரத்திலும் பாரிய பங்களிப்பைச் செய்தது. யுத்த காலத்தில் பல்வேறுபட்ட இன்னல்களும் கஷ்டங்களும் ஏற்பட்டபோதிலும்கூட, வன்னி மற்றும் யாழ்ப்பாணப் பகுதிகளில் இந்தச் சேவையானது ஒழுங்கான முறையில் இடம்பெற்றது. அக்காலகட்டங்களில், குறிப்பாக 2006 முதல் 2009 ஜனவரி மாதம் வரை வன்னிப் பகுதியில் இலங்கை செஞ்சிலுவைச் சங்கமானது, பன்னாட்டு செஞ்

சிலுவைச் சங்கத்தோடு இணைந்து அதன் உதவியுடன் வன்னிப் பகுதிக்குத் தபால் பொதிகளை மாற்றம் செய்யும் பணிகளை ஒழுங்காகச் செய்துவந்தது. அக்காலகட்டங்களில் கிளிநொச்சி மாவட்ட செஞ்சிலுவைச் சங்கத்தின் செயலாளராக இருந்தவன் என்ற வகையில், நானும் அப்பணிகளில் பூரணமாக ஈடுபட்டிருந்தேன்.

அக்காலத்தில் வட மாகாணத்தில் நடைமுறையில் இருந்த நிருவாகக் கட்டமைப்பானது பின்வருமாறு இருந்தது: அதாவது, வட மாகாணப் பிரதி அஞ்சல் மாஅதிபரின்கீழ், சிரேஷ்ட நிருவாகச் செயலாளரும் அவருக்குக்கீழ், யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார், வவுனியா ஆகிய ஐந்து மாவட்டங்களுக்கும் ஒவ்வொரு மாவட்ட அத்தியட்சகர்களும் நிருவாக நடவடிக்கைகளில் ஈடுபட்டு வந்தனர். எனினும், வட மாகாணத்தினுடைய தபால் திணைக்களத்தின் நிருவாகக் கட்டமைப்பில் ஆளணியைக் குறைக்குமுகமாக - தமிழ் உத்தியோகத்தர்களைக் குறைக்கும் நோக்கில் - தற்பொழுது, யாழ்ப்பாணத்தை யாழ்ப்பாணம் வடக்கு என்றும் யாழ்ப்பாணம் தெற்கு என்றும் இரண்டு வெவ்வேறு தனி அலகுகளாகப் பிரித்து, அவற்றுக்கு இரண்டு அத்தியட்சகர்களும் வவுனியா, முல்லைத்தீவுக்கு தலா ஓர் அத்தியட்சகர் வீதமும் மொத்தமாக வட மாகாணத்தில் நான்கு அத்தியட்சகர் காரியாலயங்களை உருவாக்குவதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இதில் மிக முக்கியமாகக் கருத்தில்கொள்ளவேண்டிய விடயம் என்ன வெனில், யுத்தத்தினால் முழுமையாகப் பாதிக்கப்பட்ட கிளிநொச்சி மாவட்டத்தின் அத்தியட்சகர் பணிமனையானது கடந்த காலங்களில் மிகச் சிறப்பாக இயங்கிவந்தது. இவ்வாறு இயங்கிய அந்தப் பணிமனை தற்பொழுது மூடப்பட்டு, அதற்குப் பதிலாக யாழ்ப்பாணம் தெற்கு என்று ஒரு புதிய அத்தியட்சகர் பணிமனை உருவாக்கப்படுகின்றது. யாழ்ப்பாணம் தெற்கு அத்தியட்சகர் பணிமனை என்று ஒன்றை உருவாக்குவதைவிட, கிளிநொச்சி மாவட்டத்துக்குரிய பணிமனை தனியாகவே இயங்க வேண்டும்.

அவ்வாறே, மன்னார் மாவட்டத்தில் சிறந்த முறையில் இயங்கிவந்த மன்னார் மாவட்ட அத்தியட்சகர் பணிமனையும் மூடப்பட்டு, அது வவுனியாவுடன் இணைக்கப்படுகின்றது. இந்நிலையை மாற்றி, மன்னார் மாவட்டத்துக்கென ஒரு தனியான அத்தியட்சகர் காரியாலயம் இருக்க வேண்டும்; அதனைச் சரியானமுறையில் இயங்கவைக்கவேண்டும். ஏனெனில், மன்னார் மாவட்டமானது பரந்த நிலப்பரப்பைக் கொண்டது. அங்கு தனியான ஓர் அத்தியட்சகர் காரியால யத்தை அமைப்பதன்மூலமே அங்குள்ள மக்களுக்குச் சிறந்தமுறையில் தபால் சேவையை வழங்க முடியும். எனவே, தற்பொழுது தீர்மானித்திருக்கின்ற இத்திட்டத்தைக் கைவிட்டு, அந்த மக்களுக்கு கிடைக்கவேண்டிய சேவைகளைச் சரியான முறையில் வழங்குவதற்குத் தபால் திணைக்களம் நடவடிக் கைகளை எடுக்கவேண்டும். இது ஒருமுகப்பட்ட அல்லது தனிப்பட்ட தீர்மானமாக அமையக்கூடாது. மிக முக்கியமாக, மன்னார் மாவட்டத்திலுள்ள முருங்கன் தபாலகக் கட்டிட மானது, இன்றும் இராணுவத்தினருடைய கைகளில் அவர்களுடைய முகாமாகவே இருக்கின்றது. இக்கட்டிடத்தைத் தபால் திணைக்களம் மீளப்பெற்று, அதனை இயங்கச் செய்வதற்கு நடவடிக்கை எடுத்து, அங்குள்ள மக்களுக்குச் சிறந்த தபால் சேவையினை வழங்குவதற்கு முன்வரவேண்டும்.

அடுத்து, அஞ்சல் திணைக்களத்தினால் தீர்மானிக்கப் பட்டுள்ள நிருவாகக் கட்டமைப்பு மாற்றம் பற்றிய மேலும் சில விடயங்களை நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இந்த மாற்றத்தின்மூலம் பல ஆளணிகள் வேறு பிரதேசங்களுக்குக் கொண்டு செல்லப் படுவதன் காரணமாக வடக்கு, கிழக்குப் பிரதேங்களில் மேற் கொள்ளப்படும் அஞ்சல் சேவை தொடர்பான அபிவிருத்திகள் பாதிப்படையும் வாய்ப்புள்ளது. அதேபோல, அஞ்சல் திணைக்களத்தினூடாக வடக்கு, கிழக்கு மக்கள் பெற்றுக்கொள்ள எதிர்பார்க்கின்ற சேவைகளை மேலும் விருத்தி செய்ய முயற்சிக்காமல், அதன் நிருவாகக் கட்ட மைப்பை மாத்திரம் சுருக்கிக்கொள்ள முனைவதானது, மக்களுக்கு வழங்கும் சேவையிலும் அதன் தரத்திலும் பாதிப்பை ஏற்படுத்தக்கூடும். ஏற்கெனவே வடக்கு, கிழக்கில் உள்ள அஞ்சல் அலுவலகங்கள் அங்குள்ள பொது மக்களுக் கான சேவைகளைத் திறம்பட வழங்க முடியாதளவுக்கு அடிப்படை வசதியற்ற நிலையில் இயங்குவதை நாம் இங்கு குறிப்பிட வேண்டும். வடக்கு, கிழக்கைச் சேர்ந்த உத்தியோகத் தர்கள் உயர் பதவிகளை வகிக்கும் வாய்ப்புக்கள் இல்லா தொழிக்கப்பட்ட நிலையில், அங்கு ஏற்படும் வெற்றிடங் களைக் காரணங்காட்டி ஆளணிகளைக் குறைக்க நினைப்பது பாரபட்சமான நடவடிக்கையாகும். வடக்கு, கிழக்கில் அஞ்சல் சேவையை அபிவிருத்தி செய்யவேண்டுமென்ற நோக்கில் ஆர்வத்துடன் கடமையாற்றும் தகைமையுள்ள உத்தியோகத்தர் களுக்குப் பதவியுயர்வுகளை உடனுக்குடன் வழங்க திணைக்களம் எந்தவிதமான நடவடிக்கைகளையும் இதுவரை மேற்கொள்ளவில்லை. எதிர்காலத்தில் வடக்கு, கிழக்கில் மக்கள் முற்றாக மீள்குடியமர்த்தப்பட்டு, உட்கட்டமைப்பு வசதிகள் கட்டியெழுப்பப்பட்டு, அஞ்சல் சேவை விருத்தி செய்யப்படும்பட்சத்தில், மீண்டும் இந்த ஆளணிகளை வழங்கும் உத்தரவாதமோ அல்லது கட்டமைப்பை மீளமைக்கும் உத்தரவாதமோ இல்லாத நிலையொன்று அங்கு உருவாக்கப்பட்டிருக்கிறது. அங்கிருக் கின்ற தபாலகங்கள் மட்டும் மாற்றப்படவில்லை; அங்கிருக் கின்ற உத்தியோகத்தர் களின் எதிர்காலம்கூட கேள்விக்குறி யாக்கப்பட்டிருக்கிறது. இன்னும் 20 வருடங்களில் வடக்கு மாகாணத்துக்கான பிரதி அஞ்சல் மாஅதிபருடைய நியமனம் இல்லாதொழிக்கப் படுகின்ற ஒரு செயற்பாடு அங்கு நடைபெற்றிருக்கிறது. மிக முக்கியமாக, வட மாகாண சிரேஷ்ட நிருவாகச் செயலாளர் ஆளணி நிறுத்தப்பட்டு, இக் குறிப்பிட்ட ஆளணி மேல் மாகாண நிருவாகக் கட்டமைப்பில் சேர்க்கப்பட்டு புதிய பதவி யொன்று உருவாக்கப்பட்டுள்ளது. ஏன், வட மாகாணத்துக் குரிய ஆளணியை மேல் மாகாணத்தோடு இணைக்க வேண்டுமென்பதை நான் இந்தச் சபையிலே கேட்க விரும்புகின்றேன்.

புதிய கட்டமைப்பில் Senior Superintendent of Post என்ற பெயரில் பதவியொன்று உருவாக்கப்பட்டிருக்கிறது. வடக்கு, கிழக்கு மாகாணங்களிலே வாழுகின்ற மக்களுக்குச் சேவையாற்றுகின்ற தபால் உத்தியோகத்தர்களுடைய பதவி உயர்வுகளைப் பறிக்கின்ற ஒரு செயற்பாடாகவே இது அமைகின்றது. இது அமைச்சரவையால் நியமனம் மேற் கொள்ளப்படுகின்ற உயர் அதிகாரி தர ஆளணியென்பதை நாங்கள் இங்கு குறிப்பிட வேண்டும். வட மாகாணம் பாரிய நிலப்பரப்பையும் பல மாவட்டங்களையும் கொண்டிருக்கின்ற அதேவேளை, அபிவிருத்தி தொடர்பில் கூடுதல் அக்கறை செலுத்தவேண்டிய ஒரு மாகாணமாகவும் இருக்கின்றபடியால் அந்த ஆளணி அங்கிருக்கவேண்டியது மிகமிக அவசியமாகும். மேலும், மாவட்ட அத்தியட்சகர் காரியாலயங்கள் மூடப்படுவது உடனடியாக நிறுத்தப்பட்டு மன்னார், கிளிநொச்சி மாவட்டங்களுக்கான அத்தியட்சகர் காரியாலயங்கள் சிறந்த முறையில் இயங்குவதற்கு ஒத்துழைப்பு வழங்க வேண்டும். ஏற்கெனவே முழுமையாக அழிக்கப்பட்ட கிளிநொச்சி மாவட்ட தபாலகத்தினுடைய கட்டுமான வேலைகள் இப்பொழுதுதான் நடைபெற்று வருகின்றன. மக்களுக்கான சேவைகளை வழங்க

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

முயற்சிக்கின்ற இந்தக் காலகட்டத்தில் அங்கிருக்கின்ற ஆளணிகளின் தரங்களைக் குறைப்பதன்மூலம் அல்லது அங்கு அத்தியட்சகர் பதவிகளை இல்லாமற் செய்வதன்மூலம் அந்த மாவட்டங்கள் புறக்கணிக்கப்படுகின்ற நிலை உருவாக்கப் பட்டிருக்கிறது.

அடுத்து, தபாலதிபர் தரம் 1இல் பதில் கடமையாற்றும் 108 உத்தியோகத்தர்களின் நிரந்தரப்படுத்தலில் இழுத்தடிப்பு நிலை காணப்படுகின்றது. பொதுச் சேவை ஆணைக்குழுவின் அனுமதியின்படியும், அமைச்சின் செயலாளர் அவர்களின் 2007.02.02ஆந் திகதிய பதவி உயர்வுக்கான கடிதத்தின் பிரகாரமும் 244 பேர் பதில் கடமையாற்ற நியமிக்கப்பட்டனர். இந்த எல்லா உத்தியோகத்தர்களுக்கும் நிரந்தரப்படுத்தலைச் செய்துகொடுப்பதில் பாரபட்சமான நோக்கங்கள் இருந்த படியால் திணைக்கள நிருவாகமானது தமது நோக்கத்திற் கேற்றவாறு பட்டியலில் பின்னாலுள்ள 108 உத்தியோகத்தர் களையும் திட்டமிட்டு ஒதுக்கிவிட்டு, பட்டியலின்படி முதல் 136 உத்தியோகத்தர்களுக்கு மாத்திரம் 2010.09.01ஆம் திகதி நிரந்தரப்படுத்தலை மேற்கொள்ள நடவடிக்கை எடுத்தது. நிரந்தரமாக்கப்படாத 108 உத்தியோகத்தர்களில் வயதில் குறைந்த 31 தமிழ் பேசும் உத்தியோகத்தர்கள் உள்ளடக்கப் பட்டிருந்தனர். நிரந்தரமாக்கப்பட்ட 136 பதில் கடமையாற்றும் உத்தியோகத்தர்களில் 11 தமிழ் பேசும் உத்தியோகத்தர்களே உள்ளடக்கப்பட்டிருந்தனர். இதில் 7 உத்தியோகத்தர்கள் ஏற்கெனவே பதவியுயர்வு கிடைக்காமலேயே இளைப்பாறிச் சென்றுவிட்டனர். இன்னும் 108 உத்தியோகத்தர்களின் நிரந்தரப்படுத்தலை திணைக்கள நிருவாகமானது பல சாக்குப்போக்குகளைக் கூறி, திட்டமிட்டு இழுத்தடிப்புச் செய்து வருகின்றது. வடக்கு, கிழக்குப் பிரதேச இளம் உத்தியோகத் தர்கள் உயர் பதவிகளுக்கான பரீட்சைகளை எழுதும் வாய்ப்புக்கள் கடந்த 10 வருடங்களாக இல்லாமற் செய்யப் பட்டு வருகின்றது. இது வடக்கு, கிழக்கில் உயர் அதிகாரி தரத்தில் அதிக வெற்றிடங்கள் ஏற்பட வழி வகுத்துள்ள தென்பதை நாம் இங்கு குறிப்பிட விரும்புகின்றோம்.

இவ்வருட ஆரம்பத்தில் இடம்பெற்ற நுண்ணாய்வு அதிகாரி பதவிக்கான போட்டிப் பரீட்சைகூட அங்கீகரிக்கப்பட்ட ஆட்சேர்ப்புத் திட்டத்தை அப்பட்டமாக மீறும்வகையில் பாரபட்சமான முறையில் நடத்தப்பட்டது. தகைமையுடைய தமிழ் பேசும் உத்தியோகத்தர்கள் அனைவருக்கும் இப்பரீட்சை எழுதும் சமவாய்ப்பை இல்லாமற் செய்யும்பொருட்டு, விண்ணப்பிப்பதற்கான தகைமையைக் குறிப்பிடும் முக்கியமான திருத்தக் கடிதமொன்றினைக்கூடத் திணைக்கள நிருவாகமானது அவசர அவசரமாகத் தயாரித்து விண்ணப்ப முடிவுத் திகதியன்று கொழும்பில் அஞ்சலிட்டிருந்தது. அத்தோடு, அப்பதவிக்கு விண்ணப்பிக்குமாறு தாம் விரும்பிய வர்களுக்கு மட்டும் தொலைபேசிமூலம் அறிவித்தல் வழங்கப் பட்டதாகவும் நாம் அறிகின்றோம். மட்டக்களப்பு, யாழ்ப் பாணம் போன்ற பிரதேசங்களுக்கு விண்ணப்ப முடிவுத் திகதிக்குப் பல நாட்களின் பின்னரேயே கிடைத்த இக்கடிதம் கூடக் குழப்பம் நிறைந்ததாகவே தயாரிக்கப்பட்டிருந்தது. அதன்காரணமாக நான்கு தமிழ் பேசும் உத்தியோகத்தர்களே பரீட்சைக்குத் தோற்றக்கூடுமாயிருந்துள்ளது. இதுதொடர்பாக விசாரணைகளை மேற்கொள்ளுமாறு விடுக்கப்பட்ட கோரிக்கைகளுக்குத் திணைக்களம் எதுவித பதிலையும் தராது மௌனம் சாதிப்பதாகச் சம்பந்தப்பட்ட உத்தியோகத்தர்கள் தெரிவிக்கிறார்கள். மிகமுக்கியமாக தமிழ் பேசும் உத்தியோகத் தர்கள் தமது மாகாணத்தில்கூட உயர் அதிகாரிகளாக வரமுடியாத வகையில் ஒரு சூட்சுமமான பொறிமுறை உருவாக்கப்பட்டுள்ளது. தமிழ் பேசும் உத்தியோகத்தர்கள் தமது மாகாணத்தில் உயர் அதிகாரிகளாக வருவதற்கான வாயில்கள் அனைத்துமே இன்று திட்டமிட்டு அடைக்கப்பட்டு விட்டதாக அவர்கள் கருதுகின்றார்கள். இன்னும், வட மாகாண பிரதி அஞ்சல் மாஅதிபரின் ஓய்வின் பின்னர் இனிவரும் 20 வருடங்களுக்கு வடக்கு, கிழக்கைச் சேர்ந்த எவருமே மாகாணங்களுக்குப் பொறுப்பான பிரதி அஞ்சல் மாஅதிபர் பதவியைப் பெற்றுக்கொள்ளமுடியாத எவுக்குத் திணைக்கள நிர்வாகத்தினால் திட்டமிட்ட வகையிலே தயாரிக்கப்பட்டுள்ள நிகழ்ச்சிநிரலொன்றின் அதனடிப்படை யிலேயே வடக்கு, கிழக்குப் பணியாளர்கள் நியமனம் செய்யப்படுவதாகப் அவர்கள் தெரிவிக்கின்றார்கள்.

இன்றைய நிலையில் தபால் திணைக்களத்தில் வடக்கு, கிழக்கிலுள்ள அதிகாரிகள் பதவிகளில் 90 வீதமானவை வெற்றிடங்களாகவே காணப்படுகின்றன. ஒன்றில் அவை கீழ்ப் பதவிகளை வகிப்போரினால் ஆற்றப்படுகின்றன, அல்லது வெளிப் பிரதேசங்களில் உள்ளவர்களைக்கொண்டு நிரப்பப்படுகின்றன அல்லது அந்த ஆளணிகள் நிர்வாக மீளமைப்பு என்ற பெயரில் வேறு பிரதேசங்களுக்குக் கொண்டுசெல்லப்படுகின்றன. யுத்த காலங்களில் தமது உயிரைப் பணயம் வைத்து இரவு பகலாகச் சேவை மனப்பான்மையுடன் கடமையாற்றிய இப்பிரதேச அரசாங்கப் பணியாளர்களைத் திட்டமிட்ட நடவடிக்கைகளின்மூலம் ஏமாற்றுகின்ற அல்லது புறக்கணிக்கின்ற நடவடிக்கையாகவே இவை அமைந்துள்ளன. எனவே, மிகமுக்கியமாக இந்தத் தபால் திணைக்களத்தினுடைய செயற்பாடுகளில் தபால் சேவைகள் அமைச்சர் அவர்கள் கூடிய கவனம் செலுத்தி, ஏற்கெனவே பலவழிகளிலும் புறக்கணிக்கப்பட்டிருக்கின்ற இந்தத் தமிழ் உத்தியோகத்தர்களின் பதவியுயர்வுகள், நிரந்தரப் பதவிகளில் மாற்றங்களைக் கொண்டுவருதல் போன்றவை சம்பந்தமாக உடனடி நடவடிக்கை எடுக்கவேண்டுமென்று இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோல, மிகமுக்கியமாக இவ்வருடம் சமூக சேவைகள் அமைச்சினூடாகப் பெருந்தொகைப் பணம் போரிலே பாதிக்கப்பட்ட இராணுவ வீரர்களுக்காக ஒதுக்கப்பட்டுள்ளது. அவ்வாறே, தென்பகுதியிலுள்ள ஊனமுற்றவர்கள் மற்றும் அங்கவீனர்களுக்காகவும் நிதி ஒதுக்கப்பட்டுள்ளது. ஆனால், வடக்கு, கிழக்குப் பகுதிகளிலே, அதிலும் மிகமுக்கியமாக யுத்தம் நடந்த கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களிலே 4,000க்கு மேற்பட்டவர்கள் அங்கவீனர்களாக இருக்கிறார்கள். இவர்களுக்குச் சமூக சேவை அமைச்சினூடாக எந்தவொரு உதவித் திட்டங்களும் முன்வைக்கப்படவில்லை. மாற்றுவலு வுடையோராக கிளிநொச்சி மாவட்டத்தில் 2,200க்கு மேற்பட்டவர்களும் முல்லைத்தீவு மாவட்டத்தில் 2,600க்கு மேற்பட்டவர்களும் இருக்கிறார்கள். வடக்கு, கிழக்கிலே மொத்தமாக 10,000க்கு மேற்பட்டவர்கள் மாற்றுவலு வுடையோராக இருக்கிறார்கள். யுத்தத்தின் காரணமாக இந்த வடுக்களைச் சுமந்த இவர்களுக்கு எந்தவொரு நலன்புரித் திட்டங்களும் அறிவிக்கப்படாத நிலையில், அவர்கள் மிகக்கூடிய ஏமாற்றத்தைச் சந்தித்திருக்கிறார்கள். பல பேருடைய வாழ்க்கை முறைகள் இதனால் பாதிக்கப் பட்டிருப்பதையும் இந்தச் சபையினூடாக நான் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன். அவர்களுடைய வாழ்வாதாரங்களில் மாற்றங்களை ஏற்படுத்த வேண்டுமாயின், அவர்களும் இந்த நாட்டின் சமமான பிரஜைகளாக வாழவேண்டுமாயின், சமூக சேவைகள் அமைச்சு இந்த விடயங்களில் கூடிய கவனம் செலுத்தி, அவர்களுடைய வாழ்வாதாரத்துக்கான உதவித் திட்டங்களை அறிமுகஞ்செய்ய வேண்டும்.

அடுத்ததாக, தனியார் போக்குவரத்துச் சேவைகளில் ஈடுபடுவதில் இன்று ஒருசிலருக்கு மட்டும் அதற்குரிய அனுமதி வழங்கப்படுவதாகப் பல குற்றச்சாட்டுகள் எழுகின்றன. இதுசம்பந்தமாக அரசாங்க அதிபருடன் தொடர்புகொள்கின்ற போது அதனைத் தனியார் போக்குவரத்துச் சபை செய்வதாக அவர் குறிப்பிடுகின்றார். ஆனால், தனியார் போக்குவரத்துச் சபையிடம் கேட்கின்றபோது, அவர்கள் விண்ணப்பம் செய்து அரசாங்க அதிபரூடாக வருவதாகக் குறிப்பிடுகின்றார்கள். ஆனால், உண்மையாக பேருந்துகளை வைத்திருந்து அனுமதிக்காக விண்ணப்பித்தவர்களுக்கு இதுவரை அங்கீ காரம் வழங்கப்படாத நிலை காணப்படுகின்றது. ஆனால், பல தனியார் பேருந்துகள் எந்த அனுமதியும் இல்லாமல் தென்பகுதியிலிருந்து யாழ்ப்பாணம் வரை மக்களை ஏற்றி இறக்குகின்றன. ஆகவே, தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சு இதில் கூடிய கவனத்தைச் செலுத்திக்கொள்ள வேண்டும்.

அடுத்து, மிக முக்கியமாக பாராளுமன்ற அலுவல்கள் தொடர்பாகவும் நான் இந்த இடத்திலே சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். பாராளுமன்றம், இலங்கையிலே இருக்கின்ற அனைத்து மக்களினதும் ஓர் உயர்ந்த பீடம். இலங்கையிலே மக்களால் தெரிவுசெய்யப்படுகின்ற 225 உறுப்பினர்களும் இணைந்து ஒரு சட்டத்தை இயற்றுவதி லிருந்து மக்களுடைய பணிகளை ஆற்றுவது வரையான பல கைங்கரியங்களை இந்த மன்றினூடாகச் செய்கின்றார்கள். ஆனால், இந்த மன்றத்தில் தண்ணீர் போத்தல்களை வீசுவதன்மூலமும் அடிதடிகளில் ஈடுபடுவதன்மூலமும் ஓர் உறுப்பினர் பேசுகின்றபோது குழப்புவதன்மூலமும் ஜன நாயகத்தை மீறுகின்ற நடவடிக்கைகளில் சிலர் ஈடுபடுவதைக் காணக்கூடியதாகவுள்ளது. மிகமுக்கியமாக, எதிரணியைச் சேர்ந்தவர்கள் பேசுகின்றபோது அரசாங்க அணியினரும் அரசாங்க அணியினர் பேசுகின்றபோது எதிரணியினருமாகக் குழப்புகின்ற நடவடிக்கைகளில் கடுமையாக ஈடுபடுகின்றனர். இதன்மூலம் இந்த நாட்டினுடைய நல்ல பிரஜைகள் என்கின்ற ஒரு தன்மையை மாற்றி, வெளிநாடுகளுக்கோ அல்லது வேறு நபர்களுக்கோ தங்களுடைய அழுக்கான வடிவங்களைக் காட்ட முயற்சிக்கிறார்கள். இச்சபையிலே ஓர் உறுப்பினர் ஒரு விவாதத்தில் பேசுகின்றபொழுது அவர் கூறுகின்ற மிக முக்கியமான விடயங்களைக் கவனித்து, அதற்குரிய விடையை மற்றைய தரப்பில் பேசுகின்றவர் அளிக்க வேண்டும். அதுதான் ஜனநாயக நாட்டிலுள்ள பாராளுமன்ற உறுப்பினர்களுடைய கடமை. ஆனால், நேற்றும்கூட இப்பாராளுமன்றத்திலே ஓர் உறுப்பினர் இன்னோர் உறுப்பினரைத் தாக்கிய சம்பவம் இடம்பெற்றது. ஏற்கெனவே பல தடவைகள் இப்பாராளு மன்றத்திலே இவ்வாறான தாக்குதல்கள் இடம்பெற்றுள்ளன. நேற்றைய தினம் இச்சபையிலே கௌரவ உறுப்பினர் ஒருவர் துண்டுப்பிரசுரங்களைக் காண்பித்தபோது அவை பறித்துக் கிழித்தெறியப்பட்டன. இப்பாராளுமன்றத்திலே நடைபெறும் விடயங்களைப் பலரும் பார்வையிடுகின்றனர். பல தொலைக்காட்சி நிறுவனங்கள் இங்கு நடைபெறுகின்ற நிகழ்ச்சிகளின் காட்சிகளை வெளிக்கொணர்கின்றன. பல பாடசாலை மாணவர்கள் இங்கு வந்து இவற்றினை நேரடியாகவே பார்வையிடுகின்றனர்.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள்தான் இச் சபையைக் குழப்புவதில் முன்னணி வகிப்பவர். தயவுசெய்து கொஞ்ச நேரம் அமர்ந்திருங்கள். நான் உரையாற்றிய பின்னர் உங்களுடன் பேசுகின்றேன்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Yes, Hon. Azwer?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, நீங்கள் குழம்பக் கூடாது. நான் உங்களுடைய நன்மைக்காகத்தான் எழுந்துள்ளேன். நேற்று ஓர் உறுப்பினர் சில 'போஸ்ரர்'களை எடுத்துக்கொண்டு சபாமண்டபத்துக்குள் cross பண்ணி அரச தரப்பினரின் பக்கத்துக்கு வந்தார்கள். இது இப்பாராளு மன்றத்தின் நிலையியற் கட்டளைக்கு முரணானது. நீங்களும் ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற முறையிலே இதனை அறிந்திருக்க வேண்டும். நீங்கள் நல்லவர்; தொடர்ந்து பேசுங்கள்!

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

நீங்கள் சொல்வதுபோன்று நிலையியற் கட்டளையின் பிரகாரம் அது பிழையானது. ஆனால், உங்களுடைய தரப்பில் இருக்கின்ற உறுப்பினர் ஒருவர் சபையைக் கடந்து வந்து எதிர்த்தரப்பில் இருக்கின்ற உறுப்பினர் ஒருவருக்கு அடிப்பது, நிலையியற் கட்டளையின் பிரகாரம் சரியானதா? ஆகவே, கௌரவ உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றம் என்பது மக்களுக்கான முதன்மை நிறுவனம். இந்த நாட்டுக் குரிய சட்டங்களை நாங்கள் இங்கே இயற்றுகின்றோம். அதேநேரத்தில், இந்த நாட்டிலே முழுமையான செயற் பாடுகளின் அடித்தளமாக இப்பாராளுமன்றத்தை நாங்கள் குறிப்பிடுகிறோம். இங்கே எத்தனை பாராளுமன்ற உறுப்பினர்களுக்கு அடி விழுந்திருக்கிறது! எத்தனை பேர் அவமதிக்கப்பட்டிருக்கின்றார்கள்! ஓர் உறுப்பினர் தனது கருத்துக்களை முன்வைக்க முடியாத அளவுக்கு அவரது பேச்சைக் குழப்பும் நோக்கத்துடன் எவ்வளவோ கூச்சல்களும் குழப்பங்களும் செய்யப்படுகின்றன. ஆகவே, நாங்கள் இச்சபையிலே முக்கியமான சில விடயங்களைக் கருத்திற் கொள்ள வேண்டும். எதிர்காலத்திலே இச்சபையிலே ஒருவர் உரையாற்றியதன் பின்னர் மற்றவர்கள் தங்களுடைய கருத்துக்களை முன்வைக்கின்ற பழக்கத்தை ஒரு நல்ல நடைமுறையாகக் கைக்கொள்ள வேண்டும். நாங்கள் உலக ஜனநாயகத்துக்கும் உலக ஒழுங்குகளுக்கும் அமைய நடப்பதற்கு முனைய வேண்டும். இன்று எதிர்த்தரப்பினராக இருக்கின்றவர்கள் நாளை அரச தரப்பினராக மாறலாம்; இன்று அரச தரப்பினராக இருப்பவர்கள் நாளை எதிர்த் தரப்பினராக மாறலாம். யாருக்கும் எந்த நிலையும் வராது என நாங்கள் நினைக்கக்கூடாது. ஆகவே, இந்தப் பாராளு மன்றத்திலே ஒவ்வோர் உறுப்பினருடைய கௌரவமான பதவியும் காப்பாற்றப்பட வேண்டும். இன்றைய உலக ஒழுங்குகளையும் நாங்கள் கவனித்துக்கொள்ள வேண்டும். நாங்கள் கடந்த ஐம்பது, அறுபது வருட காலமாகப் பல நாடுகளிலும் கோலோச்சியவர்களுடைய வரலாறுகளைப் பார்த்திருக்கிறோம். [இடையீடு]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! There is a point of Order being raised by the Hon. C.B. Rathnayake.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க )
(The Hon. C.B. Rathnayake)

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, පෞද්ගලික බස් රථ බලපත්‍ර රහිතව ධාවනය වෙනවාය කියලා. ඒකට මම එකඟයි. නමුත් එතැනදී බලපත්‍ර රහිතව ධාවනය වන බස් රථ සම්බන්ධව විශේෂ පරීක්ෂණයක් කරලා, නැවත 2012 වර්ෂයේදී එහෙම ධාවනය කරන්න දෙන්නේ නැහැයි කියන ප්‍රතිඥාව, ඇමතිවරයා හැටියට මම දෙනවා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே! நன்றி. எதிர்காலத்திலே நீங்கள் செய்கின்ற பணிகளுடன் சேர்த்து மிக முக்கியமாக அந்தந்த மாவட்டங்களில் உள்ள தனியார் பேருந்துகளைக் கொள்வனவு செய்துள்ளவர்கள்மீது கவனம்செலுத்தி அவர்க ளுக்குள்ள ஜனநாயக உரிமையின் அடிப்படையில் அவர்கள் பேருந்துச் சேவைகளை நடத்துவதற்குரிய அங்கீகாரம் கிடைக்கக்கூடிய வகையில் நடவடிக்கை மேற்கொள்ள வேண்டும் என நான் மீண்டும் ஒருமுறை கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

நான் இறுதியில் பாராளுமன்ற ஜனநாயகம் சம்பந்தமாகப் பேசிக்கொண்டிருந்தேன். இலங்கையிலுள்ள இந்தப் பாராளுமன்றம் உலகத்திலுள்ள அனைத்து நாட்டு மக்களின் பார்வைகளுக்கு மத்தியில் இருக்கின்ற அதேநேரத்தில், நாங்கள் உலக ஜனநாயகத்தையும் எங்களுடைய ஜனநாயகத்தையும் இந்த நாட்டினுடைய மகிமையையும் பேண வேண்டுமாயின், இப்பாராளுமன்றிலுள்ள அனைத்துத் தரப்பினருக்கும் சம சந்தர்ப்பம் அளித்து, அனைவருடைய கருத்துக்களையும் ஏற்று நடக்கின்ற மையமாக இம்மன்றத்தை மாற்றவேண்டும். ஆனால், இந்தச் சபையிலேகூட ஒரு தேசிய இனம் இன்னொரு தேசிய இனத்தினால் நசுக்கப்படுகின்ற தன்மையே காணப்படுகின்றது. தமிழ் தேசிய இனத்தின் சார்பில் ஓர் உறுப்பினர் தனது கருத்துக்களைத் தெரிவிக்கின்றபொழுது, ஏனைய அணியினர் அந்தக் கருத்துக்களைப் புறக்கணிக்கின்ற தன்மை இப்பாராளுமன்றத்திலே காணப்படுகின்றது. ஆகவே, ஓர் உறுப்பினருடைய கருத்துக்களை மதிக்கின்ற, அவர்களுடைய கருத்துக்களுக்குச் சந்தர்ப்பம் அளித்துச் செயற்படுகின்ற மன்றமாக இதனை மாற்ற வேண்டும். அண்மைய காலங்களில் இலங்கைப் பாராளுமன்றம் தனது கௌரவமான நிலையிலிருந்து இறங்கிப்போகின்ற சூழ்நிலையை நாம் அவதானிக்கின்றோம். இந்த மண்ணிலே இத்தகைய மாற்றம் ஏற்படக்கூடாது. முக்கியமாக, உலகிலேயே நல்ல ஒரு பாராளுமன்றமாக இது மிளிர்வதற்கு நீங்கள் அனைவரும் இணைந்து பணியாற்ற வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

அண்மையிலே, மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர் மாண்புமிகு மேர்வின் சில்வா அவர்கள் ஓர் இந்து ஆலயத்துக்குள் புகுந்து அங்கிருந்த ஆலய தர்மகர்த்தா மற்றும் மக்களுடன் மிகவும் முரண்பட்ட விதத்திலே சில செயற் பாடுகளை மேற்கொண்டிருந்தார். நாங்கள் ஒரு விடயத்தைக் கட்டுப்படுத்துகின்றபொழுது அல்லது ஓர் இனத்தினுடைய அல்லது மதத்தினுடைய செயற்பாடுகளில் கை வைக்கின்ற பொழுது, அந்த நிர்வாகத்தினருடனும் அந்த இன மக்களு டனும் இணைந்து அவர்களுடைய செயற்பாடுகளினதும் ஒருங்கிணைந்த தன்மையினதும் அடிப்படையில் எமது பங்களிப்பைச் செய்ய வேண்டும். அதைவிடுத்துத் தான்தோன் றித்தனமாக எவரும் செயற்படக்கூடாது. ஆகவே, இனிவருங் காலங்களில் அப்படியான நடவடிக்கைகள் இடம்பெறாத வண்ணம் கௌரவ உறுப்பினர்களின் செயற்பாடுகள் ஒழுக்க ரீதியானவையாக இடம்பெறவேண்டும் எனவும் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். வணக்கம்.

[අ. භා. 2.46]

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අමාත්‍යාංශ 21ක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මගේ අමාත්‍යාංශය වන සමාජ සුබසාධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වෙනුවෙන් 2011 වසරටත්, 2012 වසරටත් විශාල මුදල් ප්‍රමාණයක් ලබා දෙන්නට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙන බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. පසු ගිය දවස්වල මොරටුව රාවතාවත්ත ප්‍රේම් ළමා නිවාසය සම්බන්ධයෙන් ජන මාධ්‍යවලින් විශාල ප්‍රචාරයක් ලබා දුන්නා. ඊට පසුව මම ඒ ස්ථානයට ගිහිල්ලා ඒ ස්ථානයේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා සොයා බැලුවා. ඒ ප්‍රශ්නය සම්බන්ධව මම ඒ ළමා නිවාසයේ පාලිකාවන් එක්ක සාකච්ඡාවක් කළා. එම ආයතනය තෙරේසා මව්තුමියගේ කන්‍යා සොහොයුරියන් පාලනය කරන, ඉන්දියාවේ කල්කටා නගරයේ අනාථයන් වෙනුවෙන් පිහිටුවා තිබෙන ආයතනය යටතේ ඇති අපේ කතෝලික සභාවට අයිති ආයතනයක්. ඒ ආයතනයේ එක් ශාඛාවක් හැටියට ලංකාවේත් තෙරේසා මව්තුමියගේ ගරු කන්‍යා සොහොයුරියන් පාලනය කරනු ලබන එම ළමා නිවාසය සම්බන්ධව බැලුවාම, ඒ ස්ථානයේ කිසිම නීති විරෝධී දෙයක් සිද්ධ වෙලා නැහැ කියලා පෙනෙනවා.

විශේෂයෙන්ම මේ රටේ අහිංසක කාන්තාවන් පුරුෂයන් විසින් අනාථ කරන අවස්ථාවල ඒ කාන්තාවන්ගේ නම්බුව ආරක්ෂා කර ගෙන දරුවන් බිහි කරන්න තිබෙන ස්ථානයක් හැටියට සමාජ සේවාවක් වශයෙන් කරන කටයුත්තක් ඒ. ආගමික කටයුත්තක් වශයෙන් නොවෙයි, නමුත් ආගමික පරිසරයක් යටතේ තමයි එම කටයුත්ත සිද්ධ වන්නේ. එම ස්ථානයේ කිසි තැනක නීති විරෝධී කිසිම දෙයක් සිද්ධ වෙලා නැහැ. ඒක බොහොම සාධාරණව කටයුතු කරන ස්ථානයක්. මම පැය දෙකකට වැඩි කාලයක් ඒ කන්‍යා සොහොයුරියන් සමඟ කථා කරලා ඒ පරිසරයේ තිබෙන තත්ත්වය සොයා බැලුවා. එහි සියලුම තැන්වලට ගිහිල්ලා බලන්නය කියලා ඒ අයගෙන්ම මට ආරාධනයක් ලැබුණා. "ඔබතුමා ගිහිල්ලා සෑම තැනක්ම බලලා මෙහි තිබෙන වැරැද්ද මොකක්ද කියලා අපට පෙන්වන්න." කියලා ඒ අය මට කිව්වා. විශේෂයෙන්ම දරුවන්ට, ඒ වාගේම දරුවන් ලැබෙන්න ඉන්න අම්මලාට සුරක්ෂිත ස්ථානයක් හැටියටයි ඒ ස්ථානය පවත්වාගෙන යන්නේ. විශේෂයෙන්ම ජන මාධ්‍යවලින් කරලා තිබුණු ප්‍රචාරය සම්බන්ධයෙන් මට ලොකු කනගාටුවක් ඇති වුණා. ඒක කුකුල්ලු හදන ගොවිපළක් වාගේ, ඒ කියන්නේ "Baby Farm" කියලා තමයි පළ කරලා තිබුණේ. ඒක ඉතාමත්ම වැරැදි වැටහීමක්. ජන මාධ්‍යවලින් වුණත් එවැනි ප්‍රචාරයක් කරන්න ඉස්සෙල්ලා ඒ ස්ථානයේ වෙන්නේ මොකක්ද කියලා හරියාකාරව සොයා බලන්න තිබුණා. එතැන කිසිම

දරුවෙකු විකුණන්නේ නැහැ. උසාවියෙන් දෙන නියෝගයක් උඩ තමයි විදේශිකයන්ට හෝ නැත්නම් මේ රටේ ජනතාවට හෝ හදා වඩා ගැනීම සඳහා දරුවන් ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ. සමහර අය ඉන්නවා, කසාද බැන්දාට පස්සේ දරු එල නැහැ. නමුත් එම ස්ථානය ඒ අයට යම් කිසි පිහිටක් වෙනවා. ඒ වාගේම නියම කසාදයක් කරන්නේ නැතුව ගැබ් ගන්නා කාන්තාවන් ඉන්නවා. ඒ අයත් ආරක්ෂා කරගෙන, ඒ අයගේ නම්බුවත් ආරක්ෂා කර ගෙන සමාජය ඉදිරියට හොඳ පිරිසක් ගෙන එන්න කටයුතු කරන ස්ථානයක්, ඒ.

මෙම ස්ථානයක් පිළිබඳව පසු ගිය කාලයේ ඉතාම කැත විධියට ප්‍රචාරය කරලා තිබුණා. ඒක කතෝලික සභාවෙන් පාලනය වෙන එකක්; කතෝලික සභාවට අයිති එකක්. ඒ නිසා අපේ කාර්දිනල් වහන්සේ මේ නත්තල් උත්සවය සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් කළා. අපේ කතෝලික සභාව කවදාවත් උසාවියට ඇඟිලි ගහන්නේ නැහැ. උසාවිය දෙන තීන්දු අපි පිළිගන්න ඕනෑ. නමුත් උසාවියට වුණත් කරුණු ඉදිරිපත් කළාට පස්සෙයි තේරුණේ, කිසිම වැරැද්දක් නැතුව තමයි මේ කන්‍යා සොහොයුරිය දවස් ගණනක් රිමාන්ඩ් කරලා තිබුණේ කියලා. විශේෂයෙන්ම ජාතික ළමා රක්ෂණ අධිකාරිය අයිති අමාත්‍යාංශයේ ඇමතිතුමා වන ගරු තිස්ස කරල්ලියද්ද මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, ඒ සම්බන්ධව සමාව ඉල්ලා ප්‍රවෘත්තියක් පළ කරලා තිබීම ගැන. නමුත් ජාතික ළමාරක්ෂණ අධිකාරියේ කිසිම කෙනෙකු -ඒ සභාපති ඇතුළු කිසිම කෙනෙකු- තමන් අතින් වුණේ වැරැද්දක්ය -සුළු වැරැද්දක්වත්ය- කියලා පිළිගත්තේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ සිද්ධිය සිදු වෙලා ඉවරයි. අඩුම තරමින් මේ වැරැදි තීන්දුව ගත්තු නිලධාරින්ට විරුද්ධව ගන්න පියවර මොකක්ද?

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

ඒ ගැන තමයි මම මේ කථා කරන්නේ. ඒක අපට වෙච්ච ලොකු අවනම්බුවක්. අපේ කතෝලික සභාව කවදාවත් නීතියට ඇඟිලි ගහන්නේ නැහැ . අපේ කාර්දිනල් වහන්සේ ප්‍රකාශ කළේ, මේ වැරැදි තීන්දුවක් අරන් තිබෙන්නේ, ඒ වැරැදි තීන්දුව හරි ගස්සන්නය, විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව ඉල්ලා අස්කර ගෙන, එහෙම එකක් වුණේ නැහැය කියලා ප්‍රකාශ කරන්නය කියායි. මම මේ සම්බන්ධව CID එකෙනුත් සොයා බැලුවා, මොකක්ද මේ වෙලා තිබෙන වැරැද්ද කියලා. කිසිම වැරැද්දක් මෙතැන සිද්ධ වෙලා නැහැ. මෙතැන සිදු වන්නේ ඉතාම හොඳ දෙයක්. මේ රටේ අනවශ්‍ය විධියට ගැබ් ගත්තු අයට පිහිට වීම, ඒ වාගේම දරුවන් ලැබුණාට පස්සේ ඒ දරුවන්ට පිහිට වීම වාගේ සේවාවන් තමයි මේ ආයතනය කරන්නේ. ඔවුන් ඒවා නොමිලේයි කරන්නේ. කිසිම මුදලක් අය කරන්නේ නැහැ. ඒ වාගේ හොඳ තැනකට මෙවැනි දෙයක් කිරීම ගැන කතෝලික සභාව හැටියට අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. අපේ සභාව මෙවැනි වැරැදි දේවල් අපේ රටේ කරන්නේ නැහැ. මේ රටට හොඳ දෙයක් ලබා දෙන්න තමයි කතෝලික සභාව කටයුතු කරන්නේ. ඒ නිසා විශේෂයෙන් මේ සම්බන්ධව සොයා බලා, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ප්‍රකාශ කළා වාගේ වැරැදි කරලා තිබෙන අයට දඬුවම් ලබා දෙන්න කියන විශේෂ ඉල්ලීම මම කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය කාල සීමාවේදී "දිවි නැඟුම" වැඩසටහන ක්‍රියාත්මක කරද්දී විශේෂයෙන් ධීවර සහ පශු සම්පත් කොටස අපි තමයි කළේ. විශේෂයෙන්ම අපට සන්තෝෂයි, පසු ගිය කාලයේ "දිවි නැඟුම" වැඩසටහන යටතේ විශේෂයෙන්ම දිළිඳු පවුල්වලට කුකුළු පැටවුන් ලබා දීලා ඒ අයට හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් තත්ත්වයට කටයුතු කර ගෙන යෑම සම්බන්ධව. කුකුළු පැටවුන් දහ දෙනෙකු දෙනවාය කියලා කියන්නේ ලොකු farm එකක් දැමීමක් නොවෙයි. නමුත් සුළුවෙන් හෝ ගෙදරක කුකුළු පැටවුන් ටිකක් ඇති කළාම ඒකෙන් යම් කිසි ආර්ථික ප්‍රතිලාභයක් ඒ පවුලට ඇති වෙනවා. ඒ වාගේම ඒ දරුවන්ට ඉතාමත් හොඳ පෝෂණීය බිත්තර ගෙඩියක් හරි ලබා ගන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ නිසා "දිවි නැඟුම" වැඩසටහනෙන් අපි 2012 දී මීටත් වැඩි පිරිසකට මේ ප්‍රතිලාභය ලබා දෙනවා. එදා අපි පටන් ගත්තේ ලක්ෂ 10කිනුයි. ඊට පස්සේ ලක්ෂ 15ක් වුණා. 2012 අවුරුද්දේදි පවුල් ලක්ෂ 25ක සංඛ්‍යාවක් දක්වා සංවර්ධනය කරන්න මේ "දිවි නැඟුම" වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපි දැනට ලැහැස්ති වෙලා යනවා.

මගේ කථාව ඉවර කරන්න ඉස්සෙල්ලා සුළු ඉල්ලීමක් කරන්න තිබෙනවා. තැපැල් ඇමතිතුමාගෙනුයි ඒ ඉල්ලීම කරන්න ඕනෑ. මොකද තලවිල දේවස්ථානයේ තැපැල් කාර්යාලයක් තිබුණාට ඒක ප්‍රධාන තැපැල් කාර්යාලයක් හැටියට කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා ඒක ප්‍රධාන තැපැල් කාර්යාලයක් හැටියට දියුණු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම මඩු දේවස්ථානයටත් තැපැල් කාර්යාලයක් ලබා දීමට කටයුතු කරන්න. මොකද, මංගල්‍ය ගණනාවක් මඩු දේවස්ථානයේ පවත්වන නිසා විශාල ජනතාවක් එතැනට එක්රොක් වනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා එතැනටත් තැපැල් කාර්යාලයක් ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින් තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. Harin Fernando. Before he starts, the Hon. Alhaj A.H.M. Azwer will take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 2.56]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතා වැදගත් අමාත්‍යාංශ රාශියක් පිළිබඳව කරුණු කාරණා කිහිපයක් සාකච්ඡා කිරීමේ අවස්ථාවට එක් වීමට ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. අමාත්‍යාංශ රාශියක් ගැන සාකච්ඡා වන මේ අවස්ථාවේදී මුලින්ම, එයින් කිහිපයක් පමණක් තෝරාගෙන ඒ පිළිබඳව යම්කිසි හැඳින්වීමක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටක යහපාලනය ගැන කතා කරනවා. මේ අමාත්‍යාංශ යටතේත් පළමුවෙන්ම තිබෙන්නේ යහපාලනය සහ යටිතල පහසුකම් පිළිබඳවයි. රටක යහපාලනය ගැන කතා කරනකොට පාර්ලිමේන්තුවේ අය වැයත් එක්ක දිගින් දිගටම තිබුණු වැඩසටහන් රාශියක් පිළිබඳවත්, ඒ වාගේම විවාදවලදී විපක්ෂයට මේ යහපාලනය කොතරම් දුරට අත්විඳින්න සිද්ධ වුණාද කියන කාරණය පිළිබඳවත් තමයි මුලින්ම සාකච්ඡා කරන්න සිදු වෙන්නේ.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ඊයේ දිනයේත් මේ පාර්ලිමේන්තුවේදී -මේ උත්තරීතර සභාවේදී- තවත් අශෝභන සිදුවීමක් වුණා. අපි අහලා තිබෙනවා - [බාධා කිරීමක්] සිරිකොතයි පාර්ලිමේන්තුවයි කියන්නේ එක වාගේ නොවෙයි නේ. ඉතින් ඒකවත් තේරුම් ගන්න බැහැ නේ. කමක් නැහැ. අපේ සිරිකොතටත් පාර්ලිමේන්තුව තරමටම නම්බුවක් දෙනවා නම් අපි සතුටු වෙනවා. බොහොම හොඳයි. - [බාධා කිරීමක්] ඒක තමයි. රටටම වැඩ පෙන්නුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැනත් කතා කරන්න ඕනෑ. යහපාලනය ගැන කතා කරද්දී අපට සැකයක් තිබෙනවා, ඊයේ ආණ්ඩුව විසින් මේක කළාද කියන එක ගැන. සමහර විට ආණ්ඩුව විසින් හිතා මතා මදාවියෝ, දාමරිකයෝ යොමු කරවා එක්සත් ජාතික පක්ෂයේ සංවරය, සම්මුතිය කඩන්න කරපු ආණ්ඩුවේ තවත් වැඩ පිළිවෙළක්ද කියන එක ගැන අපට ලොකු සැකයක් තිබෙනවා. අපි දැන් ඒ ගැනත් සොයාගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපාලනය ගැන කතා කරනකොට බෞද්ධ ඉතිහාසය දිහා බැලුවාමත් අපට පෙනී යනවා, මල්ලව රජදරුවන්ගේ කාලයේදී ඒ රජ දරුවන් රට පාලනය කළේ කොහොමද කියන එක. මේ සභාවේ ඉන්න ආණ්ඩුවේ මැතිඇමතිවරුන් කියාවි, මල්ලව රජ දරුවන්ගේ කාලයේදී වාගේ තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේදීත් ඒ තරමම හොඳට යහපාලනයක් මේ රටේ සිදු වෙනවාය කියා. නමුත් අපි ඒකට එකඟ වෙන්නේ නැහැ. එහෙම එකඟ නොවෙන්න හේතු රාශියක් තිබෙනවා. මොකද, අපි දැක්කා අපි බොහොම අහිංසක ලෙස විරෝධතාව ප්‍රකාශ කරද්දි වෙච්ච ගුටි බැට හුවමාරුව; ඊට පසුව වෙච්ච සිදුවීම්; ඊයේ වෙච්ච සිදුවීම් මොනවාද කියා. ඒවාට මොන කමිටු දැම්මත්, පාර්ලිමේන්තුවෙන් මොන විධියට විනය හදන්න බැලුවත් රට හදන තැන විනයක් නැත්නම් ඒ රටේ සමාජයේ යහපාලනයක් පවතියිද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහු ගිය වකවානුවේදී මේ රටේ අතිවිශාල සිදුවීම් රාශියක් සිදුවුණු බව අපි දන්නවා. කරන්දෙනියේ හිත හොඳ දොස්තර මහත්තයාට වෙච්ච සිදුවීම, පිටකෝට්ටේ හන්දියේ වෙච්ච සිදුවීම, ලලිත් සහ කුමරන් සුදු වැන් සංස්කෘතිය, ඒ විතරක් නොවෙයි "කෝප්" වාර්තාවලින් හෙළි වුණු ආයතන 38ක දූෂණ, වංචාවලට අදාළව සිදුවීම් ගැන මේ ආදී වශයෙන් මේ සියලු දේ තිබෙනකොට රටක යහ පාලනයක් තිබෙනවාද, ඒ අමාත්‍යාංශ තුළින් යමක් සිදු වුණාද කියන එක පිළිබඳව අද අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්] මම ඒකයි කිව්වේ ඊයේ වෙච්ච සිදුවීමත්- [බාධා කිරීමක්] ඇයි ඔච්චර කලබල? මොකද මේ? පොඩ්ඩක් ඉන්නකෝ. අපි ලස්සනට යමුකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑ ගහන කෙනෙක් වෙනදා එතැන ඉන්නවා. අද එතුමා එතැන නැහැ. එතුමා හිටියා නම් තවත් කෑ ගහවි. එතුමා නැති එක බොහොම හොඳයි. ඒ ගැන මම ඉතාමත් සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ යටතේ අමාත්‍යාංශ රාශියක් ගැන කතා කරන්න තිබෙනවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
සජිත්ට ඡන්දය දුන්නාද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
දුන්නා. ප්‍රසිද්ධියේ කියනවා. අපි හංගලා ගහන්නේ නැහැ. පෙනෙන්නම තමයි අපි ඡන්දය දුන්නේ. [බාධා කිරීමක්] ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔය පැත්තේ වාසි නිසා ඔබතුමා ගියාට අපි එහෙම යන්නේ නැහැ. "ලෙඩා මැරුණත් බඩ සුද්දයි" කියලා කතාවක් තිබෙනවා නේ. අපි දීලයි තිබෙන්නේ. ප්‍රසිද්ධියේමයි දීලා තිබෙන්නේ. ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා. කතා ගොඩාක් තිබෙනවා. ඒ නිසා අපි ඒවාට යන්න කැමැති නැහැ. [බාධා කිරීමක්] දැන් ඔන්න සභාව පොඩ්ඩක් ගණනකට ආවා. නැත්නම් ඉතින් නිදිමතේ තමයි හිටියේ. එම විහිළුවත් එක්කම මා තව දෙයක් ගැන කථා කරන්නට ඕනෑ. මෙතැන තිබෙන තවත් අමාත්‍යාංශයක් තමයි ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය. දැන් මේ ඵලදායිතා ප්‍රවර්ධනය කියන්නේ මොකක්ද? මේ රටේ ආකල්පමය වෙනසක් ඇති කරලා, එම ආකල්පමය වෙනස තුළ රටේ ජනතාව ඉදිරියට ගෙන යෑම තමයි ඒකෙන් අදහස් කරන්නේ. මා කියනවා, මේ ආකල්පමය වෙනස ඉස්සෙල්ලාම ඇති වන්නට ඕනෑ පාර්ලිමේන්තුව තුළයි කියලා. අපි ඊයේ දැක්කා පාර්ලිමේන්තුව ඇතුළේ - [බාධා කිරීමක්] අපේ ආකල්පමය වෙනස ගැන ප්‍රශ්නයක් නැහැ නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගන්නකෝ. එහෙනුත් ගුටි කනවා, මෙහෙනුත් ගුටි කනවා, ගල් ගහනවා, මේක ප්‍රශ්නයක් නේ. අඩුම ගණනේ පාර්ලිමේන්තුවේවත් කථා කරන්නට අයිතියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඵලදායිතාව පිළිබඳව මා කියන්නට ඕනෑ. ඉස්සෙල්ලාම ආණ්ඩුවේ මැති-ඇමතිවරුන් අතරේ ඵලාදායිතා වෙනස ඇති කරන්නට ඕනෑ. මොකද, අපි පසු ගිය දවසක රූපවාහිනියෙන් දැක්කා, කළුතර දිස්ත්‍රික්කයේ ඇමතිවරුන් දෙදෙනෙක් අතර ඇති වුණු සටන. එක්කෙනෙක් ගිහිල්ලා නාම පුවරුවක් open කරන කොට, අනෙක් එක්කෙනා ඊළඟ දවසේ ගිහිල්ලා වතුර කරාමය අරිනවා. [බාධා කිරීම්] මේක තමයි සට්ටනය. ඔබතුමන්ලා දකින්නට ඇති තවත් අර පොල් සංවර්ධනය පිළිබඳ ඇමති කෙනෙක් හම්බගමුව පැත්තේ electricity supply එකක් විවෘත කරන්නට යන කොට එතුමාට ඉහළින් ඕඩර් එකක් ඇවිල්ලා එතුමාට electricity supply එක විවෘත කරන්න දීලා නැහැ.

ළළවලු ප්‍රවාහනය කරන කුඩ සම්බන්ධයෙන් පාරිභෝගිකයාට ඇති වෙච්ච ප්‍රශ්නය බලන්න. මේ නිසා තමයි ඉස්සෙල්ලාම ආණ්ඩුවේ මැති ඇමතිවරුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කළ යුතු වන්නේ. මේ ව්‍යාපෘතියේ දී ඉස්සෙල්ලාම ආණ්ඩුවේ මැති ඇමතිවරුන් වෙනුවෙන් යමක් කරන්නය කියලා අපි මතක් කර දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර කථාවක් තිබෙනවා, ඉස්සෙල්ලාම තමන්ගේ ගේ හදා ගන්නේ නැතිව වටේ හදා ගන්න ගිහින් වැඩක් නැහැ කියලා. ඒ නිසා මා ඉල්ලීමක් කරනවා,- [බාධා කිරීම්] අර ලෝකෝපකාරයේ කවියක් තිබෙනවා. එය මෙසේයි:

" ඔවා දෙනු පර හට - තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත දනන් දෙන - ඔවා වැද්දන් කියන බණ වැනි"

ඒ නිසා මා කියනවා ඒ වාගේ වෙන්න එපා, ඊට වඩා හොඳ වෙන්න කියලා. ඒ ඇමතිතුමාත් මෙහෙන් පැනපු කෙනෙක්. එතුමාට පුළුවන් යම් කිසි දෙයක් කරන්න. මොකද, මෙහෙන් පැනපු කට්ටිය තමයි ඔය පැත්ත run කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් වාර්තාවක් තිබෙනවා. මේ වාර්තාව තමයි, Performance Report of Senior Ministers. ඒ කියන්නේ විශ්‍රාම යවපු කට්ටියගේ Success Report එක. ඒ කියන්නේ තමන් කරලා තිබෙන වැඩ කටයුතු පිළිබඳව තිබෙන වාර්තාව. මේ වාර්තාව කියවා ගෙන එන කොට එහි හොඳ දෙයක් තිබෙනවා. එහි performances යටතේ තිබෙනවා, “Good Governance and Infrastructure” කියලා. මේ අපේ සිටින ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ගේ කාර්ය භාරයේ කොටසක්. දෙයියෝ සාක්කි! මේ Performance Report එකේ තිබෙනවා - [බාධා කිරීමක්] අහගන්න කෝ, පොඩ්ඩක්. ඒක ගැන පසුව කථා කරමු.

It states, I quote:

> "Represented Sri Lanka at the funeral of Prince Bin Abdul Aziz, Crown Prince of Saudi Arabia…."

Performance Report එකේ තිබෙන හැටියට එක් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු කරපු වැඩසටහන්වලින් එකක් තමයි මළ ගෙදරකට සහභාගී වීම. [බාධා කිරීමක්] වැරැදියි නේන්නම්. ඇමතිවරයකුගෙන් බලාපොරොත්තු වන්නේ මළ ගෙවල්වලට යන එකද? මේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් ඉන්නේ මළ ගෙවල්වල යන්නද? දැන් ඔබතුමන්ලා මේ ෆවුසි ඇමතිතුමාගෙන් කර ගන්නා කාර්ය මළ ගෙවල්වලට යවන එකද? මේ ෆවුසි ඇමතිතුමන්ලා කොච්චර වැඩ කරපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ද? ඔබතුමන්ලා එතුමන්ලාව මළ ගෙවල්වල යැමට පමණක් සීමා කරපු එක කොච්චර වැරැදිද? ඒ විතරක් නොවෙයි. තව තිබෙනවා, "Rural Affairs" කියලා. "Rural Affairs" යටතේත් තිබෙනවා, "Hon. Senior Minister's Missions abroad" කියලා. මොකක්ද mission එක?

It states, I quote:

> "Represented HE the President of Sri Lanka at the funeral of Mrs. Albertine Zizulu wife of former President of African National Congress…."

අනේ, මේ බලන්න ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ව පහළට දමලා තිබෙන හැටි. අපි ඉල්ලනවා එහෙම කරන්න එපා කියලා. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, මේ තවමත් වැඩ කරන්නට පුළුවන් හොඳ දක්ෂ ඇමතිවරුන්ව එහෙම කොන් කරන්න එපා කියලා. එතුමන්ලාට මීට වඩා යමක් කරන්න ඉඩ දෙන්න. අනෙක් එක ලජ්ජයි, මේ වාර්තාවේ මෙහෙම සඳහන් කරන එක. අඩුම ගණනේ ඊළඟ පාරවත් මේ වාර්තාවට ඕවා ඇතුළත් කරන්නට එපාය කියන ඉල්ලීම කරනවා.

"මිහින් ලංකා" කථා නොකරම බැරි මාතෘකාවක්. මා හිතනවා "මිහින් ලංකා" කියන්නේ ලංකාවේ තිබෙන පාඩු ලබන ආයතනවලින් record පිට record පිට record පිට record තබපු ආයතනයක් කියා. ඔබතුමන්ලා දන්නවා ඇති, "මිහින් ලංකා" ආයතනය මොන තරම් පාඩු ලබනවාද කියන එක ගැන. මා හිතන හැටියට ඒ ගැන කථා කරන්නට ඕනෑ නැහැ, කථිකයෝ බොහෝ දෙනෙක් ඒ ගැන කථා කරපු නිසා. වචනයක් හෝ ඒ ගැන කථා නොකර සිටියා නම් ඒක වැරැදි නිසායි මා ඒ ගැන ප්‍රකාශ කළේ.

පසු ගිය දවසකදී මේ Civil Aviation Authority එක සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් pass කළා, direct GSA ලංකාවේ තියන්න කාටවත් ඉඩ දෙන්නේ නැහැ කියලා.

But, I have to say that it is unfortunate because even after the Bill was passed, there are airlines like Thai Airways, Etihad Airways and Qatar Airways still having their direct office without a GSA being appointed. That is wrong. ඒකත් ඔබතුමන්ලාට පොඩ්ඩක් සොයා ගන්න පුළුවන්. එහෙම sales agency එකක් නැතුව දෙන්නේ නැහැයි කිව්වාට Qatar Airways, Etihad Airways and Thai Airways තවමත් ලංකාවේ officeවලින් operate කරන්නේ GSA එකක් නැතුවයි. මේ කාරණයත් ඔබතුමන්ලාගේ අවධානයට යොමු වෙයි කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සාමාන්‍යයෙන් ශුභවාදීව කථා කරන කෙනෙක්. වරාය තරම් - [බාධා කිරීම්] මා කියන්නේ නැහැ, Civil Aviation Authority එක නරකයි කියලා. වරායේ තිබෙන අඩු පාඩු තරම් Civil Aviation Authority එකේ අඩු පාඩු නැහැ. මා ඒක පිළිගන්නවා. එය හොඳ සාර්ථක වැඩසටහනක යනවා. මා හිතන හැටියට ආසියාවේ ලබා ගන්න පුළුවන් ඉහළම තැනක් Civil Aviation Authority එකට ලැබුණා. නමුත් ඒ කියන අතරතුර මා කියනවා, මේ ආයතනය සිවිල් පරිපාලනයක් තිබෙන්න ඕනෑ තැනක් කියලා. මෙම ආයතනයේ පරිපාලනය ගුවන් හමුදාව කිරීම එතරම් සුදුසුද කියන එක පිළිබඳව අපි දෙවරක් හිතන්න ඕනෑය කියන එකත් මේ අවස්ථාවේදී මේ සභාවට ප්‍රකාශ කර සිටිනවා. මොකද, ඒක civil operation එකකින්ම කෙරුණා නම් ඉතා හොඳයි කියන එකත් මේ අවස්ථාවේදී මේ සභාවට මතක් කර දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නත් එක්ක මේ රට පිළිබඳව කථා කරන කොට පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා ගැනත් යමක් කියන්න ඕනෑ. මා හිතනවා එම අමාත්‍යාංශය ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශයක් කියලා. අද රටේ පෞද්ගලික අංශයේ ගමනාගමනය සඳහා වැඩ කටයුතු රාශියක් කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. ඒ වුණාට එතුමා ලබා දීපු පොරොන්දු ඒ විධියටම ලබා දුන්නේ නැහැයි කියලා මා කියන්න කැමැතියි. මා දැක්කා, පෞද්ගලික ප්‍රවාහන අංශයේ ව්‍යාපාරිකයන් අතිවිශාල ප්‍රමාණයක් ඇවිල්ලා, මේ යන ජීවන වියදමත් එක්ක තමන්ගේ බස් ගාස්තු සාධාරණ ලෙස වැඩි කර ගැනීමට එතුමාගේ එකඟත්ව ලබා ගැනීම සඳහා උත්සාහයක් ගත් බව. එතුමා කිව්වා, එයට එකඟ වනවා, ඒ සඳහා කටයුතු කරනවාය කියලා. නමුත් තවමත් ඒකට නිසි පිළිතුරක් නොලැබීම පිළිබඳව -

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු මන්ත්‍රීතුමා, වැරැද්ද නිවැරැදි කර ගන්න ඕනෑ. මගේ කථාවේදීත් මා මේ ගැන කිව්වා. ඔබතුමා කරුණු කාරණා දන්නේ නැතුව කවුරුවත් කියලා දෙන එකක් ගැන මේ සභාවට ඇවිත් පුරසාරම් දොඩවනවා. බස් ගාස්තු වැඩි කිරීම සඳහා නිර්ණායකයක් තිබෙනවා. ඒ වාගේම ප්‍රතිපත්තියක් තිබෙනවා. මා එකඟ වුණේ, ඒ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා තමයි; බස් ගාස්තු වැඩි කරන්න නෙවෙයි. එම නිසා කවුරුත් කියලා දෙන එකක් ගැන ගිරවා වාගේ මේ සභාවේ කියවන්න එපා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ගරු ඇමතිතුමා, අපට ගිරවු වාගේ කියවන්න පුළුවන්. ඒ කෑ ගහන, පාරේ යන ගිරවු ටික හෙට අනිද්දාට ඔබතුමාගේ කන ළඟට ඇවිත් කෑ ගහන කොට ඔබතුමාට තේරෙයි ඔබතුමා කර ගත්ත දේ ගැන. මගේ අවස්ථාවේ මට කථා කරන්න දෙන්න. ඔබතුමාගේ අවස්ථාවේදී ඔබතුමාගේ ප්‍රකාශය කළා. ඉතින් මා මගේ ප්‍රකාශය කරනවා.

රටේ ජනතාව තීන්දු තීරණ ගනීවි. අද ජීවත් වීම මොන තරම් අපහසුද? බස් ගාස්තු වැඩි නොකර ඔබතුමන්ලාට ඡන්දය දීපු, ඔබතුමන්ලාට උදවු කරපු ඒ බස් හිමියන් කොහොමද මේ ජීවන වියදම යටතේ කටයුතු කරන්නේ කියන එක ඔබතුමාට තේරෙයි. මේ නත්තල් සමයේ, මේ නිවාඩු සමයේ බස් ටික වර්ජනය කළාම ඒ ගිරවු කථාව ඒ විධියටම කියන්න කියලාත් මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතකොට ප්‍රතිඵලය බලා ගන්න පුළුවන්. අපි ගිරවු වාගේ කවුරුත් කියලා දෙන එක කිව්වාට ඒ වෙලාවට ඔය උත්තරයම කියන්න කියලා ඔබතුමාට කියනවා. එතකොට මොකක්ද හම්බ වන්නේ කියලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් විපක්ෂයෙන් යමක් කියන කොට ඒ

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

කියන දේ අහ ගෙන ඉන්න බැහැ. ඒකට මොකක් හෝ විකල්පයක් යොදලා විපක්ෂයට ගහන්න හදනවා මිසක් ඒකෙන් ගන්න පුළුවන් හරයක් තිබෙනවා නම් ඒක ගන්න නොවෙයි බලන්නේ. අපි බලාපොරොත්තු වන්නේ ඇමතිතුමා අපහසුතාවට පත් කරන්න නොවෙයි; ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්නයි, තීන්දුවක් ගන්නයි, යම් කිසි සාධාරණයක් ඉටු කරන්නයි. මොකද, නැත්නම් මේ රටේ යන්ත්‍රණය සම්පූර්ණයෙන් නවතින්න ඉඩ තිබෙනවා. අපි කරන්නේ විපක්ෂයේ කාර්ය භාරයයි. ඔබතුමන්ලා කරන්නේ ආණ්ඩු පක්ෂයේ කාර්ය භාරය නොවෙයි. ඔබතුමන්ලා කරන්නේ විපක්ෂය මර්දනය කිරීමේ කාර්ය භාරයයි. සිරිකොතේ ප්‍රශ්න ගැන තමයි ඔබතුමන්ලාට වැඩියෙන්ම තිබෙන රුදාව. මා හිතනවා, සිරිකොතේ - [බාධා කිරීමක්] මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට නැවත එක්සත් ජාතික පක්ෂයට එන්න බැහැ. ඔබතුමාට ආශා වුණත් එන්න බැහැ. ඔබතුමාට ආශා වුණත් ඔබතුමාව ගන්නේ නැහැ. එම නිසා නාමල් බේබි ළඟට වෙලා ඉන්න. ඔබතුමාට නැවත යූඑන්පී එකට එන්න බැහැ. එම නිසා ඔබතුමා ඔහොම ඉන්න කෝ. ප්‍රශ්නයක් කර ගන්න එපා. [බාධා කිරීම්] දැක්කා නේ. එක්සත් ජාතික පක්ෂය ගැන ඔය තරම් අනුකම්පාවක් තිබෙනවා නම් අපි සතුටු වනවා. එක්සත් ජාතික පක්ෂයට ඇවිල්ලා ඔබතුමාට ඊට වඩා යමක් කරන්න තිබුණා. පාවා දීමක් කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා කියන්න ඕනෑ, මේ රටේ ශුභ සාධනය පිළිබඳවත්, සමාජ සේවය පිළිබඳවත් අතිවිශාල ප්‍රශ්න රාශියක් තිබෙන බව. මා හිතන හැටියට අපේ ඇමතිතුමාත් අපිත් එක්ක එකඟ වෙයි. බදුල්ල ප්‍රදේශයේ වුණත් සමාජ සේවා සම්බන්ධ ප්‍රශ්න රාශියක් ඇති වුණා. ඉඩම් බෙදුවා. ඉඩම්, සියලු දේ බෙදුවාට ඒ සියලු දේ ජනතාවට ලැබුණාද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙනවා. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
යූඑන්පීකාරයන්ට යූඑන්පීකාරයන්ම ගහලා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට බාධා වැඩියි. ඔබතුමා පොඩ්ඩක් ඒක යම් කිසි මට්ටමකට- [බාධා කිරීම්] දැන් ඉඳ ගන්න කෝ. [බාධා කිරීම්] දැන් ඔබතුමාට යූඑන්පී එක ගැනද කියන්න ඕනෑ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let the Hon. Member speak.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ඡන්දයක් තියලා එහෙම ගැහුවා නම්, මෙතුමන්ලා ආණ්ඩුවක් හැදුවා නම් කොහොම ගහයිද? ඊයේ තමන්ගේ පාක්ෂිකයන්ට -[බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වා මේක රටේ යහපාලනය පිළිබඳ ප්‍රශ්නයක් කියා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඊයේ කරුගේ cut-out එකත් ගලවලා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
නැහැ ඊයේ -[බාධා කිරීම්] ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා, පොඩ්ඩක් ඉන්න කෝ. අහ ගන්න කෝ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නිශ්ශබ්ද වෙමු. නිශ්ශබ්ද වෙමු. [බාධා කිරීම්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
පොඩ්ඩක් මේක අහ ගන්න කෝ. ඉඳ ගන්න කෝ. මම දැන් ඔබතුමා කියන දේ ඇහුවා නේ. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මෙතුමාගෙන් අහ ගන්න වැඩ කරන හැටි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
හරි, ඔබතුමා අහ ගන්න කෝ. පොඩ්ඩක් ඉඳ ගන්න කෝ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ජාතික සංවිධායක හැටියට දයාසිරි හැම දාම පාර්ලිමේන්තුවේ කථා කළා. අනේ! පක්ෂයේ මිනිස්සු සලකලා නැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
අපි සැලකුවා. [බාධා කිරීම්] අපි සැලකුවා. මෙහෙමයි. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක නිසා අන්න ඒක තේරුම් ගන්න. මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් දිහා පොඩ්ඩක් බලලා ඉගෙන ගන්න. [බාධා කිරීම්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
පොඩ්ඩක් ඉන්න කෝ. [බාධා කිරීම්] බොහොම ස්තුතියි. ඔබතුමන්ලාට අපි වෙනුවෙන් තිබෙන කැක්කුමට බොහොම ස්තුතියි. මම ඔබතුමාට එකක් කියනවා. අපේ එක්සත් ජාතික

පක්ෂයේ ප්‍රශ්නය, අපේ ගේ කඩා ගත්තත්, අපේ ගේ හදා ගත්තත් ඒ වැඩේ අපි කර ගන්නම්. ඔබතුමන්ලා එක දෙයකට හය වෙන්න. [බාධා කිරීම්] එක දෙයකට හය වෙන්න. ඒ තමයි,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එක්සත් ජාතික පක්ෂයේ මොන ප්‍රශ්න තිබුණත් නැවත වරක් එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ සියලු දෙනා එකතු වෙලා වැඩ කරන්න එකඟ වෙලා තිබෙනවා. එකතු වෙලා වැඩ කරන්න. ඒ නිසා දයාසිරි ජයසේකර වේවා, සජිත් ප්‍රේමදාස වේවා, රනිල් වික්‍රමසිංහ වේවා, කරු ජයසූරිය වේවා එක මතයක ඉන්නවා. [බාධා කිරීම්] ඔබතුමා-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ වුණාට මන්ත්‍රීතුමා, සජිත් මන්ත්‍රීතුමාට බැරි වුණා අඩු ගණනේ තමන්ට ලැබෙන ඡන්ද ටිකවත් කරු මහත්තයාට අරගෙන දෙන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අපි දැන් සිරිකොත පොඩ්ඩකට අමතක කරලා මාතෘකාවට එමු. [බාධා කිරීම්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මට මේක කියන්න දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සිරිකොතේ ප්‍රශ්නය ඒ ගොල්ලන්ට විසඳා ගන්න දීලා මාතෘකාවට එන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මට මේක කියන්න දෙන්න. [බාධා කිරීම්] නියෝජ්‍ය ඇමතිතුමා මට කියන්න දෙන්න. [බාධා කිරීම්] ඉතින් ඔබතුමා කිව්වා නේ- [බාධා කිරීම්] එකක් මතක තියා ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You have only one more minute.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එක්සත් ජාතික පක්ෂය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා. [බාධා කිරීම්] රනිල් වික්‍රමසිංහ ඡන්ද ගත්තා; දයාසිරි පැරදුණා; සජිත් දිනුවා; රවි කරුණානායක පැරදුණා. හැබැයි ඔබතුමන්ලාගේ පක්ෂයේ හැම දාම රාජපක්ෂලා. වෙන කවුරුවත් නැහැ. [බාධා කිරීම්] නාමල් බේබි ගාවට වෙලා ඉන්න. නාමල් බේබි ගාවට වෙලා ඉන්න ඔබතුමාට ඇමතිකමක් ලැබෙයි. නාමල් බබා ඇමතිකමක් අරගෙන දෙයි. ඒ නිසා කරුණාකරලා ඔබතුමා කට වහ ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, Order, please!

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එක්සත් ජාතික පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදය අපි රැකලා දෙන්නම්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, Order, please!

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා කලබල වෙන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මේ පාර්ලිමේන්තුවේ බේබිලා නැහැ. ගරු මන්ත්‍රීවරුන් පමණයි ඉන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මොකක්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පාර්ලිමේන්තුවේ බේබිලා නැහැ. ගරු මන්ත්‍රීවරුන් පමණයි ඉන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
නැහැ. නැහැ. මම ඒ නාමල් බේබි කියලා කිව්වේ නාමල් රාජපක්ෂ මැතිතුමාට නොවෙයි. වෙන කෙනෙක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ මන්ත්‍රීතුමා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
වෙන කෙනෙක්. ඒ වෙන කෙනෙක්. අපි ඒ මන්ත්‍රීතුමාට කිව්වේ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ ඉන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඒ නිසා අවසාන වශයෙන්-[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමන්ලාගේ වචනවලට, මේ කෑ ගැහිල්ලට ඔබතුමාට සුබ අනාගතයක් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. නමුත් භය වෙන්න එපා එක්සත් ජාතික පක්ෂයේ -[බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපිට දීලා තිබෙන්නේ ජනාධිපතිතුමා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඔය බලන්න පොඩි දෙයයි කියන්න ඕනෑ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-[බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි අවසාන කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
අවසාන වශයෙන් මා මේ කාරණය කියනවා. එක්සත් ජාතික පක්ෂය ගැන කලබල වෙන්න එපා. එක්සත් ජාතික පක්ෂයේ තිබුණු ප්‍රශ්නය, ඒ කැඩිච්ච වීදුරු ටික අපි දමා ගන්නම්. ඔබතුමන්ලාගේ උදවු ඕනෑ නැහැ වීදුරු ටික හදා ගන්න. නමුත් එක්සත් ජාතික පක්ෂය ගොඩ එන දවසට ඔබතුමන්ලාටත් දුවන්න ඉඩ නැති වෙයි කියන එක හොඳට මතක තියා ගන්න. ඒ බව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.15]

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන හැටියට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථාවකට සූදානම් වෙලා ආවේ නැතුවද දන්නේ නැහැ, කට්ටිය අවුස්සා ගෙන මොන මොනවාද ටිකක් කියා ගෙන ගියේ. මම ඒ නිසා -[බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකතුමා එනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකතුමාට මම සුබ පතනවා. හා! එතුමාට ඊයේ පත් වෙන්න බැරි වුණාද කොහේද නේද? කොහොම වුණත් මගේ කථාව වෙනම තියා ගෙන මම ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට විනාඩි දෙකකින් උත්තරයක් දිය යුතු වෙනවා.

එතුමා කිව්වා "ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට" කියලා. එතුමාම ඒ ආදර්ශය ගත්තොත් හොඳයි කියලා මම හිතනවා. මොකද, පසු ගිය දිනවල ඇති වූ තත්ත්වය පිළිබඳව මම ඉතාමත් හොඳින් දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුව තුළ ප්‍රචණ්ඩව හැසිරුණා නම් ඒකේ පළමුවැනියා තමයි එතුමා. ඒ නිසා තමයි එතුමා ගුටි කෑවේ. ඒ නිසා තමුන්නාන්සේම ඒක පිළිපදින එක වඩා හොඳයි කියලා මම කියනවා. බොරුවට බණ කියන්න ඕනෑ නැහැ. "හක්කේ බුදුරැස් - බොක්කේ දඩමස්" කථාවක් තමයි තමුන්නාන්සේලාගේ තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ, අපේ ආණ්ඩුවේ අර්බුද තමුන්නාන්සේ විසඳන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලාගේ අර්බුදය විසඳා ගන්න. [බාධා කිරීම්] එක්සත් ජාතික පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදය කොහොමද කියලා ඊයේ අපි හොඳටම දැක්කා. දැන් ඒකත් අපේ පිටින් දමන්න හදනවා. එතුමා අද කියනවා ඒක කළේ ආණ්ඩුවෙන් ද දන්නේ නැහැයි කියලා. ආණ්ඩුවෙන් බත් පැකට් දීලා කට්ටිය ගෙන්වූවේ නැහැ. "කරු ජයසූරියට ජය වේවා" කියලා කියන්න අපේ ආණ්ඩුවේ කවුරුවත් නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාම කට්ටිය ගෙනැල්ලා අද මොකක්ද වෙලා තිබෙන්නේ? රවි කරුණානායක මහත්තයාට කට ඇරලා කියන්න පුළුවන් නම් ඒ අය ගෙනාවේ ආණ්ඩුවෙන් කියලා, එහෙම නම් මම පිළිගන්නවා. එහෙම නැත්නම් ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියනවා ද -[බාධා කිරීමක්] නැහැ, ඔබතුමාගේ කථාවේ දී කියන්න. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියනවා ද ආණ්ඩුවේ කට්ටිය ඇවිල්ලා තමයි "එක්සත් ජාතික පක්ෂය" කියලා තිබුණ නම ගලවා ගෙන ගියේ කියලා; අලියා ගලවා ගෙන ගියේ කියලා? එක්සත් ජාතික පක්ෂයේ අලියා ගලවා ගෙන ගිහිල්ලා, "එක්සත්" කියන කෑල්ල ගලවා ගෙන ගිහිල්ලා විතරක් නොවෙයි සිරිකොතේ තිබුණ බුද්ධ රූපයත් අර ගෙන යන්න හදලා තිබෙනවා. මේවා ආණ්ඩුව කරන වැඩ නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේලාගේ ප්‍රශ්න තමුන්නාන්සේලා බේරා ගන්න. එක්සත් ජාතික පක්ෂය තවත් කඩන්න ආණ්ඩුවට ඕනෑ නැහැ. කැඩිලා ඉවරයි. තමුන්නාන්සේලා ආණ්ඩු ගැනිල්ල ගැන කථා කරනවා. තව අවුරුදු 15කින්වත් තමුන්නාන්සේලාට ආණ්ඩුවක් ගන්න ලැබෙන්නේ නැහැ.

අතිගරු ජනාධිපතිතුමා අය වැය කථාව අවසාන කළේ විරුද්ධ පක්ෂයට සමගි වන්න කියලායි. මොකද, අතිගරු ජනාධිපතිතුමාම කියනවා හොඳ විරුද්ධ පක්ෂයක්, සමගි වෙච්ච විරුද්ධ පක්ෂයක් රටට අවශ්‍යයි කියලා. හැබැයි, ඒක රටට විරුද්ධ පක්ෂයක් නොවෙයි. ආණ්ඩුවට විරුද්ධ පක්ෂයක් අවශ්‍යයි කියලා එතුමා කියනවා. ඒ නිසා ආණ්ඩුවට මෙකට මැදිහත් වන්න ඕනෑ නැහැ. අපි අතිගරු ජනාධිපතිතුමා කිව්ව වචනවලින්ම කියනවා, තමුන්නාන්සේලා පුළුවන් නම් ආණ්ඩු ගැනිල්ල පැත්තක තියලා අඩු ගණනේ පක්ෂයේ සමගියවත් හදා ගන්න කටයුතු කරන්න කියලා. කාගෙ කාගේත් හැසිරීම් පිළිබඳව අපි ඊයේ දැක්කා. ඒ විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඊයේ ඡන්දය පාවිච්චි

කරපු කරු ජයසූරිය මහත්තයා අද ඒ කාර්යාලයෙනුත් අයින් කරලා තිබෙනවා. දැන් එතුමාට කාමරයත් නැහැ. සිරිකොතේ තිබුණ එතුමාගේ නම සහිත බෝඩ් එක රනිල් වික්‍රමසිංහ මහත්තයා ගලවා ගෙන ගිහිල්ලා එහා පැත්තේ කුණු බක්කියට දමලා. දැන් එතුමාට කාර්යාලයක්වත් නැහැ. ඒ නිසා එතුමාගේ කාර්යාලය පවත්වා ගෙන යන්න ඔබතුමන්ලාට පුළුවන් නම් කොහෙන් හරි කාමරයක් කුලියට අර ගෙන දෙන්න. [බාධා කිරීමක්] ඔබතුමා කියනවා නම් එතුමාට කාර්යාලයක් තිබුණේ නැහැයි කියලා ඒක හරිම වැරැද්දක් නේ. පාර්ලිමේන්තුවේත් එතුමාට කාර්යාලයක් තිබුණා නේද? දැන් ඒක කෝ? ඒවා ක්ෂණිකව කරන වැඩ නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒවා බොහොම හෙමින් කරන වැඩ. අද එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම කොච්චර කේන්තියකින්, වෛරයකින්, පළි ගැනීමකින් ඉන්නවාද කියලා ඒවායින් පෙනෙනවා. මම ඊට වඩා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශය පිළිබඳව මම වචන කිහිපයක් ප්‍රකාශ කළ යුතු වනවා. මා සඳහන් කරන්න කැමැතියි, ප්‍රධාන කාර්ය භාරයන් පිළිබඳව වැටහීමක් සහිතව අපේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මෙහෙවීම් කර ගෙන යන බව. අපේ අමාත්‍යාංශයේ කටයුතුවලදී ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවෙන් ප්‍රධාන කාර්ය භාරයක් සිද්ධ වනවා. ඒකේ සභාපතිත්වය දරන්නේ අතිගරු ජනාධිපතිතුමායි. එයට සම්බන්ධ නොවුණත්, සහයෝගය නොදුන්නත් විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් එහි සාමාජිකත්වය දරනවා. පසු ගිය කාලය පුරාවටම හැම මාස තුනකටම වරක් රැස්වීම් පැවැත්වුවා. පසු ගිය දිනවල හත් වැනි රැස්වීමත් පැවැත්වුවා. මේ අමාත්‍යාංශයේ මෙහෙයවීම් පිළිබඳව ඒ රැස්වීමේ දී අපට උපදෙස් දුන්නා. ඒ අනුව අපි දැනටමත් මේ අමාත්‍යාංශය තුළ ආපදා වැළැක්වීම සඳහාත්, ආපදා අවම කිරීම සඳහාත් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ අනුව 2012 වර්ෂය සඳහා ව්‍යසන කළමනාකරණය සඳහා වූ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අවශ්‍ය පියවර සකස් කර ගෙන තිබෙනවා. ඒ වාගේම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සඳහා වූ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට ඉදිරියේ දී අපි බලාපොරොත්තු වනවා. මේ වන විට ඒවායේ කටයුතු ඉතාමත් කඩිනමින් ක්‍රියාත්මක වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියට අනුකූලව සුරක්ෂිත ශ්‍රී ලංකාවක් සඳහා වූ මාර්ග සිතියම සංශෝධනය කිරීම අපි ක්‍රියාත්මක කරනවා. නාය යෑම් අවම කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය අපි ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක කරලා, සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ වගකීම දරනවා.

මේ අමාත්‍යාංශය මෙහෙයවන විට මම හැම දාම කියනවා, අපේ බලාපොරොත්තුව ව්‍යසනයක් ඇති වුණාම, ආපදාවක් ඇති වුණාම කන්න බොන්න ලබා දීලා ඒකෙන් සතුටට පත් වීම නොවෙයි කියන එක. මේ අමාත්‍යාංශය බත් පැකට් බෙදන අමාත්‍යාංශයක් බවට පත් කිරීම නොවෙයි අපේ බලාපොරොත්තුව. ජනාධිපතිතුමා කිව්ව විධියටම ඇති වෙන ඕනෑම ආපදාවකට මුහුණ දෙන්න අපි සූදානමින් ඉන්නවා වාගේම, ආපදාවක් ඇති වුණොත් පළමුවන කෑම වේලේ ඉඳලා සියලුම කෑම වේල් ටික ලබා දීලා, ඒ අයට අවශ්‍ය අනෙකුත් සහයෝගයත් අපි ලබා දෙනවා.

අපේ ඉලක්කය තමයි මේ අමාත්‍යාංශය තුළින් ආපදා වැළැක්වීම සඳහා ගන්න පුළුවන් ක්‍රියා මාර්ග ගැනීම; ඒ වාගේම ආපදාවලින් වන හානිය අවම කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපේ අමාත්‍යාංශය මෙහෙයවීම. දැනටමත් අපි ඒ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඉදිරියේදී ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළත් එක්ක ගංවතුර පාලනය කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ අනුව කොළඹ ගංවතුර පාලනය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයත් සමඟ ඒකාබද්ධව රුපියල් බිලියන 08ක ව්‍යාපෘතියක් 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන බව මා සඳහන් කරන්න කැමැතියි. ඒ ව්‍යාපෘතිය අවසන් වන විට කොළඹ නගරයට වෙනදා වහින ප්‍රමාණයට වැස්සත්, ඊට වඩා ටිකක් වැඩිපුර වැස්සත් ගංවතුරක් ඇති වන්නේ නැහැ. කොළඹ නගරය සඳහා ජලාශ සකස් කරමින්, කාණු පද්ධති, ඇළ මාර්ග සකස් කරමින් ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ නිසා, යම් මට්ටමකට කොළඹ නගරය ගංවතුරෙන් තොර නගරයක් කර ගන්න අපට පසු ගිය කාලයේ හැකියාව ලැබුණා.

මගේ නියෝජ්‍ය අමාත්‍යතුමා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ පසු ගිය වතාවේ ඇති වුණු වර්ෂාපතනය දෙස බැලුවාම, හරි නම් ගංවතුරක් ආ යුතුව තිබුණා. නමුත් බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒ නියෝජ්‍ය ඇමතිතුමා එක්ක එකතු වෙලා ක්‍රියාත්මක කළ වැඩසටහන නිසා ගිය වතාවේ ගම්පහ දිස්ත්‍රික්කයට ගං වතුරක් ඇති වුණේ නැහැ. අපි ගං වතුර ඇති වුණු දිස්ත්‍රික්ක පිළිබඳව අවධානය යොමු කරලා, අම්පාර දිස්ත්‍රික්කයේ ගං වතුර පාලන වැඩසටහන, මඩකළපුව දිස්ත්‍රික්කයේ ගං වතුර පාලන වැඩසටහන, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගං වතුර පාලන වැඩසටහන දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2012 වර්ෂයට මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා, යාපන දිස්ත්‍රික්කයේ ගං වතුර පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න සහ දඹුල්ල ගං වතුර පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න. ඒවා මේ අවුරුද්දේත් ක්‍රියාත්මක කළා. ඒ ඉතිරි කොටස්වලට මුදල් ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ඇතුළු ප්‍රදේශයේ ගං වතුර පාලන ව්‍යාපෘතිය සඳහා දැනටමත් මුදල් ලැබිලා තියෙනවා. ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කළාම ඒ ප්‍රදේශවල ගං වතුර පාලනය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම සැලසුම් සහගතව රත්නපුර දිස්ත්‍රික්කයේත් කළුතර දිස්ත්‍රික්කයේත් ගං වතුර පාලනය කිරීමේ ව්‍යාපෘතියක් කෙරෙහි මේ වන විටත් අපේ අවධානය යොමු වෙලා හමාරයි.

අපේ අමාත්‍යාංශය යටතේ නාය යෑම් අවම කිරීමේ වැඩසටහන් දැනට දියත් කරලා තිබෙනවා. ඒ යටතේ ඉදි කරන නිවාස සුරක්ෂිත නිවාස බවට පත් කර ගැනීමේ වැඩ පිළිවෙළට දායකත්වය ලබා දෙනවා වාගේම, ඒ නාය යෑම් අවම කිරීම සඳහා වන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න අපි අනාගතයේදී බලාපොරොත්තු වනවා. ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමතිය ලැබිලා තියෙනවා. එය මේ වන විටත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබෙන බව සඳහන් කරන්න කැමැතියි.

පසු ගිය දවස්වල ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වුණු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳව අපි අවධානය යොමු කර තිබෙනවා. මා සඳහන් කරන්න කැමැතියි, ඊයේත් රාජිත සේනාරත්න ඇමතිතුමා මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කරලා තිබුණු බව. මාතර ප්‍රදේශයේ ඇති වුණු ඒ තත්ත්වයට අදාළව අපේ ගරු සහෝදර අමාත්‍යවරයෙක් ඉදිරිපත් කළ කාරණය සම්බන්ධව තර්ක කරන්න මා සූදානම් වන්නේ නැහැ. මොකද, එහි යම් යම් පරස්පර කරුණු රාශියක් තිබුණ නිසා. කෙසේ වෙතත්, ජනතාවගේ ජීවිත පිළිබඳව අපි අවධානයෙන් ඉන්නවා වාගේම, ඒ වගකීම දරන අමාත්‍යාංශයක් විධියට දැනටමත් අපි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඒ පිළිබඳ වාර්තාවක් අරගෙන තිබෙනවා. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ස්වාධීන කමිටුවක් පත් කරන්න අවශ්‍ය සියලු පියවර අරගෙන තිබෙනවා. වැරැද්දක් වෙලා තිබෙනවා නම්, අතපසුවීමක් වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධව කටයුතු කරන්න අපි පසුබට වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් අපි පටන් ගන්නවා. අදට වඩා හොඳ කාලගුණ අනාවැකියක් කියන්න

[ගරු මහින්ද අමරවීර මහතා]

පුළුවන් තත්ත්වයට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කරන ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගන්නා වැඩ පිළිවෙළක් දැනටම සූදානම් කරලා තිබෙනවා. ඒ අනුව මාර්තු මාසය වන විට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඩොප්ලර් රේඩාර් යන්ත්‍ර ක්‍රියාත්මක වනකොට වඩා හොඳ කාලගුණ අනාවැකියක් කියන්න පුළුවන්. ඒ වාගේම අපි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කරන්න, නව ආයතනයක් බවට පත් කරන්න, ඒ වාගේම එයට අවශ්‍ය උපකරණ ලබා දෙන්න, මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කරන බව සඳහන් කරනවා.

මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු කර ගෙන යෑම සඳහා මට මාගේ නියෝජ්‍ය අමාත්‍යතුමා ඉතාම හොඳ සහයෝගයක් ලබා දෙනවා. මගේ කටයුතුවලට, ඉතාම ඉහළින් ඒ ලබා දෙන සහයෝගයට එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අතිරේක ලේකම්තුමන්ලා දෙපළ ඇතුළු අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ටත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂතුමා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා, ගොඩනැගිලි පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු ඒ සියලුම කාර්ය මණ්ඩලවලටත් අපේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ඉදිරි කාලය තුළ සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහි කිරීමට අපේ අමාත්‍යාංශය මෙහෙයවීම සඳහා කැප වී කටයුතු කරන බවත් සහතික වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 3.27]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අමාත්‍යාංශ ගණනාවක් ඒකාබද්ධ කර පැවැත්වූ ඒ කමිටු වාර්තාව තුළින් හෙළිදරව් වූ කරුණු සහ හෙළිදරව් නොවූ කරුණු ගැන වචන ස්වල්පයක් කථා කරන්න මා මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. අප මේ අවස්ථාවේ කථා කරන්න අවශ්‍ය වන්නේ යහ පාලනය සම්බන්ධවයි. යහ පාලනය ගැන කථා කරනකොට, ඒ යහ පාලනයේ ප්‍රතිඵල තමයි අපට මේ අමාත්‍යාංශ තුළින් පෙනෙන්නට තිබෙන්නේ. නමුත් මේක යහපාලනයක්ද නැත්නම් පිස්සු නැටීමක් ද කියන එක තමයි කාරණය.

මා මුලින්ම කථා කරන්නට කැමැති වන්නේ Civil Aviation Authority, SriLankan Airlines සහ Mihin Air යන ආයතන සම්බන්ධයෙන්. ඒක ඉතාම වැදගත් කටයුත්තක් හැටියටයි මා සලකන්නේ. ඒ සම්බන්ධයෙන් අපි එදා සිටම කථා කළ පරිදි මට මතකයි, මේ පාර්ලිමේන්තුවේ ඉතාම තීරණාත්මක අවස්ථාවක, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාත් මාත් අතර පැවැති විවාදයකදී මා කිව්වා, SriLankan Airlines ආයතනය පෞද්ගලීකරණය කරනකොට මේ රටට අහිතකර දෙයක් කරන්න එපා කියලා. එදා ඒක පාර්ලිමේන්තුව ඇතුළේ තදින් විවාද කරලා අන්තිමට එළියට ඇවිත්,- [බාධා කිරීමක්] SriLankan Airlines ආයතනය පෞද්ගලීකරණය කරලා, ඒක නැවත පවරා ගෙන අද වෙලා තිබෙන දෙය ගැන කථා කරන කොට, එහි වැඩ කරන 4,900 දෙනාට අද ඇස්වල කඳුළු එන තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. අද විෂයය භාර ගරු ඇමතිතුමා මෙතැන සිටිනවා. එතුමාට බැණලා වැඩක් නැහැ. මොකද, එතුමාගේ දූෂිත ආණ්ඩුව කරන ඒ ක්‍රියාවලට එතුමාට බැණලා හරියන්නේ නැහැ. මුළු කැබිනට් මණ්ඩලයම, මේ කරන පාපකර්මයට, බදු ගෙවන ජනතාවගේ සල්ලිවලට කරන මේ පාපකර්මයට වග කියන්න ඕනෑය කියන එක විතරයි මා මතක් කරන්නේ. යම් විධියක හොඳ අදහස් ඇතිව මේ ආයතන ඉදිරියට ගෙන යන්න පුළුවන් දක්ෂයෝ ඉන්නවා නම්, ඒ දක්ෂයෝ පැත්තකට දාලා, ඊට පස්සේ ඒ ආයතන දේශපාලනීකරණය කරන එක තමයි අපරාධය. එතැන වැඩ කරන කට්ටිය ඉන්නවා. ඒ අය දිරිමත් කරන්නට තමයි මා නැඟී සිටියේ. නැත්නම් විපක්ෂයක් වශයෙන් නිකරුණේ ඔහේ කෑගහලා, ප්‍රශ්නයක් කිරීම නොවෙයි අපට කරන්න තිබෙන්නේ. අඩු ගණනේ ඒ තිබෙන හොඳ අදහස් අනුව ඉදිරියට කටයුතු කර ගෙන යන්න. ඔබතුමන්ලා ඒ හොඳ අදහස් පව්ච්චි කරන්න.

මේ ආයතනයේ ගුවන් යානා ලෝකය පුරාම පියාසර කරන්නේ නැතිව, පියාසර කරන්න අවශ්‍ය ප්‍රදේශ, යන්න අවශ්‍ය රටවල් කොහේද තියෙන්නේ කියලා target කරන්න ඕනෑ. ලෝකයේම පියාසර කරන්න ගිහින් අන්තිමට වෙලා තිබෙන්නේ ඒ පාඩුව දරා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙන එකයි.

මේ ඉදිරිපත් කර තිබෙන වාර්තාව තුළින් ඔබතුමන්ලා කියනවා, Sri Lankan ආයතනයේ පාඩුවෙන් සියයට 74ක් control කරන්න බැරි, ඒ කියන්නේ තමන්ගේ පාලනය තුළ නැති වියදම් නිසා සිදු වී තිබෙනවා කියලා. ඉන්ධන වියදම -fuel -cost එක- මේ වාර්තාත් එක්ක සංසන්දනය කළොත්, අනෙක් ජාත්‍යන්තර ආසියානු companies එක්ක බැලුවොත්, සියයට 35කුත් සියයට 45කුත් අතර ප්‍රමාණයක් බව පෙනෙනවා. ඒක සියයට 75ක් නම් වැඩ කරන ජනතාව නිකම් ද වැඩ කරන්නේ? එම නිසා මීට වඩා බොහොම ඕනෑකමින් වැඩ කරන්න අවශ්‍යයි. ඉස්සර වෙල route sectors සොයා ගන්න. මොනවාද කරන්න තිබෙන්නේ? මෙතැන cabin factor එක සියයට 77ක් තිබෙනවාය කියනවා. ඒක හොඳ තත්ත්වයක්.

නමුත් ඒ සියයට 77ක cabin factor එකක් තිබෙනවා නම්, ඇයි මෙතරම් අලාභයක් තිබෙන්නේ? නිකරුණේ තුට්ටු දෙකට විකුණලා හරි යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මිහින් එයාර්" ආයතනය ගැන අපි එදා කිව්වා. අද මෙතැන නම කියන්න අකැමැති නමුත් කියන්න අවශ්‍යයි. මොකද, මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා ඕනෑ එකක් කියන්න පුළුවන්. ගරු සජින් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමාට අපි අවුරුදු හතරකට ඉස්සෙල්ලා කිව්වා, "කරුණාකර, දේශපාලනික වශයෙන් නමක් ඇති කරන්න මෙවැනි ආයතන පටන් අරගෙන ඒ තිබෙන නම නැති කරන්න එපා"ය කියලා. අපි එදා කිව්වා, "මේ මිලියන 2,000ක්, 3,000ක් දමලා මේ පටන් ගන්න යන ආයතනය තුළින් කිසි සේත්ම ලාභයක් උපයන්න බැහැ"යි කියලා. එතුමන්ලා එදා කිව්වා, "එක්සත් ජාතික පක්ෂය මේක කුහකකමින්, ඊර්ෂ්‍යාවෙන් කිව්වා"ය කියලා. ඒ වාගේම එතුමන්ලා කිව්වා, “අපට අවුරුද්දක්, දෙකක් දෙන්න. අපි තවම දණ ගහගෙන ඉන්නේ.” කියලා. අද දණ ගහගෙන, හොම්බ ඇන ගෙන ඊට පස්සේ තමන්ගේ දෙමවුපියන් වන ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනයට ගිහිල්ලා භාර දීලා තිබෙන දේට -මා හිතන විධියට රුපියල් කෝටි 1,080ක විතර අලාභයක් තිබෙන පැත්තකට දමලා තිබෙන දේට- මේ අය වැය තුළින් මුදල් වෙන් කරලා නැවත පුනර්ජීවනයක් දෙන්න හදන අවස්ථාවක් තිබෙන්නේ. එදා කිව්වාම, ඒක ඒ ආකාරයෙන් පිළිගත්තේ නැති වුණාම, ඒ අපරාධය ගැන අපි කථා කරන කොට අද අපිට "දේශද්‍රෝහියෝ" කියනවා. මේ වාගේ පිස්සු ගමනක් තුළ ගිහිල්ලා, දූෂණයට ලක් වෙලා කටයුතු කළාම ඒ අය දේශප්‍රේමියෝ. ඒ අය ජනාධිපතිතුමා ළඟ ඉඳගෙන බොහොම හොඳයි කිය කියා, නම් පාව්ච්චි කරලා මොනවාද කරලා තිබෙන්නේ? ඒ නිසා ඒ ගැන කථා කරන්න මා ඊට වැඩිය වෙලාව නාස්ති කරන්න අවශ්‍යතාවක් නැහැ. මේ වාගේ අය තමයි මේ කාබාසිනියා කරන දේවල්වලට වග කියන්න අවශ්‍ය වන්නේ.

ගරු පියංකර ජයරත්න ඇමතිතුමනි, කරුණාකර මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මේ ආයතන දෙක ඒකාබද්ධ කළාය කියලා එතැන තිබෙන ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඉස්සෙල්ලාම මෙතැන තිබෙන්නේ, ඒ වැඩ කරන සේවක පිරිස තුළ චිත්ත ශක්තිය දියුණු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කිරීම. අද එක් කෙනකු, දෙදෙනකු යම් විධියකින් ඒ තිබෙන කළමනාකරණයට විරුද්ධව කටයුතු කළොත් ඒ අය වෙනත් තැන්වලට දමලා ඒ තිබෙන හොඳ අදහස් ටික යටපත් කරලා, කටයුතු කරන්න හදනවා. ඊට වැඩිය මේකට හොඳ think tank එකක් දමලා, පිටස්තර අයගේ දැනුවත්කමත් පාවිච්චි කරලා කටයුතු කළ යුතුයි. මොකද, මේ අහස් යානා කොම්පැනි නිකම් private bus එකක් දුවන විධියට දුවන්න බැහැ. කරුණාකර, මෙන්න මේවා ගැන අවධානය යොමු කිරීම තමයි අවශ්‍ය වන්නේ. එතැන වැඩ කරන දක්ෂයෝ ඉන්නවා. නැතිව නොවෙයි. නමුත් අද එක තැනක, හෙට තව තැනක. බැරි වෙලාවත් ආණ්ඩුවට විරුද්ධව කිව්වොත් මේක කරන්නය කියලා, තව තැනකට transfer කරනවා. ඒ වාගේ නැතිව කටයුතු කරන්න ඕනෑය කියන එක මා මේ අවස්ථාවේදී වගකීමකින් මතක් කරන්න කැමැතියි.

මා මීට වැඩිය දරුණු මට්ටමකට මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි. නමුත් ඒකට අවශ්‍යතාවක් නැහැ. මොකද, අවස්ථාවක් දෙන්න අවශ්‍යයි, ඒ අයට හදලා ගන්න. මා හිතන්නේ දැන් අහස් යානා 17ක් ද කොහෙද තිබෙනවා කියලායි. මේක 25 හෝ 28 දක්වා වැඩි කරන්න යනවා. මේක re-fleet කරන්න හදනවා. මේ re-fleet කරන ගමන තුළ, මේක ගන්නවාද, නැත්නම් මේ ආයතනය අරගෙන lease-out කරනවාද කියන මේ වාගේ නොයෙක් නොයෙක් තර්ක තිබෙනවා. නමුත් තමන්ගේ තිබෙන corporate plan එකට හරි යන ආකාරයෙන් ගමන් කරන්න පුළුවන් මාර්ගයක් තිබෙනවාද, නැද්ද කියන එක තමයි තිබෙන ප්‍රශ්නය. ප්‍රශ්න ඇහුවාම උත්තර දෙන්න බැරි තත්ත්වයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා වාගේ කෙනකු කැබිනට් එකේ ඉඳන් නිකම් අත් ඔසවලා ලයිට් කණුවක් වාගේ ඉන්නවාට වැඩිය හොඳයි ප්‍රශ්න කිරීම. අඩු ගණනේ වැඩි කල් යන්න ඉස්සරින් වැටෙන මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව තුළින් නැවත-[බාධා කිරීමක්] රට බේරා ගන්න පුළුවන් පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය. ඊට පස්සේ ඒ වෙලා තිබෙන අපරාධයවත් අඩු කර ගන්න පුළුවන් වේවිය කියන එක තමයි මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔතැන ඉඳන් ඔළුව වැනුවාට වැඩක් නැහැ. කරුණාකර මේ සිදු වන දේවල් ගැන සොයා බලන්න. මා දන්නවා ඔබතුමාට කැමැත්තක් තිබෙනවා, හැකියාවක් තිබෙනවා, අවස්ථාව ලබා දේවිද කියන ප්‍රශ්නය විතරයි තිබෙන්නේ කියලා.

මේ අවස්ථාවේදී ඒ ගන්න බොයිං එකෙන් re-fleet කරනවාද, නැත්නම් airbus එකකින් re-fleet කරනවාද, සියයට 10ක කොමිස්වලින්ද, නැත්නම් සියයට 20ක් කොමිස් ලැබෙනවාද කියන ඒවා බලන්න. මොකද, ඔබතුමාගේ පාලනය යටතේ ඕවා එන්නේ නැහැ. දැන් මේ asset leaseback එකක් අනුව කරලා තිබෙන aircraft ඉතාමත් අධික මිලකට අරගෙන තිබෙන්නේ. මා හිතන විධියට Cathay Pacific Airways වලින් අරගෙන තිබෙනවා කියලා දන්නවා. මා ඒ ගැන වැඩිය නොදන්නා නිසා ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. නමුත් මා වාර්තා දැක තිබෙන නිසා තමයි මේ සම්බන්ධයෙන් කෙටි මතක් කිරීමක් කළේ. මේ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය තුළින් ඉතාමත් වැදගත් සේවයක් ලංකාවට කරන්න පුළුවන්. මොකද, මේ වාගේ දූපත් රටක සංචාරක කර්මාන්තය දියුණු කරන්න අපේම අහස් යානා කොම්පැනි එකක් අවශ්‍යයි. නමුත් මේක අපේම කියන අයිතිය තුළින්ම ගෙන යන්න අවශ්‍යතාවක් නැහැ. ඊට වැඩිය ලොකු සේවයක් කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවා. දැන් මාලදිවයිනේ අහස් යානා කොම්පැනි එකක් නැහැ. එහේට ලක්ෂ පහක, හයක පිරිසක් එනවා. නමුත් ඔබතුමන්ලා පාඩු විඳිනවාට වැඩිය හොඳයි ඒ තිබෙන සල්ලි ප්‍රමාණයත් දමලා ඒ tourist destinations දුවන්න-[බාධා කිරීමක්] දැන් ඔබතුමාගේ ඉස්සරහා ඉන්න ගරු නිරූපමා රාජපක්ෂ මැතිනියගේ ස්වාමි පුරුෂයා අද හිල්ටන් හෝටලය දක්ෂ ලෙස ගෙන ගිහිල්ලා අලාභය ලාභයට ගෙනැල්ලා, තිබෙන වත්කම රජයට පවරාගෙන කරලා තිබෙන දේවල් බැලුවාම මේ අහස් යානා කොම්පැනි සම්බන්ධයෙන් තමාම අයිතියක් තියා ගන්න අවශ්‍යතාවක් නැහැ. මේක ඒකාබද්ධ කිරීම තමයි වැඩිම හොඳ. අර එමිරේට්ස් ආයතනයට දෙන කොට හරියාකාරව දුන්නා නම් මේ වාගේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

Mihin Air ආයතනය ගැන නම් කථා කරලා වැඩක් නැහැ. ඒ තියෙන අපරාධයට වියදම් කළ මුදල් විරැකියාවෙන් ඉන්න අහිංසක තරුණ තරුණියන්ට රැකී රක්ෂා ලබා දෙන්න පාවිච්චි කළා නම් ඊට වැඩිය ලොකු සෙතක් වනවා කියන එක තමයි මම මතක් කරන්නේ. නමුත් Ministry of Civil Aviation යටතේ ඇති Airport and Aviation Services (SL) Limited එකේ තිබෙන runways ගැන කියන්න ඕනෑ. අද කටුනායක එක runway එකක් තිබෙනවා. මේ runway එක දීර්ඝ කරන්න සහ එහි දෙවන runway එක ඇති කිරීම සම්බන්ධයෙන් මීට අවුරුදු දොළහකට විතර ඉස්සෙල්ලා තිබෙන වාර්තාවක් තිබෙනවා. මේ ගැන කිසිම සැලකිල්ලක් නැතුව මේකම මත්තලට ගෙනිහිල්ලා ප්‍රශ්නය විසඳනවා කියන මතයෙන් ගෙනිහිල්ලා අද ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අද නූතන ක්‍රමය අනුව, A380 aircraft මේ පැතිවල සංසරණය කරන අවස්ථාවලදී බැරි වෙලාවත් මේ රටට එන්න plan කළොත් ඒවා මේ රටට ගෙනෙන්න අපට runway එකක් නැහැ. ඇයි, මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත්තේ? අවුරුදු දහයකට දොළහකට ඉස්සරවෙලා මේ plan එක තිබුණා; මේවාට සල්ලි වෙන් කළා. ඔය පැතිවල අක්කරයක් දෙකක් තව ගත්තා නම්, Katunayake Air Force Base එක කළුතරට හරි වීරවිලට හරි ගෙනගියා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් මේක මත්තලට ගෙනිහිල්ලා airport එකක් හැදුවායි කියලා, හිතන්න එපා, මේ පැතිවලට ඔන්න එක පාරටම airport එක-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன )
(The Hon. Piyankara Jayaratne)

ගරු මන්ත්‍රීතුමා, අපි මේ කටුනායක කිසි දෙයක් මත්තලට ගෙනිහින් නැහැ. කටුනායක දෙවන අදියර ලබන අවුරුද්දේ මැද භාගයේදී ආරම්භ කරන්න අපි සියලු සැලසුම් දැන් සකස් කරලා තිබෙනවා. A 380 යානයක් දැනටත් ගොඩ බාන්න පුළුවන්, ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි ලබන අවුරුද්දේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ දෙවන අදියර ආරම්භ කරනවා. දැන් සැලසුම් සකස් කරලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇත්ත වශයෙන්ම ඔබතුමා යම් දෙයක් ගැන ඇත්ත කිව්වා. කොළඹ වරායේ සිට හම්බන්තොට වරායට කිසි දෙයක් ගෙනිච්චේ නැහැයි කියලා කිව්ව එක ඇත්ත. මොකද, නැව් දහස් ගණන් එනවා කිව්වාට නැව් හතරයි අවුරුද්දටම ගිහින් තිබෙන්නේ. ඔන්න ඔය වාගේ මේ කටුනායක airport එකෙන් කිසි දෙයක් මත්තලට යන්නේ නැහැ. එහේ යන්නේ කවුද? මොකටද, යවන්න අවශ්‍ය වන්නේ? කොයි airline එකද, එහාට ඇවිල්ලා තිබෙන්නේ? IATA එක මේක accept කරලා තිබෙනවාද? ඔබතුමා උත්තර දෙන්නකො ඇමතිතුමා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

දැන් ඔබතුමා කියන එකෙන් වැරදි මතයක් එනවානේ පාර්ලිමේන්තුවට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මිත්‍රශීලී ඔබතුමා උත්තර දෙන්න හැදුවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
කටුනායක ගුවන් තොටුපොළට ගුවන් යානා එනවා වාගේම මත්තල සඳහාත් මේ වන කොට අපට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට කියන්න කොහෙන්ද කියලා. ඉදිරිපත් කරන්න මේ පාර්ලිමේන්තුවට. අද ඕනෑ නැහැ. ඔබතුමා හෙට උදේ-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඔබතුමා ප්‍රශ්නයක් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දන්න නිසා අහන්නේ. අහස් යානා කොම්පැනි හතළිස් එකකින් අහස් යානා මේ රටට එනවා. ඒකෙන් scheduled flights 28ක් තිබෙනවා. මට කියන්න, මත්තලට මේ වාගේ aircraft එනවායි කියලා, application ඉල්ලා තිබෙන, එක ජාත්‍යන්තර ආයතනයක්? කියන්න එපා, Mihin Air කියලා: කියන්න එපා, SriLankan Airlines කියලා. මට කියන්න, ජාත්‍යන්තර මට්ටමේ ආයතනයක්?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
"Fly Dubai". KLM ආයතනය අපට අනුමැතිය දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකරලා ඔය ඉල්ලීම් හෙට පාර්ලිමේන්තුවට සභාගත කරන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මන්ත්‍රීතුමා,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔහොම කියන්න එපා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
එහෙම සභාගත කරන්න අවශ්‍ය නැහැ. තමුන්නාන්සේට අවශ්‍ය නම් ඉල්ලීමක් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක නිකම් මේ කියනවා, විජය මලයා ලංකාවට එනවා, ඒ නිසා මගේ aircraft ටික හම්බන්තොටට ගෙනෙනවා, කින් ෆිෂර් මෙහාට එනවා කියලා. එහෙම කියලා හරි යන්නේ නැහැ නේ. මම දන්නවා, ඒ වාගේ කට්ටිය. මම දන්න නිසා කියන්නේ. Cathay Pacific Airways ආයතනය, Thai Airways, Singapore Airways, Emirates Airways, Qatar Airways ඔබතුමා කියනවාද ඒ වාගේ ඒවා? මේවායින් එකක් මට කියන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
හදන්නේ නැතුව දැන් එන්න පුළුවන් යැ? ඔබතුමා බලන්න, ලබන අවුරුද්දේ විවෘත කළාට පස්සේ කවුද එන්නේ, කවුද එන්නේ නැත්තේ කියලා. අනෙක මේ plan එකකට නිකම් සෙල්ලම් ගුවන් තොටු පොළවල් හදන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, හම්බන්තොට වරාය හදන්න අවුරුදු තුනක් ගියා. හම්බන්තොට වරාය හදන කොට මෙන්න මෙතැන වරායක් තිබෙනවා කියලා ලෝකයා දන්නවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
තමුන්නාන්සේ වැරදි මතයක් දෙන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, මම මේ කියන්නේ සංසන්දනය කිරීමක් නේ. මේ ඔක්කොම හම්බන්තොට නේ. කොළඹ හදලා එහාට ගෙනියන්න හදනවා වාගේ තමයි මේ හම්බන්තොට වරායෙන් එහාට නැව් ගිහින් තිබෙනවාද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
අවශ්‍යතාවක් තිබෙනවා, ඒකයි හදන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් කටුනායක සිට මත්තලට ගෙනියන්න හදනවා. ගෙනියන්න ඉස්සර මම ප්‍රශ්නය කියනවා. මොකද, අපි දන්නවා, ඉදිරි දර්ශනය අනුව වෙන්න යන්නේ මොකක්ද කියන එක. ඔබතුමන්ලාගේ සල්ලි පාවිච්චි කරනවා නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව යටතේ මේ සම්පූර්ණ සල්ලිවල මූල්‍ය පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. අපි එදා Mihin Air ආයතනය ගැන කථා කළා. එදා තිබුණු අපරාධය නවත්වන්න තිබුණා, අපි කිව්ව දෙය පිළිගත්තා නම්. මෙන්න අද වෙලා තිබෙන්නෙත් ඒක. අපි ඒ ගැන කියන්නේ ඒකයි. අපි අහනවා, A380 යානයක් හෙට ලංකාවට එන්න අවශ්‍ය නම් කොයි ප්‍රදේශයේද මේක land කරන්න පුළුවන් වන්නේ කියලා. කටුනායක පුළුවන් වෙයිද, මත්තල හදන airport එකෙන් පුළුවන් වෙයිද? බැහැ. මේවා නිකම් විහිළු කරන්න හදන airport. Airport එකක් හදනවා නම්-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මන්ත්‍රීතුමා, මාත් එක්ක එන්නකෝ මත්තල පොඩ්ඩක් රවුමක් යන්න. මොකක්ද ඒකේ තත්ත්වය බලා ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, හරි රවුම් ගහන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
එන්නකෝ. මා ගැන භය වෙන්න එපා. ඇවිල්ලා බලන්න මොකක්ද මේ වෙන්නේ කියලා. රනිල් වික්‍රමසිංහ එක්ක යනවා වාගේ භය වෙන්න එපා. මාත් එක්ක යන්න පුළුවන්, කිසි දෙයකට භය වෙන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කිසි ප්‍රශ්නයක් නැහැ. අපට කාත් එක්කවත් යන්න කිසිම භයක් නැහැ. ඒ ගැන භය වෙන්න එපා. මතක තියා ගන්න, අපට රවුම් ගහන එක නොවෙයි අවශ්‍යව තිබෙන්නේ. ඒ රවුම් ගහන්න ඉස්සෙල්ලා වෙන්න යන්නේ මොකක්ද කියලා තමයි අපි කියා තිබෙන්නේ. [බාධා කිරීම්] මොකක්ද, සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි? ඔබතුමා නියෝජ්‍ය ගුවන් සේවා ඇමති කාලයේ වැයමක් කළා, එතැන පිරිසිදු කරන්න. මම එය අගය කරනවා. එතැන පොඩි ශබ්දයක් දාලා තර්ජනය කරලා කරන්න හැදුවා; බැරි වුණා.

ඒකයි මම කියන්නේ. එතුමා එතැන පිරිසිදු පාලනයක් ගෙන යන්න බැලුවා. අද මොකද වෙලා තිබෙන්නේ? ඒවා දේශපාලනය තුළින් වෙලා තිබෙන දේවල්. එතුමාට වෙලා තිබෙන අසාධාරණය දිහා බැලුවාම අපටත් දුකයි. ඒ වාගේ දේවල් තිබෙනවා. හැම පක්ෂයේම ඒ වාගේ දේවල් වෙනවා. [බාධා කිරීමක්] මම දන්නවා. වැඩිය කථා කළොත් ඔබතුමාගේ තිබෙන තනතුරත් නැති වෙනවා. ඒ නිසා මම වැඩිය කථා කරන්නේ නැහැ. SriLankan Airlines එක පිරිසිදු කරන්න ගිහින් අන්තිමට වුණේ -ඒ පිරිසිදු කරන හැකියාව නැති වෙලා- තමන්ට තිබුණ අමාත්‍යාංශයත් නැති වුණ එක විතරයි. එච්චරයි වුණේ. ගරු ඇමතිතුමා, ඒ කරන්න ගිය හොඳ වැඩ පිළිවෙළ කරුණාකරලා ක්‍රියාත්මක කරන්න. ඒකයි අපට අවශ්‍ය වන්නේ. මේ මත්තල හදන airport එකේ A380 ගුවන් යානයක් එන්න පුළුවන්ද කියලා අපි අහනවා. [බාධා කිරීමක්] ඇමතිතුමා එහෙම කියන්න එපා. අහන්න. Corporate Plan එක ඉදිරිපත් කරන්න. ඒකේ නැහැ. ඕක ගැන IATA එකේදී Mr. Dayanthe Athulathmudali කථා කළා. ඒ, අපේ ලලිත් ඇතුලත්මුදලිගේ මල්ලී. එතුමා මේ වාර්තාව අවුරුදු 15කට ඉස්සෙල්ලා දුන්නා. මෑතකදී ඩුබායි ඉඳන් මේ රටට ආවා. ඒ වාගේ දක්ෂයෝ පාවිච්චි කරන්න. Retire වෙලා හිටියාට කමක් නැහැ. ඒවා දැන ගෙන පාවිච්චි කරන්න, මොනවාද කරන්න පුළුවන් වන්නේ කියලා. IATA එක මේ පැත්ත පළාතට ගන්න බැරි එකක්. සාමාන්‍යයෙන් මේ airport ඇති කරලා තිබෙන්නේ දේශගුණය අනුව. Runways ඇති කරලා තිබෙන්නේ දේශගුණය අනුව. කටුනායක තිබෙන එකත්, මත්තල තිබෙන එකත් ඔක්කොම එක පැත්තක තිබෙන්නේ. ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂ කාලයේ අපි මේක ඇති කරන්න හැදුවේ බුත්තල පැත්තේ. Geographical location අනුව තමයි බලන්න ඕනෑ. දේශපාලනය නිසා ඒක හම්බන්තොටට ගෙනාවාට හරි යන්නේ නැහැ. එහෙම නේද නිරූපමා රාජපක්ෂ මැතිනිය? අහන්න. ඔය ප්‍රශ්නවලට දේශපාලන උත්තරයක් නොවෙයි අවශ්‍ය වන්නේ. මේවා ව්‍යාපාර. මේවා ව්‍යාපාර අනුව ගන්න තිබෙන තීන්දු. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා ඊට වැඩිය මම කථා කරන්න හදන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් අහන ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු ඇමතිවරයෙක් සිටිනවා. දැන් මෙතැන ඒ ඇමතිත් නැහැ. මහජන සම්බන්ධතා හා මහජන කටයුතු ඇමතිතුමාත් දැන් මෙතැන නැහැ. අපි මේ කථා කරන්නේ හුදකලාවේද? මේවාට උත්තර දෙන්නේ කවුද? හිටපු අගමැති අද මෙතැනට ඇවිල්ලා අහගෙන ඉන්නවා. අඩුතරමින් එතුමාගේ දක්ෂතාව පාවිච්චි කළා නම්, ඔතැන තිබෙන අමාත්‍යාංශ 10ක් විතර ඒකාබද්ධ කරලා එතුමාට දුන්නා නම් වැඩේ හරි. අද ඒ දක්ෂතාව පාවිච්චි කරන්නේ නැහැ. උඩට පයින් ගහලා, තිබෙන හැකියාව නැති කරලා අන්තිමට එතුමාට භාර දීලා තිබෙන්නේ මොකක් කරන්නද? මම ගරුත්වයක් ඇතිවයි හිටපු අගමැතිතුමාට කියන්නේ. කරුණාකරලා හිටපු අගමැතිතුමා වශයෙන් මේවා ගැන කැබිනට් මණ්ඩලයේදී කථා කරන්න.

අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් බලන්න. එක පැත්තකින් මීට අවුරුදු හය, හතකට ඉස්සෙල්ලා මේ ආණ්ඩුවම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අවශ්‍ය නැහැ කිව්වා. ඉන් පසුව අන්තිමට ඒ ආණ්ඩුවම නැවත ඒ අයට ආරාධනා කරලා, පාවඩ දාලා, ඉඹලා ආයෙත් ලංකාවට ගෙනාවා. ගෙනාවාට පසුව ඒ අය කියන දේ පිළිපදින්න හදනවා. පිළිපදින්න හදලා අන්තිමට අනා ගත්තාට පසුව ඒ අය සල්ලි දෙන්න බැහැයි කියනවා. ඊට පස්සේ මූල්‍ය අර්බුදයක් ඇති වෙන නිසා රුපියල අවප්‍රමාණය කරන්න හදනවා. ඇමතිතුමනි, මේ අය වැය තුළින් අවප්‍රමාණය කරන එක ගැන මම ඉතාමත් ඕනෑකමින් අහනවා. තමන්ගේ වම් අත කරන දේ දකුණු අත දන්නවාද? මහ බැංකුවේ Monetary Board එකක් තිබෙනවා. ඒ මූල්‍ය කළමනාකරණ කමිටුවේ අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහ බැංකුවේ අධිපතිතුමා සහ තවත් දෙපලක් එතැන ඉන්නවා. එක පැත්තකින් ඒකේ තිබෙන ඩොලර් ටික විකුණලා රුපියල රකින්න හැදුවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් Monetary Board එකේ ඉන්න පුද්ගලයෙක්.

එතුමා අය වැය තුළින් රුපියල සියයට 3ක් අවප්‍රමාණය කරන්න අදහස යොමු කරනවා. අපි අහන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා Monetary Board එකේ ඉඳ ගත්තාම දැන ගත්තාද, රුපියල ශක්තිමත් කරන්න එක පැත්තකින් උත්සාහ කරන විට අනෙක් පැත්තෙන් රුපියල අවප්‍රමාණය කරන්න යනකොට මේ දෙක අතර මුදල ඩොලර් මිලියන 8,100ක් සම්පූර්ණයෙන් නැති වෙනවා කියලා. කවුද මේකට වග කියන්නේ? මේ නිසා අද මේ පාර්ලිමේන්තුවේ තිබෙන අය වැය හිඟය සියයට 6.2 සිට 7.3කට වැඩි වෙනවා. මේ පාපකර්මයට කවුද වග කියන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී අහනවා. මෙතැනදී ඒකට උත්තරයක් දෙන්න ඒ අමාත්‍යාංශයේ ඇමතිතුමා නැහැ. මේ පාර්ලිමේන්තුවේ මුදල් ඇමතිතුමා නැහැ. නියෝජ්‍ය මුදල් ඇමතිත් නැහැ මේ පාර්ලිමේන්තුවේ. මේ රට දුවන්න හදන්නේ auto system එකට auto pilot යනවා වාගේ තමයි. [බාධා කිරීමක්] අපේ ප්‍රතිපත්තිය කියපු නිසා තමයි අද ඒකේ එල්ලිලා ඒ තුළින් ගමන් කරන්න හදන්නේ.

අපි ඔබතුමන්ලාට මේ පාර්ලිමේන්තුවේදී බොහොම ඕනෑකමින් කියනවා, ඔබතුමන්ලා හෙට ඡන්දය දෙන්න යන්නේ අය වැය හිඟය සියයට 6.2යි කියලා සිතා ගෙනයි කියලා. අපි කියනවා, රුපියල සියයට 3කින් අවප්‍රමාණය කිරීමෙන් මේකට තව රුපියල් මිලියන 81,000ක හිඟයක් එනවා කියලා. ඒක අඩංගු කරලා තිබෙනවාද මේ අය වැය හිඟයට? මේ 7.3 ගැන උත්තර දෙන්න කියලා මේ පාර්ලිමේන්තුවේ කාගෙන්ද අහන්නේ? මට අහන්න පුළුවන් හිටපු අගමැතිතුමාගෙන්. එතුමාගෙන් ඇහුවොත් කියයි, "අනේ, මම නම් දන්නේ නැහැ, මට දීලා තිබෙනවා හොඳ කාමරයක්, ඊට වැඩිය කරන්න දෙයක් නැහැ" කියලා. ඉතින්

[ගරු රවි කරුණානායක මහතා]

ඇත්ත නේ එතුමා කියන්නේ. ඊට වැඩිය දෙයක් කියන්න පුළුවන්ද එතුමාට? දැන් මෙතැන ඇමතිවරු හය-හත් දෙනෙක් ඉන්නවා, ඔබතුමන්ලා දන්නවාද මේවා ගැන? කැබිනට් එකට එනවා, ඕවා බලන්නේ නැතිව එතැන තිබෙන කේක් කෑල්ල කාලා එළියට එනවා. ඊට පස්සේ කවුද මේවාට වග කියන්නේ? අප විපක්ෂයක් වශයෙන් සද්ද කරලා අහන්නේ මේ ජනතාව වෙනුවෙන්. මේ කරන අපරාධයට කවුද වග කියන්නේ?

ගරු ඇමතිතුමනි, කරුණාකරලා වග කීමකින් මේ පාර්ලිමේන්තුව හොබවන්න ඕනෑය කියන එක මේ අවස්ථාවේදී අප මතක් කරනවා. මේ පාර්ලිමේන්තුවේ කිසි යහ පාලනයක් නැහැ. අමාත්‍යාංශ 64ක්, 65ක් තිබෙනවා. මෙතැන ඉන්න ඇමතිවරු දන්නේ නැහැ තමන්ගේ අමාත්‍යාංශවල මොනවා වෙනවාද කියලා. බලන්න විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා ඒ අමාත්‍යාංශයට එක වරක් දෙවරක් යනවා කියලා තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. හැබැයි කවුද ඒක ගෙනියන්නේ? ඔය පස්සේ ඉන්න මන්ත්‍රීවරු දෙන්නෙක් තුන් දෙනෙක් remote control කරලා ජනාධිපති කාර්යාලයට දුවනවා; අගමැති කාර්යාලයට දුවනවා; ඒක තුළින්, මෙන්න මෙහෙම තමයි විදේශ ප්‍රතිපත්තිය තිබෙන්නේ කියලා කෑ ගහනවා. ඉන්දියාවට ගියාම එක ප්‍රතිපත්තියක්. ලංකාවට ආවාම ඉන්දියාව සම්බන්ධයෙන් තිබෙන ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් වෙනස්. ඒ නිසා තමයි අප අහන්නේ.

ආණ්ඩුව ඉදිරි දැක්මක් සහිතව ඉලක්කයක් කරලා යන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමයි ඉදිරිපත් කළ යුතු වන්නේ. දැන් බලන්න, මේ අමාත්‍යාංශ 21ක් කාරක සභාවට දැම්මේ ඔබතුමන්ලාට උදවු කරන්න. මොකද විපක්ෂයක් වශයෙන් අප මේවා ඔක්කොම ගැන විවාද කළා නම් එක අමාත්‍යාංශයකට පැය දෙකක්වත් දෙන්න වෙන්නේ නැහැ. ඒ නිසා තමයි මේ ඔක්කොම ඒකාබද්ධ කරලා තිබෙන්නේ. වැදගත් ක්ෂේත්‍ර තිබෙන ඒවා ඔක්කොම ඒකාබද්ධ කරලා අප මේ ප්‍රශ්න අහන්නේ. මෙතැන මේ අමාත්‍යාංශ දහයක් නැති කරන්න පුළුවන් නේද හිටපු අගමැතිතුමනි? ඔබතුමන්ලාට දීලා තිබෙන කාර්ය භාරය මොකක්ද? නිකම් කාර් එකක් දෙන්න, නිකම් ලේකම් කෙනෙක් දෙන්න ඔය වාගේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑද? ගහනවා නම් කනට පාරක් ගහලා එළියට දමන එකේ ඊට වැඩිය ගරුත්වයක් තිබෙනවා නේද?

හිටපු අගමැතිතුමනි, මා මේ අවස්ථාවේදී ඔබතුමාට කියන්නේ ඉදිරි 2012 අවුරුද්දේවත් කරුණාකරලා මේ තිබෙන සීමිත සම්පත් පාවිච්චි කරලා මේ අසීමිත ඉල්ලීම් තුළින් මේ ජනතාවට මීට වැඩිය සෙතක් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලායි. ශ්‍රී ලංකන් ආයතනය, මිහින් ආයතනය කිව්වාම අප ඒක කිව්වා මොනවාද වෙන්න තිබෙන්නේ කියලා. අද ගෙවුම් ශේෂයේ ඉතාම බැරෑරුම් මට්ටමට විශාල හිඟයක් ඇති වීගෙන යනවා. මේක තුළින් එක පැත්තකින් අපනයනකරුවන්ට තිබෙන ප්‍රශ්න නිරාකරණය කරන්න ගිහිල්ලා අද ආනයනය කිරීමේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒකෙන් වෙන්නේ 2012 ජනවාරි මාසයේ ඉඳන් ජීවන වියදම අඩු ගණනේ සියයට 5කින්-

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
රටට සිමෙන්ති ගෙනැල්ලා-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔන්න බලන්න. මම මේ ගෙවුම් ශේෂ හිඟය ගැන කියනවා. මෙතුමා සිමෙන්ති ගැන කථා කරනවා. මේ වාගේ පිරිසක් එක්ක ඉදිරියට යන්න පුළුවන්ද මම අහන්නේ. හිටපු ගරු අගමැතිතුමනි, කරුණාකර පස්ස බලන්න, කවුද මේ කථා කරන්නේ කියා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ආණ්ඩුව ඔහොම defend කරන්න එපා. ඔබතුමා ඔහොම defend කළාට වෙනත් කිසිම අමාත්‍යාංශයක් ලැබෙන්නේ නැහැ. ඔබතුමා අපෙන් අහනවා මොකක්ද ප්‍රතිපත්තිය කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව 1994 ඉඳලා 2001 වෙනකම් ඉඳලා අවුල් කරලා තමයි අපට භාර දුන්නේ.

2001 දී අප ආණ්ඩුව අරගෙන මාස 26කින් ඒ තිබුණු ආර්ථිකය සම්පූර්ණයෙන් නැවත හදලා තමන්ලාට full tank එකක් ගහලා තමයි දුන්නේ පිස්සු කෙළින්න කියලා. දැන් පිස්සුව ආයෙත් කෙළගෙන යනවා. දැන් ජීවන වියදම අඩු කරන්නේ නැතිව මොනවාද වෙන්නේ? දැනට දවස් තුන හතරකට ඉස්සර වෙලා කොටුව වටේ වැලි බෑග් ලක්ෂයක් විතර දමාගෙන ඔන්න "හූම්", "සූම්", "සූම්" ගගා ඉන්න කාර් ටික එහේ මෙහේ කැරකුණා. මේ, දහ දොළොස් දෙනෙකුගේ තෘප්තිය සඳහා. අර වැඩ කරන අහිංසක ජනතාව ලක්ෂයක් විතර එනවා පිටකොටුවට වැඩ කරන්න. පිටකොටුවට ඇවිල්ලා ඒ වැඩ කරන අයට හවස දෙකහමාරට තුනට ගෙදර යන්න තිබුණා. බස් එකේ, trishaw එකේ යන්න හදන ඒ අහිංසක කට්ටිය එළවලා ඒ අයට කිසිම දෙයක් දෙන්නේ නැතිව අන්තිමට පීඩනයට ලක් කරලා තිබෙන්නේ. ඊට පස්සේ රූපවාහිනියෙන් පෙන්වනවා. ඒකත් වැඩිය පෙන්වන්නේ නැහැ. මොකද එතකොට ගම්බද ප්‍රදේශවල ඉන්න අය අහයි, මේකද මේ ප්‍රදේශයේ තිබෙන සංවර්ධනය කියලා. මේක වටේ කැරකි කැරකී යන එක යම් අයට ජොලියක්. අනිත් අයට කාගෙන ඉන්න බැහැ මොන පිස්සුවක්ද මේ කෙළින්නේ කියලා. අප අහනවා ඒකට ගිය වියදම කීයද කියලා. කොළඹ නගර සභාවේ පාලනය අද අපේ අතේ තිබෙන්නේ. නමුත් ඊට පෙර ලක්ෂ 100ක් ඕකට වෙන් කරලා තිබුණා, මේවා හදන්න. මොනවාද මේකෙන් ඇති වන්නේ? මේකෙන් රක්ෂා කීයක් ඇති වෙනවාද? මේකෙන් රක්ෂා කීයක් නැති වුණාද? මේ තිබෙන දේවල් පාවිච්චි කළා නම්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට විනාඩි 25ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තව විනාඩියක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව විනාඩි 10ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව මිනිත්තුවයි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ ලක්ෂ 100න් කොච්චර දේවල් කරන්න තිබුණාද? අද එක පැත්තකින් උතුරු කොළඹ, මැද කොළඹ, නැඟෙනහිර කොළඹ, ඒ වාගේම බටහිර කොළඹ හා බොරැල්ලේ ගෙවල් ටික කඩනවා. මේ තිබෙන සල්ලි ටික නාස්ති කරමින් ඕක වටේ "රූං", "රූං", "සූස්" ගාලා යමින් ෆ පිස්සු කෙළින්නේ නැතිව ඒ තිබෙන සල්ලි ටික ගෙවල් ටික හදන්න පාවිච්චි කළා නම් කොතරම් සෙතක්ද ඇති වන්නේ? මෙහේ එක පැත්තකින් වැදි බණ කිය කියා සංවර්ධනය වෙනවා කියලා වෙනින් පැතිවල දේවල් රූපවාහිනියෙන් පෙන්න පෙන්නා යන ගමන තමයි තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට නියමිතව තිබූ කාල වේලාව අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉතින්, මා පටන් ගත්තේ-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට මිනිත්තු 25ක් දීලා තිබෙනවා. ඒ කාල වේලාව දැන් හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට තව මිනිත්තු පහක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් මිනිත්තු පහක් දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු පහක් ලබා දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බලන්න අප යන ගමන. [බාධා කිරීම්] අපේ පක්ෂයේ තිබෙන ප්‍රශ්න ගණන් ගන්න එපා. ඒවා ගැන බය වන්න එපා. අපි ඒවා හදන්නම්. දැක්කා නේ, රනිල් වික්‍රමසිංහට කෙළින්න ගිහිල්ලා වුණු දේ. මෙන්න මෙහෙම තමයි තිබෙන්නේ කියලා පෙන්නුවා. ඔන්න ඕක තමයි තිබෙන්නේ. අපේ තිබුණේ නායකත්වය ගැන ප්‍රශ්නයක්. වෙනින් ප්‍රශ්න නැහැ. ඔන්න බොහොම සෘජුව පෙන්නලා තිබෙනවා මෙන්න මෙහෙම තමයි තිබෙන්නේ කියලා. ගිය අප්‍රේල්වල කිරිබත් කන්න හදපු යම් යම් අයට මොනවාද වුණේ කියලා පෙනෙනවා නේ. අහසට ලොකු උසක් තිබුණා කිව්වාට දැන් පෙනෙනවා මොන වාගේ තත්ත්වයක්ද තිබෙන්නේ කියලා. හැබැයි ඔබතුමන්ලා මොනවාද කළේ, මේ යහ පාලනය ගැන කථා කරන අවස්ථාවේදී? ඊයේ මොනවාද සිරිකොතේ වුණේ? මගේ ඇස්වලට කඳුළු එනවා ඒ වාගේ දේවල් බලන කොට. අවුරුදු 18ක් පාර්ලිමේන්තුවේ ඉඳ ගෙන මොනවාද වුණේ සිරිකොතේ? පොලිසියට අපි කිව්වා, මෙන්න මේ වාගේ ප්‍රශ්නයක් ඇති වෙන්න ඉඩ තිබෙනවා කියලා. මොකද, අපට ආරංචි වුණා. රජයෙන් කවුරුත් එව්වේ නැහැ කියලා මම වගකීමෙන් කියනවා. නමුත් රජයේ හිටපු පොලීසිය මොනවාද කළේ? අපේ අය එතැන දේශපාලනය කරන්න ගිහිල්ලා, එතැනදී විනය කඩ කරලා තිබුණු අවස්ථාවේදී පොලීසිය එතැන බලා ගෙන හිටියාද ඒ ඔක්කෝම වන කොට? ඔබතුමන්ලාගෙන් ප්‍රශ්නය ඇහුවාම රජය එව්වාද? නැහැ. නමුත් රජයේ හිටපු පොලීසිය මොනවාද කළේ? මෙන්න මේ වාගේ ප්‍රජාතන්ත්‍රවාදය ඔබතුමන්ලාගේ ආණ්ඩුව කථා කරන්නේ. අපේ අයගේ ප්‍රජාතන්ත්‍රවාදය අපි හෙළිදරවු කරන්නම්. ඔන්න දැනටම උසාවියෙන් හයහත්දෙනෙක් අටදහදෙනෙක් අල්ලලා අත් අඩංගුවේ දමලා තිබෙනවා. නමුත් ඔබතුමන්ලාගේ-

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால)
(The Hon. H.R. Mithrapala)

අලියා ගලවා ගෙන ගියේ පොලීසියද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ අලියාට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා තමයි හුළං බස්සන්න කියන්නේ. අපි ඒ අලියා ශක්තිමත් කරලා ආරක්ෂා කර ගෙන තියන්නම්. ඔබතුමන්ලාගේ වගේ එක දවසකින් පුටුවෙන්, අනෙක් දවසේ බුලත් කොළයෙන්, තව දවසකින් අතින් ඡන්දය ඉල්ලන පක්ෂයක් නොවෙයි අපේ පක්ෂය. මේ රටට ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍යයි. 1948 මේ රටේ නිදහස ලබා ගත්තු දා සිට එක්සත් ජාතික පක්ෂය අවුරුදු 32ක් පාලනය මේ රට කර තිබෙනවා. ඔබතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ඔක්කෝම හවුල් එකතු වෙලා, පිස්සු කෙළින හවුල් ඇති කරලා, ඒත් අවුරුදු 31ක් පාලනය කරලා තිබෙනවා. නමුත් මේ වාගේ විළි ලජ්ජාවක් නැතිව මේ පක්ෂය නැති කරන ගමනක් ඇති කරලා නැහැ. ඔබතුමන්ලාගේ machine එක වැඩ කරන්නේ නැති නිසා ඔබතුමන්ලා හිතනවා එක්සත් ජාතික පක්ෂයෙන් -අපෙන්- එක්කෙනකු, දෙදෙනකු, තුන්දෙනකු අරන් ඒ nut එක තුළින් තමන්ගේ මැෂිම දුවවන්න පුළුවන් වේවි කියලා. ඒක වෙන්නේ නැහැ. නමුත් ඔබතුමන්ලා බලන්න හැම පක්ෂයකටම- ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය වෙන්න පුළුවන්-

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැන-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තමුන්නාන්සේලා තියා ගන්න කෝ ප්‍රශ්න. අපේ ප්‍රශ්න අපි විසඳන්නම් කෝ. ඔබතුමන්ලා ඕච්චර ප්‍රශ්නයක් කර ගන්න එපා. ඉතින් මේ අවස්ථාවේදී අප කියන්නේ, එක්සත් ජාතික පක්ෂය තුළ ඔය වාගේ ප්‍රශ්න ඇති කරලා හිතන්න එපා ඒ තුළින් ආණ්ඩුව ගෙන යන්න පුළුවන් කියලා. තමුන්නාන්සේලා පත් කරලා තිබෙන්නේ රටක් පාලනය කරන්නයි; විපක්ෂය කඩන්න නොවෙයි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය වෙන්න පුළුවන්, Ceylon Workers' Congress වෙන්න පුළුවන්, මේ පැත්තේ -විපක්ෂයේ- ඉන්න බැරි නම් ඔන්න ආණ්ඩුවට ගන්න හදනවා. එහෙම නොවෙයි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න තිබෙන්නේ. ඔබතුමන්ලා පත් කරලා තිබෙන්නේ රටේ ජීවන වියදම අඩු කරන්නයි, රටේ සංවර්ධනයක් ඇති කරන්නයි. පවුල්වාදයක් ගෙන යන එක නොවෙයි කරන්න ඕනෑ. ඉදිරියේදී හරියාකාර විධියට ගමන් කරන එක තමයි කරන්න තිබෙන්නේ.

[ගරු රවි කරුණානායක මහතා]

මා ඊයේ කිව්වා වාගේ සිරිකොතේ වූ විනය කඩ කිරීම-[බාධා කිරීමක්] ඒ ගෙනාපු කට්ටිය කවුද කියලා අපි පෙන්වන්නම්. නමුත් පොලීසිය එතැන බලා ගෙන සිටියාද මොනවාද වෙන්නේ කියලා? කී දෙනකුගේ කාර්වලට ප්‍රශ්න ඇති වුණාද? අපේ ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාගේ, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ, ගරු තිස්ස අත්තනායක මැතිතුමාගේ, සෙනරත් කපුකොටුව මැතිතුමාගේ වාහනවලට ප්‍රශ්න ඇති වුණා. ඒ වාගේම තිබුණු කාර් එළියට අර ගෙන පිස්සු කෙළපු ඒවාත් අපි පෙන්වන්නම්. අපේම අය කරලා තිබෙනවා - [බාධා කිරීමක්] හැබැයි, අපට ඒක නොවෙයි අවශ්‍ය වන්නේ. පොලීසිය මේවා බලා ගෙන සිටියා. මොනවාද පැය දෙකක් කළේ? මේක තමයි තිබෙන ප්‍රශ්නය. කාගේ අනුදැනුම තුළින්ද මෙතෙක් දුර ඔය වාගේ පිස්සු කෙළින්න ඉඩ දුන්නේ? ඒ නිසා කරුණාකර රටේ විනයක් ඇති කරන්න. හිතන්න එපා දේශපාලන පක්ෂයක් ඇතුළට ඇවිල්ලා එතැන තිබෙන සියලු දේවල් කඩලා, ඒක නැති කරලා ඔබතුමන්ලාට ආණ්ඩුව රකින්න පුළුවන් වෙයි කියන එක. අද ඒ වාගේ බය වෙන්නේත් නැහැ, බය වෙන්න ඉඩ දෙන්නේත් නැහැ. අපි අපේ එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරනවා කියන එක මම ඉතාම ඕනෑකමින් මතක් කරන්න කැමැතියි.

අපි දැන් එක්සත් ජාතික පක්ෂයේ තිබෙන ප්‍රශ්න විසඳලා තිබෙනවා. අපට අවශ්‍ය වන්නේ මේ පිස්සු කෙළින ආණ්ඩුව ගෙදර යවන්නයි. මේක තමයි අපට කරන්න ඕනෑ වෙලා තිබෙන්නේ. මොකද, සමහර අය දන්නේ නැහැ අපේ මූලික ප්‍රශ්නය තිබෙන්නේ මොකක්ද කියා. අපේ යුතුකම වන්නේ ආණ්ඩුව රැකීම නොවෙයි. මේ පිස්සු කෙළින ආණ්ඩුව කොහොමද හරියාකාරව ජනතාවට සේවය කරන්නේ? ඒක කරන්නේ නැත්නම් ආණ්ඩුව ගෙදර යවලා එක්සත් ජාතික පක්ෂය 2001 ඉඳන් 2004 වෙන කොට රට හැදුවා වාගේම නැවත මේ වැටිලා තිබෙන ආර්ථිකය හදන එකයි අපේ යුතුකම. ඒ නිසා මම ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේදී කියනවා කරුණාකර අපට-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට දුන්නු කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව එකක් කියන්න ඕනෑ. අපේ මහජන සම්බන්ධතා හා මහජන කටයුතු ඇමතිතුමා කෝ?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
එතුමා කථා කරලා ගියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කථා කරලා යන්නේ කොහොමද? අද දවස එතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත් කථා කරන දවස නේ. අපි ප්‍රශ්න අහනවා. ඒක කියන කොටම ඔන්න එනවා තව රජ බඩුවක්; අපේ අගමැතිතුමා. [බාධා කිරීමක්] අගමැතිලා දෙදෙනෙක් ඉන්නවා නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. වැඩියෙන් දුන්නු වෙලාවත් අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අගමැති ඔහොම එන කොට මේ විධියට නවත්වන්න එපා. හරි නැහැ. මොකද,

අනිවාර්යයෙන්ම මම දන්නවා මම මේ කියන්න යන වැඩේ එතුමා කරනවා කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක අගමැතිතුමාගේ office එකට ගිහිල්ලා කථා කර ගන්න. මට වෙලාව පාලනය කර ගන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම හිතන්නේ මම අහපු ප්‍රශ්නවලට අගමැතිතුමා හිතන්න ඇති ඇවිල්ලා උත්තර දෙන්න ඕනෑ කියලා. අඩු ගණනේ මට කියන්න තිබෙන දේ කියන්න මිනිත්තු 5ක් දෙන්න කෝ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට වෙලාව තිබෙනවා. ජෝන් අමරතුංග මැතිතුමා කිව්වා අපේ පක්ෂයෙන් ඕනෑ තරම් කාලය ගන්න කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේට ලබා දුන් මිනිත්තු 5ක කාලය ඉවරයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, තව මිනිත්තු 5ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම නම් දැන් එතුමා ඇවිත් කිව්වොත් හරි. නැත්නම් කථාව නවත්වන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, ඒක ගැන බය වෙන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ සභාව තුළ හික්මීමක් තිබෙන්නට ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අගමැතිතුමනි, මම මේ කිය කියා හිටියේ මහජන සම්බන්ධතා ඇමතිවරයා සරත් ෆොන්සේකා මැතිතුමා ගැන කිව්වා. මේ අවස්ථාවේදී එතුමා මෙතැන නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අනිත් කථිකයාත් ඇවිල්ලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රටේ ත්‍රස්තවාදය නැති කරලා එතුමා අද හිර ගෙදර ඉන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, දැන් කථාව නවත්වමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ අවස්ථාවේදී අපේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පියංකර ජයරත්න ඇමතිතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්න බලන්න, එහෙම්මම නැවැත්වූවා. [බාධා කිරීම්]

[අ. භා. 3.57]

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් ගුවන් කේන්ද්‍රස්ථානයක් කරා යන ගමනේදී අප අමාත්‍යාංශයේ කාර්ය භාරය පිළිබඳව සංක්ෂිප්තව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

මෙම වර්ෂය තුළදී සිවිල් ගුවන් සේවාව වර්ධනාත්මක ප්‍රගතියක් පෙන්නුම් කරන බව මා ප්‍රථමයෙන් ප්‍රකාශ කරන්නට කැමැතියි. මෙම ප්‍රගතිය අපට ළඟා කර ගත හැකි වූයේ අප අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන එකමුතුව වැඩ කිරීම සහ ගුණාත්මකභාවය පිළිබඳ ඇති උනන්දුව නිසා බව විෂය භාර අමාත්‍යවරයා හැටියට මා ඉතාමත් ආඩම්බරයෙන් සඳහන් කරනවා. ගුවන් කේන්ද්‍රස්ථානයක් කරා යන විට ඒ ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකාවේ පළමු වරට ගුවන් සේවා ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙහිදී ඉතා වැදගත් කරුණක් ලෙස සඳහන් කළ යුතුයි. එම ප්‍රතිපත්තිය මහජනතාව වෙත ඉදිරිපත් කර අදහස් සහ යෝජනා ලබා ගැනීමට පෙර කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කර තිබෙනවා.

මේ වන විට සිවිල් ගුවන් සේවාව ජාත්‍යන්තර තලයේ ඉතා හොඳ ස්ථානයකට පත්ව තිබෙන බව ඔප්පු වී තිබෙනවා. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් කරන ලද විගණනයට අනුව ශ්‍රී ලාංකීය ගුවන් සේවාවේ ජාත්‍යන්තර ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ සාපේක්ෂකත්වය පරීක්ෂා කිරීමේදී එම ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීමේ සඵලතාව සියයට 86ක් වෙනවා. ඒ නිසා ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පළමු ස්ථානයද, ආසියා ශාන්තිකර කලාපයේ රාජ්‍යයන් 34ක් අතරින් හතරවන ස්ථානයද හිමි කර ගෙන තිබීම ගුවන් ක්ෂේත්‍රය තුළ අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් බව මා සඳහන් කරන්නේ ඉතාමත් සන්තෝෂයෙන්. විශේෂයෙන්ම මේ වන විට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත පැමිණෙන හා පිටත්ව යන ගුවන් මගීන් සංඛ්‍යාවේ වර්ධනය වැදගත් ස්ථානයක් ගන්නවා. ගුවන් කේන්ද්‍රස්ථානයක් වශයෙන් එය අත්‍යවශ්‍යම සාධකයක්. සංඛ්‍යාත්මක වශයෙන් බලන කල, පසු ගිය වසරේ මුල් කාර්තු තුන තුළදී මෙහෙයවන ලද මගී සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 3.8ක් වෙනවා. ඒ වාගේම මෙම වසරේ එම කාලය තුළ මෙහෙයවන ලද මගී සංඛ්‍යාව මිලියන 4.5ක් වෙනවා. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දැනට තිබෙන පහසුකම්වලින් වැඩි දියුණු කළ යුතු අංශ දැනටමත් හඳුනා ගෙන තිබෙන අතර, ලබන වසරේදී ඒවා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනවා. ඒවා අතර ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණීමේ සහ පිටවීමේ පර්යන්තවල නවීකරණ කටයුතු, පිවිසුම් මාර්ග පිළිසකර කිරීම, තීරු බදු සාප්පු පහසුකම් වැඩි කිරීම ආදී සංවර්ධන කටයුතු සිදු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙරටට පැමිණෙන සංචාරකයන් මෙන්ම දේශීය මගීන් වෙනුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මගී කුලී රථ සේවාවෙන් සිදු වන සේවා පහසුකම් වැඩිදියුණු කිරීමට අතිගරු ජනාධිපතිතුමා අප වෙත අවශ්‍ය පහසුකම් ලබා දී තිබෙනවා. ඒ සඳහා නව මගී කුලී රථ ගෙන්වීමේදී ලංකාවේ ප්‍රථම වතාවට සියයට 50ක බදු පහසුකම් සැලසීමට අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැය තුළින් අවස්ථාව ලබා දී තිබෙනවා. එය ක්‍රියාත්මක කිරීම සඳහා අපි මේ වන විටත් එම කුලී රථ ප්‍රවාහන නියෝජිතයන් සමඟ සාකච්ඡා පවත්වලා ලබන වර්ෂය ආරම්භයේ සිට ඒ සඳහා නවීන පන්නයේ වාහන යොදවලා සංචාරකයන්ට අවශ්‍ය සියලු පහසුකම් ලබා දෙන්න කටයුතු කරමින් තිබෙනවා.

මගේ අමාත්‍යාංශය විවිධ රාජ්‍යයන් සමඟ පවත්වනු ලැබූ ද්විපාර්ශ්වික සාකච්ඡා මඟින් ගුවන් ගමන් වාර සංඛ්‍යාව වැඩි කර ගැනීමට මේ වසර තුළදී අවස්ථාව ලැබුණා.

ඒවා රටවල් වශයෙන් සඳහන් කළොත්, එංගලන්තයට පසු ගිය වසරේ සතියකට තිබූ ගුවන් ගමන් වාර ගණන 14ක් වුණත් එය මේ වසරේ සතියකට ගමන් වාර 21 දක්වා වැඩි කර ගත්තා. රුසියාව සමඟ ගුවන් ගමන් ආරම්භ කළ අතර, දිගු කාලයකට පසු රුසියන් ගුවන්යානා දැන් ශ්‍රී ලංකාවට සතියකට ගමන් වාර දෙකක් පවත්වනවා. යුක්රේනය සමඟ ද අලුත් ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹී ඇති අතර, සතියකට ගුවන් ගමන් වාර හතක් ඇති කර ගෙන තිබෙනවා. පිලිපීනය සමඟ ද නව ගුවන් සබඳතා ඇති කර ගෙන ඇති අතර "මිහින් ලංකා" ගුවන් සේවය පිලිපීනය වෙත ලබන වසරේදී යාමට අපේක්ෂා කරනවා.

[ගරු පියංකර ජයරත්න මහතා]

සෞදි අරාබියට මෙතෙක් සතියකට ගමන් වාර සංඛ්‍යාව හතරකට සීමා වී තිබුණා. මේ වසරේ එය සතියකට ගමන් වාර 14ක් දක්වා වැඩි කර ගෙන තිබෙනවා. ඉන්දියාවේ දිල්ලි නගරය සඳහා මෙතෙක් ක්‍රියාත්මක වූ සතියකට ගමන් වාර හත මේ වසරේ 14 දක්වාත්, චෙන්නායි සඳහා සතියකට 15ක් වූ ගමන් වාර සංඛ්‍යාව මේ වසරේදී සතියකට ගමන් වාර 42ක් දක්වාත් වැඩි කර තිබෙනවා. චෙන්නායි සහ කොයිම්බැතූර් සඳහා සතියකට ගමන් වාර හත බැගින් මේ වසරේ අපට අලුතෙන් ලැබිලා තිබෙනවා. සංඛ්‍යාත්මකව මෙම ගුවන් ගමන් වාර වැඩි වීම වාගේම අප ගුවන් සේවාවන් සතු වූ ගුවන් යානා ප්‍රමාණය ද වැඩි වීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ කරා ළඟා වීමට හැකි වෙලා තිබෙනවා. තවදුරටත් ඉදිරි වසරේ ගුවන් යානා ප්‍රමාණය වැඩි කර ගැනීම තුළින් වැඩි වාසි ලබා ගැනීමට අපේක්ෂා කරනවා. ගුවන් තොටුපළ මෙහෙය වන ලද ගුවන් යානා සංතරණයන් සංඛ්‍යාව පසු ගිය වසරේ 24,584ක් වූ අතර, එය මෙම වසරේ 32,026 දක්වා වැඩි වෙලා තිබෙනවා.

තවද, ගුවන් භාණ්ඩ මෙහෙයුම්වල සුළු වර්ධනයක් ද මෙම වසරේ පළමු කාර්තු තුන තුළදී පෙන්නුම් කරනවා. පසු ගිය වසරේ මෙහෙයවූ ගුවන් භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 124,407ක් වන අතර, එය මෙම වසරේ 125,003ක් දක්වා සියයට 4ක සුළු වර්ධනයක් පෙන්නුම් කරනවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගම, මේ වසර තුළ විශාල ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා. බොහෝ දෙනෙකු ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට විවේචන එල්ල කළත් එම ආයතනය පිළිබඳව, විගණනය විසින් සහතික කළ වාර්ෂික ගිණුම් වාර්තාව අනුව ප්‍රගතිය ඉදිරිපත් කරන්න මම කැමැතියි. [බාධා කිරීමක්] එහෙම නම් මන්ත්‍රීතුමා පසුව අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකේ කියලා තිබෙනවා ඉදිරි දැක්මක් නැතුව යන ආයතනයක්ය කියලා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
නැහැ, නැහැ. එහෙම එකක් නැහැ. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන් මඟී ආදායම ගතහොත් 2010 වසරේ රුපියල් මිලියන 48,360ක් වූ අතර, 2011 වසරේදී එය රුපියල් මිලියන 60,518 තෙක් වැඩි වී තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන් බඩු මෙහෙයුම් ආදායම ගතහොත් 2010 වසරේ රුපියල් මිලියන 7,145ක් වූ අතර, 2011 වසරේදී එය රුපියල් මිලියන 9,810 තෙක් වැඩි වී තිබෙනවා.

රවි කරුණානායක ගරු මන්ත්‍රීතුමනි, මේක අහගන්න. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ශුද්ධ අලාභය 2010 වසරේ රුපියල් මිලියන 2,698ක් වූ අතර, 2011 වසරේදී එය රුපියල් මිලියන 381 දක්වා අඩු කර ගෙන තිබෙනවා. ඉතින් අපි බලාපොරොත්තු වෙන්නේ ඉදිරි කාල සීමාව තුළ මේ ආයතනය ලාභ ලබන තත්ත්වයට ගෙන එන්නයි. ඒ සඳහා අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒකට තමුන්නාන්සේලාගේ සහයෝගය අපට ලබා දෙන්න. [බාධා කිරීමක්] මම කියන්නේ 2010, 2011 වර්ෂයයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දෙන සංඛ්‍යා ලේඛන වැරැදියි. මෙහිදී විශේෂයෙන්ම ශ්‍රී ලන්කන් ගුවන් සේවය ගැන කථා කළොත්, 2009 මාර්තු 31වන දින වන තෙක් එමිරේට්ස් ගුවන් සේවයේ පාලනයට යටත්ව තිබුණා. නමුත් සම්පූර්ණයෙන්ම ජාතික ගුවන් සේවයක් ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය පසුබිම අතිගරු ජනාධිපතිතුමා අපට ලබා දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ශ්‍රී ලාංකිකයන් හැටියට, සියයට සියයක් ශ්‍රී ලංකාවේ අනන්‍යතාව තිබෙන, ශ්‍රී ලංකා කොඩිය ගහගෙන යන්න පුළුවන් ගුවන් සේවයක් අපට ලබා දීම පිළිබඳව මා නැවතත් අතිගරු ජනාධිපතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා. නැවත රජයට පවරා ගත් අවස්ථාවේ අපට තිබුණේ ගුවන් යානා 12ක් පමණයි. 2011 වසර මුල වන විට ගුවන් යානා ඇණියට තවත් ගුවන් යානා හතරක් එකතු වීමෙන් ගුවන් යානා 16 දක්වා වැඩි කර ගත්තා. ඊ ළඟ වසර මැද වන කොට අපි බලාපොරොත්තු වෙනවා අපේ ශ්‍රී ලන්කන් ගුවන් යානා ඇණිය 20 දක්වා වැඩි කරන්න.

අපි දැනට අලුත් ගමනාන්ත රාශියක් පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙන්නේ නවීන පන්නයේ ගුවන් යානා ගෙන එන්නයි. අපි දන්නවා, A340 ගුවන් යානා තිබෙන බව. ඒවා ගොඩාක් පරණයි. සමහර විට අවුරුදු 17ක්, 18ක් විතර වෙනවා. අපි ඒවා භාර දෙන්න ඕනෑ. වියදම වැඩියි. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, A340 ගුවන් යානා ටික ආපසු දීලා අලුතෙන් A330 ගුවන් යානා මිලදී ගෙන ඒවා අලුත් ගමනාන්ත කරා යන්න. ඒ නිසා අපේ Corporate Plan එක අනුව අපේ වැඩ පිළිවෙළ සකස් කරනවා. ඒ සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සහාය දෙනවා. [බාධා කිරීමක්]

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
A340 ගුවන් යානාවල වියදම් වැඩියි. [බාධා කිරීමක්] මම කියන්නම්. අපි අලුතින් හඳුනා ගත් ඒවා තිබෙනවා. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසාන වේගෙන යනවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ශ්‍රීලන්කන් ගුවන්යානා ඇණිය 2012 වර්ෂය තුළදී 25 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටවල් රාශියක් අපෙන් ගුවන් සේවාව ඉල්ලා තිබෙනවා. දැන් ලන්ඩන්වලට යන එක මදි වෙලා තිබෙනවා. ඒ සඳහා අපට තවත් යානා දමන්නට වෙලා තිබෙනවා.

ශ්‍රීලන්කන් ගුවන් සේවය සියයට 100ක්ම ජාතික ගුවන් සේවාවක් වශයෙන් මෙවැනි ප්‍රාග්ධනීකරණයක් සිදු කිරීම අවශ්‍යයි. මේවා ආරක්ෂා කර ගෙන දියුණු කිරීමට දායක වීමද ඔබ, අප සැමගේ යුතුකමක්. අතපසු වූ ගුවන් යානා මිලට ගැනීම හා සේවයේ නවීකරණ කටයුතු සිදු කිරීමට මෙහිදී කටයුතු කරනවා. ඒවාට අදාළ සැලසුම් සකස් කර අදාළ මූලික කටයුතු මේ වන විටත් අපි කර ගෙන යනවා.

මිහින් ලංකා පෞද්ගලික සමාගමේ ගුවන් මඟී ආදායම ගතහොත් 2009-2010 වසරේ රුපියල් මිලියන 1,607ක් වූ අතර 2010-2011 වසරේදී එය රුපියල් මිලියන 2,981 තෙක් වැඩි වී තිබෙනවා. මිහින් ලංකා පෞද්ගලික සමාගමේ ගුවන් බඩු මෙහෙයුම් ආදායම 2009-2010 වසරේ රුපියල් මිලියන 52ක් වූ අතර 2010-2011 වසරේදී එය රුපියල් මිලියන 72 තෙක් වැඩි වී තිබෙනවා. මිහින් ලංකා පෞද්ගලික සමාගමේ ශුද්ධ අලාභය

2009-2010 වසරේ රුපියල් මිලියන 1,221ක් වූ අතර එය 2010-2011 වසරේදී රුපියල් මිලියන 938 දක්වා අඩු කර ගන්න හැකියාව ලැබී තිබෙනවා. මෙහිදී මේ තත්ත්වය ළඟා කර ගැනීමට ඉවහල් වී ඇත්තේ අඩු වැය සංකල්පයත්, ගමනාන්ත ජාලය වර්ධනය කර ගැනීමත් යන කාරණාය.

තවදුරටත් ගමනාන්ත ජාලය වැඩි කර ගැනීම මඟින් ආදායම වර්ධනය කර ගැනීමටත්, වැය පාලනය මඟින් ආයතනය ලාභදායී තත්ත්වයකට ගෙන ඒමටත් බලාපොරොත්තු වනවා. නව ගුවන් යානයක් 2012 වසරේදී එක් කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් සාජා, කැලිකට්, චෙන්නායි, පිලිපීනය, බැංකොක් සහ ඩෝහා සඳහා නව ගමනාන්තයන් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරනවා.

ගුවන් කේන්ද්‍රස්ථානයක් කරා යන ගමනේදී අපේ ඉතිහාසයේ ප්‍රථම වරට ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් දෙකක් 2012 වර්ෂයේදී අප සතු වීම සතුටට කරුණක්. මත්තල ඉදි වන ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ඉදි කිරීම් කටයුතු අවසන් කර 2012 අවසන් භාගයේදී විවෘත කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් භාණ්ඩ සහ මඟී මෙහෙයුම් කටයුතු දැනට වඩා වැඩි කර ගැනීමට අපේක්ෂා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු ඇමතිතුමා. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 50 ඉක්මවා තිබෙනවා.

දකුණු ආසියාවේ බොහෝ ගුවන් සේවාවන්ට කාර්මික පහසුකම් සැපයිය හැකි මධ්‍යස්ථානයක් වශයෙන්ද, වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන්ද මත්තල ගුවන් තොටුපොළ වැඩිදියුණු කිරීමට හැකි වන බව මාගේ විශ්වාසයයි.

අභ්‍යන්තර ගුවන් ගමන් සේවය සලකා බලන විට ජලතර ගුවන් සේවය සඳහාද හොඳ ඉල්ලුමක් පවතිනවා. මේ අනුව 2010.12.18 වන ආරම්භක දින සිට මේ දක්වා මඟින් 8,000ක් ඉක්මවා අපි රැගෙන ගොස් තිබෙනවා.

සිවිල් ගුවන් සේවාවේ වර්ධනයත් සමඟ පුහුණු කිරීමද නිරන්තර අවශ්‍යතාවක් වනවා. ශ්‍රී ලන්කන් ගුවන් සේවය මඟින් Airbus A320 පූර්ණ ගුවන් යානා පියාසර ආකෘතික පියසක් - simulator - ඉදි කර අතිගරු ජනාධිපතිතුමා අතින් 2011 දී විවෘත කළා. ඒ තුළින් ආසියාවේ සහ අපේ කලාපය තුළ ගුණාත්මක ගුවන් යානා නියමුවන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරලා තිබෙනවා. [බාධා කිරීමක්] කටුනායක තිබෙන්නේ. එන්න, බලන්න. මට වෙලාව නැහැ. ඔබතුමා එක්ක ගෙන යනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ වෙලාව නම් හරි.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
අමාත්‍යාංශය යටතේ පවතින නාවික හා ගුවන් සේවා තොරතුරු සහ පර්යේෂණ ආයතනය විසින් ගුවන් සේවා ක්ෂේත්‍රයේ වර්ධනයට අදාළ විවිධ පර්යේෂණ සිදු කරමින් පවතිනවා. එහි ප්‍රතිඵල අපේ ගුවන් සේවා ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා යොදවා ගැනෙනවා. එමෙන්ම තවදුරටත් රාජ්‍ය අංශයේ වෙනත් ආයතනවල පර්යේෂණ සඳහා ද දායකත්වය ලබා දෙමින් පවතිනවා.

ජාත්‍යන්තර වශයෙන් ලෝක ගුවන් සේවයේ පවතින උච්චාවචනයන් මැද අපගේ ගුවන් සේවයද අභියෝග රාශියකට මුහුණ දෙමින් ගුවන් කේන්ද්‍රස්ථානයක් කරා පිය නඟනවා. මෙම ගමනේදී තවදුරටත් සිවිල් ගුවන් සේවාවේ දියුණුව සඳහා අප වෙත ලැබෙන සංවර්ධනාත්මක විවේචනයන් රැකුලක් කර ගන්න අප බලාපොරොත්තු වනවා.

තවද ගුවන් කේන්ද්‍රස්ථානයක් කරා යන ගමනේදී අමාත්‍යාංශය හා ආයතන වෙත ලැබෙන්නා වූ සංවර්ධනාත්මක සැලසුම් සහ යෝජනා පිළිබඳ අගය කරන අතර ඒ සඳහා සහාය වීමට ඔබ සියලු දෙනාටම අවස්ථාව සලසා දීමටද කැමැත්ත ප්‍රකාශ කරනවා.

මෙවැනි අභියෝගවලට මුහුණ දෙමින් මෙතෙක් සාර්ථක තත්ත්වයන් කරා ආයතන මෙහෙයවමින් කටයුතු කිරීම පිළිබඳව පළමුව අමාත්‍යාංශ ලේකම් හා අතිරේක ලේකම් දෙපළ ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයටත්, සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ සහ මිහින් ලංකා ගුවන් සමාගමේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයටත්, නාවික හා ගුවන් සේවා තොරතුරු හා පර්යේෂණ ආයතනයේ සභාපති ඇතුළු කාර්ය මණ්ඩලයටත් සහ ශ්‍රී ලන්කන් කේටරින් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයටත් මා ස්තුතිවන්ත වන අතර මේ සඳහා නිසි නායකත්වයක් ලබා දෙන, ඒ වාගේම මේ රටේ ගුවන් සේවය ආසියාවේ හොඳම ගුවන් සේවය බවට පත් කරන්න අපට ශක්තිය දෙන අතිගරු ජනාධිපතිතුමාටත් මගේ ස්තුතිය පුද කරමින් ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

[අ. භා. 4.11]

**ගරු නවීන් දිසානායක මහතා (රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Public Management Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවකාශය ලැබීම ගැන මා සන්තෝෂ වනවා. විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වන මගේ අමාත්‍යාංශය සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශ දෙක ඉතාම කිට්ටුවෙන් කටයුතු කරන බව මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම මෙම අමාත්‍යාංශය ගරු ජනාධිපතිතුමා ගිය වසරේ පිහිටුවන ලද්දේ, රාජ්‍ය සේවකයන් තුළ යම් කිසි වෙනසක් ඇති කිරීම සඳහායි. ඉතින් මේ උදාර අරමුණ කරා යෑමට විශේෂයෙන්ම ආකල්පමය වෙනසක් අපි රාජ්‍ය සේවකයන් අතර ඇති කිරීම අවශ්‍යයි. අපි මේ ආකල්පමය වෙනස ඇති කරන්නේ කොහොමද? අද නොයෙක් වාර්තා මඟින් මැනවින්ම ඔප්පු වෙලා තිබෙනවා, රාජ්‍ය සේවයේ ඵලදායිතාව හොඳටම මදි කියලා. විශේෂයෙන්ම එම සමීක්ෂණවලින් හෙළිවෙලා තිබෙනවා, රාජ්‍ය සේවයේ දවසකට වැඩ කරන ප්‍රමාණය පැය හතරකට පහකට සීමා වනවා කියලා. නමුත් සමහර වෙලාවට පෞද්ගලික අංශයේ සේවකයන් පැය අටකට සීමා නොවී පැය දහයක්, එකොළහක්,

[ගරු නවීන් දිසානායක මහතා]

වැඩ කරනවා. ඉතින් මේ වෙනස අපි ඇති කරන්නේ කොහොමද? ඇයි අපි මේ වෙනස ඇති කළ යුත්තේ? විශේෂයෙන්ම මහින්ද චින්තන වැඩසටහන අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ආර්ථික ඉලක්කවලට යෑමට පැහැදිලිව අපට ඉතාම දක්ෂ රාජ්‍ය සේවයක් අවශ්‍යයි. එම නිසා මේ අමාත්‍යාංශය හරහා කළ යුතු විශාල වැඩ පාරාසයක් අපට තිබෙනවා. මට කියන්න සතුටුයි, අතිගරු ජනාධිපතිතුමා මාගේ නුවරඑළිය ආසනයට රාජ්‍ය සේවකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ලබන වසරේ ලබා දීමට දැනටමත් කටයුතු කර තිබෙන බව. ඒ සඳහා ඉඩමක් තෝරා ගෙන, ඒ ඉඩම මැනලා, එහි වැඩ පටන් ගන්න ලබන වසරේ පුළුවන්.

සේවකයන් තුළ ආකල්පමය වෙනසක් ඇති කරන අතරම, අපේ රාජ්‍ය ආයතනවලත් යම් කිසි ව්‍යුහමය වෙනසක් ඇති කරන්න අවශ්‍යයි. We must make some structural changes especially in the public sector institutions. So, are we going to make these changes that are necessary? I think it is a political decision, because if you look at the Ceylon Petroleum Corporation and the Ceylon Electricity Board, you would see that these are institutions driven by public sector money. These institutions are there to serve the public. They are not profit-making institutions. So, at least they should be well managed. අපි ඒ විශාල වෙනස්කම් කරන්න යනවාද, නැද්ද කියන එක ගැන පැහැදිලිවම සේවකයන් සමඟ සාකච්ඡා කරලා, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා කටයුතු කරන්න අවශ්‍යයි. එහෙම නොකර කටයුතු කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. මා දැක තිබෙන ආකාරයට එක්සත් ජාතික පක්ෂය හා මේ රජය අතර තිබෙන වෙනස ඒකයි. එක්සත් ජාතික පක්ෂය බොහෝ අවස්ථාවල මේ වෙනස්කම් කළේ හිතුවක්කාර විධියට; තමන්ගේ තනි කැමැත්තට. නමුත් මේ රජය ඊට වඩා පුළුල් ලෙස බලලා, මේ වෙනස්කම් කරන්න බලාපොරොත්තු වනවා.

මාගේ අමාත්‍යාංශය හරහා ආයතන හා අමාත්‍යාංශ 21ක කාර්ය සාධනය පිළිබඳ විමර්ශනයක් කරනවා. We are undertaking a functional review of 21 ministries and public institutions. අපි එම වැඩ කොටස දැන් පටන් ගෙන තිබෙනවා. මාස හයක් ඇතුළත මෙම ආයතන හා අමාත්‍යාංශවල වැඩ කොටස හරියට කෙරෙනවාද නැද්ද, අඩු පාඩු මොනවාද, ඒ අඩු පාඩුකම් සපුරන්නේ කොහොමද කියන ප්‍රශ්නවලට අඩු ගණනේ න්‍යායාත්මක විසඳුම් ලබා දෙන්න අපට පුළුවන්. අපි එම වාර්තාවල තිබෙන යෝජනා ක්‍රියාත්මක කරන්නේ විශේෂයෙන්ම එම ආයතනවල සිටින සේවකයන් හා වෘත්තීය සමිති සමඟ පුළුල් සාකච්ඡාවක් කරලායි. ඒ නිසා මම හිතනවා මේ කටයුත්ත අපට කරන්න පුළුවන් කියලා.

විශේෂයෙන්ම අද දින මා කියන්නට සතුටුයි, තරුණ පිරිස අතරින් රාජ්‍ය සේවයට අලුතින් බැඳෙන අය ඉතාම හොඳ අකල්පමය මට්ටමක සිටින බව. එම නිසා මා හිතනවා, ශුභවාදීව හිතලා, අපේ රාජ්‍ය සේවකයන් සමඟ ඒක රාශි වෙලා මේ රට හොඳ දිශාවකට ගෙන යන්න අපට අවකාශයක් තිබෙනවාය කියලා. Mr. Presiding Member, I think we have a very good Public Service. There maybe shortcomings but most of the Public servants in this country want to contribute positively towards the well-being of the country and the economic targets of the Government. Therefore, it is very important that we motivate the Public servants, conduct good training programmes for them and keep them in line with international trends and events that are now occurring in the world.

විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන් පුහුණු කිරීමට විශාල වැඩ කොටසක් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ සඳහා අපට රජයෙන් මුදල් ප්‍රමාණයක් ලැබී තිබෙනවා. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවෙන්, ලෝක බැංකුවෙන් හා රාජ්‍ය නොවන ආයතනවලිනුත් ඒ සඳහා අපට විශාල ආධාර ප්‍රමාණයක් ලැබෙනවා. I believe the Asian Development Bank, the World Bank and other non-governmental institutions will make a very positive contribution towards reforms in the public sector.

මා කියන්න කැමැතියි, 06/2006 චක්‍රලේඛය සංශෝධනය කිරීමට අවශ්‍ය සියලුම කටයුතු අපි දැනටමත් කරලා තිබෙන බව. මෙම චක්‍රලේඛයට අවශ්‍ය සංශෝධන ගෙන ඒම, රාජ්‍ය සේවයේ උසස් වීම් හා පඩි වැඩි කිරීම් සඳහා අපට විශාල ශක්තියක් වනවා. පඩි වැඩි කිරීම්වලට අවශ්‍ය සියලුම සංශෝධන දැනටමත් ලැබිලා තිබෙන්නේ. උසස් වීම් සම්බන්ධයෙන් එම චක්‍රලේඛය සංශෝධනය කරන්න දැනට කටයුතු කර ගෙන යනවා. රජයට බඳවා ගන්නා සියලුම රාජ්‍ය සේවකයන්ට පෙර පුහුණුවක් ලබා දෙන්න ගරු ජනාධිපතිතුමා ලබන වසර වෙනුවෙන් අපගේ අමාත්‍යාංශයට රුපියල් මිලියන 40ක මුදලක් ලබා දීලා තිබෙනවා. His Excellency the President has given our Ministry a sum of Rs. 40 million for pre-training programmes of public sector employees who have been selected for the Public Service. I think that is a very good initiative. මේ කාර්යය අවුරුදු 30කට, 40කට ඉස්සෙල්ලා කරන්න තිබුණු දෙයක්. ලබන වසරේ ඉඳලා අපි ඒ කාර්යය පටන් ගන්නවා.

ඒ විතරක් නොවෙයි. රාජ්‍ය සේවකයන්ගේ ආකල්පමය වර්ධනය හා ව්‍යුහමය වෙනස්කම් සම්බන්ධයෙන් දැනටමත් ජනාධිපතිතුමා හා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. ඒ අදාළ ඇමතිවරුන්ගේ උපදෙස්, අනුශාසනා ලබා ගෙන, මෙම ව්‍යුහමය වෙනස්කම් විය යුත්තේ කෙසේද කියා එම අමාත්‍යාංශ තුළින්ම අදහස් ලබා ගන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම මෙම ආයතනවල තිබෙන දුර්වලකම් හඳුනා ගන්න විශේෂඥයන් පත් කරලා විශාල කාර්යභාරයක් කිරීමට අපි බලාපොරොත්තු වනවා.

ඒ නිසා විශේෂයෙන්ම ලබන වසර දෙක, තුන තුළ අපගේ රාජ්‍ය සේවකයන් විශාල ආකල්පමය වෙනසකට යොමු කරවන්න පුළුවන් වෙයි කියලා මා බලාපොරොත්තු වනවා. මක් නිසාද, අද ලෝකය ගොඩක් වෙනස් වෙලා තිබෙනවා. අද අපි තාක්ෂණය පාවිච්චි කරනවා. විශේෂයෙන්ම අපේ රාජ්‍ය සේවකයන් තාක්ෂණයත් සමඟ අත් වැල් බැඳ ගෙන ඉදිරියට යන්න අවශ්‍යයි. අද රාජ්‍ය සේවකයන් කොළවලට සීමා වෙලා නැහැ. අවශ්‍ය පරිදි ඉතාම ක්‍රමවත් විධියට සන්නිවේදන කටයුතු කරන්න පුළුවන්; e-mails පාවිච්චි කරන්න පුළුවන්, internet පාවිච්චි කරන්න පුළුවන්, තොරතුරු සොයා ගන්න.

අපේ රාජ්‍ය සේවකයන්ට ඒ ක්‍රමවේදය, ඒ දක්ෂකම, ඒ සුදුසුකම තිබෙනවා. ඒ තිබෙන දක්ෂකම් තවත් ඔපමට්ටම් කරලා ඉදිරියට ගන්න අවශ්‍යයි. මීට අවුරුදු 30කට, 40කට පෙර මේ රටේ Ceylon Civil Service කියලා ඉතාම වැදගත් රාජ්‍ය අංශයක් අපට තිබුණා. අපි එතැනට යන්න ඕනෑ. සිංගප්පූරුව, මැලේසියාව හා අපේ කලාපයේ තිබෙන රටවල් දිහා අපි බැලුවොත් -ඉන්දියාව වුණත්- ඒ විධියට කටයුතු කරනවා. If we can achieve this objective of training our Public servants, re-focusing and re-orienting them towards specific targets towards uplifting their productivity, then I think a lot of money can be saved and secondly, our economic targets can also be achieved.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කාර්යය කිරීමට මට විශාල ශක්තියක් වෙලා තිබෙනවා, මාගේ අමාත්‍යාංශයේ

ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය. ඔවුන්ට මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම අපගේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තිබෙන චෝදනා, ඒ වාගේම අපගේ අඩු පාඩු ඉතාමත්ම සංවේදීශීලීව අපට ලබා දෙන්න. Please make constructive criticism of my Ministry. I welcome those criticisms because it is only through criticism and dialogue that we can move forward.

Sir, I would like to thank my Secretary and the staff of my Ministry who have helped me immensely to undertake this task. I would also like to place on record the contribution made by the former Minister and Prime Minister, the Hon. Ratnasiri Wickramanayaka, towards setting up this Ministry and getting it on track.

I thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොච්චර වෙලාවක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මිනිත්තු 25ක්.

[අ. භා. 4.21]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් වැදගත් මාතෘකාවක් යටතේ අද මේ විවාදයට සම්බන්ධ වීමට හැකි වීම ගැන මම සතුටු වෙනවා. මම මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි මා හිතවත්, මා ගරු කරන අපේ ගරු අමාත්‍ය නවීන් දිසානායක මැතිතුමාගේ කථාවේ අවසානයෙන්. එතුමා ආරාධනා කළා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ධනාත්මක විවේචන එතුමා භාර ගන්න සූදානම්, ඒ අනුව එතුමාගේ වැඩ කටයුතු සකස් කර ගන්නට, ඉදිරියට ගෙන යන්නට සූදානම්, ඒවා ලබා දෙන්නය කියලා. ඇත්ත වශයෙන්ම මම ඒක අගය කරනවා. අද මේ ආණ්ඩුවේ සමහර ඇමතිවරුන්ට මෙන්න මේ දර්ශනය නොමැති වීම ගැන මම කනගාටු වෙනවා. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට රජය විවේචනය කරන කොට, ඒ ඒ අමාත්‍යාංශ විවේචනය කරන කොට මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමනි, සභා ගර්භයේ ආණ්ඩු පක්ෂයේ ඉඳලා විපක්ෂයට ඇවිල්ලා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගහන එක නොවෙයි සිදු කළ යුත්තේ; විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මරණ තර්ජන එල්ල කරන එක නොවෙයි සිදු කළ යුත්තේ. පාර්ලිමේන්තු ඉතිහාසයේත් ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත්, මන්ත්‍රීවරු අතර විවිධ මතභේද, මතවාද, තර්ක විතර්ක අනන්ත අප්‍රමාණ සිදු වෙලා තිබෙනවා. උණුසුම් විවාද ඇති වෙලා තිබෙනවා. උණුසුම් විවාද ඇති වීම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ එක කොටසක්. නමුත් දිගින් දිගටම මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහමුලින්ම උල්ලංඝනය කරමින් ආණ්ඩු පක්ෂයේ සිට විපක්ෂයට ඇවිල්ලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගහනවා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තර්ජනය කරනවා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට බාධා කරනවා නම් ගරු නවීන් දිසානායක ඇමතිතුමා කියපු ඒ දේශපාලන සදාචාරය, පාර්ලිමේන්තු සදාචාරය ක්‍රියාත්මක කිරීම කළ හැකිද? අද මේ ආණ්ඩු පක්ෂයේ සමහර මැති ඇමතිවරු **මැරවරයෝ** ලෙස, පාතාල ලෝකයේ ගණන්කාරයෝ ලෙස හැසිරිලා ඒ තත්ත්වයට පත්වීම ගැන නවීන් දිසානායක ඇමතිතුමා, එතුමාගේ හෘදය සාක්ෂියට අනුව එකඟ වෙන්නේ නැහැයි කියන එක මම පැහැදිලිව කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු කථානායකතුමා මූලාසනයේ සිටියදී, ඒ වාගේම ගරු අගමැතිතුමා මේ සභා ගර්භයේ ඉන්න අවස්ථාවේදී මා මේ යෝජනාව කරන්න බලාපොරොත්තු වෙලායි ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු කථානායකතුමාට යෝජනාවක් ගෙනෙනවා. මෙය ගරු අගමැතිතුමාගේ දැඩි අවධානයටත් මම යොමු කරනවා. "කරුණාකර, මීට පස්සේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආත්මාරක්ෂාව සඳහා helmet පැළඳ ගෙන පාර්ලිමේන්තුවට එන්නට අවසර දෙන්නය" කියලා මා යෝජනාවක් කරනවා. [බාධා කිරීම්] අපට මේ කරන තර්ජන, ගර්ජන, පහරදීම්වලින් බේරෙන්න helmet එකක් පැළඳ ගෙන පාර්ලිමේන්තුවට එන්න අවසර දෙන්න.

ගරු අගමැතිතුමනි, helmet එකක් පැළඳ ගෙන පාර්ලිමේන්තුවට එන්නට අපට අවසරය, අනුමැතිය දෙන්න කියලා ගරු කථානායකතුමාගෙන් මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයේ තර්ජන ගර්ජනවලට තමයි- [බාධා කිරීම්] දැන් මේ කථා කරන වේලාවෙත් මගේ කථාවට බාධා කරනවා නම්, මට හිතා ගන්න බැහැ. ගරු අගමැතිතුමනි, සමාවෙලා තමුන්නාන්සේ මේ සභා ගර්භයේ රැඳී සිටින්න. එසේ නැත්නම් ඔය ඇමතිවරු මේ පැත්තට ඇවිල්ලා මටත් ගහලා යන්න පුළුවන්. අද එවැනි තත්ත්වයක් තිබෙනවා. තමුන්නාන්සේ ඊයේ පාර්ලිමේන්තුවේ හිටියා. තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න වෙලාවේ, තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවේ කථා කරන වෙලාවේ තමයි ගරු අගමැතිතුමනි, ඔය පැත්තේ ඉඳලා ඇමතිවරු ඇවිල්ලා රංගෙ බණ්ඩාරට මන්ත්‍රීතුමාට ගැහුවේ. ගරු අගමැතිතුමනි, මම දන්නවා, තමුන්නාන්සේ මේවා නිහඬව බලා ගෙන ඉන්නවා කියලා. තමුන්නාන්සේ මේවා අනුමත කරන්නේ නැහැ. නමුත් අගමැතිතුමනි, තමුන්නාන්සේට රටේ ජනතාව අතර පිළිගැනීමක් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අතර පිළිගැනීමක්, ගෞරවයක් තිබෙනවා. හිටපු අගමැති ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමාටත් එහෙමයි. තමුන්නාන්සේලා කවදාවත් මේවා අනුමත කරන්නේ නැති බව මම මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ නිසා ගරු අගමැතිතුමනි, සමාවෙලා, කරුණාකරලා ගරු කථානායකතුමාට තමුන්නාන්සේගෙත් අනුමැතිය දෙන්න මීට පස්සේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ජීවිත ආරක්ෂාව සඳහා සභා ගර්භයට එන කොට helmet පැළඳ ගෙන එන්න.

අඩු තරමින් අපේ ඔළුවවත් බේරා ගන්න, මොළයවත් බේරා ගන්න අපට අවස්ථාව සලසා දෙන ලෙස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, there is a point of Order being raised by the Hon. Shantha Bandara. මොකක්ද point of Order එක. - [*Interruption.*] Allow him to raise the point of Order.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ඉතාම වැදගත් යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. මොකද, ඊයේ සිරිකොතේ ඇති වුණ සිද්ධියත් එක්ක ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න ඕනෑ. විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිරිකොතට යන්න ආරක්ෂාව දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඊයේ රජයේ දේපොළ විනාශ කළා. ඒ නිසා මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

That is not a point of Order. Hon. (Dr.) Jayalath Jayawardana, you can continue with your speech.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයට මේ ගරු සභාව විහිළුවට - "point of Order" කියලා විහිළුවට - ලක් කරන්නට, රඟ මඩලක් බවට පත් කරන්නට ඉඩ දෙන්න එපා කියලා ගරු අගමැතිතුමා මේ ගරු සභාවේ ඉන්න අවස්ථාවේ මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඉතිහාසයේ වැරදි ගැන කථා කරනවා නම්, ඉතිහාසයේ වැරදි ගැන අපි වෙනම කථා කරමු. ඉතිහාසයේ කවුරු හරි වැරදි කළාය කියලා යම් පක්ෂයක් වැරදි කළාය කියලා ඒ වැරදි ඊට වඩා හොඳින් නැවත වරක් කරන්නද ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ මේ ඇමතිවරුන්ට නිදහස දීලා තිබෙන්නේ කියලා මම තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සාකච්ඡා කරන්නේ අමාත්‍යාංශ 21ක් පිළිබඳව සොයා බලන්න -අමාත්‍යාංශ 21ක වැඩ කටයුතු පිළිබඳව සොයා බලන්න- පත් කළ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ගැනයි. ඒක ඉතාමත්ම හොඳ දෙයක්, ගරු අගමැතිතුමනි. අපි හොඳ දේට හොඳයි කියලා කියනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් කරන්න ඇමතිවරු, විපක්ෂයේ මන්ත්‍රීවරු, අමාත්‍යාංශ ලේකම්වරු, අමාත්‍යාංශවල උසස් නිලධාරින් ගෙන්වලා ඒ සියලු දෙනාම විපරමට ලක් කරලා, ප්‍රගතියකට ලක් කරලා, සමාලෝචනයකට ලක් කරලා ඒ අමාත්‍යාංශ 21 වැඩ කටයුතු පිළිබඳව සොයා බැලීම, සමාලෝචනය කිරීම ඉතාමත්ම ධනාත්මක ක්‍රියා මාර්ගයක් බව -රජය ගත් හොඳ ක්‍රියා මාර්ගයක් බව- විපක්ෂයේ ඉදිරි පෙළේ මන්ත්‍රීවරයකු හැටියට මම මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ සඳහා මගේ තව යෝජනාවක් තිබෙනවා. අමාත්‍යාංශ 21 පමණක් නොවෙයි ගරු අගමැතිතුමනි, සියලුම අමාත්‍යාංශ මේ ආකාරයට විපරමකට ලක් කිරීම ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු-

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

There is no time for that.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

"No time" කියන්න එපා, ගරු නවීන් දිසානායක ඇමතිතුමනි. මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න නම් -[බාධා කිරීමක්] එදා ඩොනොමෝර් ආණ්ඩු ක්‍රමය පිළිබඳව අපි කථා කළා. එදා පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභා ක්‍රියාත්මක වුණේ කොයි ආකාරයට ද කියලා ගරු අගමැතිතුමා දන්නවා, ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා දන්නවා. ඒ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවලින් ලැබුණ ප්‍රතිඵල මොනවාද? රජයට පමණක් නොවෙයි, ජනතාවට යහ පාලනය ලබා ගැනීමට හැකි වුණා. පාරදෘශ්‍යභාවයක් තිබුණා. තොරතුරු දැන ගැනීමේ අයිතිය තිබුණා. රජයේ පාලනය සඳහා විවේචනාත්මක දායකත්වයක් ලබා දෙන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අවස්ථාවක් එදා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න ඒ නිසා තමයි මම කියන්නේ මේක හොඳ ආරම්භයක්ය කියලා. මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු, ඇමතිවරු, අමාත්‍යාංශ ලේකම්වරු ඉන්නවා. අමාත්‍යාංශ නිලධාරින්ට තම අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු කථා කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු යෝජනා ගෙනෙනවා, විවේචන ගෙනෙනවා. නමුත් නිලධාරින්ට ඒවාට උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ. සමහර වෙලාවට නිලධාරින්ගෙන් අපට හරි දේ දැන ගන්න පුළුවන්කමක් නැහැ. නිලධාරින් පමණක් නොවෙයි, අමාත්‍යාංශ ලේකම්වරු ඉන්නවා. ඒ සියලු දෙනාටම පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ගේ අදහස් උදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් නැහැ. ඒ සඳහා මෙන්න හොඳ වේදිකාව. මෙන්න හොඳ ආරම්භය. මෙවැනි විශේෂ කාරක සභාවලින් නිලධාරින්ටත් කථා කරන්න අවස්ථාවක් ලැබෙනවා. ඔවුන්ගෙන් ඍජුව ප්‍රශ්න කරන්න හැකි වනවා. ඔවුන්ගේ වැරදි තිබෙනවා නම් - [බාධා කිරීමක්]සමහර වෙලාවට විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපට ලැබෙන තොරතුරු හරි තොරතුරු වන්න පුළුවන්, වැරදි තොරතුරු වන්නට පුළුවන්. මෙන්න මේ වාගේ විශේෂ කාරක සභාවක් තුළින් ඒ තොරතුරු මොනවාද, ඒවා හරිද, වැරදිද කියලා සාක්ෂි ඇතිව සොයා ගන්න හැකියාව ලැබෙනවා.

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Yes, Hon. Navin Dissanayake.

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

Sir, for that, there is a Consultative Committee for each Ministry.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා ක්‍රියාත්මක වීමේ දී බොහෝ වෙලාවට කරන්නේ කුමක්ද? ඒවාට අපිත් යනවා. අපි ගිහිල්ලා අපේ ප්‍රශ්න ගැන කථා කරනවා; අපේ අවශ්‍යතාවන් ගැන කථා කරනවා. නමුත් ඒ අමාත්‍යාංශවල සිදු වන සියලුම වැඩ කටයුතු විමර්ශනය කරන්න, සොයා බලන්න, අපිට ලැබෙන වැරදි තොරතුරු නිවැරදි කර ගන්න, හරි දේ දැන ගන්න, ඇත්ත ඇති සැටියෙන් දැන ගන්න මේක හොඳ ආරම්භයක්. ගරු අගමැතිතුමනි, ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමනි, ගරු ෆවුසි ඇමතිතුමනි, ගරු තිස්ස විතාරණ ඇමතිතුමනි, තමුන්නාන්සේලාට යෝජනාවක් මා මේ කරන්නේ. මේක ඉතාම හොඳ වැඩක්. කැබිනට් මණ්ඩලයේදී ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ ජනාධිපතිතුමාට යෝජනාවක් ගෙනෙන්න. මේ යෝජනාවට කිසිම ඇමතිවරයෙක් විරුද්ධ වන්න හේතුවක් නැහැ. විශේෂ කාරක සභාවක් තුළින් අමාත්‍යාංශය සම්පූර්ණ විමර්ශනයකට ලක් වනවා. ඒ අමාත්‍යාංශයේ ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා, ලේකම්වරු ඒ වාගේම අතිරේක ලේකම්වරු අනෙකුත් රජයේ නිලධාරින් එතකොට කාර්යක්ෂමව වැඩ කරන්න පටන් ගනිවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඵලදායිතාව - productivity - ගැන කථා කරනවා. බොහොම හොඳයි. මෙන්න ඒ ඒ අමාත්‍යාංශවල කාර්යක්ෂමතාව කියා පෙන්වන්න පුළුවන්, දකුණු ආසියාකරයටම ආදර්ශයක් දෙන්න පුළුවන් වැඩ පිළිවෙළකට තමුන්නාන්සේලා අහම්බෙන් හෝ අද අවතීර්ණ වීම ගැන ජනතාවගේ නියෝජිතයෝ හැටියට අපි එක්තරා විධියකට සතුටු වනවා. අන්න ඒකයි සිදු වන්න ඕනෑ, ගරු අගමැතිතුමනි. ඒසේ නැතුව පාර්ලිමේන්තුවේ කථා කරන බොහෝ දේවලට අපිට ඒ නිලධාරින්ගෙන් ඍජු පිළිතුරු ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඍජු පිළිතුරු ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඇමතිවරයා ඇවිල්ලා වාචික ප්‍රශ්න අහන එක ඇත්ත. සභාව කල් තැබීමේ යෝජනා ගෙනෙන එක ඇත්ත. නමුත් අපිට ලැබෙන්නේ සීමිත කාල සීමාවක් පමණයි. වාචික ප්‍රශ්නයක් ඇසීමේදී ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ දන්නවා, ඇමතිවරුන් තමුන් කැමැති නම් ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්; එසේ නැතුව ඒ ප්‍රශ්නයට උත්තර නොදී ඉන්නවා කියලා කියන්න පුළුවන්. එසේ නැතිනම් ඒ ප්‍රශ්නයට ඍජුවම උත්තරයක් නොදී ඉන්න පුළුවන්. ඒක තමයි පාර්ලිමේන්තුව තුළ සිදු වන්නේ. මේක තමයි ඇත්ත කථාව. නමුත් මෙවැනි විශේෂ කාරක සභාවකදී අපට පුළුවන්කම ලැබෙනවා, අදාළ ඇමතිවරයාගෙන් පමණක් නොවෙයි නියෝජ්‍ය ඇමතිවරයාගෙන්, අනෙකුත් නිලධාරින්ගෙන් ප්‍රශ්න අහන්න. විපක්ෂයේ සහයෝගය ලබා ගන්න, ක්‍රියාකාරී දායකත්වය ලබා ගන්න, ප්‍රධාන ප්‍රවාහයක් එහෙම නැත්නම් ප්‍රධාන මාර්ගයක් හැටියට මා මෙය දකිනවා.

අද මා කථා කරන්න බලාපොරොත්තු වෙලා හිටියේ නැහැ. අපේ විපක්ෂ නායකතුමාගෙන් ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් වෙලාව ඉල්ලා ගත්තේ රජය කරන හරි දේ තවත් හරියට කරන්න අපේ විපක්ෂයේ දායකත්වය ලබා දෙන්න. උදාහරණයක් ගත්තොත් අද මේ අමාත්‍යාංශය යහ පාලනය ගැන කථා කරනවා. යහ පාලනය ගැන කථා කරන විට ගරු අගමැතිතුමනි, ජනතාවගේ යහ පාලනය කියන්නේ මොකක්ද? ලංකාවේ ප්‍රධාන ආයතන නිර්දේශපාලනීකරණය කරන්න ජනතාවගේ ජනතා නියෝජිතයෝ හැටියට තමුන්නාන්සේලා අපි සියලු දෙනාම එකතු වෙලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ ගරු සභාවේ අනුමත කළා. ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එකඟව පක්ෂපාතිව ඡන්දය දුන්නා. දි.මු. ජයරත්න අගමැතිතුමනි, තමුන්නාන්සේත් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පූර්ණ අනුමැතිය දුන්නා. රත්නසිරි වික්‍රමනායක මැතිතුමා එදා අග්‍රාමාත්‍යතුමා හැටියට ඒ සඳහා සම්පූර්ණ අනුමැතිය ලබා දුන්නා. ෆවුසි ඇමතිතුමා එකඟත්වය පළ කළා. මෙන්න මේ ආකාරයට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇයි අපි ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් මැතිඇමතිවරු එක්කාසු වෙලා අනුමත කළේ? ජනතාවගේ යහ පාලනය සඳහා.

පොලීසිය නිර්දේශපාලනීකරණය කිරීම සඳහා අපි කටයුතු කළා. කුමන ආණ්ඩුවක් යටතේ හෝ වේවා, අතීතයේ අපි අත් දැකපු, අත් වින්ද කනගාටුදායක පළපුරුදු සහ අත් දැකීම් අපට තිබෙන නිසා පොලීසියේ නිලධාරින්ට තමුන්ගේ නිල ඇඳුම ඇඳලා ආත්ම ගෞරවයක් ඇතුව නිර්භීතව, අපක්ෂපාතීව රටේ නීතිය අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරන්න, රාජකාරිය කරන්න අවශ්‍ය නිසා ස්වාධීන පොලිස් කොමිසමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමේ අත්‍යවශ්‍යතාව තමුන්නාන්සේලාත් අපිත් දැක්කා. ඒ වාගේම මැතිවරණ දූෂණ ගැන තමුන්නාන්සේලාත් කථා කරනවා; අපිත් කථා කරනවා. අපි විපක්ෂයේ ඉන්නකොටත් කථා කරනවා. තමුන්නාන්සේලා එදා විපක්ෂයේ ඉන්නකොටත් කථා කළා. නමුත් අපි දෙගොල්ලෝම ස්වාධීන මැතිවරණ කොමිසමක අත්‍යවශ්‍යතාව දැක්කා. ජනතාවගේ පැතුම, ජනතාවගේ අපේක්ෂාව ඉටු කිරීමට අවශ්‍ය නෛතික -නීතිමය- බලතල ඉන්දියාවේ ක්‍රියාත්මක වන ආකාරයට ස්වාධීන මැතිවරණ කොමිසමක් තුළින් ක්‍රියාත්මක කළ යුතු බවට අපි තීරණය කළා. ඒ අවශ්‍යතාව අපි දැක්කා. ඒ වාගේම රාජ්‍ය සේවය ගැන මෙතුමා කථා කළා. ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක අත්‍යවශ්‍යභාවය අපි දැක්කා. රාජ්‍ය සේවකයා දේශපාලන අතකොලුවක් බවට පත් වන්නේ නැතුව -කුමන රජයක් යටතේ හෝ වේවා, දේශපාලනඥයන්ගේ අතකොලු බවට පත් නොවී- ස්වාධීනව හා අපක්ෂපාතිව තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව නීත්‍යානුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟව ක්‍රියා කිරීමේ වාතාවරණය අපි දැක්කා.

ඔවුන්ගේ කායික හා මානසික වාතාවරණය සහතික කිරීමේ අවශ්‍යතාව එදා තමුන්නාන්සේලාත් දැක්කා; අපත් දැක්කා. එම නිසායි ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පැන නැඟුනේ. ඒ වාගේම ස්වාධීන අධිකරණ සේවා කොමිසමක් ක්‍රියාත්මක කළ යුතු බවටත් තීරණය කළා. අපේ අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය තවතවත් ශක්තිමත් කරන්න, යුක්ති පසිඳලීමේදී ජාති, ආගම්, කුල මල, දේශපාලන භේදයෙන් තොරව යුක්තිය නීතිය, සදාචාරය සියයට සියයක්ම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පුරවැසියන්ට සහතික කිරීමේ ජාතික අවශ්‍යතාව අප දැක්කා. එම නිසා යි තමුන්නාන්සේලාත් අපත් එක්කාසු වෙලා ස්වාධීන අධිකරණ සේවා කොමිසමක් ස්ථාපිත වෙන දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අප මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමත කර ගත්තේ ගරු අග්‍රාමාත්‍යතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මානව හිමිකම් කොමිසමට ස්වාධීනත්වය ලබා දෙන්න අවශ්‍යයි. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට- Sri Lanka Medical Council එකට- ස්වාධීනත්වය ලබා දෙන්න අවශ්‍යයි. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට තොරතුරු ලබා ගන්නට තිබෙන අයිතිය ඇති කරන්නට ඕනෑ. අද ඉන්දියාව වැනි රටවල පවා ජනතාවට තොරතුරු ලබා ගැනීමේ අයිතිය තිබෙනවා; නෛතික අයිතියක් තිබෙනවා. ඕනෑම අමාත්‍යාංශයක තිබෙන තොරතුරු ලබා ගැනීමේ අයිතිය අපටත් තිබෙන්නට ඕනෑ. අප අද කථා කරනවා, මේ විශේෂ කාරක සභාව තුළින් සාකච්ඡා කළ අමාත්‍යාංශ විසි එක ගැන. ඒ අමාත්‍යාංශවල තොරතුරු ලබා ගැනීමේ අයිතිය ජනතාවට තිබෙන්න ඕනෑ. තමන්නාන්සේලාත් අපත් එකතු වෙලා මේ අමාත්‍යාංශවලට මුදල් වෙන් කරනවා. මේ මුදල් මහජනතාවට අයිති මුදල්; මහ ජනතාවගේ මුදල්.

මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය අනුව රටේ පරමාධිපතිත්වය තිබෙන්නේ රටේ ජනතාවටයි. ඒ පරමාධිපතිත්වයේ නියෝජිතවරු හැටියට, ජනතා නියෝජිතවරු හැටියට තමයි ඒ පැත්තේත් මේ පැත්තේත් ඉන්න මන්ත්‍රීවරු ක්‍රියා කරන්නේ; ඒ වාගේම ඒ පැත්තේ ඉන්න ඇමතිවරු ක්‍රියා කරන්නේ. එහෙම නම්, රටේ ජනතාවට අයිතියක් තිබෙනවා, ඔවුන්ට උරුමයක් තිබෙනවා, මේ මහ ජන මුදල් පරිපාලන වන හැටි, අමාත්‍යාංශවල වියදම් කරන හැටි, අමාත්‍යාංශවල ක්‍රියා කරන හැටි සොයා බලන්න. තොරතුරු දැන ගැනීමේ අයිතිය තිබෙනවා. මේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය අප රටේ ජනතාවට දිය යුතුව තිබෙනවා. අද එය යුගයේ අවශ්‍යතාව බවට පත් වී තිබෙනවා. අවාසනාවකට ගරු අගමැතිතුමනි, අපේම නරක වෙලාවට, රටේම නරක වෙලාවට, ජනතාවගේ අවාසනාවට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම නිසා, අද ස්වාධීන මැතිවරණ කොමිසමත් නැහැ; ස්වාධීන පොලිස් කොමිසමත් නැහැ; ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමත් නැහැ; ස්වාධීන අධිකරණ සේවා කොමිසමත් නැහැ. එහෙම නම් යහ පාලනය ගැන, ජනතාවගේ පරමාධිපතිත්වය සහතික කිරීම ගැන කුමන කථා ද කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්නට කැමතියි, මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

අද ජනතාව අතර විශ්වාසය බිඳෙමින් පවතිනවා. දොම්පේ පොලිසියේ වෙච්ච සිදු වීම බලන්න. විවිධ අවස්ථාවලදී විවිධ සිදු වීම්වලදී ජනතාව නීතිය අතට ගන්න තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ඇයි? කැළෑ නීතිය රජ කරන්නට අද යොමු වෙමින් පවතින්නේ ඇයි? මෙවැනි නිර්දේශපාලනීකරණ ආයතන දේශපාලනීකරණය වීම නිසා යි. අද ඒ ආයතන දේශපාලන අතකොලු බවට පත් වීම නිසා රටේ නීතිය වල් වැදිලා; රටේ නීතිය කැළෑ වැදිලා. එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජනයක්. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජනයක් කියන එක මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්නට ඕනෑ. ධනාත්මක විවේචනයක් මා මේ කරන්නේ. මේ විවේචනය තමුන්නාන්සේලාට සමහර වෙලාවට තිත්ත වුණත් මේක තමයි තිත්ත ඇත්ත. ඒ පැත්තේ හිටියත්, මේ පැත්තේ හිටියත් මේක තමයි දේශපාලන යථාර්ථය කියන එක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පැහැදිලිව කියන්නට ඕනෑ.

තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට එකඟව තමුන්නාන්සේලා කවදා හෝ දවසක තේරුම් ගනීවි, අප කර ගත් ලොකුම පාප කර්මය දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරීමට අත එසවීමය කියා. එම නිසා මේ රටට හෙණ ගැහුවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට හෙණ ගැහුවා, රටේ ජනතාවගේ පරමාධිපතිත්වයට හෙණ ගැහුවාය කියා හෘදය සාක්ෂිය අනුව තමුන්නාන්සේලාට තේරුම් ගන්නට පුළුවන් වේවි. ඒක අද වන්නට පුළුවන්; හෙට වන්නට පුළුවන්; නැත්නම් තව මාසයකින්, අවුරුද්දකින් වන්නට පුළුවන්. එදාට තමුන්නාන්සේලා හෘදය සාක්ෂියට කතා කරාවි. එදාට තමුන්නාන්සේලාට පසුතැවිලි වන්නට සිදු වෙයි කියන එක මම පැහැදිලිව කියන්නට ඕනෑ. අපේ රටේ දේශපාලන විසඳුමක් අවශ්‍ය වෙන්නේ මෙන්න මේ යහ පාලනය ක්‍රියාත්මක කරන්නයි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගරු තිස්ස විතාරණ ඇමතිතුමනි, හොඳ වැඩක්. නමුත් ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ තනිවම නිර්භීතව ඉඳගෙන දේශපාලන යථාර්ථය අනුව යමින්, හෘදය සාක්ෂියට අනුව යමින් තමුන්නාන්සේගේ තිස්ස විතාරණ කොමිසමේ වාර්තාව පිටු එක්දහස් එකසිය ගණනකින් යුක්තව ඉදිරිපත් කරන්න කටයුතු කළා.

මා දන්නවා, එදා තමුන්නාන්සේට උසුළු විසුළු කළ බව. දේශපාලන විසඳුමක් ගැන කථා කරද්දී සමහර ජාතිවාදී, අන්තවාදීකොටස් විසින් තමුන්නාන්සේවත් ජාතිද්‍රෝහියකු හැටියට, රට පාවා දෙන්නකු හැටියට හංවඩු ගැසුවා. නමුත් තමුන්නාන්සේව ආරක්ෂා කරන්න වාගේම, තමුන්නාන්සේගේ දේශපාලන ස්ථාවරය වෙනුවෙන් මා එදාත් පෙනී සිටියා කියන එක ගරු තිස්ස විතාරණ ඇමතිතුමනි, තමුන්නාන්සේ දන්නවා.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ ඉතාමත්ම හොඳ නිර්දේශ විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ එකම අපේක්ෂාව අඩු තරමින් ඒ කොමිසමේ තිබෙන වැදගත් නිර්දේශ අවංකව, නිර්භීතව මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරාවි කියන එකයි. එය ක්‍රියාත්මක කරන්න ගරු තිස්ස විතාරණ ඇමතිතුමනි, තමුන්නාන්සේට ශක්තිය, ධෛර්යය, බලය ලැබේවා කියලාත් මා ප්‍රාර්ථනා කරනවා. මොකද, තමුන්නාන්සේ ඉතාමත්ම මහන්සියෙන් හදාපු පිටු එක්දහස් ගණනක තිස්ස විතාරණ කමිටු වාර්තාව අද හමස් පෙට්ටියේ. අද එය ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේවත් නැහැ. ඒ සඳහා අවංක උත්සාහයක්වත් මේ රජය නොගත් බව ගරු තිස්ස විතාරණ ඇමතිතුමනි, තමුන්නාසේගේ හෘදය සාක්ෂියට එකඟව දන්නවා. මම මෙහෙම කියන්නේ ඉදිරි අනාගතයේදීවත් නැවත වරක් ඒ කුරිරු ත්‍රස්තවාදය ශ්‍රී ලංකාවේ ඇති නොවේවා කියන ප්‍රාර්ථනය ඇතිවයි. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා මේ රටේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් හැම ජන කොටසකටම එක හා සමාන අයිතිවාසිකම්, උරුමයන් සහ අවස්ථාවන් ලැබෙන දේශපාලන විසඳුමකට, එක රටක් තුළ එවැනි දේශපාලන විසඳුමකට එදාත් එක්සත් ජාතික පක්ෂය පෙනී සිටියා; අදත් එක්සත් ජාතික පක්ෂය පෙනී සිටිනවා. ගරු අගමැතිතුමනි, සිංහල මන්ත්‍රීවරයෙක් හැටියට වන්නියේ අහිංසක දෙමළ ජනතාවට සිංහලයාගේ දයාව, කරුණාව, මුදිතාව රැගෙන යන්නට "කොටියා" කිව්වත්, "කොටි ඔත්තුකාරයා" කිව්වත්, "දේශද්‍රෝහියා" කිව්වත්, "ජාතිද්‍රෝහියා" කිව්වත්, මොකාය කියලා කිව්වත් එදාත් මම ගියා; අදත් මම පෙනී සිටිනවා; හෙටත් මම පෙනී සිටිනවා කියන එක ඉතා පැහැදිලිව කියන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
**(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)**
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මුස්ලිම් නායකයෙක්. තමුන්නාන්සේ දන්නවා උතුරේ මුස්ලිම් ජනතාව අවතැන් වෙලා ඉන්න හැටි; දෙමළ ජනතාව අවතැන් වෙලා ඉන්න හැටි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා එරාවූර් මුස්ලිම් පල්ලියේ යාඥා කර කර හිටපු මුස්ලිම් භක්තිකයන් අමුඅමුවේ මරා දමද්දී, මා ඒ අය වෙනුවෙන් පෙනී සිටි, එරාවූර් මුස්ලිම් ජනතාව වෙනුවෙන් පෙනී සිටි, ඒ අයගේ ආරක්ෂාව පතා ක්‍රියා කළ, උතුරේ මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්න පෙනී සිටි සිංහල මන්ත්‍රීවරයකුය කියන එක මා මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්නට ඕනෑ. අන්න ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයේදී පටු දේශපාලන වාසි ලබා ගන්න අන්තවාදීව, ජාතිවාදීව කටයුතු කරලා නැවත වරක් මේ රට ගිනි තියන්නට ඉඩ නොතැබිය යුතුයි කියන එක ඉතාමත්ම වගකීමෙන් යුතුව මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

මොන විධියට අපහාස උපහාස කළත් මා කියන්න කැමැතියි, "එල ඇති රුකටයි ගල් ගහන්නේ" කියන එක. ඒ වාගේම සඳුන් ගසට ගහන කොට සඳුන් ගසේ සුවඳ තවතවත් වැඩියෙන් විහිදෙනවා කියනවා. ඒ නිසා මට නින්දා, අපහාස උපහාස කළාට කිසිම ගැටලුවක් නැහැ. ඒක මට ප්‍රශ්නයක් නොවෙයි.

තේරීම් කාරක සභා පත් කිරීමේදී ඒවා රජයේ සියලුම අමාත්‍යාංශවලට වහාම ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිමින් අවසාන වශයෙන් නැවත වරක් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මේ සභා ගර්භයට helmet පැළැඳ ගෙන එන්න අවසරය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

[අ. භා. 4.45]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
**(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)**
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී අපේ අමාත්‍යාංශය ගැනත් වචන කිහිපයක් කථා කරන්නට මා කැමැතියි. ඔබතුමා දන්නවා ඇති රටේ සංවර්ධනයත් එක්ක පෞද්ගලික සංවර්ධනය පැත්ත බැලුවොත් අපේ අමාත්‍යාංශයට ලොකු කාර්ය භාරයක් ඉෂ්ට කරන්න සිද්ධ වන බව. සියයට 11ක් පමණ වැඩිහිටි ජනගහනයත්, සියයට 7ක් ආබාධිත අයත්, කුටුම්බ සංඛ්‍යාවෙන් එහෙමත් නැත්නම් පවුල් සංඛ්‍යාවෙන් බලපුවාම සියයට 23ක් තනි මාපියන් සහ දරුවනුත් අපට අයිති වෙලා

තිබෙනවා. ඉතින් මේ අමාත්‍යාංශය අපි භාර ගත්තායින් පස්සේ මමත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත්, මගේ ලේකම්තුමාත්, කාර්ය මණ්ඩලයත් සුවිශාල වැඩ කොටසක් ඉෂ්ට කර තිබෙන බව කියන්නට කැමැතියි.

විශේෂයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමාත් කිව්වා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ගැන. එතුමා කිව්වා, "තම ජීවිතය දරුවන් වෙනුවෙන් රට දැය වෙනුවෙන් කැප කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තනි වෙන්නට මම ඉඩ නොතබමි" කියලා. මුළු ජනගහනයෙන් සියයට 7ක් ඉන්න ආබාධිතයන්ට අනුකම්පාවට අමතරව සම තැන දීමටයි අපි කටයුතු කරන්නේ. ඒ වාගේම ශ්‍රව්‍ය ආබාධිත අයට, දෘශ්‍ය ආබාධිත අයට අපි counselling කරනවා. මේ වෙද්දී මාත් නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අපේ කාර්ය මණ්ඩලයත් එකතු වෙලා ආසන 86කට පෞද්ගලිකව ගිහිල්ලා ආබාධිත අය, ශ්‍රව්‍ය අබාධිත අය, දෘශ්‍ය ආබාධිත අය හම්බ වෙලා ඔවුන් වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. මේ දේවලින් ලැබූ අත් දැකීම් අනුව අපි ජනාධිපතිතුමාත් සමඟ සාකච්ඡා කරලා ඒ පවුල් -කුටුම්බ- පිළිබඳ අලුත් වැඩ පිළිවෙළක් හදන්න කටයුතු කරනවා.

ඉස්සර, "පවුල" කියපුවාම, පවුලේ හත් අට දෙනෙක් සිටියා. එය පවුල් ඒකකයක් වශයෙන් තිබුණේ. අද ඒක නැතුව වෙන් වෙන් වශයෙන් හිතන්න පුරුදු වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ ආයුෂ කාලයත් වැඩි වෙලා තිබෙනවා. එන්න එන්නම වැඩිහිටි ජනගහනය වැඩි වනවා. ලංකාවේ සාක්ෂරතාව සියයට 96ක් විතර වනවා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ සංකල්පය අනුව නොමිලයේ අධ්‍යාපනය ලබා දීම ඒකට හේතුවයි. නොමිලයේ සෞඛ්‍ය පහසුකම ලබා දීම නිසා ජීවිත අපේක්ෂාවත් වැඩි වී තිබෙනවා. කාන්තා පාර්ශ්වයට අවුරුදු 76ක් හා පිරිමි පාර්ශ්වයට අවුරුදු 73ක් දක්වා ජීවිත අපේක්ෂාව වැඩි වීමේ ප්‍රවණතාව අනුව 2025 වෙද්දී වැඩිහිටි ජනගහනය සියයට 20ක් 22ක් විතර වනවායි කියලා තමයි උපකල්පනය කරන්නේ. මේ උපකල්පනය අනුව ප්‍රතිපත්ති සකස් කිරීමේදී වෙනස්කම් සිදු කිරීම සඳහා කටයුතු කිරීම අපට භාර වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ආබාධිත අය ගැන අපට හොඳ අවබෝධයක් තිබෙනවා. ආබාධිත අයට යමක් කළ නොහැකියි කියන මට්ටමෙන් අපි බැහැරව ඉන්නවා. අපි කියන්නේ ආබාධිත අයට තම ආබාධිත බවෙන් වැඩ කරන්න පුළුවන් සුදුසු පරිසරයක් නිර්මාණය කරන්න ඕනෑයි කියන එකයි. රෝද පුටුවක් අපි දුන්නාට රෝද පුටුවෙන් යාමට අවශ්‍ය පරිසරයක් තිබෙන්න ඕනෑ. ඒ පරිසරය ඇති වුණොත් විතරයි ඔවුනට යමක් කරන්නට පුළුවන් වන්නේ. මීට පසුව රජයේ ගොඩනැගිලි හැදීමේදී ප්‍රතිපත්තියක් වශයෙන් ආබාධිත අයට ප්‍රවේශ මාර්ග සකස් කිරීමට අවශ්‍ය නීතිය අපි සම්පාදනය කර තිබෙනවා; ඒ සඳහා කටයුතු කර තිබෙනවා. උදාහරණයක් වශයෙන් ශ්‍රවණාබාධිත අයට ශ්‍රවණාබාධයක් තිබුණත් සමාජගත වන්නට අවශ්‍ය නම් ඒ භාෂාව පිළිබඳ දැනුමක් තිබිය යුතුයි. බිහිරි අයගේ භාෂාව නැත්නම් සංඥා භාෂාව ඉගැන්වීමට ගුරුවරුන් නොමැතිකම ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

මේ සමාජයට අනුගත වෙච්ච ප්‍රශ්න ගැන අපි අපේ අමාත්‍යාංශයෙන් විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා විතරක් නොවෙයි සාම්ප්‍රදායිකව ශ්‍රී ලංකා පවුල් ඒකකවල දරුවන්ට ඒ වාගේම වැඩිහිටි අයට ජීවත් වීමේ පරිසරය හදලා තිබෙනවා. වැඩිහිටි සමාජ විශාල ප්‍රමාණයකට කොන්ත්‍රාත් කිරීමට ගිවිසුම් අත්සන් කිරීමේ බලය ලබා දීලා තිබෙනවා. එම ගිවිසුම් අත්සන් කිරීමේ බලය මත වැඩිහිටි සමාජවලට ස්වයං මූලික මූල්‍යකරණයකට -තමන්ට ස්වයං ආර්ථිකයක් හදා ගැනීමේ වැඩ පිළිවෙළකට- යාමේ අවස්ථාව මේ වෙද්දී ක්‍රියාත්මක කරලා තිබෙනවා. එම නිසා හැම කෙනකුටම, හැම සමිතියකටම යම්කිසි අරමුදලක් නිර්මාණශීලී වෙලා ලබා ගන්න පුළුවන්.

එපමණක් නොවෙයි, සංවර්ධන ලොතරැයියෙන් අපි සියයට 8ක් ඉල්ලා ගන්නවා. අතිගරු ජනාධිපතිතුමා ඒ සියයට 8 අපට ලබා දුන්නා. ආබාධිතයන්ට ගෙයක් හදා ගන්න දුන්නු රුපියල් 1,50,000ක මුදල රුපියල් 5,00,000 දක්වා වැඩි කරන්නට තීන්දුවක් ගත්තා. දැයට කිරුළ වැඩසටහන යටතේ අපි මේ වෙද්දීත් ගෙවල් හතරක් පහක් සාදා නිම කරලා තිබෙනවා.

ආබාධිත, දෘශ්‍යාබාධිත අය වෙනුවෙන් නොයෙකුත් විධියේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කර තිබෙනවා. වෙන එකක් තියා, superstars තෝරනවා වාගේ "V Awards" කියලා reality show එකක් කිරීමටත් වැඩ පිළිවෙළක් තිබෙනවා. Counselling කරන්න, ඒ වාගේම ස්වේච්ඡාවෙන් වැඩ කරන අය හඳුනා ගැනීමට ලක් කරලා ඒ අයගෙන් සමාජයට වැඩක් ගන්න දැන් අපි වැඩ පිළිවෙළවල් හදලා තිබෙනවා. මේ සුළු කාලය තුළ අපේ වගකීම අපි නිසියාකාරව ඉෂ්ට කළා කියලායි මම සිතන්නේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් 34 දෙනකුට ජීවිතාන්තය දක්වාම රුපියල් 3,000 බැගින් දීමට රුපියල් මිලියන 411ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම සමාජ දීමනාව -ඒකට පින් පඩිය කියනවාට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි- වැඩි කරන්නත් ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා. එතුමා පසු ගිය අය වැය කථාව මුලින්ම ආරම්භ කළේ සමාජ සේවා අමාත්‍යාංශය මුල් කර ගෙනයි. ආබාධිත අය, ශ්‍රවණාබාධිත අය, දෘශ්‍යාබාධිත අය strike කරන්නේ නැහැ; කෑ ගහන්නේ නැහැ; ප්‍රශ්න ඇති කරන්නේ නැහැ. නමුත් ඒ අය මනුෂ්‍ය කොට්ඨාසයක් වශයෙන් පිළි අරගෙන නැවත වරක් සමාජ ගත කරන්න, රැකියා ඇති කිරීමේදී ඒ අය වෙනුවෙන් සියයට 3ක් අනිවාර්යයෙන් ලබා දෙන්න ඕනෑ කියන ඉල්ලීම ඉෂ්ට කරන්න, ඒ පිළිබඳ සම්මේලන තියන්න අපි කටයුතු කර තිබෙනවා. අපේ සමාජ සේවා නිලධාරින්ව දැනුවත් කරලා, තැන් තැන්වල ගිහින් සාකච්ඡා තියලා, සම්මන්ත්‍රණ තියලා ඒ අය සමාජයත් එක්ක වැඩ කරන්නේ කොහොමද, මේ අයව ඉදිරියට ගේන්නේ කොහොමද කියන කටයුත්ත පිළිබඳව අපි විශාල වැඩ කොටසක් දැනටමත් ආරම්භ කරලා තිබෙනවා.

මම හිතන්නේ වැඩිහිටි සමාජ 9,500කට ආසන්න ප්‍රමාණයක් අපි ඇති කර තිබෙනවා කියලායි. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මුලතිව් දිස්ත්‍රික්කයේ වාගේම රටේ හැම තැනම, -උතුර, දකුණ, නැඟෙනහිර, බස්නාහිර, වයඹ වාගේ හැම තැනම- අපේ වැඩ පිළිවෙළ දියත් කළා. මමත් අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් සාමාන්‍යයෙන් අපේ නිලධාරි මහත්වරුත් සමඟ සති අග අපේ කාලය සම්පූර්ණයෙන් ගත කළේ මේ වැඩ පිළිවෙළ ඉෂ්ට කරන්නයි. ඒ නිලධාරින්ටත් මම විශේෂ ප්‍රශංසාවක් කරනවා. නිලධාරින් තමුන්ගේ නිවාඩු දිනවල පවා ගිහිල්ලා මේ කටයුතු ඉටු කළා. දෘශ්‍යාබාධිත අයට,-ඇස් පෙන්නේ නැති අයට- අපි කණ්ණාඩි දුන්නා. CBR වැඩසටහන යටතේ පාසල්වලට රුපියල් 50,000ක් දුන්නා. ඒ හැම එකක්ම කරලා තිබෙනවා. ඒ වාගේම අපි කොරියාවත් සමඟ කථා කරලා, කොරියාවට ගිහින් පුහුණු වෙන්නත් වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා තිබෙනවා. මේවා විනාඩි පහකින්, දහයකින් කියන්න පුළුවන් කථාන්දර නොවෙයි. හුඟාක් වෙලා ගත කරන්න ඕනෑ. නමුත් මට තිබෙන වෙලාව විනාඩි 10ක කාලයකට සීමා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි උපදේශනය - counselling - කරනවා. මේ වන විට "සමබර පෞරුෂයකින් යුත් නිරෝගී ජාතියක්" කියන තේමාව යටතේ තමයි අපි උපදේශනය කරන්නේ. ඒ යටතේ සාමාන්‍ය පුරවැසියාගේ පටන් ආබාධිත රණ විරුවන් දක්වා මේ උපදේශන වැඩසටහන් කරලා තිබෙනවා. අපි රණ විරුවන් වෙනුවෙන් හදපු අනුරාධපුර "අභිමන් සල" නමැති ආයතනයේ සේවය කිරීමට පුහුණු කළ හමුදාව සඳහා උපදේශන මාලාවක් පැවැත්වූවා. ඒ වැඩසටහන ඉතාමත්ම සාර්ථක වුණා. 2011 සැප්තැම්බර් මස 31වන දින වන විට වව්නියාව, කිලිනොච්චිය, මුලතිව් දිස්ත්‍රික්කය ඇතුළු දිවයිනේ සෑම

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

ප්‍රදේශයකම උපදේශන සේවා 4,211ක් පැවැත්වුවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා ප්‍රතිලාභීන් 83,475ක් සහභාගි වෙලා තිබෙනවා. නමුත් අපි counselling සඳහා වැය කළ මුදල රුපියල් ලක්ෂ 111ක් පමණයි. ඔබතුමා දන්නවා ඇති අද රටේ පුංචි දේටත් දිවි නසා ගන්නවාය කියන එක. පසු ගිය දවස්වල තුන් දෙනෙකු ගසක එල්ලුණා. මානසික අගාධයට වැටෙද්දී, ඉච්ඡා බංග වෙද්දී, අපේක්ෂා බංග වෙද්දී එකම දේ වහ බොන එක; නැත්නම් වෙඩි තියන එක; තුවක්කු පත්තු කරන එක.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා. Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කර කර සිටියේ අපේ උපදේශන සේවාව ගැනයි. අපි ඒ ක්‍රමයට සක්‍රීය වශයෙන් හැම තැනකම උපදේශන සේවාව පවත්වලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, අද සරත් ෆොන්සේකා ගැන විශාල ප්‍රශ්නයක් තිබෙන බව. උපදේශන සේවාවලට සහභාගි වෙලා මමත් යමක් ඉගෙන ගත්තා. හරි උපදේශනයක් තිබුණා නම් සරත් ෆොන්සේකාට ඔහොම වෙන්නේ නැහැ කියන එකයි මගේ පෞද්ගලික මතය. අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ මතයේ ඉන්නවා. සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රශ්නය ගැන මම පොඩ්ඩක් කථා කරන්න කැමැතියි. එතුමා දක්ෂ නිලධාරියෙක් වෙන්න ඇති. එතුමා සක්‍රීය හමුදාවෙන් ඉවත් වුණාට පසුව 2009 දෙසැම්බර් මාසයේ 01වන දින විශ්‍රාම යාමට අවශ්‍ය බව අතිගරු ජනාධිපතිතුමාව හමු වෙලා ප්‍රකාශ කළා. එදා ජනාධිපතිතුමාගේ රාත්‍රී භෝජන සංග්‍රහයක් තිබුණා. ජනාධිපතිතුමා සරත් ෆොන්සේකා මහත්මයාටත් ඒ සඳහා ආරාධනා කරලා එතුමාගෙන් ඇහුවේ, "ඔබට තිබෙන ප්‍රශ්න මොනවාද?" කියලායි.

අන්න counselling කෙරුවා. මොකක්ද එතුමා කිව්වේ? ජනාධිපතිතුමා කිව්වා, "ප්‍රශ්නයක් තිබෙනවා නම් මම එක්ක කථා බහ කරලා ඒවා විසඳා ගන්න පුළුවන්" කියලා. ඊට පස්සේ ෆොන්සේකා ඒකට උත්තර දුන්නා, "මම එළඹෙන ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයා වශයෙන් තරග කරන්න කැමැතියි" කියලා. ඒක තමයි උත්තරය. ඊට පස්සේ ජනාධිපතිතුමා මොහොතක් නිහඬව ඉඳලා බොහොම ගැඹුරු කට හඬින් කිව්වා, "මම ඔබට සුබ පතනවා" කියලා. එහෙම කියලා එතුමා නැවත වරක් මෙහෙම කිව්වා; හොඳ උපදේශනයක් දුන්නා. "මේක ඔයාගේ ජීවිතයේ ගන්න වැරැදි තීරණයක් කියලායි මට නම් හිතෙන්නේ. කවදා හරි ඔයාට මේ තීරණය සම්බන්ධයෙන් දුක් වෙන්න වෙයි. මගේ ජයග්‍රහණය ඉර හඳ වාගේ විශ්වාසයි. ඔයා ජනාධිපතිවරණයෙන් පැරදුණාට පස්සේ මේ අය ඔයාව විසි කරලා දමනවා. ඊට පස්සේ ඔයාට තේරෙයි මේ කට්ටියගේ සැලසුම් කොහොමද කියලා. මේ කට්ටියට මෙවැනි දේවල් හොඳට පුරුදුයි. මේ games මේ අයට පුරුදුයි. මම ඔබට සුබ පතනවා. ජනාධිපතිවරණයෙන් පස්සේ අපි එකතු වෙලා වැඩ කරමු. ඔයා මට සහෝදරයෙක් වාගේ. කාටවත් අහු වෙන්න එපා. එදා මට කුණුහරුපෙන් බැණපු අයත් අද මට හොඳ කියනවා. මා ළඟ ඉන්නවා. ඔයා ආපහු මා ළඟට ආපු දාට මගෙන් උදව්වක් ඉල්ලුවොත් මම ඔයාට දෙනවා" කියලා තමයි ජනාධිපතිතුමා කිව්වේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Minister, please wind up now.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ටික කියන්න මට අවස්ථාව දෙන්න. මේක වැදගත් කාරණයක්.

එහෙම තමයි ජනාධිපතිතුමා කිව්වේ. ඒක ඉතා හොඳ උපදේශනයක්. ඒ නිසා මම මෙන්න මේ ටික කියන්න ඕනෑ. බලන්න, එතුමා කොයි තරම් සංවේදී නායකයෙක්ද කියලා. ජනාධිපතිවරණයට ඡන්දය ඉල්ලන්න ආපු ෆොන්සේකා මහත්තයාට ජනාධිපතිතුමා එහෙම කිව්වා නම් එතුමාට ෆොන්සේකා මහත්තයා වෙනුවෙන් කරන්න බැරි දේකුත් නැහැ. තමුන්ව පාවා දීපු, තමුන්ව ඉස්සරහට දාපු, තමුන්ව කුලප්පු කරලා තොග පිටින් ගිහිල්ලා බොරුවට සෙනහ පෙන්වපු අය ගැන ෆොන්සේනා මහත්මයා වටහා ගන්න ඕනෑ. ඡන්ද ලක්ෂ හතළිස්ගණනකින් පැරදිලා ඉන්න ෆොන්සේකා මහත්මයා මේ යථා තත්ත්වය තේරුම් අරගෙන, පාවා දීපු අයව තේරුම් අරගෙන, නැවත වරක් අර සංවේදී නායකයා ළඟට ගිහිල්ලා මේ වෙච්ච වැරැද්ද ගැන කථා කළොත් එතුමා කවදාවත් අත අරින්නේ නැති බව මට නම් විශ්වාසයි. එතුමාගේ තිබෙන සංවේදීකම නිසා ස්ථිර වශයෙන්ම ඒ යුතුකම ඉෂ්ට කරන්න එතුමා කවදාවත් පැකිලෙන්නේ නැහැ. තමන්ට කුණුහරුපෙන් බැණපු අයට පවා එතුමා තනතුරු දීලා තිබෙනවා නම්, ඇමතිකම් දීලා තිබෙනවා නම් එතුමාට මේක මොකක්ද කියන එකයි අවුරුදු තිස්තුනක් දේශපාලනය කරපු කෙනෙක් හැටියට මගේ පෞද්ගලික විශ්වාසය. ඒ වැදගත් කාරණාව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.58]

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මෙවර ඉදිරිපත් කරපු අය වැය ගැන විවිධ කතා බහා, ඒ වාගේම විවේචන, චෝදනා, යෝජනා විපක්ෂයෙන් නැඟුවත්, මේ වෙද්දි මේ අය වැය ගැන අප සොයා බැලුවාම අපට පෙනී ගියා 2012 වසර වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන අය වැය දිගුකාලීන ප්‍රතිඵල ගෙන දෙන අය වැයක් බවට බුද්ධිමත් සහ විශේෂයෙන්ම පටු ආකල්ප හා දේශපාලන අරමුණුවලින් බැහැර වූ ආර්ථික විශ්ලේෂකයන් සාක්ෂි දරන බව. තුන්වැනි ලෝකයේ රටක් හැටියට මේ ඉදිරිපත් කරන ලද අය වැය දිහා බැලුවාම මෙය ඉතාම ශක්තිමත් අය වැයක් බව අපට පේනවා. ඒ වාගේම මේ අය වැය කළගුණ සලකපු අය වැයක්. මේ අය වැයෙන් රාජ්‍ය සේවකයන් අමතක කර නැහැ. ඒ වාගේම මෙවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප රුපියල් 1,000කින් ඉහළ නංවා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැයේදී ත්‍රස්තවාදී සටනේදී දිවි දුන් රණ විරුවන් අමතක කරලා නැහැ. රණවිරුවන්ගේ ආර්ථික දුෂ්කරතා ඇති පවුල්වලට හා ත්‍රස්තවාදී සටනේදී දිවි දුන් රණවිරුවන්ගේ දෙමව්පියන්ට රුපියල් 750ක දීමනාවක් ලබා දී තිබෙනවා. ආබාධිත සෙබළුන්ට ණය යෝජනා ක්‍රම හඳුන්වා දී තිබෙනවා. මේ අනුව කළ ගුණ සැලකීම මනාව ප්‍රදර්ශනය වන අය වැයක් ලෙස මෙය අපට හඳුන්වන්න පුළුවන්. කෘෂිකර්මය, සත්ව පාලනය දියුණු කරන්න අවශ්‍ය පියවර ගණනාවක් මේ අය වැය තුළ අන්තර්ගත වෙනවා. ඒ වාගේම "දිවි නැඟුම" වැඩ සටහන තුළින් රට නැඟුමට පියවර තබා තිබෙනවා. මේ අය වැයෙන් අධ්‍යාපනයේ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව සඳහාත් පියවර රැසක් ගනිමින් මේ රටේ නිරෝගී, උගත් පරපුරක් අපේක්ෂා කර තිබෙනවා. දුෂ්කර ගම්මාන නඟා සිටුවීමටත් වෙනම රුපියල් බිලියන 15ක් වෙන් කර තිබෙනවා. දිළිඳුකම සියයට 15.6 සියට සියයට 8.9 දක්වා අඩු කිරීමට පියවර ගෙන තිබෙනවා. ඒ වාගේම මෙය රටේ ජනතාව වෙනුවෙන් යුතුකම් ඉටු කරපු මාධ්‍යවේදීන් අමතක නොකරපු අය වැයක්. රට නිදහස් කර ගැනීම තුළ ජාතික අවශ්‍යතාව ඉටු කළ සියලු මාධ්‍යවේදීන් කෘතවේදීව සිහිපත් කළ අය වැයක්.

ඉතිහාසයේ පැවැති පාලන කාලවලදී මෙවැනි පොලී රහිත විශාල ණය මුදල් මාධ්‍යවේදින්ට ලැබුණු අවස්ථා තිබුණාද යන්න ප්‍රශ්න කළ යුතුව තිබෙනවා. ඒ වාගේම මේ අය වැය දේශීය නියෝජනය ඉහළ නංවමින් කර්මාන්ත, ධීවර ආදි රටේ දහඩිය හෙළන ජනතාව අමතක නොකළ අය වැයක් ලෙස හැඳින්වීමට පුළුවන්. ඒ අනුව සෑම ක්ෂේත්‍රයක් පුරාම විකාශය වූ අය වැයක් ලෙස මේ අය වැය හඳුන්වන්න පුළුවන්. අල්පෙනෙත්තේ සිට විශාල පර්වතය දක්වා සිතා බලා සකස් කරන ලද අය වැයක් ලෙස මේ අය වැය හඳුන්වන්න පුළුවන් කියන එක තමයි ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයකු හැටියට මට ප්‍රකාශ කරන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප අමාත්‍යාංශය වන රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය භාරය ගැන මඳක් කිව යුතුයි. රජය සතු නිෂ්ක්‍රිය සම්පත් කළමනාකරණය සහ ව්‍යවසාය සංවර්ධනය තුළින් "මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ" රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම අප අමාත්‍යාංශයේ කාර්ය භාරය වෙලා තිබෙනවා. 2010 අප්‍රේල් 30 ආරම්භ කළ අප අමාත්‍යාංශය කළ කැප කිරීම් රාශියක් තුළ විශාල ජයග්‍රහණ රැසක් අත් පත් කර ගෙන තිබෙනවා. ලාභය ඉහළ නැංවිය හැකි ආයතන හැටියට Lanka Mineral Sands Limited ආයතනය, Lanka Phosphate Limited ආයතනය, පරන්තන් රසායනික ආයතනය වැනි ආයතන ඉදිරියට ගෙන ඒමට අපි කටයුතු කර තිබෙනවා. ඛනිජ වැලි කර්මාන්තයෙන් 2009දී ලැබූ රුපියල් මිලියන 230ක් වූ ශුද්ධ ලාභය 2012 ආසන්නයේදී රුපියල් මිලියන 1,200ක් දක්වා ඉහළ නංවා, භාණ්ඩාගාරයට අදාළ ලාභාංශය ලබා දීමට අපි සමත් වෙලා තිබෙනවා. අපි ඒ ගැන ආඩම්බර වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම Lanka Mineral Sands Limited ආයතනය යටතේ යාන්ඔය ප්‍රදේශයේ නව යන්ත්‍රාගාරයක් ආරම්භ කිරීමටත්, ඒ ආශ්‍රිත කර්මාන්ත පුරයක් ආරම්භ කිරීමටත් අපි අපේක්ෂා කරනවා. ආයෝජකයන් සමඟ සම්බන්ධ වෙලා ඒ කර්මාන්ත පුරය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට අපි කටයුතු කරනවා. ඒ වාගේම කෝකිලායි කළපුවෙන් එගොඩ තිබෙන ඛනිජ නිධිය හා සම්බන්ධ කැනීම් එන වර්ෂයේ ආරම්භ කර මේ රටේ ආර්ථිකයට ශක්තියක් ලබා දීම සඳහා කටයුතු කිරීමට අපි අදහස් කර තිබෙනවා. ඒ වාගේම Lanka Phosphate Limited ආයතනය සඳහා ඇඹරුම් යන්ත්‍රයක් මිල දී ගැනීමට මේ වන විට අපි කටයුතු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පරන්තන් කර්මාන්තශාලාව, පරන්තන් ප්‍රදේශය තුළම පිහිටුවීම සඳහා මේ වන විට ඉඩම් නිරවුල් කර ගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා එන වර්ෂයේදී පරන්තන් කර්මාන්තශාලාව පරන්තන් ප්‍රදේශයේම ස්ථාපිත කිරීමේ වැඩ පිළිවෙළ සඳහා යන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඒ සඳහා මේ අවුරුද්දේ සල්ලි වෙන් කර තිබෙනවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
අපේ අමාත්‍යාංශය තුළ කැබිනට් අනුමැතියක් ලබා ගෙන කටයුතු කර ගෙන යන ක්‍රමවේදයක් තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් ඔබතුමාට පැහැදිලි කරන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "ලක්සල" කඩා වැටෙන තත්ත්වයේ තිබුණු ආයතනයක්. අපේ අලුත් පරිපාලනය තුළ ලක්සල මේ වර්ෂයේදී රුපියල් මිලියන 50ක ලාභයක් උපදවා ගැනීමේ තත්ත්වයට පත් කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. තුන්මුල්ල ප්‍රදේශයේ පිහිටි ප්‍රදර්ශනාගාරය අලුත්වැඩියා කරනවා වාගේම, කොටුව ප්‍රදර්ශනාගාරය අලුත්වැඩියා කිරීමේ වැඩ පිළිවෙළත්, මොරටුව, නුවර සහ ගාල්ල ප්‍රදර්ශනාගාර බෙහෙවින් සිත් ගන්නා සුළු ආකාරයේ, යුගයට ගැළපෙන ආකාරයේ ප්‍රදර්ශනාගාර බවට පත් කිරීමේ වැඩ පිළිවෙළත් පළමු අදියර හැටියට ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විසිතුරු භාණ්ඩ සපයන උදවිය ශක්තිමත් කිරීම සඳහා අපි ඊයේ ලංකා බැංකුව සමඟ ගිවිසුම්ගත වුණා. ලංකා බැංකුවත්, භාණ්ඩාගාරයත්, අප අමාත්‍යාංශයත්, සංචාරක අමාත්‍යාංශයත් ඒකාබද්ධව කටයුතු කරමින් විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කරන උදවියට රුපියල් මිලියන 500ක මුදලක් ණය හැටියට ලබා දීලා, හොඳ වෙළෙඳ පොළක් ලක්සල තුළින් ලබා දීලා, ඒ උදවිය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අප අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සහ ලංකා සිමෙන්ති සංස්ථාව ඒකාබද්ධව කටයුතු කරමින් මේ වර්ෂයේදී අපි මිලියන 10ක ලාභයක් උපදවලා තිබෙනවා. අපි ඒ ලාභය උපදවලා තිබෙන්නේ සිමෙන්ති කර්මාන්තශාලාවේ තිබුණු EPF සහ ETF සම්බන්ධ සේවක ප්‍රශ්නත් නිරාකරණය කර ගෙනයි කියන එක තමුන්නාන්සේලාට ප්‍රකාශ කිරීම මගේ වගකීමක් සහ යුතුකමක් වෙලා තිබෙනවා. කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව අදියර තුනකින් ආරම්භ කිරීමේ වැඩ පිළිවෙළේ පළමු අදියර එන වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

අපේ අමාත්‍යාංශය සතුව වසා දමා තිබූ ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගතකරණය කිරීම තුළින් වසර 30ක කළමනාකරණ ගිවිසුමක් යටතේ පෞද්ගලික අංශයට පවරා දීලා, එන වර්ෂයේදී ඒ වැඩ කටයුතු ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඒ සේවකයන්ගේ සියලු ප්‍රශ්න නිරාකරණය කිරීමටත් අප සමත් වෙලා තිබෙනවා. එය අප ලැබූ ජයග්‍රහණයක් හැටියට හඳුන්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1980 ජූලි වර්ජකයන් තවමත් පාරේ ඉන්නවා. නමුත් අපි, අපේ අමාත්‍යාංශයේ වාගේම අපේ රජය යටතේ ඉන්න සේවක මහත්ම මහත්මීන් ආරක්ෂා කර ගෙන ඒ උදවියට ලබා දිය යුතු දීමනා සියල්ල ලබා දෙමින් කටයුතු කරනවා. එසේ කටයුතු කරන රජයක් බවට මේ රජය පත් වෙලා තිබෙනවා කියන එක තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්න ඕනෑ.

වාලච්චේන කඩදාසි කම්හල ගැන අපේ ගරු යෝගේස්වරන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මම එතුමා සමඟ එකඟ වෙනවා. එතුමා හොඳ යෝජනාවක් කළා. ඒ යෝජනාව කළ එතුමා මේ අවස්ථාවේ මෙතැන නැති වුණත් මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. වාලච්චේන කඩදාසි කම්හල අප විසින් පවත්වා ගෙන

[ගරු දයාශ්‍රිත තිසේරා මහතා]

යනු ලබන කඩදාසි කම්හලක්. අපි ඒ උදවියගෙන් ඉල්ලා සිටින්නේ ඒ ආයතනය තවදුරටත් පවත්වා ගෙන යෑමට සහයෝගය ලබා දෙන්න කියායි. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට එම ඉල්ලීම කරන එක මගේ යුතුකමක් වෙලා තිබෙනවා. එහි සේවකයෝ 108 දෙනෙක් ඉන්නවා. එන වර්ෂය මුලදී මාත්, ඒ වාගේම අපේ නියෝජ්‍ය ඇමතිතුමාත්, ලේකම්තුමාත්, නිලධාරිනුත් ගිහින් ඒ සේවකයන් සමඟ සාකච්ඡා කරලා ඒ කර්මාන්තශාලාවට කළ යුත්තේ කුමක්ද  කියලා ඒ අයගේ අදහස් විමසා බලනවා. ඒ සේවක මහත්වරුන් සමඟ සාකච්ඡා කරලා ඒ අයගේ අදහස් අනුව ඒ කර්මාන්තශාලාවත් තව තවත් ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඇඹිලිපිටිය කඩදාසි කම්හලේ තිබෙන ඒවාට වඩා පැරැණි යන්ත්‍ර සූත්‍ර තමයි වාලච්චේන කර්මාන්තශාලාවේ තිබෙන්නේ කියන එකත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාවනැල්ල රබර් නිෂ්පාදන කර්මාන්තශාලාව සම්බන්ධයෙන් මෙතැනදී තවත් මන්ත්‍රීවරයකු නඟපු ප්‍රශ්නයක් මට මතක් වෙනවා. ඒ කර්මාන්තශාලාව 2002 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමයේදී ප්‍රතිව්‍යුහගතකරණය කොට වසා දමපු කර්මාන්තශාලාවක්. අතිගරු ජනාධිපතිතුමා 2006 දී නැවත ඒ කර්මාන්තශාලාව ආරම්භ කෙරුවත්, ඒ කර්මාන්තශාලාවේ තිබුණු යන්ත්‍ර සූත්‍ර බොහොම අබලන්, පැරැණි යන්ත්‍ර සූත්‍ර බවට පත් වෙලා තිබුණා. ඒ නිසා අපට ලාභයක් උපදවා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. මේ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ උදවිය ගොඩක් ඉන්න නිසාත්, ඒ කර්මාන්තශාලාවෙන් ආදායම් උපදවලා රජය ශක්තිමත් කරන්න නොහැකි වුණු නිසාත්, කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරලා ඒ කර්මාන්තශාලාවත් වසර 30ක කළමනාකරණ ගිවිසුමක් යටතේ ආයෝජකයකුට ලබා දීමට අපි කටයුතු කරලා තිබෙනවා.  ඒ ප්‍රදේශයේ ජනතාවට ඍජු සහ වක්‍ර රැකීරක්ෂා නැවත උත්පාදනය කිරීම තමයි අපි එයින් බලාපොරොත්තු වෙන්නේ. වසා දමලා තිබුණු ආයතනයක් තමයි වසර 30ක බදු පදනම මත ආයෝජකයකුට ලබා දීමට කටයුතු කර තිබෙන්නේ කියන එක තමුන්නාන්සේලාට ප්‍රකාශ කිරීම අපේ වග කීමක් සහ යුතුකමක් වෙලා තිබෙනවා.

අපේ වතු ක්ෂේත්‍රය තුළ තිබෙන ප්‍රශ්න හා ගැටලු නිරාකරණය කිරීමට අලුත් සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාවෙන් -කෝප් වාර්තාවෙන්- අපට ඉදිරිපත් කළ කරුණුවලට සවන් දීලා, එන වර්ෂයේදී කෙසේ හෝ අපේ වතු ක්ෂේත්‍රය නඟා සිටුවීමට යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපි මේ වෙද්දීත් නොපසුබටව ක්‍රියාත්මක වෙලා තිබෙනවාය කියන එක  සිහිපත් කරන්න ඕනෑ.

අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සියලුම ආයතන දිහා බලපුවාම ඒවා තුන් කොටසකට වර්ගීකරණය කරන්න පුළුවන්, ලාභ ලබන, මධ්‍යස්ථ  ලාභ ලබන, ඒ වාගේම වැටී තිබෙන එහෙම නැත්නම් වසා තිබෙන ආයතන වශයෙන්. වසා දමා තිබෙන, වැටී තිබෙන ආයතන, පැරැණි යන්ත්‍ර සූත්‍ර තිබෙන ඒ  ආයතන නැවත ආරම්භ කරන්න අපි පළමුව කටයුතු කරනවා. ඒවාට මේ රටේ ජනතාවගේ දායකත්වය ලබා දීලා,  මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න අපේ පුරවැසියන්ගේ යහපත  සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඇඹිලිපිටිය කඩදාසි කම්හල හා සමානවම, ඒ ක්‍රමවේදය තුළම, කන්තලේ සීනි කර්මාන්තශාලාවත් වසර 30ක් සඳහා වූ කළමනාකරණ ගිවිසුමක් යටතේ පෞද්ගලික සමාගමකට ලබා දීමට අපි මේ වෙද්දී කටයුතු කරමින් සිටින බවත්, ඊට අදාළව ඉදිරිපත් කරන කැබිනට් පත්‍රිකාවේ අවසන් අදියර තුළ ඉන්න බවත් ප්‍රකාශ කරන්න ඕනෑ. මේ සියල්ල කළමනාකරණය කිරීම සඳහා අලුත් වැඩ පිළිවෙළක් හැටියට සීමාසහිත රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවත් පිහිටුවලා, අපේ අමාත්‍යාංශය  යටතේ තිබෙන ලාභ ලබන ආයතනවලින් ලැබෙන ලාභය එතැනට අරගෙන, එතැනින් පාඩු ලබන ආයතනවලට යොමු කරලා, ඒ පාඩු ලබන ආයතනත් නඟා සිටුවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ ක්‍රමවේදය තුළ ලාභ ලබන ආයතනත්, පාඩු ලබන ආයතනත් සියල්ල ගොඩ නැඟීමට යම් සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා, එදා මේ රටේ සංවර්ධනයට දායකත්වය ලබා දුන් ඒ ආයතන සහ කර්මාන්තශාලා නැවත මේ රටේ සංවර්ධනය සඳහා දායක කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ හරහා  මේ රටේ ඒ ඒ ප්‍රදේශවල ජීවත් වන උදවියගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සහ අනාගත පරපුරේ ජීවන තත්ත්වය නඟා සිටුවීම තමයි මේ අමාත්‍යාංශයේ කාර්ය භාරය වෙලා තිබෙන්නේ.

අපි ඇඹිලිපිටිය කඩදාසි කම්හල ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී, දේශප්‍රේමීන් යැයි කියා ගන්නා සමහර උදවිය ඊට හරස්  වෙලා, ඒ කාර්ය භාරය හරි නැහැ කියලා ප්‍රකාශ කෙරුවා අපට මතකයි. ඒ පිළිබඳව විවිධ කථා මේ පාර්ලිමේන්තුවේදීත් කිව්වා. මම එකක් කියන්න ඕනෑ. දේශප්‍රේමීන් කියලා ලේබල් ගහ ගත්ත උදවියම තමයි එදා ඇඹිලිපිටිය කඩදාසි කම්හල ගිනිබත් කරන්න උත්සාහ කෙරුවේ. එදා ගිනිබත් කරන්න උත්සාහ කරපු කම්හල තමයි අද අපි ආරම්භ කරන්නේ. දේශප්‍රේමීන් කියා ගන්නා උදවිය එදා මේ රට තුළ විනාශ කළ ඒ කර්මාන්තශාලා අද අපි නැවත ආරම්භ කරන්න යද්දී, ඒසේවකයන්ගේ ප්‍රශ්න විසඳලා අපි නැවත ඒ කර්මාන්තශාලා ආරම්භ කරන්න යද්දී,  ඒ උදවිය විවිධ යෝජනා, විවිධ චෝදනා කරමින් රජයටත්, අතිගරු ජනාධිපතිතුමාටත්, අපටත්, අපේ අමාත්‍යාංශයටත් ඇඟිල්ල දික් කරමින් කථා කරනවා. ඒ ගැන මම කනගාටු වෙනවා.

එක්සත් ජාතික පක්ෂය ගැනත් යමක් කිව්වොත් හොඳයි කියලා මට හිතෙනවා.  රනිල් වික්‍රමසිංහ මහත්මයා ගැනත් මට පොඩ්ඩක් කියන්න ඕනෑ. අද රනිල් වික්‍රමසිංහ මහත්මයා සාටකය ගැන කථා කරනවා. මම හිතන්නේ, සාටකය දකින කොටම අපේ විපක්ෂ නායකතුමා හීනෙනුත් බය වෙනවාය කියායි. රජය පෙරළන්න නොයෙකුත් කථාබස් ඒ වාගේම නොයෙකුත් දේවල් කිව්වාට මේ රජය පෙරළන්න බැහැ. සමහරු කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයාව එක්සත් ජාතික පක්ෂයේ නායකයා විධියට ආරක්ෂා කරගෙන තිබෙන්නේ ජනාධිපතිතුමායි කියලා. නමුත් රනිල් වික්‍රමසිංහ මහත්මයාව එළවා ගන්න කොන්දක් තිබෙන නායකයෙකු යූඑන්පී එකේ නැති කොට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මොනවා කරන්නද කියලා මම ප්‍රශ්නයක් අහනවා. ඒ වාගේම සාටකය ගැන කථා කරද්දී මේ රට තුළ සාටකය අද ශක්තිමත් වෙලා තිබෙනවා. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා මෙතැනදී ටයි පොල්ල ගැලෙව්වා. හෙට අනිද්දා වෙද්දී සාටකයක් කරේ දා ගනීදෝ කියලා සැකයක් මට ඇති වෙලා තිබෙනවා. ඒ නිසාද දන්නේ නැහැ, එතුමා මෙතැනදී ටයි පොල්ල ගැලෙව්වේ කියන එකත් තමුන්නාන්සේලාට සිහිපත් කිරීම මගේ යුතුකමක් සහ වගකීමක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයේ අපේ නිලධාරින් සම්බන්ධවත් මම යමක් ප්‍රකාශ කිරීම මගේ යුතුකමක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මගේ සහෝදර නියෝජ්‍ය අමාත්‍යතුමා මට ලබා දෙන සහයෝගය, ශක්තිය සිහිපත් කිරීම මගේ වගකීමක් වෙනවා. ඒ වාගේම මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමිය ඇතුළු අනෙකුත් සියලුම නිලධාරින් සහ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල සියලු නිලධාරි මහත්ම මහත්මීන් ලබා දෙන සහයෝගය, ශක්තිය, එකමුතුකම උඩ තමයි පසු ගිය වර්ෂය තුළ මේ අමාත්‍යාංශය

තුළින් යම් දෙයක් මේ රටට ලබා දීමට අපට පුළුවන් වෙලා තිබෙන්නේ. මේ අමාත්‍යාංශයේ කාර්ය භාරය මේ රටේ ජනතාවට පෙන්වා දීමට පුළුවන් වෙලා තිබෙන්නේ ඒ නිසයි කියන එක ඔබ තුමන්නාන්සේලාට ප්‍රකාශ කරමින් මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධනයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

"3 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 253,604,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

3 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 39,500,000

"3 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 39,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

3 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 3, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 253,604,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 3, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 39,500,000

“தலைப்பு 3, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 39,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 3, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 253,604,000, for Head 3, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 3, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 39,500,000

Question, "That the sum of Rs. 39,500,000, for Head 3, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 3, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"108 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 77,980,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

